

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

අද පත්‍රය සමඟ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ අධි වප් පුර පැළවිය ලත් කිව් දින | කාණ්ඩය 111 | පත්‍රය 235 | පිටු 36 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 සැප්තැම්බර් 18 සිකුරාදා

ආකල්ප වෙනසක් සමඟ සංවර්ධන පෙරළියකට සැරසෙන්න

◀ ජනපති කියයි

තමා නිරීක්ෂණය කර ඇති පරිදි රටටම ඇති පොදු ප්‍රශ්නය කිසිවකු වැඩ නොකිරීම බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කියා සිටී. රාජ්‍ය, පෞද්ගලික දෙඅංශයේම දක්නට ලැබෙන මන්දගාමී ක්‍රියාකාරිත්වය කනගාටුවට කරුණක් යයි ඔහු සඳහන් කරයි. කොළඹ නගරයේ සහ තදාසන්න නගර කිහිපයක සිදු කෙරෙමින් පවතින ඉදිකිරීම් හැම දවසකම එකම මට්ටමක තිබීම නිදසුනකැයි ජනාධිපතිවරයා පෙන්වා දෙයි. අරඹා ඇති සියලු ඉදිකිරීම් කඩිනමින් නිම කළ යුතු බව සඳහන් කළ ජනාධිපතිවරයා ආකල්ප වෙනසක් සමඟ සංවර්ධන පෙරළියකට සූදානම් වන මෙන් සියලු පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටී. පිට 06

අනාගතයේ මෙරට ප්‍රධාන ආදායම් මඟ

වරාය නගර ව්‍යාපෘතියයි

6 වැනි සැමරුමේදී අගමැති කියයි

ධනුෂ්ක ගොඩකුඹුර

අනාගත ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් වන්නේ කොළඹ වරාය නගර ව්‍යාපෘතිය බව හය වැනි සංවත්සරය සමරන වරාය නගරයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (17) ප්‍රකාශ කළේය. පිට 06

කොළඹ වරාය නගරයේ හය වැනි සංවත්සරය වෙනුවෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (17) එහි නිරීක්ෂණ චාරිකාවක නිරත විය. අග්‍රාමාත්‍යවරයා එම සංචාරය අතරතුර වරාය නගරයේ ගෝල්ෆ් ක්‍රීඩා කළ අයුරු. *ඡායාරූපය - අග්‍රාමාත්‍ය මාධ්‍ය ඒකකය*

19 සාධනීය ලක්ෂණ ඉවත් කරන්නේ නෑ

රටට හානිකර යෝජනා 20 දී වෙනස් වෙනවා

පිට 06

ඇමැති කෙහෙලිය

කොළඹ, මාලිගාකන්ද, මහාබෝධි අග්‍රශ්‍රාවක මහා විහාරයේ ඊයේ (17) පැවැති ශ්‍රීමත් අනගාරික ධර්මපාල කුමාගේ 156 වැනි ජන්ම සංවත්සරයට සහභාගි වූ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එහි ප්‍රධාන ශාලාවේ තැන්පත් කර ඇති අනගාරික ධර්මපාල පිළිරුවට පුෂ්පෝපහාර දැක්වූ අයුරු. *ඡායාරූපය සුලෝචන ගමගේ*

සේවයේ යෙදවිය හැකි අවම වයස 16යි

බුද්ධිකා ඉඹුලාන සහ සිතාරා සේනානි

ශ්‍රමිකයන් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 16 දක්වා ඉහළ දැමීමට අදාළ කම්කරු නීති සංශෝධනය කෙරේ. පිට 06

රස පරීක්ෂක වාර්තා නැතිව නඩු 4,000ක් අතරමඟ නැවතිලා

ස්වර්ණා විජේකෝන්

රස පරීක්ෂක වාර්තා සැපයීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් 4,000කට වැඩි නඩු ප්‍රමාණයක් අතරමඟ ඇනහිට ඇතැයි රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ. ජේ. රත්නසිරි මහතා පවසයි. පිට 06

එජාප නව නායකයා දෙසැම්බරයේ කරළියට

ශිරෝමි අබයසිංහ

ආණ්ඩුව 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කර, අලුත් මැතිවරණ කොමිසමක් යටතේ ලබන වසරේ මාර්තු මස වන විට පළාත් සභා මැතිවරණය පවත්වනු ඇතැයි අනුමාන කරන හෙයින් මැතිවරණය සඳහා සූදානම් වීමට දෙසැම්බර් මස වන විට අනිවාර්යයෙන්ම නව නායකයා පත් කිරීමට එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතා තීරණය කර තිබේ. පිට 06

සමාජ මාධ්‍ය වීඩියෝව ගැන අපක්ෂපාති පරීක්ෂණයක්

ප්‍රභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු සම්බන්ධයෙන් මේ දිනවල සමාජ මාධ්‍ය ජාල ඔස්සේ සංසරණය වන වීඩියෝව පිළිබඳ අමාත්‍යාංශ මට්ටමෙන් අපක්ෂපාති පරීක්ෂණයක් අරඹා තිබෙන බව එම අධිකාරියේ සභාපති නීතිඥ සරණ කරුණාරත්න මහතා දිනමිණට පැවසීය. පිට 06

ශ්‍රී ලංකාව ඉස්ලාම් රාජ්‍යයේ කොටසක් ලෙස නම් කර ඇති බව මා දැනගත්තත් ආරක්ෂක කවුන්සිලය දැනුම්වත් කළේ නෑ

හිටපු ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි පිට 06

20ට විරුද්ධ වෙන්න

මන්ත්‍රී විජිත හේරත්

නදී මාණික්කගේ

ජනාධිපති ගමනකට පාර කියන 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ වෙන්නැයි ආණ්ඩු පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් සහ ඇමැතිවරුන්ගෙන් ඉල්ලා සිටින බව ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා ඊයේ (17) පැලවත්ත පක්ෂ මූලස්ථානයේ පැවති මාධ්‍ය හමුවකදී පැවසුවේය. පිට 06

අංගොඩ ලොක්කා මැරුණේ පපුවේ අමාරුවකින්

පිට 06

ඉන්දීය මධ්‍යම අපරාධ කාර්යාංශය

විජයකලා මහේශ්වරන් විද්‍යා ඝාතන සැකකරු මුදාහරින වීඩියෝව ජනපති කොමිසමට

රෝෂන් තුෂාර

යාපනයේ විද්‍යා දැරිය ඝාතන නඩුවේ ප්‍රධාන සැකකරුවන දැනට පලා ගොස් සිටින මහලිංගම් ශශිකුමාර්ට යාපනය වැසියන් විසින් ලයිට් කණුවක බැඳ පහර දෙන අවස්ථාවේ එතැනට පැමිණි හිටපු ඇමැතිනී විජයකලා මහේශ්වරන් මහත්මිය විසින් මුදාහරින අයුරු දැක්වෙන වීඩියෝ දර්ශනයක් දේශපාලන පළි ගැනීම් පිළිබඳ විමර්ශනය කරන ජනපති කොමිසම හමුවේ ඊයේ (17) ප්‍රතිවාදනය කරනු ලැබිය. පිට 06

අය-වැය ඔක්තෝබර් දෙවැනි සතියේ

බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි

ලබන වසර සඳහා වූ අය-වැය ඔක්තෝබර් මස දෙවැනි සතියේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව වැවිලි කර්මාන්ත ඇමැති, සම කැබිනට් ප්‍රකාශක වෛද්‍ය රමේෂ් පතිරණ මහතා පැවසීය. පිට 06

පාඨලීගේ නඩුව 29 දා

පිට 06

නිව් ඩයමන්ඩ් නැවේ කපිතාන්ට නොතිසි

පිට 06

කිංග්ස්බරි ප්‍රහාරයට සැක 13කගෙන් ප්‍රශ්න කරනවා

සීඅයිඩීය අධිකරණයට කියයි පිට 06

යළි කොවිඩ් ආවොත් වැඩි අවදානම දරුවන්ටයි

නොතැකීමත් නොසැලකිල්ලත් වෙනුවට සෞඛ්‍යාරක්ෂාව ගැන හිතන්න

වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය ජයරුවන් බණ්ඩාර

සිතාරා සේනානි

කොවිඩ් පාලන උපදෙස් කෙරෙහි මවිපියන් මෙන්ම ගුරුවරුන්, සිසු දරුවන් ඇතුළු සමස්ත පාසල් ප්‍රජාව මේ වන විට අඩු අවධානයක් යොමු කරන බවට තොරතුරු වාර්තා වී ඇතැයි අධ්‍යාපන අමාත්‍යාංශය සඳහන් කළේය.

මේ හේතුවෙන් පාසල් ප්‍රවාහන සේවා සැපයීම, පාසල් ආපණ ශාලා පවත්වා-ගෙන යෑම ඇතුළු පාසල් දරුවන් සෘජුව සමාජයට මුදා හැරෙන සෑම අවකාශය-කම ඔවුන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීමේ සමාජ වගකීම පාසල් බලධාරීන් ප්‍රමුඛ පාසල් ප්‍රජාවට පැවරෙන බවත් දරුවන්ගේ අසනීප තත්ත්වයන්හි දී දැඩි අවධානය යොමු කරමින් ඔවුන්ගේ සෞඛ්‍යාරක්ෂාව කෙරෙහි උපරිම ලෙස සැලකිලිමත් විය යුතු බවත් අමාත්‍යාංශය අවධාරණය කර තිබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පෙරේදා (16) පැවැති සාකච්ඡාවකදී අදහස් දක්වමින් කොළඹ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ, වෛද්‍ය ජයරුවන් බණ්ඩාර මහතා සඳහන් කළේ, කොවිඩ් දෙවැනි රැල්ලක අවදානම මුළුමනින්ම රටෙන් පහව ගොස් නැති බවයි. යම් ලෙසකින් එවන් තත්ත්වයක් මතු වුවහොත් වැඩිම බලපෑමට ලක් වන පාර්ශ්වය රටේ පාසල් දරුවන් බව කී ඒ මහතා, නොතකා හැරීම සහ නොසැලකිලිමත් වීම වෙනුවට සෑම මොහොතකම පූර්ණ සෞඛ්‍යාරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීමේ ස්වයං විනය පවත්වා ගැනීමට සියලු දෙනා වග බලා ගත යුතු බවද කියා සිටියේය.

කොවිඩ් වයිරසයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් රජයේ මැදිහත්වීමෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග හේතුවෙන් රට තුළ කොවිඩ් පාලනය වී ඇති බව හා ලෝකයේ සෙසු රටවල් අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව යහපත් තත්ත්වයක පසුවන නමුත් ලෝකයේ සෞඛ්‍යාරක්ෂිත රටවල් අතර තවමත් අප සිටින්නේ යහපත් මට්ටමක නොවන බව ද වෛද්‍ය ජයරුවන් බණ්ඩාර මහතා එහිදී පෙන්වා දුන්නේය.

සෞඛ්‍ය අමාත්‍යාංශය ලබා දී ඇති නිර්දේශ හා උපදෙස් අකුරටම පිළිපදිමින් පාසල් පවත්වා ගත යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සියලු පාසල් ප්‍රධානීන්ට මෙහිදී දැනුවත් කරනු ලැබ තිබේ.

මේ සම්බන්ධව පාසල් ප්‍රධානීන් ඇතුළු සමස්ත ජනතාව දැනුවත් කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය සහ ඉ-තක්සලාව ඇතුළු මාධ්‍යයන් ද යොදා ගනිමින් විශේෂ කඩිනම් පියවර ගන්නා බව මෙම හමුවට එක් වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ නීල් ගුණදාස මහතා පැවසීය. ඉ-ඉගෙනුම් හා නැණසැ රූපවාහිනී වැඩසටහන් ඒකකයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ඩබ්.ඒ.එස්.ඩබ්ලිව්. විජේසූරිය මහත්මිය, අධ්‍යාපන අමාත්‍යාංශයේ මාධ්‍ය ලේකම් බුද්ධික වික්‍රමාදර මහතා ඇතුළු නිලධාරිහු පිරිසක් මෙම අවස්ථාවට එක් වූහ.

පුරා විද්‍යා පර්යේෂණ කැණීම් ව්‍යාපෘතිය 23දා යාපහුවෙන් ඇරඹේ

උපාලි කරුණාරත්න

පැරණි නගර ආශ්‍රිතව සිදුකරන පුරා විද්‍යා පර්යේෂණ කැණීම් ව්‍යාපෘතිය මේ මස 23 වැනිදින යාපහුවෙන් ආරම්භ වේ. මේ පර්යේෂණ කැණීම් සඳහා මෙරට සෑම පැරණි නගරයක්ම හසුවන බවත් පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක මහතාගේ අදහසක් අනුව මෙය ආරම්භ කරන බවත් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී (පර්යේෂණ) ආචාර්ය ප්‍රියන්ත ජයසිංහ මහතා පැවසීය.

ඒ පිළිබඳ වැඩිදුරටත් ප්‍රියන්ත ජයසිංහ මහතා මෙසේද කීය.

යාපහුව පුරා විද්‍යා ස්ථානයේ කැණීම් ආරම්භ කරමින් මේ වැඩසටහන ආරම්භ කරනවා. සෑම පැරණි නගරයකම කැණීම් සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට ඉතා දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. පැරණි මැටි බඳුන් කියන්නේ පුරා වස්තුවක්. මේවා නිවැරැදිව වර්ධනය වූ ආකාරය පිළිබඳ තවම නිසි අධ්‍යයනයක් කර නැහැ. පැරණි නගර ආශ්‍රිතව අලුතින් කැණීම් කර හමුවන වළං කටු ආශ්‍රයෙන් අපට ඒවායේ නිවැරැදි වර්ධන අනුපිළිවෙළ හඳුනාගත හැකියි. තාක්ෂණය වර්ධනය වූ ආකාරය අධ්‍යයනය කරන්න පුළුවන්. දිවයිනටම පොදු අතීත මැටි බඳුන් වර්ගීකරණයක් කිරීම මේ පර්යේෂණ කැණීම්වල මූලික අභිප්‍රායකි.

වගා නොකරන කුඹුරු ඉඩම් සංවර්ධන වැඩට යොදාගැනීමට පෙර පුළුල් අධ්‍යයනයක් කළ යුතුයි

සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න

නදී මාණික්කගේ

වගා නොකරන කුඹුරු ඉඩම් සංවර්ධන කටයුතුවලට යොදා ගැනීමට පෙර ඒ සඳහා පුළුල් අධ්‍යයනයක් කර අදාළ කුඹුරු වගා කළ නොහැකිද එසේත් නැත්නම් වෙනත් කාරණයක් හේතුවෙන් වගා නොකර අත්හැර තිබේද යන්න ඉතා තදින් සොයා බැලිය යුතු බවත් මේ ඉඩම් වගුරුබිම් ලෙස අතහැර දැමීම කළ නොහැකි නිසා ඉතා සූක්ෂ්මව සැලසුම් සහගතව මේ කාර්යයට යොදාගත යුතු බවත් ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න මහතා පෙරේදා (16) දිනමිණට පැවසීය.

වගා නොකරන ඉඩම් වගා කිරීමට පෙළඹවීම කළයුතු බව පැවසූ ඒ මහතා එසේ නොමැති වුවහොත් වගාකරන කුඹුරු ප්‍රමාණය තවදුරටත් වගාවෙන් ඉවත්වීම සහ වෙනත් විකල්ප ක්‍රියාවලියකට යොදාගැනීමට ජනතාව විසින් සැලසුම් සකස් කිරීමේ ප්‍රවණතාවක් ආරම්භ විය හැකි බැවින් ඒ සියල්ල සැලකිල්ලට ගෙන මේ කාර්යය ඉටුකළ යුතු බව පැවසීය.

සාමාන්‍යයෙන් අපේ රටේ කුඹුරු ඉඩම් ගොඩකිරීම සම්බන්ධයෙන් වන නීති තද නිසා කුඹුරු ආරක්ෂා වී ඇති බවත් රටේ ප්‍රධානම ආහාරය වන හාල් නිෂ්පාදනය මේ කුඹුරුවලින් සිදුකරන බැවින් වගා නොකරන ඉඩම් වගා කිරීමට පෙළඹවීම කළයුතු බවත් වගා කිරීමට නොහැකි යන පදනමේ කුඹුරු සංවර්ධන වැඩ සඳහා ගැනීම යනු වෙනත් කටයුතුවලට යොදා ගැනීම බවත් එවිට මේ ඉඩම් ගොඩකිරීමට සිදුවන බවත් ඒ මහතා කීය.

නාගරික හා ප්‍රධාන පාරවලට මුහුණලා ඇති කුඹුරු ඉඩම්වලට තමයි මේ අවධානම තියෙන්නේ. ඒවා වගා කරන්නේ නැත්තේ වගාකරන්න බැරි නිසා නොවෙයි. ඒ ඉඩම වී වගා නොකර වෙනත් කටයුත්තකට අරගන්න තමයි එයාලා සැලසුම් කරන්නේ. එවිට මේවා ඇතුළේ අක්‍රමවත් ලෙස ඉඩම් ගොඩකරනවා. ඒ ගොඩකිරීම නිසා කුඹුරු තිබෙන ප්‍රමාණය අඩුවෙනවා. ඒ වගේම ගංවතුර ගැලීම්, පාරසරික ගැටලු විශාල වශයෙන් ඇති වෙනවා. කුඹුරු ඉඩම්වල වටිනාකම ගොඩඉඩම්වල වෙළෙඳපොළ වටිනාකමට වඩා අඩුයි. කුඹුරු ඉඩමක් මාකට් කර ගැනීමේදී වෙළෙඳපොළේ ගොඩඉඩමකට වගේ මාකට් කරගන්න බැහැ. ඒ නිසා මේකත් එක්ක බොහෝ අය හුරුවෙලා ඉන්නවා කුඹුරු ඉඩම ගොඩඉඩමක් විදියට ඔප්පුව වෙනස් කර ඉඩමට වටිනාකමක් ගන්න. ඒ නිසා සමහරු හිතාමතාම කුඹුරු ඉඩම් වගා නොකර පුරන් වෙන්න තියනවා. තවත් සමහරු උපක්‍රමශීලීව කුඹුරු වගා නොකර පොල් හා කෙසෙල් වගේ දේවල් දානවා. පස් සහ රොඩු දාලා ගොඩ ඉඩමක් බවට පරිවර්තනය කරනවා. ඒත් ඉඩමේ ඔප්පුව තියෙන්නේ කුඹුරු ඉඩමක් කියලා. ඔප්පුව වෙනස් වෙලා නැහැයැයි නාමල් කරුණාරත්න මහතා සඳහන් කළේය.

තිහෝගම තිස්ස සම්බුද්ධ බෞද්ධ මධ්‍යස්ථානයේදී පින්කම් මාලාවක්

මධ්‍යම හුරුළු පළාතේ උප ප්‍රධාන සංඝනායක සිද්ධමුල්ලේ මංගල නාහිමියන්ගේ මෙහෙයවීමෙන් පින්කම් මාලාවක් මේ මස 19, 20, 21, 22, 23, 24, 25 යන දිනයන්හිදී පැවැත්වේ. ධර්ම දේශනා සහ සර්වරාත්‍රික පිරිත් දේශනාවක් ඊට ඇතුළත්ය.

24 වැනි දින සර්ව රාත්‍රික පරිත්‍රාණ දම් දෙසුම පැවැත්වෙන අතර 25 වැනි දින පෙ.ව. 6.00ට යෙදෙන සුබ මොහොතින් කුල දරුවන් සසුන්ගත කිරීමත් කෙරෙන අතර එදින දහවල මහා සඟසතු දානමය පින්කමෙන් පසු පින්කම් මාලාව නිමාවට පත් වේ.

පින්කම් තිහෝගම තිස්ස සම්බුද්ධ අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

පොත් ප්‍රදර්ශනය පවත්වනවා නම් සෞඛ්‍ය උපදෙස් දැඩිව පිළිපදින්න

වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානී විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර

සන්ධ්‍යා කරුණාරත්න

කොළඹ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය පවත්වන්නේ නම් කොවිඩ් - 19 වළක්වා ගැනීම සඳහා සෞඛ්‍ය අංශ ලබා දී ඇති මාර්ගෝපදේශ දැඩිව අනුගමනය කිරීම සංවිධායකයන්ගේත් පැමිණෙන මහජනතාවගේත් වගකීමක් වන බව වසංගත රෝග විද්‍යා අංශය අවධාරණය කළේය.

සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය නොකරන්නේ නම් ඊට එරෙහිව නීතිය දැඩි ලෙස ක්‍රියාවට නැංවීමට පියවර ගන්නා බව වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානී විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවසීය. ඒ මහතා කියා සිටියේ, ප්‍රදර්ශන භූමියට නොපැමිණ එහිදී ලබා දෙන වට්ටම් සහිතව පොත්හල්වලින් අවශ්‍ය පොත් ලබා ගැනීමට හැකි නම් කොවිඩ් - 19 වළක්වා ගැනීම සඳහා එය ඉතාම කාලෝචිත සෞඛ්‍යාරක්ෂිත පියවරක් බවයි.

කොවිඩ් -19 අවදානම පහව ගොස් නැති පසුබිමක දහස් ගණන් ජනතාව එක් රැස් කරන කටයුතු සංවිධානය කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස තමන්ගේ මනාපයක් නොමැති බවත් බොහෝ දෙනකුට මේ වන විට කොවිඩ් -19 අමතක වී තිබෙන අතර එය රටක් වශයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති කරන හැසිරීමක් බවත් ඔහු කීය.

ප්‍රදර්ශන භූමියට ඇතුළු වන සියලු දෙනා නිවැරදිව මුව ආවරණ පැලඳීම, දැත් සබන් යොදා සෝදා ගැනීම, මීටරයක පුද්ගල (සමාජ) දුරස්ථ බව පවත්වා ගැනීම අනිවාර්ය කරුණු වන බවද ඔහු එහිදී සිහිපත් කළේය. හෙතෙම වැඩිදුරටත් කියා සිටියේ, රට පුරා ප්‍රදේශවලින් මහජනතාව ප්‍රදර්ශන භූමියට පැමිණෙන අතර නොදැන හෝ ආසාදිතයකු ජනතාව සමඟ ගැවසුණහොත් රට පුරා නැවත වයිරසය ව්‍යාප්ත වීමේ අවදානමක් පවතින බවයි.

වකුගඩුවක් දන් දී තරුණ දිවියක් රැක දෙමු

පුංචි අත්මඟ, පරහැර, කැකණදුර ලිපිනයේ පදිංචි 31 හැවිරිදි රුසිරු තරංග හෙට්ටිආරච්චි මහතා දරුණු වකුගඩු රෝගයකින් පෙළෙයි. ඔහුට ප්‍රතිකාර කරන වෛද්‍යවරුන්ගේ නිර්දේශය වන්නේ හැකි ඉක්මණින් වකුගඩුවක් බද්ධ කළයුතු බවයි.

නාරාහේන්පිට යුද හමුදා රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින ඔහු රට ජාතිය වෙනුවෙන් අම්ල මෙහෙයක් ඉටු කළ යුද හමුදා සෙබළෙකි. O + හෝ O - වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාග කිරීමට හැකි පින්වත් අයෙකු වේ නම් 075 8002074 / 077 1924296 දුරකථන අංකවලට අමතා මේ උතුම් පුණ්‍යකර්මයට දායක වන්නැයි කාරුණික ඉල්ලීමක් කරයි.

නිහඬ කෘෂි විප්ලවවාදියකුගේ 37 වැනි ගුණ සැමරුම අද

(හෙක්ටර් කොබ්බෑකඩුව මහතා දිවංගත වී 37 වසරක් සපිරීම නිමිත්තෙනි)

විප්ලවවාදියකු යන නාමය කන වැකුණු සැණින් අප කාගේත් මතකයට නැඟෙනුයේ අවි අත දරා උස් රළු හඬින් ජනතාව අමතමින් විදියක් විදියක් පාසා ජන අරගල කරමින් සිටින පුද්ගලයෙකි. එහෙත් අප හදවත් සොරාගත් මේ නිහඬ කෘෂි විප්ලවවාදියා සෑම විටම ජනතාවාදී අදහස්වලින් පොහොසත් විනීත ගති පැවතුම්වලින් හෙබි ආර්ය සිංහල ඇදුම පැලඳි නිතරම අව්‍යාජ සිනහවකින් මුව සරසාගෙන සරල බසින් ජනතාව ආමන්ත්‍රණය කළ අන් කවරකුවත් නොව දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මහතාය.

1916 අගෝස්තු මස 27 වැනිදින ඓතිහාසික කන්ද උඩරට සෙංකඩගල පුරවරයේ යටිනුවර දෙල්දෙණිය වලව්වේදී ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව සහ සංඝමිත්තා දුල්ලැව කුමාරිහාමි යන දම්පතීන්ට දාව උපත ලද හෙක්ටර් සෙනරත් රාජකරුණා බණ්ඩාර කොබ්බෑකඩුව මහතා මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරුවේය. අනතුරුව කොළඹ විශ්වවිද්‍යාලයෙන් හා නීති විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හදාරා නීතිඥයකු ලෙස තම වෘත්තීය දිවිය ආරම්භ කළේය. උපතින් ලද මානව දයා ගුණයෙන් හෙබි මෙතුමා තම නීතිඥ වෘත්තියේදී හමු වූ දිළිඳු ගොවීන්ගේ නඩු කටයුතුවලදී ඉතාමත් සංවේදී විය. එම ගොවි ජනතාවගේ නඩුවලට කිසිම ගාස්තුවක් අය නොකළ එතුමන් සෑමවිටම මේ ගැටලුවලට විසඳුම් ලබාදිය හැකි මාර්ග පිළිබඳ විමසිලිමත් වූයේ තම මානව හිතවාදී ගුණාංග තවදුරටත් විද්‍යාමාන කරමිනි.

තම නීතිඥ වෘත්තියෙන් ඔබ්බට ගොස් ජනතාවට සේවය සැපයීමේ අරමුණින් දේශපාලන ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වන හෙක්ටර් කොබ්බෑකඩුව මහතා 1952 දී මහනුවර නගර සභාවේ අම්පිටිය අසුනට ස්වාධීන අපේක්ෂකයකු ලෙස මැතිවරණයට ඉදිරිපත් විය. තියුණු තරගයකින් පසු තම මන්ත්‍රී ආසනය ජය ගත් මෙතුමා ජනතා හිත් දිනා ගනිමින් දිනෙන් දින ජනප්‍රිය විය. එහෙත් කිසිදා තම පෞද්ගලික වාසි වෙනුවෙන් බලය අයුතු ලෙස භාවිතා නොකළ මෙතුමා 1956 දී පැවති මහ මැතිවරණයෙන් මහනුවර අසුනට තරග කරන ලෙස එස්.ඩබ්ලිව්.ආර්. ඩී. බණ්ඩාරනායක මහතා කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් එම අවස්ථාව එවකට හේවාහැට ප්‍රදේශයේ ආදායම් පාලකයකු ලෙස කටයුතු කළ පියසේන තෙන්නකෝන් මහතාට ප්‍රදානය කළේ එයට වඩාත් සුදුසු පුද්ගලයා ඔහු බව පවසමිනි. එපමණක් නොව තෙන්නකෝන් මහතාගේ ජයග්‍රහණය වෙනුවෙන්ද කටයුතු කළ එතුමා එම ක්‍රියාවෙන් පිළිබිඹු කළේ දිනෙන් දින මානුෂීය ගුණාංග ක්ෂය වෙමින් යන වර්තමාන දේශපාලනඥයන්ටද කදිම ආදර්ශයක් දෙමිනි. අනතුරුව 1960 සහ 1965 දී පැවති මැතිවරණවලට ඉදිරිපත් වුවද ඉතා සුළු ඡන්ද ප්‍රමාණවලින් පරාජයට පත් වූ මෙතුමා 1961දී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙසද 1963 වර්ෂයේදී එහි සභාපතිවරයා වශයෙන් ද පත් විය.

1970 මහ මැතිවරණයෙන් මහනුවර දිස්ත්‍රික්කයෙන් යටිනුවර ආසනය ජයග්‍රහණය කළ එතුමන් සමඟි පෙරමුණ රජයේ කෘෂිකර්ම සහ ඉඩම් ඇමැති ධුරයට පත්විය. එවකට අගමැතිනී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කෘෂිකර්ම ප්‍රතිපත්තියත් සමඟම නව පන්නරයක් ලැබූ කොබ්බෑකඩුව මහතා සැමටම ආදර්ශයක් වෙමින් තම ඉඩම් පවා ජනතා සන්තක වන පරිදි දැඩි පරිශ්‍රමයක් දරා ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සම්මත කර ගත්තේය. එහිදී ඉඩම් අක්කර 50ට වැඩි වූ ගොඩ ඉඩම් ද අක්කර 25ට වඩා වැඩි වූ මඩ ඉඩම් ද ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ රජයට පවරා ගැනීමට කටයුතු කළේය. මෙමගින් ඉඩම් අක්කර දස ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් රජයට පවරා ගත් අතර ඉන් ඉඩම් අක්කර ලක්ෂ 7කට ආසන්න ප්‍රමාණයක් බිම් අඟලක්වත් නොමැති අහිංසක ජනතාව වෙත බෙදා දී ඔවුන් දිළිඳු භාවයෙන් මුදා ගැනීමට කටයුතු කිරීමත් දේශීය කෘෂි නිෂ්පාදන ඉහළට ඔසවා තැබීමට කටයුතු කිරීමත් කැපී පෙනේ. මෙතුමා කැබිනට් ඇමැති ධුරය දරන කාලවකවානුවේදී නව කෘෂිකාර්මික අණ පනත් සහ නීතිරීති සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට සමත් වීම ගොවිතැනින් තම දිවිය සරිකර ගන්නා ගොවි ජනතාව ලැබූ මහත් වූ ජයග්‍රහණයකි.

නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති මාලාව හමුවේ පවරා ගනු ලැබූ ඉඩම්වලින් ජනතාව අතර බෙදාදීමෙන් පසු ඉතිරි වූ ඉඩම් ප්‍රමාණ උඩරට වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ජනාවාස කොමිෂන් සභාව වැනි ආයතනවලට පවරාදීම මගින් අපමණ දුක් ගැහැට විඳිමින් තම ජීවනාලිය සරිකර ගත් සුවහසක් ගොවි ජනතාවට සිදු වූ අපරිමිත සේවයන් විදේශවලට ඇදී ගිය මහා ධනස්කන්ධය මෙරට තුළම ඉතිරි කර ගැනීමට ලැබීමත් මුළු මහත් ශ්‍රී ලංකාවාසී ජනතාව ලැබූ භාග්‍යයක් කොට සැලකිය හැකිය. මෙහි ප්‍රතිලාභ දකුණේ සිංහල ජනතාවට මෙන්ම උතුරේ සහෝදර දෙමළ ජනතාවටත් සමසේ භුක්ති විඳීමට සැලැස්වීමෙන් ජනිත වන්නේ එතුමාගේ කාර්ය ශූරත්වයත් අවංක භාවයත් වැඩ කිරීමේදී ඇති විනිවිද භාවයත්ය. මෙවැනි ඉඩම් පනත් බොහෝ රටවල ක්‍රියාත්මක නොවුණත් ඉන්දියාව, පිලිපීනය, බ්‍රසීලය යන රටවල ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාව තුළ මෙන් නොව බොහෝ ලේ වැගිරීම් සහ ජීවිත හානි සිදු වූ බව ඉතිහාසය දෙස බැලීමේදී සනාථ වේ. එහෙත් අප රටේ කිසිදු ලේ බිඳකුදු නොසෙල්වා ඉඩම් ජනසතු කිරීමට මෙතුමා මානුෂීය වීම නිහඬ කෘෂි විප්ලවය ලෙස හැඳින්වීමට කදිම නිදසුන වේ.

ගොවිජන සහ ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය උදෙසා නව දැනුම ජනනය කර එය දියුණුවෙන් දියුණුවට පත් කිරීමෙහිලා සෑමවිටම ජනතා හිතෛෂී මානුෂීය මුහුණුවරකින් කටයුතු කළ මෙතුමන්ගේ ක්‍රියා කලාපය අද ජනාධිපතිතුමන්ගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති මාලාව සමඟ ද මනා සේ සැසඳේ. එය හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ දුර දක්නා නුවණේ මහිමය මනා සේ පිළිබිඹු කරන්නකි. කෙසේ වෙතත් රටටත් ජාතියටත් මෙබඳු සේවයක් කළ මෙතුමන්ට 1977 දී පැවති මහ මැතිවරණයේදී තම මන්ත්‍රී ආසනය අහිමි වූයේ විවෘත ආර්ථිකය ගැන සිහින මැවූ අලස, කළගුණ නොදත් මිනිස් සමාජයක් නිසාය. මෙවැනි තත්ත්වයක් යටතේ වුවද 1982 දී පැවති ජනාධිපතිවරණය සඳහා මෙතුමාගේ නම යෝජනා වීම දෛවෝපගත සිදුවීමකි. මේ මැතිවරණ පරාජයත් සමඟම අවස්ථා ගණනකදී ජේ.ආර්. ජයවර්ධන රජය විසින් මෙතුමන්ට විවිධ අහූත චෝදනා එල්ල කරමින් ප්‍රශ්න කිරීම් රාශියක් සිදු කිරීම නිසා මෙතුමා බලවත් චිත්ත පීඩාවට පත් වී සිටියේය. ඒ හේතුවෙන් විවිධ රෝගාබාධවලට ලක් වූ මේ අසහාය නායකයා 1983 සැප්තැම්බර් මස 18 වැනිදින සඳහටම දෙනෙත් පියා ගත්තේය.

1977 සිට පැවති කිසිදු රජයක් විසින් මෙවන් ජනහිතකාමී නායකයන්ගේ කිසිදු මෙහෙවර ඇගයීමක් නොකළ අතර 1995 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ රජය යටතේ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය 'හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනය' ලෙස නම් කරනු ලැබීය. එතුමාගේ වියෝවෙන් 37 වසරක් පිරීම නිමිත්තෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය සහ 'හෙක්ටර් කොබ්බෑකඩුව සංසදය' විසින් අද (18) පෙරවරු 8.30ට පුෂ්පෝපහාරයකින්ද පෙරවරු 10.00ට දිවංගත කොබ්බෑකඩුව ඇමැතිගේ කෘෂිකර්ම සහ ඉඩම් ප්‍රතිපත්තිය නව රජයේ 'සෞභාග්‍යයේ දැක්ම' වැඩසටහන සමඟ අනුබද්ධ කර ගත හැකි අයුරු පිළිබඳ වූ සම්මන්ත්‍රණයකින් ද පස්වරු 7.30ට 'සහන උදය' වැඩිහිටි විවේකාශ්‍රමයේදී නේවාසික වැඩිහිටියන්ට රාත්‍රී දානය පිරිනැමීමකින් ද පින් පැමිණවීමට කටයුතු සංවිධාන කර තිබේ.

ටිකිරි කොබ්බෑකඩුව
ආණ්ඩුකාරවර සබරගමු පළාත

රස්සා දෙද්දි අඩු ආදායම් — අයට
සාධාරණය ඉටු වී නැත — ගම්වලට
මන්තිරිවරුන්ගේ හිතවත් — උදවියට
හත් අට දෙනා තෝරා ගෙන ඇත — ගමට

මැති ඇමැතියන් දැන හඳුනන ළඟම — ඇතී
හිතවන්තයන් හත් අට දෙනෙකුද — දෙතී
සමහර වසම්වල එක් අයකුටද — නැතී
ජනපතිතුමනි, තේරුණු අය කඳුළු — බොතී!

රටේමුල්ලේ මුදන්නායක

මහලු-කාන්තා-ළමා රැඳවූවන් නිදහස් කළ හැකි දැයි සොයන්න

රාජ්‍ය අමැතිනී සුදර්ශිනී

බුද්ධිකා ඉඹුලාන

වයස 70ට වැඩි රැඳවූවන් සහ අවු. 5ට අඩු දරුවන් සහිත කාන්තා රැඳවූවන් නිදහස් කළ හැකි දැයි සොයන ලෙස සිරකරු පොදු සමාව නිර්දේශ කරන කමිටුවට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය උපදෙස් දී තිබේ. සිරකරු පොදු සමාව සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට කැබිනට් මණ්ඩලය විසින් පත් කර ඇති කමිටුවේ ඉදිරි කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පෙරේදා (16) රාජ්‍ය ඇමැතිනිය එම කමිටු සාමාජිකයන් හමුවූ අවස්ථාවේදී මේ උපදෙස් දුන්නාය.

මත්ද්‍රව්‍ය ජාවාරම්, ස්ත්‍රී දූෂණ, කප්පම් ගැනීම, ළමා අපයෝජන ආදී අපරාධ සඳහා දඬුවම් විඳින සිරකරුවන් හැර වෙනත් විවිධ අපරාධ සම්බන්ධයෙන් මරණ දඬුවම් හිමිව තිබූ රැඳවියන්ට යහපත් කල්ක්‍රියාව හේතුවෙන් එම දඬුවම් ලිහිල් කිරීම සඳහාත්, වැරදිකරුවන්වී දිගුකාලීනව බන්ධනාගාරගතව සිටින රැඳවියන්ට දඬුවම අඩු කිරීම හෝ නිදහස් කිරීමට ජනපති පොදු සමාව සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමත් මේ කමිටුවේ මූලික කාර්යයකි. විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකුගේ සභාපතිත්වයෙන් යුතු මේ කමිටුව සඳහා නීති විශාරදයකු, අපරාධ විද්‍යාව සම්බන්ධ විශේෂඥවරයකු, මනෝ විද්‍යාව සම්බන්ධ විශේෂඥවරයකු ඇතුළු විශේෂඥ කමිටුවකින් සමන්විතය.

මේ කමිටුව මගින් පොදු සමාව ලබාදීමට නිර්දේශ කිරීමට සලකා බැලෙන නිර්නායක පිළිබඳ රාජ්‍ය ඇමැතිවරිය විසින් විමසා බැලූ අතර, එහිදී ඇය විසින් සඳහන් කර සිටියේ වසර ගණනාවක් සිරගතව සිට යහපත් කල්ක්‍රියාවෙන් කල්ගෙවූ සිරකරුවන්ට නිදහස්වීමට හෝ දඬුවම අඩු කිරීමට ඇතැම් අවස්ථාවල මඟ හැරී ඇති බවට විවිධ බන්ධනාගාරවල නිරීක්ෂණ චාරිකාවලදී සිරකරුවන් තමන් වෙත දන්වා සිටි බවයි. මෙහිදී ඇය විසින් පෙන්වා දෙනු ලැබුවේ යහපත් කල්ක්‍රියාවෙන් බන්ධනාගාර තුළ සිටින රැඳවූවන්ට යම් හෙයකින් හැඟී ගියහොත් තමන් කොතරම් හොඳට සිටිය ද කිසිදු සහනයක් නොලැබෙනවා යන්න එය ඍණාත්මක තත්ත්වයක් බන්ධනාගාර තුළ ඇතිවීමට හේතුවක් වනු ඇති බවයි. එබැවින් එම තත්ත්වයන් මඟ හරවා ගැනීමටත්, කිසිවකුට අසාධාරණයක් සිදු නොවන ආකාරයටත් එක් පොදු වැඩපිළිවෙළක් සකස් කිරීමේ වැදගත්කම ඇමැතිවරිය විසින් මෙහිදී පෙන්වා දුන්නාය.

වයස අවුරුදු 70ට වැඩි රැඳවූන්ගේ වයස සහ ශාරීරික දුබලතා පිළිබඳ සලකා බලා ඔවුන් නැවත අපරාධවලට යොමුවීමේ අවස්ථාවන් නොමැති බවට හැගෙන රැඳවූවන් නිදහස් කිරීම සඳහාත් වයස අවුරුදු 5ට අඩු දරුවන් සහිත කාන්තා රැඳවූවන්ගේ අපරාධවල ස්වභාවයත්, ඇප කොන්දේසි සපුරාගත නොහැකිව සිටින අය පිළිබඳත් සලකා බලා ඔවුන්ට දඬුවම් කාලය අවම කිරීම හෝ නිදහස් කිරීමට නිර්දේශ ඉදිරිපත් කළ හැකි දැයි සොයා බලන ලෙසත් රාජ්‍ය ඇමැතිවරිය මෙහිදී ඉල්ලීමක් කළාය.

කැබිනට් මණ්ඩලය විසින් පත්කර ඇති මේ කමිටුවට අමතරව බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් තවත් කමිටුවක් සිරකරුවන්ට සමාව දීම සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. මේ කමිටු දෙකම එකිනෙකට පරස්පර නොවූ එක් පොදු වැඩපිළිවෙළක් යටතේ ක්‍රියාත්මක කෙරෙන ක්‍රමවේදයක් සකස් කිරීම කෙරෙහිද අවධානය යොමු කරන ලෙසද ඇමැතිනිය මෙහිදී උපදෙස් දෙනු ලැබුවාය.

මේ හමුව සඳහා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ගීතාමනී කරුණාරත්න, අතිරේක ලේකම් නිශාන් ධනසිංහ, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙනිය, කොමසාරිස් මෙහෙයුම් ටී. අයි. උඩුවර, අධිකරණ අමාත්‍යාංශයේ සහකාර ලේකම් (නීති) චන්දිමා වැළිකල, සහකාර අධ්‍යක්ෂ චන්දික යන මහත්ම මහත්මිහුද සහභාගී වූහ.

විස්ස 22දා පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට

ස්වර්ණා විජේකෝන්

යෝජිත විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පාර්ලිමේන්තුවට භාර දී ඇත.

ඒ අනුව විසිවැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ කෙටුම්පත ලබන 22 වැනිදා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට නියමිත වේ.

පොඩි ලසී නඩු 2කට උසාවි නඟී

එකක් ගාල්ලේ අනෙක බලපිටියේ

දකුණු පළාත් සංචාරක, කරන්දෙණිය සමූහ, ගාල්ල දිසා සමූහ

බූස්ස බන්ධනාගාරයේදී ජනපතිට ආරක්ෂක ලේකම්ට සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් කිහිප දෙනකුට මරණ තර්ජන එල්ල කිරීම සම්බන්ධ නඩුවේ 2 වැනි සැකකරු ලෙස පොඩි ලසී නම් කරන ලෙස සීඅයිඩිය කරන ලද ඉල්ලීමක් සලකා බැලූ ගාල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා ඔහු එම නඩුවේ දෙවැනි සැකකරු ලෙස නම් කොට, 25 වැනි දින දක්වා රිමාන්ඩ් කිරීමට ඊයේ (17) නියෝග කළේය.

ඉකුත් 8වැනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කරමින් කියා සිටියේ දරුණු ගණයේ අපරාධකරුවන් වන ධර්ම කීර්තිගේ තාරක පෙරේරා විජේසේකර හෙවත් කොස්ගොඩ තාරක සහ අරුමාහන්දි ජනිත් මධුසංක හෙවත් පොඩි ලසී යන දෙදෙනා ජනාධිපතිවරයාටත් ආරක්ෂක ලේකම්වරයාටත් බන්ධනාගරයේ උසස් නිලධාරීන්ටත් ප්‍රසිද්ධියේ මරණ තර්ජන කර ඇති බවය.

ඒ අනුව පොඩි ලසී නමැත්තාගෙන් බන්ධනාගාරයට ගොස් ප්‍රකාශයක් ලබා ගැනීමටත් අධිකරණයට ඉදිරිපත් කරන ලෙසටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉල්ලා සිටියේය.

ඒ අනුව බන්ධනාගාරයට ගොස් ප්‍රකාශ ලබා ගැනීමටත් ඔහු 25 වැනි දින අධිකරණයට ඉදිරිපත් කරන ලෙසටත් මහෙස්ත්‍රාත්වරයා එදින නියෝග කළේය.

මේ අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මිනී මැරුම් විමර්ශන අංශයේ සහකාර පොලිස් අධිකාරී මෙරිල් රංජන් ළමාහේවා මහතා විසින් ඉදිරිපත් කරන ලද මෝසමක් අනුව පොඩි ලසී ඊයේ (17) අධිකරණයට ඉදිරිපත් කරන ලදි.

එහිදී සහකාර පොලිස් අධිකාරී මෙරිල් රංජන් ළමාහේවා මහතා මෙම නඩුවේ දෙවැනි සැකකරු ලෙස පොඩි ලසී නමැත්තා නම් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටියේය. ඒ අනුව පොඩි ලසී නඩුවේ දෙවැනි සැකකරු ලෙස නම් කොට ඔහු තව දුරටත් 25 වැනි දින දක්වා රිමාන්ඩ් බන්ධනාගාරයේ තැබීමටත් මහෙස්ත්‍රාත්වරයා නියෝග කළේය.

ඊයේ උදැසන සිටම ගාල්ල කොටුව බාල දක්ෂ මාවත සහ අධිකරණ සංකීර්ණය අසල දැඩි ආරක්ෂාවක් යොදවා තිබූ අතර, පොලිස් විශේෂ කාර්ය බළකායේ සහ පොලිස් නිලධාරීන්ගේ දැඩි රැකවල් මැද පොඩි ලසී අධිකරණයට රැගෙන එන ලදි.

අධිකරණ කටයුතු ආරම්භවීමෙන් පසු ආරම්භයේදීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර තිබූ මෝසම කැඳවනු ලැබූ අතර, සුදු පැහැති ඇඳුමකින් සැරසී කොණ්ඩය උටඩ බැඳ සිටි පොඩි ලසී බන්ධනාගාර නිලධාරීන් විසින් විත්ති කූඩුවට නංවන ලදි.

මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය ප්‍රකාශ කිරීමෙන් පසු විශේෂ කාර්ය බළකායේ සහ පොලීසියේ දැඩි රැකවල් මැද පොඩි ලසී බලපිටිය අධිකරණයේ විභාග වන නඩුවකට ඉදිරිපත් කිරීම සඳහා ගෙන යනු ලැබීය.

ජනාධිපති කොමිසම

යහපාලන සමයේදී මල්ලාකම් පොලීසියේ නිලධාරීන්ට බොරු සාක්ෂි මත නඩු පවරලා

ජනපති කොමිසම හමුවේ අනාවරණය වෙයි

රෝෂන් තුෂාර

2015 මැතිවරණ සමයේදී හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ රුව සහිත ඊළාම් පෝස්ටරය ඉරා දමා එජාප අපේක්ෂකයකු හා විද්‍යා දැරිය ඝාතන සිද්ධියේ ප්‍රධාන සැකකරු අත්අඩංගුවට ගත් මල්ලාකම් පොලිස් නිලධාරීන්ට යහපාලන සමයේදී බොරු සාක්ෂි මත නඩු පවරා දඬුවම් දී ඇති බව දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම හමුවේ ඊයේ (17) අනාවරණය විය.

ප්‍රධාන පොලිස් පරීක්ෂක චින්තක බණ්ඩාර, ඥානලිංගම් මයුරන් ඇතුළු පොලිස් නිලධාරීන්ට මෙසේ බොරු සාක්ෂි මත නඩු පවරා වසර දහයක සිර දඬුවම් ලබාදී ඇති බව සාක්ෂි හෙළි විය.

හිටපු ඇමැතිනී විජයකලා මහේශ්වරන් මහත්මිය විසින් ජනතාව පහර දෙමින් සිටි අවස්ථාවේදී මුදාහැරියේ යැයි කියන විද්‍යා දැරිය ඝාතන සිද්ධියේ ප්‍රධාන සැකකරු මහලිංගම් ශශිකුමාර් අත්අඩංගුවට ගැනීම, එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක කුමරන් සර්වනාදන් අත්අඩංගුවට ගැනීම හා රනිල් වික්‍රමසිංහ, විජයකලා මහේශ්වරන්, කුමරන් සර්වනාදන් මහත්ම මහත්මීන්ගේ ශ්‍රී ලංකා රුව සහිත ඊළම ප්‍රදර්ශනය කරන පෝස්ටර් ගලවා දමා ඇත්තේ මෙම පොලිස් නිලධාරීන් බව දැනට සිරගතව සිටින ඥානලිංගම් මයුරන් සිරකරු ඊයේ (17) කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පැවසීය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළ අංගජන් රාමනාදන් මහතාගේ පොලිස් නිලධාරීන්ට වෙඩි තබා රක්ෂිත බන්ධනාගාරගත වූ කුමරන් සර්වානාදන් රක්ෂිතයට යන විට ඊමම එළියට එනකොට උඹලා ඇතුළට යන්න ලෑස්ති වෙයල්ලාර යනුවෙන් පැවසූ බව ද සාක්ෂිකරු කරුණු හෙළි කළේය.

මෙම සිද්ධියෙන් පසුව 2016 ජූලි 25 දින මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණයේ සමූහ මංකොල්ලයක් පිළිබඳ නඩු විභාගයක් චින්තක බණ්ඩාර ඇතුළු පොලිස් නිලධාරීන් විසින් මෙහෙයවමින් සිටි බවත් පැවසූ සාක්ෂිකරු, ඔවුන්ට බොරු සාක්ෂි මත නඩු පැවරූ අයුරු සාක්ෂි දෙමින් ඊයේ (17) විස්තර කළේය.

චුන්නාගම් පොලිස් වසමේ සමූහ කොල්ලකෑමක් පිළිබඳව විත්තිකරුවන් පස්දෙනෙකුට විරුද්ධව නඩු විභාගයක් පැවතියා.

නඩුවේ විත්තිකරුවන් පස්දෙනා විසින් රුපියල් ලක්ෂ 33 කට අධික රන් භාණ්ඩ සොරා ගැනීම පිළිබඳව නඩු විභාගය පැවතියා. මෙහි එක් සැකකරුවෙක් පොලිස් අත්අඩංගුවෙන් පැනයාමේදී දියේ ගිලී මියගොස් සිටියා.

ශ්‍රීකාන්තගේ ශ්‍රීයුපන

• නායකකම ඉල්ලනකොට නියෝජ්‍ය නායකකම දීල බේරුණාට, රනිල්ට ඊළඟ ප්‍රශ්නෙන් බේරෙන්න බැරි වෙයි වගේ සර් !

• මොකක්ද බං ඊළඟ එක !

• ඇයි සර්, ජාතික ලැයිස්තු මන්ත්‍රී ආසනේ !

Cargills food city

ඔණ්ඩ 280 කට වැඩි ප්‍රමාණයක් සඳහා රු.15,100 කට වැඩි ඉතිරියක්

දිනමිණ
The Dinamina
1909 ඇරැඹී ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 සැප්තැම්බර් 18 සිකුරාදා

මුඛවාඩම සාක්කුවේ!

අපේ ඇත්තන්ගේ හැසිරීම නිරීක්ෂණය කරන විට හැඟී යන්නේ 'කොරෝනා' නමින් වසංගතයක් මෙරටෙහි කිසි කලෙක නොතිබුණු බවකි. මුඛ ආවරණ නැත. දැත් සේදීම අමතකය. මීටරයක දුර තබා ගැනීම කිසිසේත්ම සිදු නොවේ. කොවිඩ්19 වයිරසයට පැවැති බිය එහෙම පිටින්ම තුරන් වී ගොස් තිබේ. උපන් දින සාද, සංවත්සර උත්සව, මංගල උත්සව පෙර පරිදිම සිදු වෙයි. කිසිදු ආරක්ෂාවක් නැත. පරිස්සමක් නැත. ජනමාධ්‍ය ඔස්සේ විකාශය වන උපදේශන පමණක් සිදු වෙයි. ඒවා දෙස අවධානයකින් බලන කෙනෙක් ද නැත. කොරෝනා භීතිකාවක් නැති එක හොඳ දෙයක් වුව පරිස්සමක් නැති එක හොඳ දෙයක් නොවේ. සමාජ වර්යා රටාව මේ අයුරින් ම පැවැතුණ හොත් තුන් වන කොරෝනා රැල්ලක් ඇතිවන්නට ඉඩ තිබේ.

අසල්වැසි ඉන්දියාව දෙස බලන්න! කොරෝනා මරණ සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. දිනකට හමු වන කොරෝනා ආසාදිතයන්ගේ ගණන ලක්ෂයේ සීමාවට පැමිණ තිබේ. ඉන්දියාව වසාගෙන කොරෝනා වසංගතය ව්‍යාප්ත වන බවක් පෙනෙයි. ලෝක බලවතා වූ අමෙරිකාව කොරෝනා වසංගතය සමඟ බලවත් සටනක යෙදෙයි. අමෙරිකන් ජනාධිපතිවරයා පවා පසුවන්නේ නොසන්සුන් තත්ත්වයක යැයි කීම නිවැරැදිය. ඉරානය 'ලොක් ඩවුන්' කිරීම ආරම්භ කර තිබේ. ලෝකයේ බලවත්ම රාජ්‍යයන් පවා වසංගතයෙන් හොඳටම හෙම්බත් වී ඇති බව දැකගත හැකිය. ලෝක තත්ත්වය දෙස බලන විට අප වාසනාවන්ත යැයි කිව හැකි'මුත් සිදුවීම් දෙක තුනකින් මේ තත්ත්වය වෙනස් විය හැකි බව වටහාගත යුතුය.

දකුණේ මිනිසුන් සතියකින් සියල්ල අමතක කරන බව කියා සිටියේ වේළුපිල්ලේ ප්‍රභාකරන්ය. ඔහු යහපත් පුද්ගලයකු නොවන්නේ වුව අදහස් කළ දේ නිවැරැදිය. ප්‍රභාකරන් අපේ මිනිසුන්ගේ දුර්වලතාවෙන් හොඳ හැටි ප්‍රයෝජන ගත්තේය. එදත් අපට අපේ ආරක්ෂාව ගැන ගැඹුරු හැඟීමක් නොතිබිණි. අදත් එය එසේමය. කොරෝනා ලෝක අර්බුදයකි. එහි අවදානම තවත් වසර දෙක තුනක් යනතුරු පහව නොයන බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවා අනතුරු හැඟවීම් කර තිබේ. වයිරසය මරා දැමිය හැකි නිත්‍ය එන්නතක් හෝ ඖෂධයක් හෝ තවම සොයා ගෙන නැත. සියල්ල පවතින්නේ පර්යේෂණ මට්ටමේය.

කොවිඩ් 19 වයිරසය ලොව පුරා ව්‍යාප්ත වෙමින් පැවැති මුල් අවදියේම රට ඊට සුදානම් කිරීමට ජනාධිපතිවරයා සමත් විය. රෝග ව්‍යාප්තිය වැළකිණි. මහජනයා ඉතා හොඳ සෞඛ්‍ය පිළිවෙත් ගණනාවක් පවත්වා ගෙන යෑමට සමත් විය. ජනජීවිතය යථා පරිදි ගෙන යෑමට ද මැතිවරණ පැවැත්වීමට ද අවස්ථාව එළැඹිණි. කොරෝනා වසංගතය හමුවේ ශ්‍රී ලංකාව පරාජිත වූයේ නැතැ'යි කිව හැකිය. මේ තත්ත්වය දිගටම පවත්වාගෙන යා හැක්කේ සෞඛ්‍ය පිළිවෙත් නිසි ලෙස ආරක්ෂා කර ගත හොත් පමණි. කොරෝනා තෙවන රැල්ලක් ඇති වුව හොත් බරපතළ අර්බුදයකට මුහුණ දෙන්නට සිදු වනු ඇත. එය රටේ අනාගතයට ඉතා අහිතකර ලෙස බලපාන්නට පුළුවන.

ඉන්දියාව කොවිඩ් 19 වසංගතයෙන් බරපතළ ලෙස පීඩා විඳින රටක් බවට පත් වූයේ හේතු කිහිපයක් නිසාය. එහි ජනතාව සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය නොකිරීම හා උපදේශන ගණන් නොගැනීම ඒ අතර පවතින පළමු හේතු සාධකය ලෙස පෙන්වා දිය හැකිය. පොලිසියෙන් පහර දෙනු ලැබුව ද මුඛ ආවරණ නොපලඳින ඉන්දියානුවෝ වෙන්නායි ආදී නගරවල සිටිති. ඉන්දියානුවන්ගේ සංචාරයට ද කෙළවරක් නැත. ඔවුනු ඉබා ගාතේ ඇවිදිති. ජනයා රාශිගත වීම ද ඉන්දියාවේ ප්‍රකට ලක්ෂණයකි. මේ සෑම ලක්ෂණයක්ම කොරෝනා ව්‍යාප්තියට අවශ්‍ය පසුබිම සකස් කරයි. ඉන්දියානුවන් සිය චර්යා රටා සකස් කරගන්නා තුරු වසංගතය තවත් පැතිර යනු ඇත.

කොරෝනා වසංගතය ශ්‍රී ලංකාවට කඩාවැදුණු මුල් අවස්ථාව තුළ අපේ ජනතාවගේ හැසිරීම ඉතා බුද්ධිමත් විය. කිසිවකු මුඛ ආවරණ නැතිව ගෙයින් එළියට ගියේ නැත. සංචාර නැවතිණි. උත්සව නැවැතිණි. වෛද්‍ය උපදේශන අකුරටම පිළිපැදීමට සියල්ලෝම එකඟ වී සිටියහ. එහෙත් මේ වන විට ඒ කිසිවක් දැකගන්නට නැත. කාර්යාල ඉදිරිපිට ඇති වතුර බේසම් හා විෂබීජ නාශක කිසිවකු පාවිච්චි කරන්නේ නැත. මුඛ ආවරණ ඇත්තේ සාක්කුවලය. නැත හොත් බෑග්වලය. දුම්රිය මැදිරි තුළ මගීන් කිටිකිටියේ හිර වී සිටිනු දකින්නට පුළුවන. බස්රථවල තත්ත්වය ද ඊට වෙනස් නැත. මේ සියල්ල නිරීක්ෂණය කරන කල අනාගතය පිළිබඳ භයානක චිත්‍රයක් ඇඳී යයි.

වසංගතයෙන් පසු අප මුහුණ දෙන බරපතළ අභියෝගය වන්නේ ආර්ථිකය යථාවත් කිරීමය. පවතින තත්ත්වය යටතේ ලෝක ආර්ථික ගනුදෙනු සීමා වී ඇත. ණය හා ආධාර වැඩසටහන් ඇනහිට ඇත. මේ අනුව ස්ව - ශක්තිය කෙරෙහි විශ්වාසය තබමින් ආර්ථිකය ගොඩනැඟීමට සිදු වී ඇත. ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය ඒ සඳහා බලවත් පරිශ්‍රමයක යෙදී සිටිති. බිඳවැටුණු ව්‍යාපාර යළි සක්‍රිය කරමින් ද: ආයතන කාර්යක්ෂම තත්ත්වයට ගනිමින් ද නව ව්‍යාපෘති ආරම්භ කරමින් ද ආර්ථික යුද්ධයක නිරත වීමට රජයට සිදු වී ඇත. මේ අභියෝගය ජය ගත හැක්කේ ජනතාවගේ පාර්ශ්වයෙන් ද උපරිම සහයෝගයක් හා කැපවීමක් ලැබුණ හොත් පමණි. එම කැප වීම සිදු කිරීමට නම් පොදු ජනයා නිරෝගි විය යුතුය.

කොවිඩ් 19 සමඟ ජීවත් වන්න; ආරක්ෂාව හා පරිස්සම තබා ගන්න! විශේෂඥයන්ගේ උපදේශනය එය වී තිබේ. වසංගතයට බියෙන් ජන ජීවිතය අත්හළ යුතු නැත. ස්වකීය වගකීම් හා යුතුකම් මගහැරිය යුතු නැත. එහෙත් ආරක්ෂාව හා පරිස්සම උපරිමයෙන් පවත්වාගත යුතුය. එසේ නොවුණ හොත් සියල්ල කඩා වැටීමට ලක් වනු ඇත. අප දැන් කළ යුත්තේ කොරෝනා තෙවන රැල්ලකට එරෙහිව ශක්තිමත්ව සටන් වැදීමය.

දිල්රැඟෙ සීවලී

යහපත් රියැදුරකු නම් තිබෙනා	චාරේ
දෑතට ගන්න ජීවිතවල බර	තේරේ
මහ මඟ නොයන් කිසි විටෙකත්	අවිචාරේ
මරුවා වැඩිපුරම ඉන්නේ මහ	පාරේ

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නඳුන් ගුරුගේ

ව්‍යවසායකයාට පොදු ජනතාවට බර නොවන බදු

රජය හඳුන්වා දුන් බදු සංශෝධන සහ බදු සහන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට දිරිමත් වීමට කළ යෝජනා, විශාල පරිමාණ බදු ගෙවන්නන්ගෙන් වැඩි බදු ආදායමක් උපයා ගැනීමේ ක්‍රමෝපායන් පැහැදිලි කරමින්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නඳුන් ගුරුගේ මහතා සමඟ පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරෙන් මේ ලිපිය සකස් කෙරිණි.

> **විශාල පරිමාණ බදු ගෙවන්නන්ගෙන් වැඩි ආදායමක් රජයට එකතු කර ගැනීම සඳහා දැනටත් වඩා ප්‍රබල සහ දැඩි අධීක්ෂණයක් යටතේ නව ඒකකයක් ආරම්භ කොට එහි සෘජු අධීක්ෂණය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙතම පවරා ගන්නා ලදී.**

දේශීය ව්‍යවසායකයා සහ බදු ගෙවන පොදු ජනතාව මුළුමනින්ම අධෛර්යයට පත් නොකොට, දුර්වල ආර්ථික කළමනාකරණයෙන් මිදී රටේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා සහ පොදු ජනතාව සවිබල ගැන්වීම ඉලක්ක කොට ගත් වසර පහකටවත් නොවෙනස් වන බදු ප්‍රතිපත්තියක් රජය හඳුන්වා දී තිබේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ 'සෞභාග්‍යයේ දැක්ම' අනුව ගොඩනැගෙන ජනතා කේන්ද්‍රීය ආර්ථිකයේ සාර්ථකත්වයට නිබඳ සහාය දැක්වීමේ වගකීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගෙන තිබේ. දැනට පවතින බදු ක්‍රමය මඟින් දේශීය ව්‍යවසායකයා සහ බදු ගෙවන පොදු ජනතාව මුළුමනින්ම අධෛර්යයට පත් කර ඇතැයි මීට වසරකට පෙර රජයේ බදු ප්‍රතිපත්තිය පිළිබඳව අදහස් දක්වමින් වත්මන් ජනාධිපතිවරයා සිය මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය වූ 'සෞභාග්‍යයේ දැක්මෙහි' බොහෝ පැහැදිලිව සඳහන් කොට තිබිණි. එවැනි බදු ප්‍රතිපත්තියක් වෙනුවට රටේ ආර්ථිකය නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහාත් පොදු ජනතාව සවිබල ගැන්වීම සඳහාත් අවශ්‍ය ආකාරයට අපේ රටේ බදු ක්‍රමය සංශෝධනය කරන බව ද සටහන් කොට තිබිණි. ඒ අනුව යමින් දැනට ක්‍රියාත්මක වන දේශීය ආදායම් පනත වෙනුවට නව බදු පනතක් ගෙන එන අතර නිතර නිතර වෙනස් නොවී වසර කිහිපයක් අඛණ්ඩව පවතින සරල මිත්‍රශීලී නව බදු ක්‍රමයක් ස්ථාපනය කිරීමට රජය පියවර ගනිමින් සිටී. ඒ යටතේ නිෂ්පාදන ව්‍යාපාර සඳහා අය කරන ආදායම් බද්ද 28% සිට 18% දක්වා අඩු කෙරිණි. ආර්ථික සේවා ගාස්තු (ESC) හා පොලිය රඳවා ගැනීමේ බදු (WHT) අහෝසි කරන ලදී. එකතු කළ අගය මත බද්ද (VAT) 15% ක් හා ජාතිය ගොඩ නැඟීමේ බද්ද (NBT) 2% වෙනුවට 8% සරල එකතු කළ අගය මත බද්දක් ක්‍රියාත්මක කෙරිණි. පොලිය මත අය කරන රඳවා ගැනීමේ බදු (WHT) අහෝසි කෙරිණි. රජයේ සහ පෞද්ගලික අංශවල රැකියා කරන්නන්ගේ වැටුපට අයකරන උපයන්වීට ගෙවීමේ බද්ද (PAYE TAX) අහෝසි කරන ලදී. පෞද්ගලික ආදායම් බදුවලින් නිදහස් වන ආදායම් (Tax Free Threshold Income) ආදායම් ඉහළ දමා බදු අනුපාතය 18% ක උපරිමයකට සීමා කළ අතර ආදායම් බදු ගෙවිය යුතු සියලුදෙනාගේ බදු අය කිරීමේ ක්‍රමවේදයක් සකස් කරමින් සිටී.

ආගමික ස්ථාන සඳහා පනවා තිබූ විවිධ බදු අහෝසි කරනු ලැබිණි. සංචාරක හෝටල් සහ සංචාරකයන් සඳහා සේවය සපයන ආයතන සඳහා යොදා ගන්නා ආහාර, අමුද්‍රව්‍ය, රෙදිපිළි සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය වැනි දේශීය නිෂ්පාදනවලින් ලබා ගන්නා යෙදවුම්වලින් 60%ක් ඉක්මවන ව්‍යාපාර අපනයන කර්මාන්ත සේ සලකා ශූන්‍ය වැට (Zero Vat) බදු අනුපාතය ක්‍රියාත්මක කෙරිණි. දුරකතන සේවා ගාස්තු සහ අන්තර්ජාල පහසුකම් සඳහා අය කරන බදු 50% කින් අඩු කරනු ලැබිය.

ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රගමනයට විශාල දායකත්වයක් ලබා දිය හැකි අයුරින් බදු ප්‍රතිපත්තිය සරල කිරීම සහ සහන පිරිනැමීම සඳහා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා පියවර ගත් අතර ඒ සඳහා අගමැති හා මුදල් ඇමැති මහින්ද රාජපක්ෂ මහතා මඟපෙන්වීම් ලබා දී ඇත. මෙම සහනයන් තවදුරටත් පුළුල් කරමින් ඉදිරියේදී කටයුතු කිරීමට තම දෙපාර්තමේන්තුවට රාජ්‍ය නායකත්වයෙන් ලැබෙනුයේ විශාල දායකත්වයකි. ඒ අනුව විශාල පරිමාණ බදු ගෙවන්නන්ගෙන් වැඩි ආදායමක් රජයට එකතු කර ගැනීම සඳහා දැනටත් වඩා ප්‍රබල සහ දැඩි අධීක්ෂණයක් යටතේ නව ඒකකයක් ආරම්භ කොට එහි සෘජු අධීක්ෂණය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙතම පවරා ගන්නා ලදී.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන නව ඒකකයේ (LTU) ඒකකයේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරු දෙදෙනකු, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරු හතර දෙනකු, කොමසාරිස්වරු දහතුන්දෙනකු ඇතුළු නිලධාරීන් හැත්තෑ දෙදෙනකුගෙන් සමන්විත වේ.

ඒ අනුව විශාල බදු ගෙවන්නන්ගේ උනන්දුව සහ ඔවුන් පිළිබඳව අධීක්ෂණය වේගවත් කොට කාර්යක්ෂම බදු අය කර ගැනීමේ ක්‍රියා පිළිවෙතක් හඳුන්වා දී ඇත.

වාර්ෂිකව මෙරටට මහ පරිමාණ බදු ගෙවන සමාගම් 532ක බදු ලිපි ගොනු පරීක්ෂා කිරීමේ සහ ඒවා පිළිබඳ ක්‍රියා කිරීමේදී මීට පෙර එක් නිලධාරියකුට ලිපි ගොනු තිහක් හතළිහක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදු වී තිබිණි. එනමුත් නව පහසුකම් සහිත විශේෂ ඒකකය ආරම්භ කිරීමෙන් පසු එක් නිලධාරියකුට ලිපි ගොනු පහක් දහයක් අතර ඉතා කුඩා ප්‍රමාණයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉඩ කඩ ලබාදී තිබේ. මෙලෙස එක් නිලධාරියකුට කටයුතු කිරීමට ඇති බදු ලිපි ගොනු සංඛ්‍යාව අඩු කිරීම නිසා බදු ආදායම වැඩි කර ගැනීමට මග පෑදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දැනට වාර්ෂිකව මෙරට දේශීය බදු ආදායමෙන් 65% - 70% ප්‍රමාණයක් බදු අය වනුයේ විශාල පරිමාණ බදු ගෙවන්නන්ගෙනි. මෙම ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 80% දක්වා ඉහළ නංවාගැනීම නව විශේෂ ඒකකය ආරම්භ කිරීමේ අරමුණක් වී තිබිණි. මීට අමතරව බදු ලිපිගොනු තුන්දාහක පමණ ප්‍රමාණයක් පහළ සමාගම් අංශයේ එනම් සුළු හා මධ්‍ය පරිමාණ අංශයට වඩා ඉහළටත් විශාල පරිමාණ බදු ගෙවන්නන්ගේ අංශයෙන් පහළටත් ඇතුළත් වේ. මෙම පිරිසගේ ද නියමිත බදු ආදායම ලබා ගනිමින් ඔවුන් රටේ ආර්ථික දියුණුවට ලබා දෙන දායකත්වය දැනට වඩා සවිබල ගන්වා ඔවුන් ද විශාල පරිමාණ බදු ගෙවන්නන් බවට පරිවර්තනය කර ගැනීම දෙපාර්තමේන්තුවේ අපේක්ෂාව වී ඇත.

2019වසර දේශීය ආදායම් දෙපාර්තමේන්තු ඉතිහාසයේ වැඩිම ආදායම ඉපැයූ වසර ලෙස වාර්තා ගත වී තිබිණි. එම වසරේදී රුපියල් බිලියන 800ක ආදායම් ඉලක්කයක් ලබාදී තිබූ අතර ඉන් රුපියල් බිලියන 785ක ආදායමක් එක්රැස් කර ගැනීමට සමත් විය. වසර 2020 දී රුපියල් බිලියන 615ක ආදායමක් අය කර ගැනීමට හැකි වනු ඇතැයි ගණන් බලා තිබේ. මේ අන්දමට මේ වසරේ ආදායම යම් අඩු වීමක් දක්නට ලැබුණ ද වසර 2019 අප්‍රේල් 21 වැනිදා එල්ල වුණු පාඨක ප්‍රහාරය, වසර අග භාගයේ ලෝකය පුරා පැතිරී ගිය කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා සිදු වූ ආර්ථික බලපෑම ආදී යහපත් නොවන හේතු මේ සඳහා මුල් වූ බවට විවාදයක් නොපවතී.

එපමණක් නොව ජනාධිපතිවරයා 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සිදු කළ බදු සංශෝධන නිසා දෙයාකාරයකින් බදු ආදායම අඩු වීමට මුලපිරිණි. පළමුවැන්න නම් සමහර බදු අහෝසි කිරීමයි. දෙවැන්න නම් බදු සංශෝධනය කිරීමයි. මින් පළමුවැන්න යටතේ ජාතිය ගොඩනැඟීමේ බද්ද (NBT), උපයන විට ගෙවීමේ බද්ද (PAYE) සහ පොළී මත රඳවා ගැනීමේ බද්ද අහෝසි කරන ලදී.

පුද්ගල ආදායම් බද්ද, එකතු කළ අගය මත, නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීමේ බද්ද සංශෝධනය කරන ලදී. මෙලෙස වසර 2019 සාපේක්ෂව වසර 2020 දී බදු ආදායම ලැබීමේ අඩුවක් දක්නට ලැබුණ ද ඒ තුළින් ආර්ථිකයේ නිෂ්පාදනය ඉහළට ඔසවා තැබීමට, ආර්ථික වර්ධනය වේගවත් කිරීමට සැපවූයේ විශාල ශක්තියකි. බදු ආදායම රජයට අහිමි වුවත් එතෙක් බදු ගෙවන ලද ජනතාවට සහන හිමි වීම හේතුවෙන් ඔවුන් නව ජවයකින් ආර්ථික ක්‍රියාකාරකම්වලට මුදල් ආයෝජනය කරන ලදී. සරලව පැවසුව හොත් රජයට ගෙවිය යුතු බදු මුදල තමන්ගේ ලාභයක් සේ සලකා එය තම ව්‍යාපාරයේ දියුණුවට ආයෝජනය කිරීම රජය අපේක්ෂා කරන ලදී. මෙලෙස තනි තනි පුද්ගලයන්, ව්‍යාපාර දියුණුව සඳහා වැඩි වැඩියෙන් මුදල් යෙදවීම තුළ කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා යන අංශ සියල්ලෙහිම යම් බලගැන්වීමක් සිදු විය.

සේවා නියුක්තිකයන්ට තම ආදායම් ඉපැයීම් මත අය කළ බදු අඩු කිරීම නිසා ඔවුන්ට වැඩි වැඩියෙන් පරිභෝජනය සඳහා මුදල් ඉතිරි විණි. නැති නම් නව ආයෝජනයක් සිදු කිරීමට මුදල් ඉතිරි විණි. මෙලෙස මුදල් ඉතිරි වීම හෝ ආයෝජනය කිරීම තුළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ ඉහළ යෑමක් දක්නට ලැබිණි.

භාණ්ඩ හා සේවා මත අය කළ වැට් බදු ඇතුළු අනෙකුත් බදු අනුපාත පහත දැමීම නිසා පාරිභෝගික ජනතාවට අඩු මිලට භාණ්ඩ ලබා ගැනීමට අවස්ථාව සැලසිණි. බදු ආදායම් අය කර ගැනීමේ ක්‍රියාවලියේ සිදු කළ සහන පිරිනැමීම් සහ නව බදු සංශෝධන හරහා රජය බලාපොරොත්තු වූයේ හැකි තරම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය නව ජවයකින් දියුණුව කරා පියමනිනු ඇතැයි යන්නය. එම බලාපොරොත්තුව ඒ ආකාරයෙන්ම ඉටු කර ගැනීම සඳහා අඩුම තරමේ වසර පහකටවත් නොවෙනස් සරල සහ නොවෙනස් බදු ප්‍රතිපත්තියක් අප රටට හඳුන්වා දීම සිදු කළ යුතුමය. ඒ සඳහා එළඹ ඇති මොහොත මැනවින් භාවිතයට ගනිමින් නව බදු ප්‍රතිපත්තියක් රටට හඳුන්වා දීමට රජය ක්‍රියා කරනු ඇත.

ජයසිරි මුණසිංහ

සහල් වෙළෙඳ පොළේ කැකෑරෙන අර්බුදය

මහාචාර්ය
එන්. එස්. කුරේ
නීගාතා ජපන් අන්තර්ජාතික විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳව මහාචාර්ය ජපානයේ ශ්‍රී ලාංකික ශාස්ත්‍රඥයන්ගේ සංගමයේ සභාපති

අතීතයේ ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිතව තිබූ අතර දීර්ඝ කාලයක් පුරා සහල් අපනයනකරුවෙක් ද විය. එලෙසම විශිෂ්ට සෞඛ්‍යමය ප්‍රතිලාභ සහිත පාරම්පරික සහල් ප්‍රභේද දහසකට අධික ප්‍රමාණයක් සහිත රටක් ලෙස ද ප්‍රචලිතව තිබිණි. මෙම ප්‍රවණතා කණපිට හරවමින් පසු කාලයකදී ශ්‍රී ලංකාව සහල් ආනයනයට පෙළඹිණි. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය යටත් විජිතකරණය මෙයට බලපෑවේය. නිදහසෙන් පසුව බලයට පත් සෑම රජයක්ම ශ්‍රී ලංකාව නැවතත් සහලින් ස්වයංපෝෂිත කිරීමටත්, වී ගොවියාගේ ජීවන තත්ත්වය නගා සිටුවීමටත් බත් ප්‍රධාන ආහාරය කරගත් මිලියන ගණනක් වූ ජනතාවට සහනදායී මිලට සහල් ලබා දීමටත් විවිධ වූ සහනාධාර හා සහතික මිල යෝජනා ක්‍රම, මිල පාලනයන් සහ විවිධ වූ වෙනත් ක්‍රියාමාර්ග ආරම්භ කර උත්සාහකර බලන ලදී. මෙරට සෑම දේශපාලනික පක්ෂයක්ම පාහේ තම දේශපාලනික ප්‍රතිපත්ති ප්‍රකාශන තුළ වී ගොවියන්ටත් සහල් පාරිභෝගිකයන්ටත් වාසිදායක වන ලෙස ප්‍රතිපත්ති සකසා ඒ තුළින් තමන්ගේ ඡන්ද පොදිය වැඩි කර ගැනීම දක්වා මෙම සහල් වෙළෙඳ පොළ දේශපාලනීකරණය වී තිබේ. මේ සියල්ල නිසි ලෙස වාර්තාගතව ඇති අතර මෙය නව ප්‍රවණතාවක් නොවේ.

මැතකදී රජය මඟින් නැවතත් සහල් සඳහා පාලන මිලක් ස්ථාපිත කිරීමත් සමඟ විවිධ ජනමාධ්‍ය ඔස්සේ මෙම කාරණය නැවතත් සාකච්ඡාවට බඳුන් වී ඇත. පාරිභෝගිකයන්ගේ ජීවන වියදම අවම කරලීම වස් පාරිභෝගික සේවා අධිකාරිය විසින් සහල් වර්ග කිහිපයක් සඳහා උපරිම සිල්ලර මිල නියමයන් 2020 අප්‍රේල් 10 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙයට ප්‍රතිචාර වශයෙන් මහා පරිමාණ සහල් වෙළෙන්දන් රටේ දැවැන්ත සහල් හිඟයක් නිර්මාණය කරමින් සහල් තොග නිදහස් කිරීම නතර කළ ආකාරය අපි දුටුමු. මෙම කෘත්‍රිම සහල් හිඟයට මුහුණ දීම සඳහා පාරිභෝගික සේවා අධිකාරියේ සභාපති ඇතුළු තවත් නිලධාරීහු 50ක් පමණ ශ්‍රී ලංකාවේ වැඩිම සහල් නිෂ්පාදනයක් හා සැපයුමක් ඇති පොලොන්නරුව ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක යෙදුණහ. පාරිභෝගික සේවා අධිකාරියේ ප්‍රයත්නය ව්‍යර්ථ වූ වටපිටාවක, නැවතත් රජය විසින් පාලන මිල වෙනස් කරමින් සහල් මෝල් හිමියන්ට තමන්ට රිසි ලෙස වැඩි මිලට සහල් විකිණීමට අවස්ථාව සලසා දෙන ලදී. මෙම සිදුවීම් මඟින් වෙළෙඳ පොළ තුළ දෘශ්‍යමාන හා කෲර හස්ත ක්‍රියාත්මක වන බව සැකෙවින් පෙන්වා දෙයි. රටේ සහල් වෙළෙඳ පොළ තත්ත්වය පිළිබඳව විශ්ලේෂණය කිරීමට සහ මහජනතාව මුහුණදෙන ප්‍රශ්නයන්ට දීර්ඝ කාලීන විසඳුම් යෝජනා කිරීම වැදගත් වන්නේ එම නිසාය.

සහල් සහ වී වෙළෙඳ පොළ

සහල් වෙළෙඳ පොළ සඳහා රාජ්‍ය ආයතන, පාරිභෝගිකයන්, වී ගොවියන්, පෞද්ගලික වී සහල් වෙළෙන්දන්, කුඩා, මධ්‍යම හා මහා පරිමාණ මෝල් හිමියන් යන අය ඇතුළත්ය. විශේෂයෙන්ම සහල් සඳහා ඉල්ලුම ඇති වන්නේ සිවිල් පාරිභෝගිකයන්, ත්‍රිවිධ හමුදාව හා රාජ්‍ය ආයතන මඟිනි. රජය විසින් 6 -8%ක වී ප්‍රමාණයක් පමණක් මිල දී ගනු ලබන අතර කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හා සමූපකාර විසින් 10%ක් පමණ වී මිල දී ගනු ලබයි. ඉතිරි වී ප්‍රමාණය මහා පරිමාණ වී මෝල් හිමියන් 3 – 4 දෙනකු විසින් මිල දී ගනු ලබන අතර මෙය කතිපයාධිකාරී (Oligopolistic) වෙළෙඳ පොළ සඳහා මනා නිදසුනක් වේ. අස්වනු නෙළන අවස්ථාවේ විශාල වී ප්‍රමාණයක් මිල දී ගත හැක්කේ මහා පරිමාණ මෝල් හිමියන්ට පමණක් වන අතර මේ සඳහා මහා පරිමාණ මෝල් හිමියන් හට බිලියන ගණනක ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ. සහල්වල ගුණාත්මකභාවයේ වර්ධනයක් පෙන්නුම් කරන්නේ නම්, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සඳහා මහා පරිමාණ වෙළෙඳුන් විසින් විශාල වශයෙන් ආයෝජනය කිරීම සිදු වේ. වගා කළ හැකි බිම් ප්‍රමාණයෙන් 34% ක් වන හෙක්ටයාර 870,000ක පමණ බිම් ප්‍රමාණයක් පුරා මිලියන 1.8ක් ගොවීන් විසින් වී වගා කරනු ලබයි. නිෂ්පාදිත සහල් ප්‍රමාණයෙන් 98%ක පමණ ප්‍රමාණයක් දේශීයව පරිභෝජනය කරනු ලබයි. කෙසේ වෙතත් වී වගාව තවදුරටත් ලාභදායී ව්‍යාපාරයක් නොවන බැවින් වී ගොවීන් දැවැන්ත ණයගැතියන් බවට පත් වී ඇත.

රාජ්‍ය මැදිහත්වීම

ශ්‍රී ලංකාව තුළ නිදහස් වී හා සහල් වෙළෙඳ පොළක් නොමැති හෙයින් සහල් වෙළෙඳ පොළ ප්‍රතිඵල (සමතුලිත මිල හා ප්‍රමාණය) පිළිබඳව නිශ්චිතව කිව නොහැකිය. කෙසේ වෙතත් වෙළෙඳ පොළ තුළ අප අද දකින්නේ විකෘති වූ සහල් මිල හා ප්‍රමාණයන් බවත් කිවහැකිය. මම වරක් නොබෙල් සම්මානලාභී ආර්ථික විශේෂඥ, මහාචාර්ය ඒල්.ආර්. ක්ලයින් (L.R. Klein) මහතාගෙන් “දේශපාලන නායකයන් විසින් ආර්ථිකවේදීන් නිර්දේශ කරනු ලබන වඩා සුදුසු ආර්ථික ප්‍රතිපත්ති නොසලකා හරින්නේ ඇයි?” දැයි යන්න අසා සිටියෙමි. එයට පිළිතුර වූයේ දේශපාලන නායකයන් විසින් කෙටි කාලීනව තීරණ ගැනීමේ ආධිපත්‍යය පතුරුවාගෙන සිටින බවත්, ඔවුන් ඊළඟ මැතිවරණය වනතෙක් ලැබෙන වාසි පිළිබඳව පමණක් සිතමින් තීරණ ගන්නා බවත්ය.

ඊට හාත්පසින්ම වෙනස්ව, ආර්ථිකවේදීන් දීර්ඝ කාලීන ප්‍රතිපත්තිමය තීරණවල ආධිපත්‍යය දරන්නේ ඔවුන් කෙටි කාලීන ප්‍රතිලාභවලින් ඔබ්බට සලකා බලන බැවිනි. එම පිළිතුර ශ්‍රී ලංකාවට නිවැරදිව ගැළපෙන බව මා හට හැඟේ. රජය විසින් වී සඳහා සහතික මිලක් හා සියලු පොහොර වර්ගයන් සඳහා පොහොර සහනාධාර ලබාදීමෙන් සහල් නිෂ්පාදනය නගාසිටුවීමටත් සහලින් රට ස්වයංපෝෂිත කිරීමටත් ප්‍රයත්න දරයි. එහෙත් සහල් ඵලදායිතා ලැයිස්තුවේ රටවල් 119 අතුරින් ශ්‍රී ලංකාව 93 වන ස්ථානය ලබා ඇත්තේ නේපාලය 67 වන ස්ථානයත්, තායිලන්තය 68 වන ස්ථානයත් ලබාගන්නා පසුබිමකය. කෙසේ වෙතත් බලයට පත් රජයන් සියල්ල මෙම වැඩපිළිවෙළ නිසාම සහල් පාරිභෝගිකයන් සහ ගොවීන් විසින් ලබා දුන් ඡන්දවලින් බලයට පත් වූවා යැයි කීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නොමැත.

අදෘශ්‍යමාන හස්තය

වෙළෙඳ පොළ වී මිල හුදෙක් වී නිෂ්පාදන පිරිවැය හා ගොවීන්ගේ ලාභ ආන්තිකයේ එකතුව විය යුතුය. ඇතැම් රාජ්‍ය මැදිහත්වීම් නිසා සහල් සහ වී මිල දෙකම විකෘති වී ඇත. තවද ඔවුන් ගොවීන්ට හා සහල් පාරිභෝගිකයන්ට සුදුසු වෙළෙඳ පොළ සංඥා ලබා නොදීමෙන්, අපට පූර්ණ වශයෙන් අවබෝධකරගත නොහැකිවූ අනපේක්ෂිත ඍණාත්මක ප්‍රතිවිපාක සමාජය තුළ ජනනය කරයි. පාලන මිලක් නොමැති විට, වී ගොවීන්ට තම නිෂ්පාදන සඳහා වැඩි මිලක් ලබාගැනීමටත්, සහල් ආශ්‍රිත නිෂ්පාදන ඉහළ යෑමටත්, විදේශ විනිමය රට තුළ රඳවා ගනිමින් බිර නිෂ්පාදකයන්ට තම නිෂ්පාදන සඳහා වැඩිපුර සහල් මිලදී ගැනීමටත් අවස්ථාව ලැබෙනු ඇත. පාරම්පරික සහල් ප්‍රභේද සඳහා පාලන මිලක් නොමැති වීමෙන් එම ක්ෂේත්‍රයේ නව වර්ධනයන් රාශියක් දැකගත හැකිවී ඇත.

ජපානය ඇතුළු සහල් නිපදවන වෙනත් රටවල අත්දැකීම්වලින් පෙනී යන්නේ සහල් මත පදනම් වූ නිෂ්පාදන බොහොමයක් ඇති බවයි. ජපානය සහ වෙනත් ප්‍රමුඛ ගෝලීය බිර නිෂ්පාදකයන් බියර් නිෂ්පාදනයේදී සහල් භාවිතා කරයි. ශ්‍රී ලංකාව තුළ මනා වී, සහල් සංස්කෘතියක් ඇති නමුත් තවමත් මෙරට සහල් ආශ්‍රිත නිෂ්පාදන සීමිතය. උදාහරණයක් වශයෙන්, බිර නිෂ්පාදකයන් විසින් මෝල්ට් සඳහා විකල්පයක් ලෙස

> **මධ්‍යම හා කුඩා පරිමාණ මෝල් සහ වෙළෙඳුන් වෙළෙඳ පොළින් ඉවත්වීම හේතුවෙන් ඇති වූ වෙළෙඳ පොළ බලය භාවිතා කරමින් ඔවුහු ආධිපත්‍යය දරති. බහුල වශයෙන් සහල් ඇඹරුම්හල් පැවති ප්‍රදේශවල මෝල්වලින් 90%ක් පමණ වසා දමා ඇත.**

වසර 40ක පමණ කාලයක් පුරා දේශීය සහල්වලින් 0.25% පමණක් යොදාගනු ලබයි. එහෙත් බියර් කර්මාන්තය සඳහා ආනයනික මෝල්ට් වෙනුවට දේශීය සහල් ආදේශ කිරීම තුළින් දේශීය ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට සහ විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හැකියාවක් ඇත.

මේ වන විට ශ්‍රී ලංකාවේ මහා පරිමාණ වී මෝල් ඇත්තේ ස්වල්පයක් පමණක් වන අතර එයින් පෙන්නුම් කරන්නේ වී වෙළෙඳපොළ කතිපයාධිකාරයක් (Oligopoly) ඇති බවයි. මධ්‍යම හා කුඩා පරිමාණ මෝල් සහ වෙළෙඳුන් වෙළෙඳ පොළින් ඉවත්වීම හේතුවෙන් ඇති වූ වෙළෙඳ පොළ බලය භාවිතා කරමින් ඔවුහු ආධිපත්‍යය දරති. බහුල වශයෙන් සහල් ඇඹරුම්හල් පැවති ප්‍රදේශවල මෝල්වලින් 90%ක් පමණ වසා දමා ඇත. ප්‍රධාන වශයෙන් වී වගා කරනු ලබන දිස්ත්‍රික්ක වන පොලොන්නරුව, අම්පාර, හම්බන්තොට, අනුරාධපුර සහ කුරුණෑගල වැනි ප්‍රදේශයන්ගෙන් පිටත වී ගොවීන් බොහෝදෙනකු වී වගාව අතහැර දමා ඇත. පාලන මිලක් තිබියදී හිතකර ව්‍යාපාරික වාතාවරණයක් නොමැති නිසා එම ගොවීන්ට සහ මෝල් හිමියන්ට වෙළෙඳ පොළෙන් ඉවත් වීමට සිදු වී ඇති බව පැහැදිලිය.

රජයේ සහනාධාර ක්‍රම නිසා ගොවීහු ප්‍රධාන වශයෙන් ආනයනික රසායනික පොහොර භාවිතා කරති. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව, රසායනික පොහොර පමණක් භාවිතයෙන් සිදු කරන වගාව මුළු වගා ප්‍රදේශයෙන් 65%ක් වන අතර, රසායනික හා කාබනික පොහොර භාවිතයෙන් සිදු කරන වගාව මඟින් 34%ක් ආවරණය වේ. බොහෝ ගොවීහු කාබනික පොහොර පමණක් භාවිතා නොකරන අතර, මෙලෙස භාවිතා කරන්නේ වපුරන ලද ප්‍රදේශයෙන් 0.2%ක් පමණ වේ. එම නිසා බදු ගෙවන්නන්ගේ මුදල් යොදා ගනිමින් සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් වැය කර රසායනික පොහොර ආනයනය කරන අතර, ඒවා අධිභාවිතය හේතුවෙන් මිනිසුන් රෝගාතුර වීම සිදු වෙයි. තවද රසායනික පොහොර අධික ලෙස භාවිතා කිරීම නිසා පසෙහි ස්වභාවික සංයුතිය බාදනය විය හැකි අතර, බොහෝ පාරිසරික හානි හා සෞඛ්‍ය උපද්‍රව ඇති කරයි. රජයේ මිල පාලනයකින් තොරව කාබනික හා පාරම්පරික ප්‍රභේද ඇතුළු උසස් තත්ත්වයේ සහල් ලබා දිය හැක්කේ ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයට බව පැවසීමට තරම් අපට සාක්ෂි තිබේ.

ජපානයේ පාඩම්

ජපානයේ හොඳම සහල් නිපදවන කලාපය වන නීගාතා හි දැන් ජීවත් වන මා ගොවීන් සහල් වගාවේ නිරත වන ආකාරය සහ සහල් වෙළෙඳ පොළ ජපානයේ හැසිරෙන ආකාරය නිරීක්ෂණය කරන්නේ ඉමහත් සතුටිනි. ජපන් කෘෂිකාර්මික සමූපකාරය (Nolyo හෝ JA Group ලෙසද හැඳින්වේ) ජපානය තුළ රට පුරා ව්‍යාප්ත කෘෂිකාර්මික ජාලයක් සමඟ වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. ජපන් රජය විසින් JA සංවිධානය පිහිටුවන ලද අතර, එය ප්‍රබල ගොවිජන සභාවක් දක්වා වර්ධනය විය. මිලියන සංඛ්‍යාත ගොවි සාමාජිකයන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ඇසුරුම්කරණය, ප්‍රවාහනය, අලෙවිකරණය හා මූල්‍ය සේවා සැපයීම සඳහා යෙදවුම් සැපයීම සම්බන්ධයෙන් මෙය ක්‍රියාත්මක වේ. 1995 වසරට පෙර සහල්වල මිල තීරණය කරන ලද්දේ රජය විසිනි. කෙසේ වෙතත්, වර්තමානය වන විට නිදහස් වෙළෙඳපොළ තත්ත්වයන් භුක්ති විඳිමින් තම නිෂ්පාදන ඕනෑම කෙනකුට විකිණීමේ නිදහස ගොවීන්ට ලැබී ඇත.

ජපානයේ සහල් මිල පිළිබඳ කිසිදු පාලනයක් නොමැති අතර එය තීරණය වන්නේ ඉල්ලුම හා සැපයුම මඟිනි. අද වන විට ජපන් ජාතිකයන් 1960 ගණන්වල සහල් පරිභෝජනය කළා මෙන් අඩක් පමණක් ආහාරයට ගැනීම නිසා මිනිස් සහල් පරිභෝජනය සඳහා ඇති ඉල්ලුම අඩු වෙමින් පවතී. වාර්ෂික එක පුද්ගල සහල් පරිභෝජනය 1962 වර්ෂයේදී ඉහළම අගය වාර්තා කළ අතර, එය කිලෝග්‍රෑම් 114ක් ලෙස සටහන් විය. එමෙන්ම අවම පරිභෝජනය කිලෝග්‍රෑම් 52.2ක් ලෙස 2011 වර්ෂයේ දී වාර්තා විය. වර්තමානයේදී ශ්‍රී ලංකාවේ එක පුද්ගල සහල් පරිභෝජනය කිලෝග්‍රෑම් 107ක් පමණ වේ. සහල් පරිභෝජනය පහත වැටීමට හේතු වී ඇත්තේ ජනගහනය අඩු වීම, වයස්ගත වීම සහ එළවළු, පාන්, පැස්ටා, මස් සහ කිරි නිෂ්පාදන බහුලව ආහාරයට ගැනීමය. ජපානයේ සහල් මිල ලෝක වෙළෙඳපොළෙහි මිලට වඩා බොහෝ ගුණයකින් වැඩි ය. ප්‍රතිපත්ති සම්පාදකයන් වෙළෙඳපොළ අරමුණු කර ගත් ආර්ථික ප්‍රතිපත්ති පරිපූර්ණ යැයි සිතන්නේ නම්, ජපානය මේ වන විට සහල් ආනයනය කළ යුතුය. කෙසේ වෙතත්, දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ජපාන රජය ගොවීන්ට දැවැන්ත සහනාධාර ලබා දී ඇති අතර දේශීය වෙළෙඳපොළ ඉහළ තීරු ගාස්තුවකින් ආරක්ෂා කර ඇත්තේ අර්ධ වශයෙන් ඡන්දය පදනම් කර ගැනීම සහ ආහාර සුරක්ෂිතතාවය පදනම් කර ගැනීම හේතුවෙනි.

ශ්‍රී ලංකාව ක්ෂණික බත හෝ කැඳ නිෂ්පාදනය කරන්නේ නම්, එයට ප්‍රධාන වශයෙන් නගරවල වෙසෙන ජනතාවගේ අවශ්‍යතා සපුරාලිය හැකිය. මන්ද එයට අවශ්‍ය වන්නේ කාලය ගත වන සහල් උඳුනක් (Rice cooker) වෙනුවට පරිභෝජනයට පෙර උණුසුම් කිරීම යන සරල ක්‍රියාව පමණි. ජපානයේ ක්ෂණික බත, එක පුද්ගල පරිභෝජනයට ප්‍රමාණවත් වන අයුරින් සැපයෙන අතර, ඒවා විකුණනු ලබන්නේ කුටිටි ලෙස හෝ ප්ලාස්ටික් තැටිවලිනි. තවද දේශීය මත්පැන් වර්ගයක් වන සකේ නිෂ්පාදනය සඳහා නීගාතා ප්‍රාන්තයේ කර්මාන්තශාලා 100ක් පමණ ඇති අතර මෙම ප්‍රදේශය විවිධ වර්ගයේ උසස් තත්ත්වයේ සකේ නිෂ්පාදනය සඳහා ඉතා ප්‍රසිද්ධය.

පරමාදර්ශී වෙනස

ඉහත කරුණු සලකා බැලීමේදී අපට සහල් වෙළෙඳ පොළේ පරමාදර්ශී වෙනසක් අවශ්‍ය වේ. සහල් මිල පාලනය කිරීම සඳහා රජය මැදිහත් නොවී වෙළෙඳ පොළ බලවේග - සැපයුම සහ ඉල්ලුම, විසින් එය තීරණය කිරීම සඳහා අවස්ථා ලබාදීම සුදුසුය. වෙළෙඳ පොළ විසින් තීරණය කරනු ලබන මිල, ස්වයං කැමැත්තක් දක්වන ගැනුම්කරුවන්ට සහ විකුණුම්කරුවන්ට ඵලදායී ලෙස වෙළෙඳ පොළට සහභාගී වීමට සුදුසු වාතාවරණයක් ලබා දෙයි. නිදහස් වෙළෙඳ පොළ පරිසරයක් තුළ, කුඩා හා මධ්‍යම පරිමාණ මෝල්කරුවන්ට නැවත වෙළෙඳ පොළට ඇතුළු විය හැකි අතර, වී වෙළෙඳ පොළ පවත්නා කතිපයාධිකාරී (Oligopolistic) ස්වභාවය බිඳ දැමීමට මෙමඟින් මඟ පෑදේ. මිල තීරණය කිරීමේ අවස්ථාව වෙළෙඳ පොළට ලබාදුන හොත් ඉහත සඳහන් කළ බොහෝ අනපේක්ෂිත ප්‍රතිවිපාක අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් තුරන් කළ හැකිය. කෙසේ වෙතත්, කොවිඩ්-19 අපට නැවත මතක් කර දී ඇත්තේ අදෘශ්‍යමාන හෝ වෙළෙඳ පොළ නැඹුරු විඝාත ආර්ථික ප්‍රතිපත්ති පමණක් රට වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් නොවන බවයි. පුරවැසියන්ගේ යහපත පිළිබඳ සම්කරණයේදී සලකා බැලිය යුතු තවත් බොහෝ විචල්‍ය ඇත. එබැවින්, වෙළෙඳ පොළ බලවේගවලට ක්‍රියාත්මක වීමට රජය විසින් පහසුකම් සපයන අතරතුර අවශ්‍ය වේලාවට හා අවශ්‍ය අවස්ථාවේදී නියාමනය හෝ අධික්ෂණය කළ හැක.

රජය විසින් පොහොර සහනාධාරයේ සමස්ත පිරිවැය හා ප්‍රතිලාභ, සමස්ත සමාජයටම විමසා බැලිය යුතු අතර සමාජ පිරිවැය සමාජ ප්‍රතිලාභවලට වඩා වැඩි නම් ක්‍රමයෙන් සහනාධාරය ඉවත් කිරීම පිළිබඳව තීරණය කළ යුතුය. සමාජ පිරිවැය සඳහා රසායනික පොහොර, පළිබෝධනාශ්‍යක සහ වල් නාශක අධිභාවිතය මඟින් සෞඛ්‍යයට ඇති වන අහිතකර බැලපෑම් ඇතුළත් වේ. විශාල හා කුඩා පරිමාණ වී වෙළෙඳුන්ට තම ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය සම්පත් සඳහා සමාන ප්‍රවේශයක් ලබා ගත හැකි වන පරිදි සුදුසු වටපිටාවක් නිර්මාණය කිරීම ද අත්‍යවශ්‍ය වේ. දුම්රිය ප්‍රවාහනය තුළින් අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීමට සහ වී, සහල් අංශයට මාර්ගගත අලෙවිකරණ හා තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට රජය උත්සුක විය යුතුය. ගොවීන්, පාරිභෝගිකයන්, කෘෂිකාර්මික නිෂ්පාදකයන් සහ ආහාර සැකසුම් ආයතන සඳහා මෙම තොරතුරු ප්‍රයෝජනවත් වේ.

වී අලෙවි මණ්ඩලයට කෙටි කාලීනව වෙළෙඳ පොළ ස්ථාවර කිරීමට අවශ්‍ය නම්, පාරිභෝගිකයාට සහල් බෙදා හැරීම සඳහා සුදුසු නවීන තාක්ෂණයෙන් ශක්‍ය හා සැලසුම් සහගත බෙදාහැරීම් දාමයක් මඟින් එය කළ හැකිය.



පාම් ඔයිල් එක්ක පිළිකා කාරක

2018 වසරේ දී ශ්‍රී ලංකා රජය අමෙරිකානු ඩොලර් මිලියන 146ක වියදමින් පාම් ඔයිල් මෙට්‍රික් ටොන් 217,000ක් ආනයනය කරන ලදී. ශ්‍රී ලංකාවේ ආහාරයට ගන්නා තෙල්වලින් 82% ප්‍රමාණයක් පාම් ඔයිල් වේ. පොල් තෙල්වලට හිමිවන්නේ 12% ප්‍රමාණයකි.

පාම් ඔයිල්, මාගරින්, ආහාර පිසීමට ගන්නා අනෙකුත් තෙල් වර්ග, අයිස්ක්‍රීම්, බිස්කට්, සැකසූ මස් නිෂ්පාදන, චොකලට්, ක්ෂණික නූඩ්ලස්, පීසා පිටි සහ ළදරු කිරිපිටිවල ඉහළ ප්‍රමාණයක් අඩංගු වේ. මිල නිසා මේ ඔයිල් බහුලව භාවිතා වේ. පාම් ඔයිල් සහිත සියලු ආහාර පාම් ඔයිල් ඇති බවට ලේබලයේ සඳහන් කිරීම එක්සත් ජනපදයේ ආහාර ඖෂධ පරිපාලන ආයතනය විසින් අනිවාර්ය කර ඇත. මෙයට හේතුව නම් පිරිපහදු කළ පාම් ඔයිල්වල පිළිකා හා අභ්‍යන්තර ශරීර ඉන්ද්‍රියන්ට හානි කළ හැකි රසායනික ද්‍රව්‍යයන් අඩංගු වීමය. ළදරුවන් හා ළමයින් විශේෂයෙන් මේ රෝග තත්ත්වයට ගොදුරු විය හැකි බැවිනි.

යුරෝපීය ආහාර සුරක්ෂිතතා අධිකාරිය (EFSA) එළවළු තෙල්වල අඩංගු ග්ලයිසයිඩ් මේද එස්ටර (GE) 3 මොනොක්ලෝරොප්‍රොපැනෙඩියෝල් (3MCPD) සහ 2 මොනොක්ලෝරොප්‍රොපැනෙඩියෝල් (2MCPD) අඩංගු ප්‍රමාණ තීරණය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කර ඇත. මෙය සිදු කරන ලද්දේ මේ රසායනික ද්‍රව්‍ය පිළිකා කාරක වන අතර ඩී.එන්.ඒ. (DNA) හා අක්මාව, වකුගඩු සහ වෘෂණ කෝෂ වැනි ඉන්ද්‍රියවලට හානි කරන බැවිනි. මේ අධ්‍යයනයේ ප්‍රතිඵලවලට අනුව මේ රසායනික ද්‍රව්‍ය හා පිළිකා කාරකයක් වන ග්ලයිසයිඩෝල් එළවළු තෙල්වල අඩංගු බව තහවුරු කරගන්නා ලදී. මෙම සංයෝග සහ පාම් ඔයිල්වල ඇති පිළිකා කාරක ග්ලයිසයිඩෝල් සාන්ද්‍රණය ඔලිව් තෙල්වලට වඩා 264 ගුණයකින් වැඩි වන අතර රැප්සසිඩ් තෙල්වලට වඩා 24 ගුණයකින් වැඩි බව ඉහත කී අධ්‍යයනයේදී පෙන්වා දී ඇත.

පිරිපහදු කළ පාම් ඔයිල්වල තෙල් 1Kg ක 30mg ක GE සාන්ද්‍රණයක් අඩංගු වේ. පාම් ඔයිල්වල අධික ලෙස මේ විස රසායනික ද්‍රව්‍ය අඩංගු වන්නේ මේ රසායනික ද්‍රව්‍ය නිපදවෙන ඩයිග්ලිසරයිඩ්, පාම් ඔයිල්වල ඉහළ (4 – 12%) මට්ටමක පැවතීම හේතුවෙනි.

මිනිසාට අහිතකර බලපෑම් පෙන්නුම් කර නැතත්, 3MCP සහ ග්ලයිසිඩෝල් මියන්ගේ ජානවලට හානි කරන පිළිකා කාරක ලෙස හඳුනාගෙන ඇත. මෙම රසායනික ද්‍රව්‍ය වකුගඩු පිළිකා සහ අනෙක් අවයවවල පිළිකා ඇති වීමට හේතු වේ. පිළිකා පිළිබඳ අන්තර්ජාතික පර්යේෂණ ආයතනය විසින් (3PDR) ග්ලයිසයිඩෝල් මිනිසුන්ට පිළිකා කාරක වියහැකි (Group 2 B) සහ මිනිසුන්ට පිළිකා කාරක (Group 2A) කාණ්ඩ ලෙස පිළිවෙළින් වර්ග කර ඇත.

සංවර්ධිත රටවල පාම් ඔයිල් ආහාරයට ගැනීම අඩු වී ඇත. 2018 දී යුරෝපයට ආනයනය කරන ලද පාම් ඔයිල්වලින් 50% ජෛව ඩීසල් ලෙස වාහන සඳහා භාවිත කරන ලදී. ශ්‍රී ලංකාවේ ආහාර කර්මාන්තය ලාභ උපරිම කරගැනීම සඳහා පිරිපහදු කළ ලාභ පාම් ඔයිල් භාවිතා කරනු ඇත. මේ නිසා අනාගතයේදී පිළිකා රෝගීන්ගේ තියුණු වැඩි වීමක් හේතුවෙන් රට දැඩි අර්බුදයකට පත් විය හැකිය. පාම් ඔයිල්වලින් භාණ්ඩාගාරය ලබා ගන්නා බදු මුදල්වලට වඩා වැඩි මුදලක් පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කිරීමට වැය විය හැකි බව අවධාරණය කරමි.

මහාචාර්ය සී. දීපාල් මැතිව්
ජෛව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යා දෙපාර්තමේන්තුව
වෛද්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය.
හිටපු සභාපති
ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය

ගොවිසෙත	සුපිරි වාසනා	ලග්න වාසනාව	කෝටිපති කප්රුක	සංවර්ධන වාසනාව	ජයෝදා	ශනිදා වාසනාව	සුපර් බෝල්	ජාතික සම්පත	අද කෝටිපති	වාසනා සම්පත	දරු දිරි සම්පත
2020 - 09 - 15	2020 - 09 - 14	2020 - 09 - 08	2020 - 09 - 06	2020 - 07 - 31	2020 - 09- 09	2020 - 09 - 09	2020 - 09- 07	2020 - 09-02	2020 - 09 - 09	2020 - 09 - 07	2020 - 07 - 30
දිනුම් වාරය - 2541	දිනුම් වාරය - 1535	දිනුම් වාරය - 2916	දිනුම් වාරය - 621	දිනුම් වාරය - 354	දිනුම් වාරය - 1688	දිනුම් වාරය - 3366	දිනුම් වාරය - 1208	දිනුම් වාරය - 1051	දිනුම් වාරය - 1036	දිනුම් වාරය - 1611	දිනුම් වාරය - 013
11 45 50 71	05 06 09 10	21 37 45 59	05 15 40 45	22 23 40	07 31 35 43	31 34 60 64	25 43 48 66	6 4 8 3 9 6	07 12 39 48	10 11 37 57	04 12 33 63
අක්ෂරය F	සුපිරි අංකය -04	ලග්නය-මිතුන විශේෂිත අංක	ඉංග්‍රීසි අක්ෂරය- Q	දෙවෙ අංකය - 02 අක්ෂරය- L	අක්ෂරය-A	අක්ෂරය - D	අක්ෂරය - U	අක්ෂරය -K	අක්ෂරය - K	අක්ෂරය - Z	අක්ෂරය - U
		රු 500 තෑග සඳහා-9609							රු 500 තෑග සඳහා-2169 රු 100 තෑග සඳහා-786		

පාඨලීගේ නඩුව 29දා

කුමුදු හෙට්ටිආරච්චි

තරුණයකු රිය අනතුරකට ලක් කර බරපතළ තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් වන නඩුවේදී ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් බොරු සාක්කි ගෙතීම ඇතුළු අධි චෝදනා 16ක් මත හිටපු ඇමැති පාඨලී චම්පික රණවක ඇතුළු විත්තිකරුවන් තිදෙනකුට එරෙහිව නීතිපතිවරයා පවරා ඇති නඩුවේ වැඩිදුරටත් කරුණු සලකා බැලීම සඳහා නඩුව ලබන 29 වැනිදාට යළි කැඳවීමට කොළඹ මහාධිකරණ විනිසුරු හිහාන් කුලතුංග මහතා ඊයේ (17) නියෝග කළේය. 2016/ 02/ 28 දින රාත්‍රියේ රාජගිරිය ප්‍රදේශයේ දී සිදු කළ මේ රිය අනතුර සම්බන්ධයෙන් බොරු සාක්කි ගෙතීම ඇතුළු අධි චෝදනා මත හිටපු ඇමැති පාඨලී චම්පික රණවක, ඔහුගේ රියැදුරු දිලුම් කුසිත කුමාර හා එවකට වැලිකඩ පොලිසියේ හිටපු ස්ථානාධිපති සුදත් අස්මඩල යන විත්තිකරුවන්ට එරෙහිව නීතිපතිවරයා මේ නඩුව පවරා ඇත.

අංගොඩ ලොක්කා මැරුණේ පපුවේ අමාරුවකින්

ඉන්දීය මධ්‍යම අපරාධ කාර්යාංශය

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවෙන් පලා ගොස් වෙනත් නමකින් ඉන්දියාවේ වාසය කළ මෙරට සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයකු වන ලසන්ත චන්දන පෙරේරා හෙවත් අංගොඩ ලොක්කා නැමැති අපරාධකරු කොයිම්බතූර්හි දී මිය ගොස් ඇත්තේ හෘදයාබාධයකින් බවට ඉන්දීය මධ්‍යම අපරාධ කාර්යාංශය ප්‍රකාශ කර තිබේ.

ඒ අනුව අංගොඩ ලොක්කාගේ මරණය විෂ ශරීර ගතවීමක් හෝ සැකකටයුතු හේතුවක් මත සිදුවුවක් නොවන බවට අනාවරණය කරගෙන තිබෙන බවද අදාළ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා පදනම් කර ගනිමින් මේ බව ප්‍රකාශ කර තිබේ.

ශ්‍රී ලංකාවෙන් පලා ගොස් වෙනත් නමකින් ඉන්දියාවේ වාසය කළ මෙරට සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයකු වන ලසන්ත චන්දන පෙරේරා හෙවත් අංගොඩ ලොක්කා නැමැති අපරාධකරු කොයිම්බතූර්හි දී මිය ගොස් ඇත්තේ හෘදයාබාධයකින් බවට ඉන්දීය මධ්‍යම අපරාධ කාර්යාංශය ප්‍රකාශ කර තිබේ.

කොයිම්බතූර් හි වෙරන් මා නගර් අසල බාලාජී නගර් හි කුලී නිවෙසක අංගොඩ ලොක්කා සමඟ ජීවත් වූ අමානි තන්ජී නම් ශ්‍රී ලාංකික කාන්තාවගේ මූලික ප්‍රකාශයට අනුව ජූලි 3 වැනි දින රාත්‍රියේ ඔහුට පපුවේ වේදනාවක් ඇති වී තිබෙන අතර, අංගොඩ ලොක්කා කොයිම්බතූර් හි ජීවත් වූයේ ප්‍රදීප් සිං නමැති ව්‍යාජ නාමයෙන් බවට හෙළිව තිබේ. පසුගිය ජූනි මස 03 වැනිදා කොයිම්බර්තූර්හි රෝහලක දී මිය ගිය බවට වාර්තා වූ අංගොඩ ලොක්කාගේ මරණය විෂ ශරීරගතවීමකින් සිදුවූවක් බවට විවිධ වාර්තා පළවී තිබෙන නමුත් සිදු කළ පරීක්ෂණවල දී එම මරණය ස්වභාවික හේතුවක් මත සිදුවූවක් බවට නියමනය කළ හැකි බවද ඉන්දීය මධ්‍යම අපරාධ කාර්යාංශය සඳහන් කර තිබේ. ඔහුගේ මිතුරියන් වන මදුරෙයි හි ඩී. සිවකමසුන්දරි සහ තංජ් ජූලි 5 වැනි දින පළමු පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු අංගොඩ ලොක්කාගේ දේහය මදුරෙයි වෙත ගෙන ගොස් එහි ආදාහනය කර ඇති බවට වාර්තා වූ අතර, මේ සිද්ධිය හා ව්‍යාජ ලියකියවිලි සැකසීම යන චෝදනා මත එම දෙදෙනා ඇතුළු තුන් දෙනෙකු අගෝස්තු 2 වැනිදා ඉන්දීය පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

දිනමිණ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදිනී චන්ද්‍රිකාගේ පියා අභාවප්‍රාප්ත වෙයි

දිනමිණ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදිනී චන්ද්‍රිකා පෙරේරා මහත්මියගේ පියාණන් වූ ඒ.එල්.බී පෙරේරා (87) මහතා ඊයේ (17) අභාවප්‍රාප්ත විය.

දේහය 242/1, සම්පායවත්ත, මොරගොඩ, ගම්පහ නිවෙසේ තැන්පත් කර ඇත. දේහය පිළිබඳ අවසන් කටයුතු හෙට (19) දින පස්වරු 3.00ට ගම්පහ මොරගොඩ පොදු සුසාන භූමියේදී සිදුකෙරේ.

ටිල්වින් සිල්වාගේ මව කලුරිය කරයි

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මහතාගේ මව වන දිස්ලින් පෙරේරා වික්‍රමරත්න මහත්මිය ඊයේ (17) දින අභාවප්‍රාප්ත වූවාය. දේහය පිළිබඳ අවසන් කටයුතු අලුත්ගම පොදු සුසාන භූමියේදී හෙට (19) පස්වරු 04.00ට සිදු කෙරේ.

කිංග්ස්බරි ප්‍රහාරයට සැක 13කගෙන් ප්‍රශ්න කරනවා

සීඅයිඩිය අධිකරණයට කියයි

සුභාෂිණී සේනානායක

පාස්කු ඉරු දිනයේ කොළඹ කිංග්ස්බරි හෝටලයට ප්‍රහාරයක් එල්ල කිරීමට සම්බන්ධ සැකකරුවන් 13 දෙනෙක් රඳවා ප්‍රශ්න කරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඊයේ (17) දැනුම් දුන්නේය.

මේ සැකකරුවන් ප්‍රහාරයට සෘජුවම සම්බන්ධ වී ඇති බවට මෙතෙක් කළ විමර්ශනවලින් අනාවරණය වී ඇති බවද රහස් පොලිසිය අධිකරණයට කියා සිටියේය.

මේ සැකකරුවන් විවිධ අධිකරණ භාරයේ බන්ධනාගාරගත කර ඇති බව කියා සිටි රහස් පොලිසිය මාවනැල්ල බුදු පිළිම කඩා විනාශ කර දැමූ සිද්ධියට සම්බන්ධ සැකකරුවකුද රඳවා ප්‍රශ්න කරමින් සිටින බවද අධිකරණයට දැනුම් දුන්නේය. රහස් පොලිසිය මේ බව කියා සිටියේ සිද්ධියට අදාළ නඩුව ඊයේ (17) කැඳවූ අවස්ථාවේදී කොලඹ වැඩ බලන මහේස්ත්‍රාත් ශලනි පෙරේරා මහත්මිය හමුවේදීය.

ආනයනික භාණ්ඩ කාණ්ඩ 03කට බෙදයි

බුද්ධිකා ඉඹුලාන සහ සිතාරා සේනානි

ආනයන විධිමත් කිරීම සඳහා ආනයනික භාණ්ඩ කාණ්ඩ 03කට වර්ගීකරණය කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතිය හිමිවී ඇත.

ඒ අනුව දේශීයව වගා කළ හැකි හෝ නිෂ්පාදනය කළ හැකි අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ, වෙළෙඳ භාණ්ඩ සහ මෝටර් වාහන ආනයනය තාවකාලිකව අත්හිටුවීම සිදු කෙරේ.

නිවි ඩයමන්ඩ් කපිතාන්ට නොතිසි

සිරන්ජනි කුමාරි

ශ්‍රී ලංකාවට ආසන්න මුහුදු සීමාවේදී ගිනිගත් එම ටී නිවි ඩයමන්ඩ් නෞකාවේ කපිතාන්ට මේ මස 28 වන දින අධිකරණයේ පෙනී සිටින ලෙස දන්වමින් කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (17) නොතිසි නිකුත් කළේය.

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ 25, 26, 38 හා 53 වගන්ති උල්ලංඝනය කරමින් දඩුවම්ලැබිය හැකි වරදක් සිදුකර ඇති බවට ප්‍රමාණවත් සාක්කි ඇතැයි නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පිරිස් මහතා අධිකරණයට සැලකළ කරුණු සලකා මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය නිකුත් කළේය.

ග්‍රීක ජාතික නිරෝස් ඉලියාස්(60) යන කපිතාන්ගෙන් අධිකරණ නියෝග අනුව ප්‍රකාශ ලබාගෙන ඇති අතර ඔහු 1984 නාවික රැකියාවට බැඳී වසර 10කට පසුව ප්‍රථම තෙල් නැව් ගමන ලෙස 2019 .08.20 මෙම ගමන සිදුකර ඇත.

නෞකාවේ තිබී 6.5 KM දිග තෙල් පැල්ලමක් රජයේ රස පරීක්ෂක වෙත යොමු කර විමර්ශන වාර්තාවක් ලබා ගත් බව ත් එහි තෙල් මිශ්‍රිත පෙට්‍රල් සහිත ඝන තෙල් තට්ටුවක් නැවේ තිබුණු බවත් නැවේ බොර තෙල් කාන්දුවී නමැති අතර පැහැදිලිව සමුද්‍ර දූෂණයක් සිදුව ඇති බවට එහි සඳහන්ය. රු.මිලියන 340 වන්දියක් රජය විසින් ඉල්ලා ඇති බව සඳහන් කළ සොලිසිටර් ජනරාල්වරයා ගිනිගත් නෞකාව දමා බෝට්ටු මාර්ගයෙන් මොහු පලායාමට තැත් කළ බවට සාධාරණ සැකයෙන් තොරව චෝදනා මොහුට ඉදිරිපත් කළහැකි බව සඳහන් කළේය. අදාළ කරුණු සලකා බැලූ මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය නිකුත් කළේය.

කැනඩාවට පනින්න ගිය 13ක් අල්ලයි

චන්ද්‍රිකා පෙරේරා

ව්‍යාජ වීසා මගින් කැනඩාවට පලා යෑමට උත්සාහ කළ පුද්ගලයන් හතක් සහ කත්තාවන් පහක් ඇතුළු 13ක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවකටුනායක අන්තර්ජාතික ගුවන්තොටුපොළේදී පෙරේදා (16) අලුයම අත්අඩංගුවට ගෙන ඇත.

මේ පිරිස අතර විදේශයට පලා යෑමට සැලසුම් සකස් කළ කාන්තාවද අත්අඩංගුවට පත්ව තිබේ.

අත්අඩංගුවට පත්වූවන් කිරිබත්ගොඩ, පමුණුගම, කෑගල්ල, මාවතැල්ල, පොල්ගහවෙල, අලවතුගොඩ, තුඹගොඩ සහ පිළියන්දල ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

මේ පිරිස දේහා කටාර් රාජ්‍යයට ගොස් ඒ හරහා කැනඩාවට යෑමට අවශ්‍ය ලෙස ව්‍යාජව වීසා සකසා ගෙන තිබුණු බව රහස් පොලිසිය සඳහන් කළේය. මෙසේ රටින් පැන යෑමට සැලසුම් කළ කාන්තාව බත්තරමුල්ල, කත්දේවත්ත පාර, පස් වැනි පටුමග ප්‍රදේශයේ පදිංචි තැනැත්තියක් බවට හඳුනාගෙන ඇත.

මේ සැකකාරිය භාෂා පුහුණු හා වීසා ලබා දෙන ආයතනයක් පවත්වාගෙන ගොස් ඇති බව අනාවරණය වී තිබේ. අත්අඩංගුවට පත් සැකකරුවන් සහ සැකකාරියන් මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු විදේශයට පලා යෑමට සැලසුම් කළ ප්‍රධාන සැකකාරිය ලබන 29 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කර තිබේ. අනෙක් සැකකරුවන් සහ සැකකාරියන් රුපියල් ලක්ෂ හය බැගින් වූ ශරීර ඇප මත මුදා හැර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ පිළිබඳ වැඩි දුර පරීක්ෂණ පවත්වයි.

01 වැනි පිටුවෙන්...

20ට විරුද්ධ වෙන්න ...

ඒකාධිපති විධායක බලය පාවිච්චි කර පළමුව පහර දී තිබෙන්නේ ආණ්ඩු පක්ෂයට බව පැවසූ ඒ මහතා තමන්ගේ හෘද සාක්ෂියට එකඟව ප්‍රජාතන්ත්‍රවාදය හා රටේ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සිටගන්න යැයි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින අතර, තමන්ට හැකි සෑම ක්ෂේත්‍රයකදීම මේ ඒකාධිපති 20 වැනි සංශෝධනයට එරෙහි වන ලෙසත් එය පරාජය කිරීමට පෙළ ගැසෙන ලෙසත් ජනතාවගෙන් ඉල්ලා සිටින බව කියා සිටියේය.

සැප්තැම්බර් මස දෙවැනිදා කැබිනට් මණ්ඩලය විසින් 20 වැනි සංශෝධනය අනුමත කරන ලද බව ප්‍රකාශයට පත් කළද ඔවුන් කිසිවකු මෙය අධ්‍යයනය කර නොමැති බව අගමැතිවරයා විසින් මෙය අධ්‍යයනය කිරීම සඳහා පත් කළ කම්ටුවෙහි කැබිනට් ඇමැතිවරු පස් දෙනකු සිටීමෙන් පැහැදිලි වන බවත් කම්ටු වාර්තාව ලැබීමෙන් පසුව ද කිසිවකු නව සංශෝධන පිළිබඳ කථා කිරීමට ඊයේ පැවති කැබිනට් මණ්ඩලයේ දී ඉදිරිපත් වී නැති බවත් පැවසීය.

එජාප නව නායකයා ...

රනිල් වික්‍රමසිංහ මහතාගේ කාර්යාලයේදී පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් කිහිප දෙනකු සමඟ පැවති සාකච්ඡාවකදී ඔහු මේ බව පවසා තිබේ.

තමාට දිගටම නායකත්වයේ සිටීමට අවශ්‍යතාවක් නොමැති බවත් සිය පෞද්ගලික ජීවිතයේ කටයුතු ගැන සොයා බැලීමට මෙන්ම පොත් කිහිපයක් ලිවීමට සූදානම් වන හෙයින්ද ඉක්මනින් විවේකයක් අවශ්‍ය බවත් රනිල් වික්‍රමසිංහ මහතා එහිදී සිය සඟයන් සමඟ ප්‍රකාශ කර තිබේ.

පක්ෂයේ නියෝජ්‍ය නායකයා තෝරන අවස්ථාවේදී වජිර අබේවර්ධන මහතා පක්ෂයේ සමඟිය ආරක්ෂා කිරීමට ක්‍රියා කළ ආකාරය පිළිබඳ වික්‍රමසිංහ මහතා මෙහිදී සිය ප්‍රශංසාව පළ කර තිබේ.

නියෝජ්‍ය නායකයා තේරීමේදී ඡන්දයකට නොගොස් පක්ෂ නායකයාට සුදුසු තීන්දුවක් ගැනීමට ඉඩ දිය යුතු බවත් ඡන්දයක් පවත්වා පක්ෂය භේද නොකළ යුතු බවත් වජිර අබේවර්ධන මහතා කෘත්‍යාධිකාරි මණ්ඩල රැස්වීමේදී යෝජනා කර තිබිණි. එහෙත් වැඩි දෙනාගේ අදහස අනුව රහස් ඡන්දයක් පැවැත්වීමට සිදු විය.

සමාජ මාධ්‍ය වීඩියෝව ...

මේ වීඩියෝවට අදාළ සිද්ධිය වී ඇත්තේ 2015 වසරේදී බව පෙන්වා දුන් කරුණාරත්න මහතා එම පරීක්ෂණවලට මැදිහත්වීමට තමන්ට කිසිදු අවශ්‍යතාවක් නැති බවත් අවධාරණය කළේය.

මේ සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු ආකාරයක පැමිණිල්ලක් අධිකාරිය වෙත ලැබී නැති බවත්, තමන් සභාපති ධුරයට පත්වීමටත් පෙර සිදුවූ මේ සිද්ධිය සම්බන්ධයෙන් තමාගේ කිසිදු සබඳතාවක් නොමැති බවත් කරුණාරත්න මහතා කීය.



ඩී.එම්.පී. දිසානායක මාතාව

(විශ්‍රාමලත් පාඨශාලාචාරිනී)

නැසිගිය හේමචන්ද්‍ර මුණසිංහ මහතාගේ ආදරණීය භාර්යාව වූද, වෛද්‍ය අමිතා මුණසිංහ (සඳලංකා දිසා රෝහල), අමිත් මුණසිංහ (එක්සත් ජනපදය), සුදත් මුණසිංහ (එක්සත් ජනපදය) යන අයගේ ආදරණීය මැණියන් වූද, වෛද්‍ය එස්. කුලතුංග (රජයේ ආයුර්වේද මධ්‍යස්ථානය, වෙල්පල්ල), රත්නමාලි ඕමත්ත විතාන (එක්සත් ජනපදය), ආචාර්ය අජ්සරා මුණසිංහ (එක්සත් ජනපදය) යන අයගේ ආදරණීය නැන්දණිය වූද, ඩී.එම්.පී. දිසානායක මාතාව 2020.09.16 දින පරලෝ සැපත් වූවාය.

අවසන් කටයුතු 2020.09.18 දින ප.ව. 5.00 ට යෝගියාන පොදු සුසාන භූමියේ දී සිදු කෙරේ.

"මෙත් සිසිල", මාකඳුර, ගෝනවිල.

අනාගතයේ...

චීන ජනාධිපති ෂී ජින් පින් සහ එවකට මෙරට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්වරු 2014 සැප්තැම්බර් මස 17 වැනි දා වැඩ ආරම්භ කළ කොළඹ වරාය නගරයට වැය කෙරෙන මුදල් ඩොලර් බිලියන 15කි. එමගින් රැකියා 83,000ක් උත්පාදනය කෙරේ.

වරාය නගරය වෙනුවෙන් හෙක්ටයාර 269ක් මුහුදු ගොඩ කර භූමිය සකසා ඇති අතර, කිලෝමීටර 3. 2ක් දිගු වන දිය කඩනයේ ඉදිකිරීම් මේ වන විට අවසන් කර තිබේ.

වරාය නගරයේ සැහැල්ලු යාත්‍රාංගණය, පොදු වෙරළ තීරය නිරීක්ෂණය කළ අග්‍රාමාත්‍යවරයා එහි ස්ථාපිත වන ඇක්වා ගෝල්ෆ් ක්‍රීඩා පිටියට පැමිණ ගොල්ෆ් ක්‍රීඩාවේ ද නිරත විය.

අනතුරුව වරාය නගර මධ්‍ය උද්‍යානයේ අග්‍රාමාත්‍යවරයා විසින් මැයි මාර ගසක් රෝපණය කරන ලදි. ඉදිවෙමින් පවතින වරාය නගරයේ ආදර්ශ ආකෘතිය සහිත ප්‍රදර්ශන පීඨයට ගිය අග්‍රාමාත්‍යවරයා දැනට සිදුවන ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය වන ආකාරය ගැන විමසා සිටියේය.

පසුගිය පාලන කාලයේ යම් යම් සිදුවීම් නිසා වසර දෙකක පමණ කාලයක් වරාය නගරයේ ඉදිකිරීම් ප්‍රමාද වූ බව පෙන්වා දුන් අග්‍රාමාත්‍යවරයා දැන් නැවත වරක් එහි ඉදිකිරීම් අරඹා තිබෙන බව ප්‍රකාශ කළේය.

මේ රට මුහුදු බාදනයට ලක් වන බව කුඩා කල පටන් අසා තිබුණු නමුත් පළමු වතාවට මුහුදු රටට එකතු කරන්නට හැකි වුණේ කොළඹ වරාය නගරය ඉදිකිරීම මගින් බවත් රාජපක්ෂ මහතා පැවසීය.

කොළඹ වරාය නගරය ඉදිකිරීමට දුන් සහයට චීන රජය ස්තුතිවන්ත වන බව පැවසූ රාජපක්ෂ මහතා චීන කොමියුනිස්ට් පක්ෂයේ සිය වැනි සංවත්සරයට මෙන්ම ඔක්තෝබර් 01 දිනට යෙදෙන චීනයේ ජාතික නිදහස් දිනයටත් සුබපැතීමට මෙය අවස්ථාවක් කරගත්තේය.

මෙම අවස්ථාවට විදේශ කටයුතු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ, වරාය හා නාවික අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන, මුදල් රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල්, ශ්‍රී ලංකාවේ වැඩ බලන චීන තානාපති හූ වෙයි,කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ කළමනාකරණ අධ්‍යක්ෂ ජියන් හෝයි ලින්ග් මහත්වරු ඇතුළු වරාය නගර ව්‍යාපෘතියේ නිලධාරීන් රැසක් එක්ව සිටියහ.

ආකල්ප වෙනසක් සමඟ...

ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් පිළිබඳ ඊයේ (17) පස්වරුවේ ජනාධිපති කාර්යාලයේ පැවැති සාකච්ඡාවේ දී රාජපක්ෂ මහතා මේ බව පැවැසීය. "සෑම පවුලකටම සුව පහසු නිවසක්" හිමිකර දීම "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ අපේක්ෂාවක්. නිවසක අවශ්‍යතාව තිබුණත් එය තනිව සපුරාගත නොහැකිවීම බහුතරයකට ඇති ගැටලුවක්. නාගරික, ග්‍රාමීය සහ වතු ජනතාවගේ නිවාස හිඟය විසඳිය යුත්තේ ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ යන අයුරින් යැයි රාජපක්ෂ මහතා අවධාරණය කළේය. "ඔබට ගෙයක්, රටට හෙටක්" සංකල්පය තේමා කර ගනිමින් තම අමාත්‍යාංශය දැනටමත් රට පුරා පවුල් පන්ලක්ෂ විසි හය දහසකට අධික සංඛ්‍යාවකට වැසිකිළි නැති බව පෙන්වා දුන් ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතා සනීපාරක්ෂක පහසුකම් සම්පාදනය කඩිනම් කරන්නැයි කියා සිටියේය.

පැරණි මහල් නිවාස සංකීර්ණවල මලාපවහන පද්ධති නඩත්තු කළ යුතුව ඇතැයි ඉන්දික අනුරුද්ධ රාජ්‍ය අමාත්‍යවරයා සඳහන් කළේය. ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව යළි පණ ගැන්විය යුතු බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා කීය. සංස්ථාවේ ප්‍රාදේශීය ශාඛා ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන නියෝජිතයකු ලෙස යොදාගත යුතු යැයි ජනාධිපතිවරයා යෝජනා කළේය. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය යන ආයතනවල වත්මන් තත්ත්වය සහ ඒවා සංවර්ධනයට ගතයුතු ක්‍රියාමාර්ග දීර්ඝ සාකච්ඡාවට ලක් විය. ඉදිකිරීම්, කෘෂිකර්ම සහ ක්‍රීඩා ක්ෂේත්‍රවල පෙරළියක් ඉදිරි වසරේ සිට අපේක්ෂා කරන බැවින් මේ සියලු ආයතන දැඩි උද්යෝගයකින් සේවා සම්පාදනය කළ යුතු බව බැසිල් රාජපක්ෂ මහතා අවධාරණය කළේය. නිවාස, මාර්ග, පාලම් සහ වැවි විශාල සංඛ්‍යාවක් ඉදිකිරීමට හා ප්‍රතිසංස්කරණයට රජය සැලසුම් කර තිබේ. නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතේ ඇති සියලු රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන ඉදිකිරීම්වලට දායක කර ගන්නැයි ජනාධිපතිවරයා නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර මහතා, කැබිනට් සහ රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරු, රේඛීය ආයතනවල ප්‍රධානීහු සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පෞද්ගලික ආයෝජකයෝ ඇතුළු පිරිසක් සාකච්ඡාවට එක්ව සිටියහ.

විජයකලා මහේශ්වරන්...

හිටපු මන්ත්‍රීනී විජයකලා මහේශ්වරන් මහත්මිය ද එම අවස්ථාවේ වගඋත්තරකාරියක ලෙස කොමිසම ඉදිරියේ පෙනී සිටියාය.

බොරු සාක්ෂි මත නඩු පවරා දේශපාලන පළිගැනීමක් සිදු කළ බවට සඳහන් කරමින් හිටපු පොලිස් සැරයන් ඥානලිංගම් මයුරන් මහතා මෙම පැමිණිල්ල ගොනු කර තිබිණි.

2015 මැයි 17 දින වේලන් හන්දියේදී ලයිට් කණුවක බැඳ ජනතාව විසින් පහර දෙන ශෂී කුමාර්ව බේරාගන්නා අයුරු එම විඩියෝ දර්ශනයෙන් දිස් විය.

හිටපු මන්ත්‍රීවරිය සැකකරුව පොලීසියකට බාර නොදී මුදහැරිය බව මයුරන් මහතා පැවැසීය.

අයවැය ...

2021 වර්ෂය සඳහා වන අයවැය පිළියෙළ කිරීමේ දී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති රාමුව මුදල් ඇමැතිවරයා වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ බවද ඇමැතිවරයා කීවේය.

ඊයේ (17) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවට එක්වෙමින් ඇමැතිවරයා මේ බැව් අනාවරණය කළේය.

ඒ අනුව 'සෞභාග්‍යයේ දැක්ම' රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් අපේක්ෂිත ප්‍රතිඵල අත් කර ගැනීම සඳහා අවශ්‍ය සම්පත් වෙන් කිරීම, අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ වෙත විෂයන් පැවරීමට අදාළව තිකුත් කරන ලද ගැසට් නිවේදනයේ සඳහන් පරිදි අදාළ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සම්පත් වෙන් කිරීම, සැමට පානීය ජලය ලබා දීම, මුළු දිවයිනම ආවරණය වන පරිදි කිලෝමීටර 100,000ක මාර්ග පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, ජලජ සම්පත් සහ චාරිමාර්ග යන ක්ෂේත්‍ර සඳහා ප්‍රමුඛතාව ලබා දීම, රාජ්‍ය ආදායම 2021 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදනයෙන් 10. 2%ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තුගත කර ඇති බැවින් එම තත්ත්වය යටතේ වියදම් කළමනාකරණ ක්‍රමවේද අනුගමනය කරමින් ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කරමින් රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා සම්පත් වෙන් කිරීම, රජයේ කටයුතු ඩිජිටල්කරණය කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම, සම්පත් අඩු ප්‍රමාණයක් යොදවමින් වඩාත් ඵලදායී ප්‍රතිඵල අත් කර ගැනීමට හැකි වන පරිදි දැනට පවත්නා ක්‍රමවේද සමාලෝචනය කර සරල ක්‍රමවේද වෙත යොමු වීම කෙරෙහි අවධානය යොමු කිරීම, කරුණුවලට ප්‍රමුඛතාව දීමට තියමිතය.

මේ ප්‍රතිපත්තිය මත පදනම්ව 2021 විසර්ජන පනත කෙටුම්පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා මුදල් ඇමැතිවරයා වශයෙන් අග්‍රාමාත්‍යවරයා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

රස පරීක්ෂක වාර්තා ...

මේ තඩු කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් හයදහසකට අධික පිරිසක් රක්ෂිත බන්ධනාගාරගතව සිටින බවත් මේ තත්ත්වය කඩිනමින් වෙනස් විය යුතු බවත් අමාත්‍යාංශ ලේකම්වරයා සඳහන් කළේය.

මීට පෙර තමන් අධිකරණ අමාත්‍යාංශ ලේකම්වරයා ලෙස කටයුතු කළ බැවින් තමන් මේ සම්බන්ධයෙන් දන්නා බවත් මෙරට තිබෙන බන්ධනාගාර තිස්එක තුළ සිටිය හැක්කේ 12,000ක් වැනි සංඛ්‍යාවක් වුවද අද වන විට 26,000ක් වැනි සංඛ්‍යාවක් බන්ධනාගාරගතව සිටින බවත් ජේ. ජේ. රත්නසිරි මහතා පැවසීය.

බන්ධනාගාර තුළ සිටින සංඛ්‍යාව මෙලෙස අධි ධාරිතාවක් දක්වා වර්ධනයවීමට බලපා ඇති මූලික හේතුවක් ලෙස රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් සිදු විය යුතු පරීක්ෂණ කලට වෙලාවට සිදු නොවීම මූලික ලෙස බලපා ඇති බවද ලේකම්වරයා පැවසීය. එබැවින් සිය කාර්යයන් තිසි පරිදි පවත්වාගෙන යෑම රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වගකීමක් බවද ලේකම්වරයා අවධාරණය කළේය.

අමාත්‍යාංශ ලේකම් ජේ. ජේ. රත්නසිරි මහතා මේ බව සඳහන් කළේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සඳහා නව පත්වීම් ලැබූ පිරිසක් වෙනුවෙන් පත්වීම් ලබාදීම සඳහා එම අමාත්‍යාංශයේ දී ඊයේ (17) පැවැති උත්සවයකට සහභාගී වෙමිනි.

එහිදී අදහස් දැක්වූ අමාත්‍යාංශ ලේකම්වරයා මෙසේද පැවසීය. රජයේ මූලික කාර්යභාරයක් බවට පත්ව තිබෙන්නේ මත් උවදුරන් රට මුදු ගැනීම. අපි දන්නවා අද තොග පිටින් මත්ද්‍රව්‍ය

ජනපතිතුමා

අනගාරික ධර්මපාල කෙනකු මෙන් ක්‍රියා කරයි කියා සිතෙනවා

ලෝකය පුරා බුදු දහම ව්‍යාප්ත කරන්නේ අපේ රටේ ඉපදුණ අය බව බානගල උපතිස්ස හිමියෝ කියති



උපාලි කරුණාරත්න සහ බොරැල්ල විශේෂ

වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අනගාරික ධර්මපාලතුමා වගේ ක්‍රියා කරයි කියා තමාට සිතෙන බව ශ්‍රී ලංකා මහා බෝධි සමාගමේ සභාපති ජපානයේ ප්‍රධාන සංඝනායක බානගල උපතිස්ස නාහිමියෝ ප්‍රකාශ කළහ.

උන් වහන්සේ එසේ ප්‍රකාශ කෙළේ, ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 156 වැනි ජන්ම සමරුම් උත්සවට ඊයේ (17) පෙරවරුවේ සහභාගි වෙමිනි.

මෙම උත්සවය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ මරදාන මහාබෝධි අග්‍රශ්‍රාවක විහාරයේ දී පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහානායක ඉත්තෑපානේ ධම්මාලංකාර නාහිමි ඇතුළු නායක හිමිවරුන්, දෙස් විදෙස් භික්ෂු භික්ෂුණීන් වහන්සේ, මැති ඇමැතිවරුන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.

ජනාධිපතිවරයා විහාරස්ථානය වෙත පැමිණීමෙන් අනතුරුව බුදු රජාණන් වහන්සේට මල් පහන් පුදා සැරියුත් මුගලන් අග්‍ර ශ්‍රාවක ධාතූන් වහන්සේ වන්දනා මාන කෙළේය. මෙහිදී අග්‍ර ශ්‍රාවක ධාතූන් වහන්සේ තැන්පත් කැර තිබෙන කරඬුව ජනාධිපතිවරයාගේ හිස මත තබා මහා සංඝරත්නය ආශිර්වාද කළ අතර සංඝරත්නය සෙත් පිරිත් සජ්ඣායනය කර ජනාධිපතිවරයාට මෙහිදී පිරිත් නූලක් බැන්දේය. අනතුරුව අනගාරික ධර්මපාල පිළිරුවට මල් තබා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් උපහාර දක්වන ලදී. මොනරාගල පඤ්ඤාලංකාර හිමියන් අනතුරුව ධාතූන් වහන්සේ උදෙසා පූජාවක් පැවැත්වූහ.

තව දුරටත් අදහස් දැක්වූ ශ්‍රී ලංකා මහා බෝධි සමාගමේ සභාපති, ජපානයේ ප්‍රධාන සංඝනායක බානගල උපතිස්ස නාහිමියෝ මෙසේද පැවසූහ.

"ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 156 වැනි ජන්ම දිනය අද අප සමරනවා. මම මේ වන විට ධර්මපාලතුමාගේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑමට කටයුතු කරනවා. ඒ සම්බන්ධයෙන් මා වෙත වගකීමක් පැවරී තිබෙන බවද විශ්වාස කරනවා.

ධර්මපාල හාමුදුරුවෝ අපවත් වූ විට මහා කවි රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ ශෝක පණිවිඩයක් තිබුණා. එහි තිබෙනවා අනගාරික ධර්මපාල කියන ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයාට දැක්විය හැකි ලොකුම සැලකිල්ල බෞද්ධ විශ්වවිද්‍යාලයක් හැදීම බව. ඒ සඳහා අප කටයුතු කළා. ධර්මපාලතුමා සිව් වතාවක් ජපානයට ගියා. තවත් රටවල සංචාරය කළා. එම සෑම රටකම බෞද්ධ ධර්මය ස්ථාපිත කරන්න විවිධ දේ සිදු කෙරුවා.

මට වත්මන් ජනාධිපතිතුමා මුලින්ම මුණ ගැසුණේ මිහිඳු මහ රහතන් වහන්සේත් සංඝමිත්තා මහ තෙරණියත් වැඩ සිටි සාංචි පුද බිමේදී. මම එදා සිතුවා කවද හරි එතුමාට පූර්ණ සහයෝගය දෙන බව. ලාංකික බෞද්ධයන් බොහෝ දෙනෙක් මගෙන් වැඩ ගත්තේ නැහැ. මම සිතනවා ජනාධිපතිතුමා සමඟ දම්පල් මඟ ඔස්සේ ඉදිරියට යා හැකි බව.

අද දින මෝදි අගමැතිතුමාටත් මා සුබ පතනවා. එතුමාත් ධර්මපාල චින්තනය අගය කරන කෙනෙක්. අපේ රටේ ඉපදුණ පුද්ගලයන් තමා ලෝකයේ බොහෝ රටවල බුදු දහම ව්‍යාප්ත කරන්නේ. මෙම විහාරස්ථානය රටටම අයිති ස්ථානයක්. මෙහි අප කෞතුකාගාරයක් නිර්මාණය කළ යුතුයි. ඒ සඳහා සහයෝගය ඉල්ලා සිටිනවා.

මොනරාගල පඤ්ඤාලංකාර හිමියෝ-

සැරියුත්, මුගලන් මහ රහතන් වහන්සේගේ ධාතූන් වහන්සේ ඉන්දියාවේ සාංචි චේතියගිරි විහාරයේ ස්තූපයක තිබී සොයා ගත්තා. පසුව එංගලන්තයේදී කාබන් පරීක්ෂාවට ලක් කළා. පසුව අපට එම ධාතූන් වහන්සේලා ලැබුණා.

ධර්මපාලතුමා ඇතුළු සම්බුද්ධ සාසනය රැක ගැනීමට ක්‍රියා කළ සියලු දෙනාම මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ඒ වගේම සෞභාග්‍යවත් රටක් නිර්මාණය කිරීමට කටයුතු කරන ජනාධිපතිතුමන් කරන කාර්යයට අපෙන් ඉටු විය යුතු ක්‍රියාකාරකම් අප සිදු කරනවා."

මෙහිදී ධර්මපාලතුමාගේ 156 වැනි ජන්ම දිනය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් 500ක සමරු කාසියක්ද නිකුත් කරන ලද අතර එය මෙහිදී ජනාධිපතුතුමාට පිළිගන්වන ලදී. සමරු ඵලක ප්‍රධානය, සුපිෂ්පිත වන යුග මෙහෙවර කෘතිය පිළිගැන්වීම, දේශීය නිෂ්පාදිත බයිසිකලයක් ප්‍රදානය, රිලැක්ස් ටී.වී නාලිකාව එළි දැක්වීම මෙහිදී සිදු විය.

ඡායාරූප - සුලෝචන ගමගේ

ඩිජිටල්කරණය වූ කොටස් වෙළෙඳපොළ අගමැති අතින් ජනගත වෙයි

කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව එක්ව හඳුන්වා දෙන ලද ඩිජිටල්කරණය වූ කොළඹ කොටස් වෙළෙඳපොළ ජනගත කිරීමේ උත්සවය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ කොටස් හුවමාරු පරිශ්‍රයේ දී ඊයේ (17) පැවැත්විණි.

'අනාගතයට අධි පිම්මක් '(Hyper leap to the future) යන තේමාව යටතේ සංවිධානය කැර තිබූ මෙම සැමරුම් උත්සවය සඳහා එක්වුණු අගමැති මහින්ද රාජපක්ෂ මහතා, ඩිජිටල්කරණය වූ කොළඹ කොටස් වෙළෙඳපොළ විවෘත කිරීමේ අවස්ථාවට එක් විය.

මෙහිදී සමරු සටහනක් තැබූ අගමැති මහින්ද රාජපක්ෂ මහතා කොළඹ කොටස් වෙළෙඳපොළ හඳුන්වා දුන් නව වෙබ් අඩවිය අන්තර්ජාලයට මුදා හැරියේය.

ඩිජිටල්කරණ වැඩසටහන මඟින් නව ආයෝජකයන්ට ගාඛා කාර්යාලයකට නොගොස් මධ්‍යම තැන්පතු ගිණුමක් විවෘත කිරීමට අවස්ථාව හිමි වේ.

ඒ අනුව කොළඹ කොටස් හුවමාරුව (CSE) ජංගම දුරකතන යෙදුම මඟින් දිවයින පුරා විසිරී සිටින ආයෝජකයන්ට කොටස් වෙළෙඳපොළ හෝ තැරැව්කාර ආයතනවලට යෑමකින් තොරව ගිණුම් ආරම්භ කිරීමේ පහසුව සලසා දී තිබේ. එමඟින් නව ආයෝජකන්ට කොටස් ගනුදෙනු සඳහා අවතීර්ණ වීම කෙරෙහි බාධාවක්ව පැවති දුරස්ථභාවයේ ගැටලු මඟහැරී යනු ඇත.

ඩිජිටල්කරණ ව්‍යාපෘතියට සමගාමීව විශාල තොරතුරු ප්‍රමාණයක් අන්තර්ගත කරමින් කොළඹ කොටස් හුවමාරුව (CSE), SEC, CDS වෙබ් අඩවිය නවයකරණයට ලක් කර තිබේ. ඒ යටතේ ආයෝජන, අධ්‍යාපන හා මූල්‍ය සාක්ෂරතාව අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හඳුන්වා දෙන You Tube නාළිකාවද එළි දක්වන ලදී.

කොළඹ කොටස් හුවමාරුවෙහි ජංගම දුරකතන යෙදුමෙහි නවතම සංස්කරණය ඔස්සේ ගිණුම් විවෘත කළ හැකි අතර වෙළෙඳ ගනුදෙනු කිරීම, ගෙවීම් පියවීම සහ සිය ගිණුම් ඕනෑම ස්ථානයක කැමති වේලාවක පහසුවෙන් නිරීක්ෂණය කිරීමට පහසුකම් ඇත.

කොළඹ කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණය මඟින් අනාගතයේ දී ශ්‍රී ලංකාව ගෝලීය මූල්‍ය මධ්‍යස්ථානයක් ලෙස තහවුරු වීම සිදුවේ.

මෙම උත්සවය සඳහා රාජ්‍ය ඇමැතිවරුන් වන අජිත් නිවාඩ් කබ්‍රාල්, ෂෙහාන් සේමසිංහ, ලොහාන් රත්වත්තේ, අගමැති ලේකම් ගාමිණී සෙනරත්, මුදල් අමාත්‍යංශ ලේකම් එස්.ආර්. ආටිගල, ශ්‍රී ලංකා සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවෙහි සභාපති, ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න, අධ්‍යක්ෂ ජනරාල් චින්තක මෙන්ඩිස් මහත්වරු සහ ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවලින් පැමිණි ජ්‍යේෂ්ඨ ආරාධිතයෝ, තැරැව්කාර සමාගම්, ලැයිස්තුගත සමාගම් සහ ශ්‍රී ලංකා ව්‍යාපාරික ප්‍රජාවද සහභාගී වූහ.

රාජපක්ෂවරුන්ගේ අදහස් ධර්මපාල චින්තනය හා සමානයි

මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

අනගාරික ධර්මපාලතුමන් මේ රට තුළ ක්‍රියාත්මක කළ චින්තනය හා සමාන චින්තනයක් අගමැති මහින්ද රාජපක්ෂ සහ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්වරුන් ක්‍රියාත්මක කරමින් සිටින බව නාරාහේන්පිට අභයාරාමාධිපති ආචාර්ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියෝ පැවසූහ.

දේශයට ආදරය කරමින් රටේ ජනතාව වෙනුවෙන් සිය ජීවිතය පවා කැප කිරීමට මෙම නායකයන් තිදෙනාම කටයුතු කළ බවත්, බෞද්ධ චින්තනය තුළින් සාරධර්ම පිරි ශ්‍රී ලංකාවක් බිහි කිරීමට හැකියාව ඇති නායකයන් ලෙස මේ දෙපළ හඳුන්වා දෙන බවත් උන්වහන්සේ අවධාරණය කළහ.

කොළඹ නාරාහේන්පිට අභයාරාමයේ ඊයේ (17) පස්වරුවේ පැවැති මාධ්‍ය හමුවේදී උන්වහන්සේ මෙම අදහස් ප්‍රකාශ කළහ. එහිදී උන්වහන්සේ මෙසේ ද කීය.

ගව ඝාතනයට විරුද්ධව එදා අනගාරික ධර්මපාලතුමන් ක්‍රියා කළ ආකාරයටම අගමැති මහින්ද රාජපක්ෂ මහතා අද ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

ඔහු ගව ඝාතනය තහනම් කරන ලෙස යෝජනාවක් ගෙන ආවා. මෙය තාවකාලිකව නතර කර තිබෙනවා. අපි එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දිය යුතුයි.

අනගාරික ධර්මපාලතුමන්ගේ 156 වෙනි ජන්ම දිනය සිහිපත් කරමින් ගවයන් විශාල සංඛ්‍යාවක් පෙරහරකින් නාරාහේන්පිට සිට කොළඹ නගර සභාව ඉදිරිපිට පිහිටි ධර්මපාලතුමන්ගේ පිළිරුව දක්වා රැගෙන විත් ගව ඝාතනය පිටුදැකීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමක් ද සිදුකරනු ලැබිය. මෙය පැවිදි ජන සංවිධානය විසින් සංවිධානය කර තිබුණි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ‘දැයට සවිය’ දැන්වීම් අතිරේකය අද දිනමිණ සමඟ

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දැයට සවිය දැන්වීම් අතිරේකය අද (18) දිනමිණ පුවත්පත සමඟ නිකුත් කෙරේ.

එම අතිරේකයේ මංගල කලාපය ලේක්හවුස් ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දැන්වීම්) වරුණ මල්ලවාරච්චි මහතා විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් නදුන් ගුරුගේ මහතා වෙත ඊයේ (17) දින එම දෙපාර්තමේන්තුවේදී ප්‍රදානය කළ අයුරු.

මෙම අවස්ථාව සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ජෙනරාල් ඊ. ශෙල්ටන්ද සොයිසා මහතා, දෝශීය ආදායම් කොමසාරිස් රවි දිසානායක යන අය සහභාගී විය.

අගරදගුරු හිමි ගැන හරීන්ගේ ප්‍රකාශය ත්‍රස්ත සංවිධානවලට සහාය දක්වන්නක්

රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා

කොටදෙණියාව සමූහ - එම්.පී. කුමාර

පාස්කු පූජාව සඳහා අගරදගුරුතුමන් සහභාගී නොවූ බවට පාර්ලිමේන්තු මන්ත්‍රී හරින් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන්නේ කොවිඩ් ඛයස්පෝරාවේ හා රාජ්‍ය නොවන සංවිධානවල මුදලට යටවී හෝ ත්‍රස්තවාදී සංවිධානවල සහායට දැයි සැක කරන බව මහා මාර්ග හා යටිතල පහසුකම් පිළිබඳ රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා ඊයේ (17දා) සවස මීරිගම දී පැවසීය.

එමෙන්ම මන්ත්‍රීවරයාගේ එම ප්‍රකාශය කතෝලිකයකු වශයෙන් තමන් තරයේ හෙළා දකින බව ද විරෝධය හා කනස්සල්ල පළ කරන බව ද කීය.

ලාන්සා මහතා මේ බව ප්‍රකාශ කළේ මීරිගම මැතිවරණ කොට්ඨාසයේ වේයන්ගොඩ දිවුල්ගස් හන්දිය මාර්ගය සංවර්ධනය කිරීමේ සමාරම්භක අවස්ථාවට එක්වෙමිනි. රුපියල් ලක්ෂ 2520 ක වියදමින් මෙම මාර්ගය සංවර්ධනය කෙරේ. එහිදී ඇමැතිවරයා මෙසේද කීය.

හරින් ප්‍රනාන්දු මහතා ද කතෝලිකයකු වශයෙන් මේවා නොදැන කරන ප්‍රකාශ නොවෙයි. කතෝලික සභාවත් කිසිම කෙනෙක් පාස්කු ප්‍රහාරය පිළිබඳ නොදැන සිටි බව අපට විශ්වාසයි. කතෝලිකයකු දැන ගෙන සිටියා නම් ඒ මන්ත්‍රීවරයාගේ පියා පමණයි. ඒ නිසා හරින් ප්‍රනාන්දු මහතා ජීවිතය බේරා ගත්තත් අසරණ ජීවිත තුන්සීයක් විනාශ වුණා.

නත්තල, සිංහල අවුරුද්ද හා පාස්කු උත්සවයේ ප්‍රධාන පූජාවන් පවත්වන්නේ ඊට කලින් දවසේ. ඒවට අගරදගුර තුමන් ප්‍රමුඛ ප්‍රධාන රදගුරුවරු සහභාගී වෙනවා. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා මේ බව නොදන්නා සේ කතා කිරීම පුදුමයක්. ප්‍රහාරය ගැන කතෝලිකයන් දැන සිටියා නම් මැරෙන්න යන්නේ නැහැ. හරින් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා වගේ නොගිහින් ඉන්න තිබුණා යැයි ද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කළේය.

රනිල් හා පූජිත් ආරක්ෂක මණ්ඩල රැස්වීමට ගෙන්වන්න එපා කියලා මෛත්‍රී කිව්වා

පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ විමර්ශන කොමිසමට කියයි

හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු

සුභාෂිණී සේනානායක

හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ සහ හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර යන මහත්වරුන් ආරක්ෂක මණ්ඩල රැස්වීමට සහභාගි නොකරන්නැයි හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා තමන්ට දැනුම් දුන් බව හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා ඊයේ (17දා) පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ තොරතුරු සෙවීමේ ජනාධිපති කොමිසම හමුවේ කියා සිටියේය.

ව්‍යවස්ථාදායක අර්බුදයෙන් පසුව පත් වූ නව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ගෙන්වන්න දැයි තමා ජනපතිවරයාගෙන් විමසා සිටි බවත් මේ අවස්ථාවේ අනවශ්‍ය බව ඒ මහතා කියා සිටි බවත් හිටපු ආරක්ෂක ලේකම්වරයා කියා සිටියේය.

හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා නැවතත් අගමැතිවරයා ලෙස පත් වුණා. මම ඔහුට එන්න කියලා ආරාධනා කළේ නැහැ. මේ දෙන්නා අතර ඒ වන විට නයි පොළොං වෛරයක් තිබුණා. එහෙත් නිල බලයෙන් රනිල් වික්‍රමසිංහ මහතාට සහභාගී විය හැකියි. එහෙත් ඒ මහතා ආවෙත් නැහැ. මම ආරක්ෂක රාජ්‍ය ඇමැති රුවන් විජයවර්ධන මහතාට එන්න කියා දැන්වූවෙත් නැහැ. ඒකට හේතුවුණේ ඒ අවස්ථාවේ මෛත්‍රීපාල සිරිසේන මහතා සිටියේ තදබල කෝණයකින්. ඒ නිසා ව්‍යවස්ථාදායක අර්බුදයෙන් පසුව 2019.01.04 තිබූ ආරක්ෂක මණ්ඩලය රැස්වීම සඳහා මම මේ අයට ආරාධනා කළේ නැහැ. ඒ වුණාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් වන දයාසිරි ජයසේකර, තිලංග සුමතිපාල, මහින්ද අමරවීර සහ ලසන්ත අලගියවන්න යන මහත්වරුන් ආරක්ෂක මණ්ඩල රැස්වීමට ජනාධිපතිවරයා සමග පැමිණියා. මම ආරාධනාවක් කරන්නේ නැතිව මේ අය එන විට මා පුදුමයට පත් වුණා. නිත්‍ය සාමාජිකයන් නොවී මේ අයට පැමිණීමට නොහැකි බවද හේමසිරි ප්‍රනාන්දු මහතා පාස්කු ඉරිදා ප්‍රහාර විමර්ශන කොමිසම හමුවේ කියා සිටියේය.

ඒ වගේම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු නඩු පවරන්න සූදානම් වූ අවස්ථාවේ ඒ නිලධාරියා සම්බන්ධයෙන් පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා පොලිස් කොමිසමට ලියා තිබුණා. ඒ නිසා පොලිස්පතිවරයා සමග මෛත්‍රීපාල සිරිසේන මහතා විරසකයක් ඇති කරගත්තා යැයි ද ඒ මහතා කියා සිටියේය.

රාජ්‍ය බුද්ධි අංශය හමුදා බුද්ධි අංශය බයිපාස් කරමින් කටයුතු කරනවා කියලා හිටපු හමුදාපති මහේෂ් සේනානායක මහතා ආරක්ෂක කවුන්සල රැස්වීමකින් අනතුරුව අවස්ථා දෙකක් දී මට දැනුම් දුන්නා. නිලන්ත ජයවර්ධන මහතා බුද්ධි තොරතුරු බෙදා ගන්නේ නැහැ කියලා 2018 මාර්තු මාසයේ මට ජනාධිපතිවරයාට කියන්න කිව්වා. ඒ බව කියන්න මට නොහැකි වුණේ එතුමා අනෙකුත් අයගේ කතා අහලා මා සමග කතා කරන්න අකමැත්තක් තිබූ නිසා.

ඔහු එවූ වාර්තාවේ කොළ දෙක පෙන්වා ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා කතා කරන්නේ නැද්ද කියලා නිලන්ත ජයවර්ධන මහතාගෙන් ඇසුවා. එවිට ඔහු ටිම් එකක් යැව්වා, විමර්ශන ඉවර වුණාම සවිස්තරාත්මක වාර්තාවක් දෙන්නම් කියා කිව්වා. මම හිතුවා දින දෙක තුනකින් දැනුම් දෙයි කියා යැයි හිටපු ආරක්ෂක ලේකම්වරයා කොමිසම හමුවේ කියා සිටියේය.

ඒ මහතා මේ කරුණු කියා සිටියේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය සහ කොමිසමේ විනිසුරුවරුන් සිදු කළ විමසීම්වලට පිළිතුරු දෙමිනි.



හිටපු ජනාධිපතිවරයකු සහ එක්සත් ජාතික පක්ෂයේ හිටපු නායකයකු වූ ජේ.ආර්. ජයවර්ධන මහතාගේ 114 වැනි ජන්ම දිනය වෙනුවෙන් පිටකෝටටේ පිහිටි ජාතික සේවක සංගම් මූලස්ථානයේදී වාම් උත්සවයක් ඊයේ (17) සංවිධානය කර තිබිණි. එහිදී පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන සහ මහ ලේකම් අකිල විරාජ් කාරියවසම් මහත්වරුන් ජේ.ආර්. ජයවර්ධන මහතාගේ පිළිරුවට පුෂ්පෝහාර දැක්වූ අවස්ථාව.

නිරිතදිග හා වයඹ වැසි වැඩි වෙයි

උපාලි කරුණාරත්න

දිවයිනේ නිරිතදිග කොටසේ සහ වයඹ පළාතේ වැසි තත්ත්වයේ තරමක වැඩිවීමක් අද (18) සිට ඉදිරි දින කිහිපයේදී බලාපොරොත්තු වන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පැවසීය.

හෙට (19) දින මධ්‍යාහ්නය දක්වා ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය සහ පුත්තලම හරහා මීගමුව දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගයද විටින් විට පැ.කි.මී 60- 70 දක්වා වැඩිවිය හැකි බව ද දෙපාර්තමේන්තුව ප්‍රකාශ කළේය. මේ පිළිබඳ ධීවර හා නාවුක ප්‍රජාව වැඩි අවධානය යොමු කරන මෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඉල්ලා සිටී.

පාස්කු ඉරිදා ප්‍රහාරයේ මොළකරුගෙන් තෙවැනි දිනටත් ප්‍රකාශයක් ගනී

සුභාෂිණී සේනානායක

ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ න්‍යායාචාර්යවරයා ලෙස සැලකෙන නවුෆර් මවුලවි ඊයේ (17දා) තෙවැනි දිනටත් පාස්කු කොමිසමේ පොලිස් ඒකකයට පැමිණි ප්‍රකාශයක් කළේය. පාස්කු ඉරිදා ප්‍රහාරයේ මහ මොළකරු ලෙස නවුෆර් මවුලවි මේ වන විට හඳුනාගෙන ඇත.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු මොහු අත්අඩංගුවට ගැනුණු අතර ආපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවා සිටී.

‘නිකාබය’ තහනම් කරන යෝජනාව යහපාලනය හමස් පෙට්ටියට දැම්මා

හිටපු ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි

සුභාෂිණී සේනානායක

ජාතික ආරක්ෂාවට තර්ජනයක් බවට නිගමනය කරමින් මුස්ලිම් කාන්තාවන් පළඳින නිකාබය තහනම් කරන ලෙස යෝජනාවක් තමන් ආරක්ෂක කවුන්සිලයට ඉදිරිපත් කළද ඊට දේශපාලන නායකත්වයෙන් ඉඩක් නොලැබුණ බව හිටපු ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චි මහතා ඊයේ (17දා) පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ තොරතුරු සෙවීමේ කොමිසම හමුවේ කියා සිටියේය.

එය ජාතික ආරක්ෂාවට තර්ජනයක් බවට තමන්ට ලැබුණු තොරතුරුවලට අනුව මෙම යෝජනාව ඉදිරිපත් කළ බව කියා සිටි ඒ මහතා, එය සංවේදී කාරණයක් බැවින් පසුව සාකච්ඡාවට ගමු යැයි යහපාලන රජයේ දේශපාලන නායකත්වය කියා බවද ඒ මහතා කියා සිටියේය.

ආරක්ෂක මණ්ඩලය සඳහා යහපාලන රජයේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන, ආරක්ෂක, විදේශ, මුදල් ලේකම්වරුන්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරුන්, පොලිස්පති, ජාතික බුද්ධි ප්‍රධානී, රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ, හමුදා බුද්ධි අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූ බව ක්‍රියා සිටි ඒ මහතා අන්තවාදය සම්බන්ධයෙන් එහිදී සාකච්ඡාවට ලක් කළට බවද කියා සිටියේය.

යහපාලන රජය පත් වුණේ සුළු ජාතින්ගේ ඡන්දවලින්. උතුරු නැගෙනහිර ජනතාව තමයි වැඩිම මැතිවරණ ප්‍රතිඵලයක් යහපාලන ආණ්ඩුව ලබා දුන්නේ. අනෙක් ප්‍රදේශවල ජයග්‍රහණය අත්පත් කරගත්තේ අනෙක් ජනාධිපතිවරණ අපේක්ෂකයා. යහපාලන නායකත්වය පත්කිරීමට සුළු ජාතින් හා අන්‍යාගමිකයන් කටයුතු කර තිබුණා. ඒ නිසා ඒකපාර්ශ්වීයව කටයුතු කිරීමට නොහැකි වූ බවද ඒ මහතා කොමිසම හමුවේ වැඩිදුරටත් කියා සිටියේය.

උසාවිය මඟහැර කොමිසමේ සාක්ෂි දුන් විශ්‍රාමික මේජර්ට ඇප තබන්න නියෝගයක්

කුමුදු හෙට්ටිආරච්චි

නිසි බලතල සහිත ත්‍රිපුද්ගල මහාධිකරණයක් හමුවේ සාක්කි දීමට කැඳවා තිබියදී එය නොසලකා හැර කොමිසමක් හමුවේ සාක්කි දුන් යුද හමුදා විශ්‍රාමික නිලධාරියකුට ඊයේ (17) දැඩි ලෙස අවවාද කළ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මෙම නඩුව විභාගයට ගැනේ.

මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ මහතා පැහැරගෙන ගොස් අතුරුදන් කිරීම හා ඔහු ඝාතනය කිරීම සම්බන්ධයෙන් නීතිපතිවරයා පවරා ඇති නඩුවේ තුන්වන සාක්කිකරු වූ විශ්‍රාමික යුද හමුදා සැරයන් මේජර් ජේ. එම්. රන්බණ්ඩා නමැත්තාට එසේ ඇප නියම වුණි.

රුපියල් ලක්ෂ පහක පෞද්ගලික ඇපයක් හා රුපියල් ලක්ෂ දහයක ශරීර ඇප බැඳුම්කරයක් තැබීමට සාක්කිකරුහට නියම වුණි. මහාධිකරණය විනිසුරුවරුන් වන සම්පත් අබේකෝන්, සම්පත් විජේරත්න හා ගිහාන් කුලතුංග යන මහත්වරුන්ගෙන් සැදුම්ලත් විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මෙම නඩුව විභාගයට ගැනේ.

අධි චෝදනා 17 ක් මත ලුතිනන් කර්නල් ශම්මි අර්ජුන් කුමාරරත්න මහතා ඇතුළු විත්තිකරුවන් නව දෙනකුට එරෙහිව නීතිපතිවරයා විසින් මෙම නඩුව පවරා ඇත.

ත්‍රිපුද්ගල මහාධිකරණයක් හමුවේ සාක්කි දීමට කැඳවීම් කර තිබියදී එය නොසලකා හැර කොමිසමක් හමුවේ සාක්කි දීමට යෑම මෙම නඩු කටයුත්තට බාධාවන් බව පෙන්වාදුන් ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල සාක්කිකරු හට තරයේ අවවාද කළහ.

මෙම නඩුවේ පළමු විත්තිකරු වන ලුතිනන් කර්නල් ශම්මි කුමාරරත්න මහතා අසනීපව යුද හමුදා රෝහලේ ප්‍රතිකාර ලබන බවට පවසමින් ඔහු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ අනිල් සිල්වා මහතා අධිකරණය වෙත වෛද්‍ය වාර්තාවක්ද ඉදිරිපත් කළේය.

එම වෛද්‍ය වාර්තාවෙන් විත්තිකරුගේ රෝගී තත්ත්වය පෙන්වාදී නොමැති බවට නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් දිලීප පීරිස් මහතා දැක්වූ කරුණු සලකා බැලූ විනිසුරු මඩුල්ල විත්තිකරුගේ රෝගී තත්ත්වය පිළිබඳ එම රෝහලෙන් වෛද්‍ය වාර්තාවක් කැඳවීමට අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාට නියම කළේය. නඩුවේ වැඩිදුරටත් විභාගය ලබන 22වැනිදාට කල් තැබුණි.

යාපනය සරසවියේ සමාජ මාධ්‍ය නවකවධ සිද්ධිය ගැන බුද්ධි අංශ විමර්ශනයක්

බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි

යාපනය විශ්වවිද්‍යාලයේ සිසුන් පිරිසකට සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කළේ යැයි කියන නවක වද සිද්ධිය පිළිබඳ තොරතුරු රැස් කිරීමට බුද්ධි අංශ මේවන විටත් ක්‍රියාත්මක බව ජනමාධ්‍ය ඇමැති ,සම කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා කියයි.

එම විමර්ශන කටයුතු අනුව ඉදිරියේදී ඒ හා සම්බන්ධ වූ අයට නීතිය අකුරටම ක්‍රියාත්මක වන බවද ඇමැතිවරයා අවධාරණය කරයි.

එම විශ්වවිද්‍යාලයේ කළමනාකාරණ පීඨයේ දෙවැනි වසරේ සිසුන් පිරිසක් වට්ස්ඇප් සහ සමාජ මාධ්‍ය ඔස්සේ නිරුවත් ඡායාරූප සහ විඩියෝ දර්ශන එවන ලෙස නවක සිසුන් පිරිසකට බලපෑම් කර ඇති බවට තොරතුරු වාරතාවී තිබිණි. එසේ නොකරන සිසුන්ට විශ්වවිද්‍යාලයට පැමිණීම තහනම් බවට ජ්‍යේෂ්ඨ සිසුන් තර්ජනය කරෙ ඇති බවද වාර්තාවේ.

20ට ධවල පත්‍රිකාවක් ගෙනෙන්න

හිටපු කථානායක කරු ජයසූරිය

චන්ද්මා කරුණාරත්න

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු කරුණු ධවල පත්‍රිකාවක් මඟින් ඉදිරිපත් කරන්නැයි හිටපු කථානායක කරු ජයසූරිය මහතා ඊයේ (17) පිටකෝටටේ පැවැති මාධ්‍ය සාකච්ඡාවටක එක්වෙමින් පැවැසී ය.

මීට පෙර අවස්ථාවලදී ද අපේ රටේ ව්‍යවස්ථාව නිර්මාණය කිරීමට ධවල පත්‍රිකා ගෙන ආ බවත් එමඟින් හොඳ ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමේ හැකියාව පවතින බවත් ජයසූරිය මහතා පෙන්වා දුන්නේය.

පිටකෝටටේ සෝලිස් උත්සව ශාලාවේදී ඊයේ (17) පැවැති විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡාවට සහභාගී වෙමින් එසේ කී හිටපු කථානායකවරයා 20 වන ව්‍යවස්ථා සංශෝධනයට අයිතිකරුවක් නැතැයි යන චෝදනාව ආණ්ඩුව භාරගත යුතු බව ද අනාවරණය කළේය.

වන අලි ප්‍රහාරයෙන් වනජීවී ක්ෂේත්‍ර සහායක ජීවිතක්ෂයට

ඩී.එස් ගුණතිලක උඟව වෙල්ලස්ස විශේෂ

සියඹලාණ්ඩුව-හෙළමුල්ල ගම්මානයට වන අලි කඩා වැදී ඇති බවට ලද තොරතුරක් අනුව ඊයේ (17) වන අලීන් පලවා හැරීමට ගිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දමන කලාපයේ සේවය කරන වනජීවී ක්ෂේත්‍ර සහායක වරයෙකු වන අලියෙකු පහරදීමෙන් ජීවිතක්ෂයට පත්වී ඇතැයි සියඹලාණ්ඩුව පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්ව ඇත්තේ දමන වනජීවී කාර්යාලයේ සේවය කළ වඩිනාගල පදිංචි ඩී.එන් ධර්ම කුමාර (44) නැමති දෙදරු පියෙකි.

මේ පිළිබඳ මහේස්ත්‍රාත් පරීක්ෂණය හා පශ්චාත් මරණ පරීක්ෂනය ඊයේ (17) මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේදී පැවැත්වීමට නියමිතව තිබිණි.

ළමා හා තරුණ ආඥාපනත සංශෝධනයට පියවර

බුද්ධිකා ඉඹුලාන, සිතාරා සේනානි,

ළමයින් සම්බන්ධයෙන් පවතින අණ පනත් ක්‍රියාත්මක කිරීමේදී මතුවන නීතිමය සංකූලතාවන්ට විසඳුමක් ලැබෙන පරිදි ළමයකු යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තකු ලෙස අර්ථ නිරූපණය කිරීම සඳහා ළමා හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීමටත්, ඊට සමගාමිව තරුණ තැනැත්තකු යනු වයස අවුරුදු 18 සහ 22 අතර තැනැත්තකු ලෙස අර්ථ නිරූපණය කිරීම සඳහා තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීමටත් රජය තීරණය කරයි.

අධිකරණ ඇමැති අලි සබ්‌රි මහතා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

බලපත්‍ර ක්‍රමය නැවත ඇති කිරීමෙන් වැලි මිල ඉහළ ගිහින්

ගම්පහ දිස්ත්‍රික් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම්කරුවෝ

වැලි ප්‍රවාහනය සඳහා ප්‍රවාහන බලපත්‍ර ක්‍රමය නැවත ඇති කිරීම නිසා පාරිභෝගිකයන්ට අඩු මිලට වැලි ලභාදීමට හැකියාව නොමැති බව ගම්පහ දිස්ත්‍රික් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම්කරුවන්ගේ සංගමය පවසයි.

කාලයක් පුරාවට වැලි ප්‍රවාහන බලපත්‍ර ක්‍රමය නොතිබූ බැවින් පාරිභෝගිකයා සඳහා අඩු මිලට වැලි සැපයීමට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම්කරුවන්ට හැකිවූ බවත් එම කාලය තුල වැලි කියුබ් 03 ක මිල රුපියල් 6000ත් 10000ත් අතර මුදලකින් අඩුවූ බවද ඔවුන් පවසයි. වැලි ප්‍රවාහන බලපත්‍ර නැවත ලබාගැනීමට සිදුවීමෙන් අවසන් පාරිභෝගිකයා සඳහා වැලි මිල කියුබ් 03ක ප්‍රමාණයක් සඳහා රුපියල් 10000ක වැනි මිලකින් වැඩිවීම සම්බන්ධයෙන් විමර්ශනයක් ක්‍රියාත්මක කරන ලෙස ඔවුන් රජයෙන් ඉල්ලා සිටියි.

කළුතර හිරගෙදර රැඳවූවෙක් ගෙල වැළලාගෙන

කළුතර බන්ධනාගාරයේ රඳවා සිටි රැඳවූවකු ගෙල වැලලාගෙන සියදිවි හානි කරගෙන තිබේ.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පුද්ගලයෙකු මෙලෙස සියදිවි හානිකර ගෙන ඇති අතර මියගොස් ඇති පුද්ගලයා අඟුලාන ප්‍රදේශයේ පදිංචිව සිටි 38 හැවිරිදි පුද්ගලයකු බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය පවසයි. සැකකරු බන්ධනාගාර වැසිකිළිය තුළ දී සිය ඇඳුමක් ආධාරයෙන් සියදිවි හානි කරගෙන ඇති බවට පරීක්ෂණවල දී අනාවරණය වී ඇත.

වන සම්පත් විනාශ කිරීම සම්බන්ධයෙන් විපක්ෂය සහ රාජ්‍ය නොවන සංවිධාන බොරු සමාජගත කරනවා

ඇමැති සී.බී. රත්නායක

මානෙල් පුෂ්ප කුමාරි

වන සම්පත් විනාශ කිරීම සම්බන්ධයෙන් විපක්ෂය සහ රාජ්‍ය නොවන සංවිධාන, සමාජ මාධ්‍ය හරහා බොරුව සමාජගත කරමින් ගෙනයන අසත්‍ය පුවත් පිළිබඳ තමා බිය නොවන බව වනජීවී ඇමැති සී.බී. රත්නායක මහතා අවධාරණය කළේ ය.

බත්තරමුල්ල, ජයන්තිපුර පිහිටි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඊයේ (17) පැවැති මාධ්‍ය හමුවේ දී ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේ ය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා කියා සිටියේ,

වනජීවී අමාත්‍යාංශය මඟින් වන සම්පත් විනාශය සම්බන්ධයෙන් දිහින් දිගටම සිදු කරනු ලබන නිරීක්ෂණ අධීක්ෂණ සහ පරීක්ෂණ හේතුවෙන් මේ තත්ත්වය උදා වී තිබෙනබවයි. කැලෑවල ඇති වටිනා ගස් රාත්‍රී කාලයේ කපන්නන්ටත් දඩයමේ යන්නන්ටත් මේක රිදිලා තියෙනවා. අපි මේවා සොයන්න යනකොට මේවා කළේ කවුද කියා හෙළි වෙයි කියලා. අපිත් මිහිතලයට ආදරෙයි. අපිට අවශ්‍ය වෙන්නේ අනාගත දරු පරපුරට සෞභාග්‍යවත් රටක් ලබා දීම බව ඇමැති සී.බී. රත්නායක මහතා පැවසීය.

සිදු වූ වැරදි හදාගෙන යළිත් පක්ෂය ගොඩනඟනවා

ඒජාප නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන

වත්මන් ව්‍යවස්ථා සංශෝධනය, එක්සත් ජාතික පක්ෂයේ නව නායකත්වය වැනි කරුණු කාරණා සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා සමඟ කළ සාකච්ඡාවකි.

● එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ වැඩි කැමැත්තෙන් පක්ෂයේ නියෝජ්‍ය නායකයා බවට ඔබ පත් වුණා. රටේ සමස්ථ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ කැමැත්ත සහ විශ්වාසය ඔබ කෙරෙහි තිබෙනව ද?

ඔව්. බහුතරයේ කැමැත්ත සහ විශ්වාසය මට තිබෙන බව පෙනෙන්න තිබෙනවා. නායකත්වය පිළිබඳ ප්‍රශ්නය උද්ගත වූ විට ඒ සඳහා ඉදිරිපත් වීමට මගේ කිසිම අදහසක් තිබුණේ නැහැ. කිහිප දෙනෙක්ම ඒ සඳහා ඉදිරිපත් වුණා. ඒ අවස්ථාවේදී රට වටෙන්ම බොහෝ දෙනා මා මුණ ගැසීමට මා පැමිණියා. දුරකතනයෙන් මා ඇමතුවා. ඔවුන්ගේ ඉල්ලීම වුණේ නායකත්වය සඳහා ඉදිරිපත් වන ලෙසයි. මහ නායක ස්වාමීන් වහන්සේලා බැහැදැකපු අවස්ථාවේදීත් උන් වහන්සේලාගෙනුත් එවැනි අදහසක් තමයි මතු වුණේ. ඒ ඉල්ලීම්වලට ඇහුම් කන් දී මේ අවස්ථාවේ පක්ෂයේ වගකීම භාර ගත යුතු බව මා සිතුවා.

● එක්සත් ජාතික පක්ෂ නායකත්වයත් පවුලේ අය අතර දෝලනය වන බව චෝදනා තිබෙනවා.

එහි සත්‍යතාවයක් නැහැ. මා පත්වුණේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ඡන්දයෙන්. නායකතුමා එහිදී ඡන්දය ප්‍රකාශ කළේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ සුදුස්සාට සුදුසු තැන ලැබෙනවා. එක්සත් ජාතික පක්ෂය මගේ හෝ වෙන කාගෙවත් පෞද්ගලික දේපළක් නොවේ.

● පාසල් අධ්‍යාපනය ශාන්ත තෝමස් විද්‍යාලයෙනුත් ඉහළ අධ්‍යාපනය එංගලන්තයෙනුත් ලබා ගත් රටේ ඉහළ පවුල් දෙකක් නියෝජනය කරන ඔබට පක්ෂය යළි පොඩි මිනිසාගේ හදවතට ළං කරන්න පුළුවන් වෙයිද?

සමාජය තුළ අපේ පක්ෂය ගැන විවිධ මතිමතාන්තර ගොඩ නැගිලා තිබුණා. පසුගිය ජනාධිපතිවරණයේදී අපට බහුතර බෞද්ධ ඡන්ද අහිමි වුණා. අපේ පක්ෂය සුළු ජාතීන්ගේ ප්‍රශ්නවලට වැඩි අවධානයක් යොමු කරන බවට මතයක් තිබුණා. ජාත්‍යන්තරය කියන පදයට නටන පක්ෂයක් ලෙසත් හැඳින්වුවා. නිලතල ඉහළ පැලැන්තියට පමණක් බව පැවසුණා. මේ මත දුරු කළ යුතුයි. එක්සත් ජාතික පක්ෂය යනු එදා සිටම මේ රටට විශාල සේවයක් කළ පක්ෂයක්. විශ්වාසය අප යළි ගොඩ නගා ගත යුතුයි. එය විශාල අභියෝගයක්. ඒ සඳහා මුළු රට වටේම ගොස් පාක්ෂිකයින් හමු වී බිම් මට්ටමින් වැඩපිළිවෙළක් ඉක්මනින් ක්‍රියාත්මක කරනවා.

● පක්ෂය හැර ගිය පාක්ෂිකයින් යළි එක් කර ගැනීමට හැකි වෙතැයි ඔබ සිතනව ද?

ඔව්. මා විශ්වාස කරනවා. පක්ෂය හැර ගියත් ඔවුන් තවමත් හදවතින් පක්ෂය සමගයි. වැරදි මත දුරු කර වැරදුණු තැන් යළි නිවැරදි කර ගත් විට ඔවුනගේ විශ්වාසය යළි දිනා ගැනීමට හැකි වෙතැයි මා සිතනවා.

● සමගි ජන බලවේගයට එක් වූ එක්සත් ජාතික පක්ෂයේ සිටි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් යළි මහ ගෙදරට එයිද?

-බලමු. රටේ පවතින දේශපාලන වාතාවරණය අනුව සියළුම විපක්ෂයේ කණ්ඩායම් එකම මේසයකට පැමිණ ක්‍රියාමාර්ගයක් ගැනීමේ අවශ්‍යතාවය ඇති වී තිබෙනවා. සමගි ජන බලවේගය සමග වැඩ කරන්න අපට බාධාවක් නැහැ. . එක්සත් ජාතික පක්ෂයට එක් වීමට කැමති පිරිසක් එහි සිටිනවා . ඒ අයත් සමඟ සාකච්ඡාකර එකඟ විය හැකි නම් රට වෙනුවෙන් වැඩ කරන්න සූදානම්

● ඔවුන් බොහෝ දෙනෙක් පක්ෂය හැර ගියේ නායකත්වය සමග ප්‍රශ්නයක් නිසා නේද? ඔවුන් යළි එන්න නායකත්වයේ වෙනසක් සිදු විය යුතුයි නේද?

නායකත්වය සමග තිබූ ප්‍රශ්නයක් නිසා ගියේ කිහිප දෙනෙක් පමණයි. බහුතරයක් සමගි ජන බලවේගය සමග එක් වුණේ මැතිවරණය ජයග්‍රහණය කර පාර්ලිමේන්තු යෑමේ අදහසින්.

● ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස වැනි දැවැන්තයන් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය දැරුවා. එසේම රට පාලනය කළා. ඔබ නායකත්වයට පත් වුණොත් ඒ සඳහා ශක්තියක්, හැකියාවක්, දැක්මක් තිබෙනවද?

ඔවුන් ක්‍රියාත්මක කළේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තියි. ඒ දැක්ම අනිවාර්යෙන්ම ඉදිරියට ගෙන යනවා. ඩී.එස්.සේනානායක, ඩඩ්ලි සේනානායක මහත්වරුන්ට මේ රට එක්සේසත් කරන්න, කෘෂිකාර්මික විප්ලවයක් ඇති කර රට සශ්‍රික කරන්න විශාල දැක්මක් තිබුණා. අපේ පක්ෂයට ආර්ථික ප්‍රතිපත්තියක් තිබෙනවා. කව්රු විවේචනය කළත් ඒ ගැන විශාලම දැනුමක් ඇත්තේ අපේ වත්මන් නායක රනිල් වික්‍රමසිංහ මහතාටයි. ඇත්තටම එතුමාගේ දැනුමෙන් අපේ පක්ෂයවත් අපේ රටවත් ප්‍රයෝජනයක් ගත්තේ නැහැ.

දැන් රටේ තිබෙන දේශපාලන වාතාවරණය දිහා බැලුවොත් ඇත්තටම කණගාටු හිතෙනවා. විශාල පාරිසරික හානි සිදු කරනවා. මීනීමරුවන් ත්‍රස්තවාදීන් පාර්ලිමේන්තුවට ගෙනත් තිබෙනවා. අපේ පොලිස් නිලධාරීන් මාංචු දාලා ගෙනියනවා. ඔවුනගේ වැරදි ඇති. පාස්කු ප්‍රහාරයෙන් පසු ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගන්න ඔවුන් විහාල මෙහෙයක් සිදු කළා. එක්සත් ජාතික පක්ෂය ගොඩ ගෙන ශක්තිමත් විපක්ෂයක් හැටියට මේවාට විරෝධය පළ කර රට හරි මගට ගෙන යන්න අප කටයුතු කරනවා.

● විසි වැනි සංශෝධනයට ඔබගේ පක්ෂය විරුද්ධයි. ඒ ගැන ඔබේ සටන ක්‍රියාත්මක වන්නේ කුමන ආකාරයටද?

අප 19 වැනි සංශෝධනය අප ගෙන ආවේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ පරම චේතනාවෙන්. 1977 ව්‍යවස්ථාව ගෙන ආ විට එදා විපක්ෂය ජේ.ආර්. ජයවර්ධන මහතාට දොස් කිව්වා. 2015 ජනාධිපතිවරණයේදී එම විධායක බලතල අඩු කර පාර්ලිමේන්තුවට යළි බලය දෙන බව අප පොරොන්දු වුණා. අප පොරොන්දු වූ ලෙසම 19 වැනි සංශෝධනය ගෙනවිත් විධායක බලතල පාර්ලිමේන්තුවට ලබා දුන්නා. ස්වාධීන කොමිසම් සභා ඇති කළා. අද 20 වැනි සංශෝධනයෙන් එය ආපස්සට කරකවා තිබෙනවා. ආපසු එක් පුද්ගලයෙකුට බලතල දී තිබෙනවා. අප එයට විරුද්ධව සටන් කරනවා.

● එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය පුරවන්න මෙතරම් කල් ගන්නේ ඇයි?

එය පුළුවන් තරම් ඉක්මනින් පත් කරනවා. ඒ සඳහා හතර පස් දෙනෙකුගේ නම් යෝජනා වී තිබෙනවා. වර්තමාන දේශපාලන තත්ත්වයට එරෙහිව පාර්ලිමේන්තුව තුළ හඬ නැගිය හැකි කෙනෙකු අප පත් කරනවා. ඒ සඳහා පරිනත කෙනෙකු අවශ්‍යයි. ඒ සඳහා ඉතාම සුදුස්සා පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා බව බොහෝ දෙනා අතර මතයක් තිබෙනවා. නමුත් පාර්ලිමේන්තුවට යන්න නායකතුමාගේ අදහසක් නැහැ.

● ඒ සඳහා ඔබට ඉල්ලීම් නැද්ද?

මගේ අදහසක් නැහැ. මගේ පූර්ණ කාලීන අවධානය යොමු වන්නේ පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු වෙතයි.

● පක්ෂයේ දැනට ඉතිරිව ඉන්න බොහෝ අය ඔබට වඩා ජ්‍යෙෂ්ඨයින්. ඉන් සමහරෙක් පක්ෂයේ නියෝජ්‍ය නායකධූරය මෙන්ම පක්ෂ නායකත්වය බලාපොරොත්තු වෙන අයයි. පක්ෂය යළි ගොඩ ගන්න ඔවුනගේ සහාය ඔබට ලැබෙයිද? නැතිනම් කකුලෙන් අදියිද?

එතුමාලගේ සහයෝගය අනිවාර්යෙන්ම අවශ්‍යයි. ඔවුන් අවුරුදු ගණනාවක් තිස්සේ මේ පක්ෂයට කැපවීම් කළ සේවය කළ පරිණත දේශපාලනඥයෝ. පක්ෂය ගොඩ ගන්න එක් අයෙකුට පමණක් බැහැ. ඔවුන්ගේ ක්‍රියාශීලීත්වය පක්ෂය ගොඩ ගන්න අවශ්‍යයි. එතුමාලගේ සහයෝගය මට ලබා ගන්න පුළුවන් වේ යැයි මා විශ්වාස කරනවා.

පක්ෂය යළි ගොඩ ගන්න හැකි බවට දැඩි විශ්වාසයකින් මා සිටිනවා. පසුගිය කාලයේ ඇත්ත වශයෙන්ම පක්ෂයක් වශයෙන් අප පාක්ෂිකයන්ගෙන් ඈත් වුණා. අපට තවත් වැරදුණු තැන් මොනවද? ඒවා නිවැරදි කර ගන්නේ කොහොමද? ඒ සියලු කරුණු විශ්ලේෂණය කර ඉතා ඉක්මනින් ප්‍රතිසංවිධාන කටයුතු සිදු කළ හොත් ලබන මහ මැතිවරණය වෙනවිට අපේ පක්ෂය යළි හොඳ තැනකට ගෙන ඒමට හැකි වෙතැයි මා විශ්වාස කරනවා. මගේ අදහස් මෙන්ම පක්ෂයේ අනෙක් ජ්‍යෙෂ්ඨ නායකයින්ගේ අදහස්ද ලබා ගෙන ප්‍රතිසංවිධාන සැලසුම ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. විවිධ මතිමතාන්තර වලටත් වලටත් ගරු කරමින් පක්ෂය ශක්තිමත් කිරීම මගේ අරමුණයි .

● නියෝජ්‍ය නායකයන් බවට පත් වුණු කරු ජයසූරිය සහ සජිත් ප්‍රේමදාස මහත්වරුන්ට පක්ෂයේ නායකයා වීමට බැරි වුණා. ඔබට පක්ෂයේ නායකයා වෙන්න ලැබෙයිද?

නායකත්වයෙන් ඉවත් වන බව රනිල් වික්‍රමසිංහ මහතා පැහැදිලිවම කියා තිබෙනවා. දෙසැම්බර් වන විට අලුත් නායකයාට පූර්ණ බලතල දී පත් කරන බව එතුමා ප්‍රකාශ කර තිබෙනවා .ඒ විශ්වාසය අප ළඟ තිබෙනවා. නායකත්වය බලාපොරොත්තු වන තවත් අය ඉන්නවා. පාක්ෂිකයන්ගේත් කෘත්‍යාධිකාරී මණ්ඩලයේත් විශ්වාසය තිබෙනවා නම් පක්ෂ නායකත්වයට ඉදිරිපත් වෙන්න මා ලෑස්තියි.

ශිරෝමි අබයසිංහ

> පසුගිය කාලයේ ඇත්ත වශයෙන්ම පක්ෂයක් හැටියට අප පාක්ෂිකයන්ගෙන් ඈත් වුණා. අපට තවත් වැරදුණු තැන් මොනවද? ඒවා නිවැරදි කර ගන්නේ කොහොමද? ඒ සියලු කරුණු විශ්ලේෂණය කර ඉතා ඉක්මනින් ප්‍රතිසංවිධාන කටයුතු සිදු කළ හොත් ලබන මහ මැතිවරණය වන විට අපේ පක්ෂය යළි හොඳ තැනකට ගෙන ඒමට හැකි වෙතැයි මා විශ්වාස කරනවා.

විපක්ෂයට ඕනෑ 19 තියාගෙන රට අවුල් කරන්න

පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. බී. දිසානායක

වර්තමානයේ ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ ඇතිව තිබෙන කතා බහ, ජීවන මිල පාලනයට ආණ්ඩුව ගන්නා පියවර මොනවාද? අලුත් ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමේ දී ඇති කළ යුතු වෙනස්කම් මොනවා ද යන්න ගැන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස් බී දිසානායක මහතා සමඟ සිදු කළ සාකච්ඡාවකි.

● ව්‍යවස්ථා සංශෝධන කටයුතු නිසා රට වෙනුවට දේශපාලන න්‍යාය පත්‍රයක් මුල් කරගෙන ආණ්ඩුව වැඩ කරන බවට චෝදනා එල්ල වෙනවා. මේ ගැන ඔබේ අදහස කුමක් ද?

මෙතැන වෙනත් න්‍යාය පත්‍රයක් නැහැ. තියෙන්නේ එකම න්‍යාය පත්‍රයක් පමණයි. ඒ ජනතාව දෙවරක් අති බහුතර ජනවරමකින් පිළිගත් දෙයක්. ඒ දහනව වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කළ යුතු බව. අප අද ක්‍රියාත්මක කරන්නේ එදා බහුතර ජනතාව අප වෙත ලබා දුන් ජනවරමයි. අප රටක් විදිහට ස්ථාවර තැනකට යන්න ඕනෑ. දේශපාලන පිල් බෙදීම් ආණ්ඩුව ඇතුළත ගැටුම් ඇති වන ක්‍රමවේදයන් අනුමත කරන්න බැහැ ඒ නිසා තමයි අප රට ස්ථාවර කරන විසිවන සංශෝධනයක් වෙත මුලින් යොමු වීමට සැලසුම් කළේ. මෙය අලුත් ව්‍යවස්ථාවක් ගෙන එනතුරු අන්තර් කාලයකට ගෙන එන ව්‍යවස්ථා සංශෝධනයක් පමණයි. ඉදිරි අවුරුදු දෙක ඇතුළත අලුත් ව්‍යවස්ථාවක් ගෙන එනවා. එහිදී අපට සියලු පාර්ශ්වවල අදහස් ලබා ගැනීමට කටයුතු කරනවා.

විසිවන සංශෝධන මගින් දහනවය නිසා අස්ථාවර වූ රට නැවත ස්ථාවර තැනකට පත් කරන්න පුළුවන්.

● එහෙත් මේ සංශෝධනය තුළ වැරදි තැන් තියෙනවා කියලා විපක්ෂය චෝදනා කරනවා?

විපක්ෂයට අවශ්‍ය වෙලා තියෙන්නේ දහනවය තව දුරටත් පවත්වා ගෙන යන්න. එයින් ඔවුනට අවශ්‍ය දේශපාලන වියවුල් සහගත තත්ත්වයක් ඇති කර රට අවුල් කිරීම. ඒත් රටේ යහපත ගැන සිතන ස්ථාවරත්වය ගැන හිතන අයට දහනවය හොඳයි කියල කියන්න බැහැ. මෙතැන වරදක් තියෙනවා කියල හිතෙනවා නම් ඕනෑම කෙනෙකුට අධිකරණයට යන්න පුළුවන්. එහෙම නොගිහින් විවේචන කරන එකේ තේරුමක් නැහැ.

● මේ අවස්ථාවේ ජනතාවගේ මූලික අවශ්‍යතාව විසිවන සංශෝධනය කඩිනමින් ගෙන ඒම කියල ද ඔබ විශ්වාස කරන්නේ?

රටක් දේශපාලන වශයෙන් ස්ථාවර වෙන්න ඕනෑ දියුණු වෙන්න ඕනෑ නම්. අපෙන් ජනතාව ඉල්ලුවේ රට සුරක්ෂිත තැනක් කරන්න කියලා. ඒ කටයුත්තට දහනවවන ව්‍යවස්ථා සංශෝධනය නිසා බාධා වෙනවා. ඒ නිසා තමයි දහනවය වෙනස් කිරීමට අප උත්සාහ කරන්නේ.

● එහෙත් මේ තත්ත්වය රට තුළ දැඩි පාලනයක් ඇති විය හැකි බවට ඇතැම් පාර්ශ්ව චෝදනා එල්ල කරනවා නේද?

දැඩි පාලනයක් නැතිනම් රටක් ගොඩ නඟන්න බැහැ. දැනට ලෝකයේ දියුණු වෙලා තියෙන රටවල් ඒ තැනට පැමිණියේ ඉබේ නොවෙයි. දැඩි පාලනයක් කියන්නේ හිතුවක්කාරී ආඥාදායකත්වයක් නොවෙයි. ජනතාවාදී දේශප්‍රේමී නායකයකුටයි රටක් දියුණු කරන්න පුළුවන්කම තියෙන්නේ.

ජනතාවට අද අවශ්‍ය කරන්නේ අපේ රටත් දියුණු රටක් බවට පත් කිරීමට ඒ සඳහා ජනාධිපතිතුමාට අවශ්‍ය බලය තියනවා, රට දියුණු කරන්න ලෝකයේ ඉහළම තැනට රට ගෙන ඒමට. ඒ නිසා අපි ඉදිරි වර්ෂ පහ තුළ රට දියුණු කිරීමට ජනාධිපතිතුමාට සහාය දෙන්න ඕනෑ. සිංගප්පූරුව මැලේසියාව වගේ රටවල් දශක හතරකට කලින් අපට පසුපසින් සිටියේ. ඒත් දැන් ඒ අය අපව පහුකරල ගොඩක් ඉස්සරහට ගිහින්. ඒ නිසා අපි දැන්වත් අලුත් රටාවකට මේ ගමන් පටන් ගන්න ඕනෑ. අලුතින් සිතන නායකයකු විදිහට රට ගොඩ නැඟීමේ ශක්තිය වගේම බුද්ධිය ජනතාවට තියෙනවා.

● ඔබ කියන විදිහට අනාගතයේ දී රට සාර්ථක ගමනක් යයිද?

එක නායකයකුට එක දේශපාලන පක්ෂයකට විතරක් එය කරන්න බැහැ. සාමූහිකව එකතු වෙන්න ඕනෑ. අපි දේශපාලනය කරන්න ඕනෑ මැතිවරණවලට තරග කරන්න ඕනෑ. ඒත් රට ඉදිරියට ගෙන යන්න ජාතික ප්‍රතිපත්තියක් ඇති කළ යුතුයි. දේශපාලන වෙනස්කම්වලදී ආණ්ඩු පෙරළිවලදී වෙනස් නොවන ජාතික ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ. ඉදිරි කාලයේ දී ජනාධිපතිතුමා මේ සඳහා මැදහත්ව වැඩ කරන්න පුළුවන්. එතුමාට මේ සඳහා හොඳ හැකියාවක් තියෙනවා.

● ව්‍යස්ථා සංශෝධන ගැන ආණ්ඩුව අවධානය යොමු කරන අතර ජීවන මිල ඉහළ යෑම සහ ජනතාට බලපාන ගැටලු විසඳීමට අවශ්‍ය පියවර ගෙන නැති බවට චෝදනාවක් තියෙනවා. මේ ගැන ඔබේ අදහස කුමක් ද?

ජීවන බර ඉහළ යෑම වගේ දේවල් ආණ්ඩුවකට සම්පූර්ණයෙන්ම පාලනය කරන්න බැහැ. ගොඩක් දුරට එළවළු, පොල් වගේ ද්‍රව්‍යවල මිල ඉහළ යෑමට හේතු වන්නේ ස්වාභාවික හේතු. ඒවා ආණ්ඩුවකට පාලනය කරන්න පුළුවන් වෙන්නේ එක් සීමාවකට පමණයි. ඒ නිසා ආණ්ඩුවලට පමණක් දොස් කීමෙන් පලක් නැහැ. ආණ්ඩුවකට කරන්න පුළුවන්කම තියෙන්නේ මේ නිෂ්පාදනවල නිෂ්පාදන පරිමාණය ඉහළ දැමීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කිරීමයි.

පසුගිය කාලයේ දී දේශීය කර්මාන්ත නැංවීම, දේශීය කෘෂිකර්මාන්තය ඉහළ නැංවීමට වැඩ කළේ නැහැ. ඒ නිසා අපේ ගොවිතැන දේශීය ආර්ථිකය පල්ලෙහාටම වැටුණා. අප ආණ්ඩුවක් විදිහට මේ ප්‍රතිපත්තිය වෙනස් කර තියෙනවා. ඒ නිසා දීර්ඝ කාලීනව ආර්ථිකය, කෘෂිකර්මාන්තය නැංවීමට වැඩ කර තියෙනවා.

● එක්සත් ජාතික පක්ෂය බෙදී යෑමත් සමඟ මෙරට ප්‍රධාන විපක්ෂය විදිහට මතුව ආ සමගි බලවේගය ආණ්ඩුවට අභියෝග කරන වැඩසටහන් ඉදිරි සතියේ සිට ක්‍රියාත්මක කරන බවට කියනවා. මේ තත්ත්වය ආණ්ඩුවට අභියෝගයක් ද.?

ආණ්ඩුවට පාර්ලිමේන්තුව තුළ පමණක් නොවෙයි සමාජය තුළත් ලොකු පිළිගැනීමක් තියෙනවා. අපි ඒ පිළිගැනීම ආරක්ෂා වන විදිහට වැඩ කරනවා නම් විපක්ෂය අපිට අභියෝගයක් වෙන්නේ නැහැ. 2019 ජනාධිපතිවරණයේ දී සම්පූර්ණ එජාපය පමණක් නොවෙයි මුස්ලිම් දෙමළ පක්ෂ බහුතර සහායත් ලැබුණේ සජිත් ප්‍රේමදාස මහතාට. ඒත් ඔහුව ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පරාජය කළේ අතිවිශාල වැඩි ඡන්ද ප්‍රමාණයකින්. මේ වගේ තත්ත්වයක් තුළ බෙදී ගිය එක්සත් ජාතික පක්ෂයේ බෑයකට අපට අභියෝගයක් කිරීමට නොවෙයි හිතන්නවත් බැහැ.

උදිත ගුණවර්ධන

> රටක් දියුණු වෙන්න ඕනෑ නම් දේශපාලන වශයෙන් ස්ථාවර වෙන්න ඕනෑ. අපෙන් ජනතාව ඉල්ලුවේ රට සුරක්ෂිත තැනක් කරන්න කියලා. ඒ කටයුත්තට දහනවවන ව්‍යවස්ථා සංශෝධනය නිසා බාධා වෙනවා. ඒ නිසා තමයි දහනවය වෙනස් කිරීමට අප උත්සාහ කරන්නේ.

ඡායාරූපය - ලේක්හවුස් මාධ්‍ය පුස්තකාලය

විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතේ වගකීම ජනපති-අගමැති භාර ගන්නවා

› ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල

බුද්ධිකා ඉඹුලාන සහ සිතාරා සේනානි

විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ සම්පූර්ණ වගකීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාත්, අගමැති මහින්ද රාජපක්ෂ මහතාත් භාර ගන්නා බව ජනමාධ්‍ය ඇමැති, සම කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (17) පැවති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදී පැවැසීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'එම කෙටුම්පත සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය සාමූහික වගකීමකින් යුතුව කටයුතු කළා. දැනට ඉදිරිපත් කර ඇති විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ගැසට් කර මේ වන විට දින 14ක් සම්පූර්ණව තිබෙනවා. එනිසා ඉදිරියේ එළැඹෙන ඕනෑම දිනයකදී එය පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කළ හැකියි. පක්ෂ නායක රැස්වීමේදී තීන්දුවක් ගෙන එම කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා. ජනතාව ආණ්ඩුවට තුනෙන් දෙකක බහුතර බලයක් ලබාදී ඇත්තේ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනස් කරන්න. එනිසා එය සිදු නොකිරීම ජනතාවට කරන ද්‍රෝහීකමක්.'

විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් මාධ්‍යවේදීන් නැඟූ ප්‍රශ්නවලට පිළිතුරු දුන් සම කැබිනට් මාධ්‍ය ප්‍රකාශකවරු මෙසේ පැවැසූහ.

මාධ්‍යවේදියා:

විසි වැනි සංශෝධනය කෙටුම්පත සම්බන්ධ වගකීම භාර ගන්නේ කවුද?

ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල:

ජනාධිපතිවරයාත්, කැබිනට් මණ්ඩලයත් ඒ පිළිබඳ සම්පූර්ණ වගකීම ගන්නවා.

මාධ්‍යවේදියා:

විසි වැනි සංශෝධනය සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කළ කමිටුවේ වාර්තාව අගමැතිවරයාට ලබාදී තිබෙනවා. නමුත් පෙරේදා (16) පැවති කැබිනට් මණ්ඩල රැස්වීමේදී ඒ පිළිබඳ කිසිදු සාකච්ඡාවක් සිදු නොවූ බව අපට දැනගන්න ලැබුණා. ඒ ආකාරයට මේක හදිසියේ ම ඇවිත් නිහඬ වුණේ ඇයි?

ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල:

එහෙම නිශ්ශබ්ද වීමක් නෑ. කැබිනට් රැස්වීම පැවති කාල සීමාවෙන් 50%කටත් වඩා සාකච්ඡා වුණේ විසි වැනි සංශෝධනය සම්බන්ධයෙන් තමයි. කමිටුවේ වාර්තාව ලැබුණාම ඒ සම්බන්ධයෙන් ද දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ කමිටුවේ සාකච්ඡා කර එකඟවූ කරුණු සැලකිල්ලට ගෙන තමයි ඒ කටයුතු කරන්න බලාපොරොත්තු වෙන්නේ.

මාධ්‍යවේදියා:

මේ පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයේ අනුමත වූ කෙටුම්පතක්. ඇයි කැබිනට් මණ්ඩලය අනුමත කළාට පසු එහි තිබෙන විවිධ ගැටලු ගැන ඇමැතිවරුන් කියන්නේ?

ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල:

මේ කමිටුව පත් කර තිබෙන්නේ අගමැතිවරයා. කෙටුම්පත ගැන දේශපාලන ප්‍රශ්න ගණනාවක් තිබෙන්න පුළුවන්. ඒ ගැන සාකච්ඡා කරන්න කමිටුව පත් කළා. එතැනදී අපට අවශ්‍ය වෙනවා නම් යම් යම් සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්. මූලික රාමුවට එකඟතාවක් තිබෙනවා. ජනතාවගේ අදහස් නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් එය ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදීව, විනිවිදභාවයකින් යුතුව සිදු විය යුතුයි. අපේ පාර්ලිමේන්තුව නියෝජිත පාර්ලිමේන්තුවක්.

මාධ්‍යවේදියා:

සාමාන්‍යයෙන් පනත් කෙටුම්පතක් ගැසට් කිරීමට පෙර ඇමැති මණ්ඩලයට ඒ ගැන අදහස් දක්වන්න සතියක පමණ කාලයක් ලබා දෙනවා. එසේ වුවත් මීට පෙර සිදු වූයේ පනත් ගෙන ඒම සහ පසුව හකුලා ගැනීමයි. ඔබතුමාලත් කරන්න යන්නේ ඒ දේම නේද?

ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල:

නෑ. එහෙම හකුළා ගැනීමක් වෙලා නෑ.

ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ:

මේ සම්බන්ධව කරුණු සාකච්ඡා කිරීමට ඇමැති මණ්ඩලයට කාලයක් ලබාදීමෙන් පසුව තමයි ගැසට් නිවේදනය ඉදිරිපත් කළේ. ඉන් පසු විවිධ මතවාද සමාජමය සහ දේශපාලනමය වශයෙන් මතුව තිබෙනවා. ඒ පිළිබඳ කරුණුත් සැලකිල්ලට ගෙන අපට අවශ්‍ය කරුණු රටේ යහපත සහ සුබසිද්ධිය වෙනුවෙන් කමිටු අවස්ථාවේ සංශෝධන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙනවා. කිසිසේත් මේ කෙටුම්පත ආපසු හැරවීමක් සිදු කර නෑ.

මාධ්‍යවේදියා:

මේ පනත් කෙටුම්පත කෙටුම්පත් කළේ කවුද?

ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ:

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව තමයි කෙටුම්පත් කළේ. ඒ සඳහා සහාය වීමට නීතිඥ මණ්ඩලයක් පත් කර තිබුණා.

මාධ්‍යවේදියා:

කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කවදා ද?

ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල:

පක්ෂ නායක රැස්වීමේදී තීන්දුවක් ගෙන එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

මාධ්‍යවේදියා:

සහතිකයක් දෙන්න පුළුවන් ද විසි වැනි සංශෝධනයත් එක්ක ස්වාධීන කොමිසන් සභාවලට කිසියම් හෝ බලපෑමක් සිදු වෙන්නේ නෑ කියලා?

ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල:

බොහොම පැහැදිලිව අප මේක ඉදිරිපත් කරන්නේ ඒ සහතිකයත් එක්ක. කොමිසන් සභා එක්ක ඇති වූ ප්‍රතිඵල විශ්ලේෂණය කළාම එයට වඩා හොඳ ක්‍රමයකට යන්න තමයි අප තීන්දු කර තිබෙන්නේ. බොහොම පැහැදිලිව ඒ සහතිකය එහිම සඳහන්ව තිබෙනවා. 19 වැනි සංශෝධනයේ අඩංගුව තිබූ ඉවත් වූ කරුණු රටට අයහපත් සහ පරිපාලනයට අයහපත් කියන තේමාව මතයි. ඒ නිසා ඒ සහතිකය එතැන ම තිබෙනවා.

ඡායාරූපය - රංජිත් අසංක

පෙතියකන්ද වත්ත ඉඩමේ හරිත කර්මාන්ත පුරයක් ඇරඹීමට පියවර

බුද්ධිකා ඉඹුලාන සහ සිතාරා සේනානි

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට අයත් 'පෙතියකන්ද වත්ත' ඉඩමේ අක්කර 194ක භූමි භාගයක හරිත කර්මාන්තපුරයක් ස්ථාපිත කිරීමට කර්මාන්ත ඇමැති විමල් වීරවංශ සහ ඉඩම් ඇමැති එස්. එම්. චන්ද්‍රසේන මහත්වරුන් ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත.

අත්තනගල්ල සහ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් එම ඉඩම පිළිබඳ සවිස්තරාත්මක ඇගයීමක් සිදු කොට වාර්තාවක් ලබාදීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත පැවැරීමටද කැබිනට් මණ්ඩලය තීරණය කර තිබේ.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (17) පැවති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවට එක් වෙමින් වැවිලි ඇමැති, සම කැබිනට් ප්‍රකාශක වෛද්‍ය රමේෂ් පතිරණ මහතා පැවැසුවේ බස්නාහිර පළාතේ කර්මාන්ත ඇරඹීමට උනන්දුවක් දක්වන ආයෝජකයන් 150ක් පමණ සිය අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවයි.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'බස්නාහිර පළාතේ පිහිටා ඇති කර්මාන්තපුර අටකට අවශ්‍ය පහසුකම් සලසා දීමට නොහැකි වන බව පෙනී ගොස් තිබෙනවා. එනිසා ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික්ක දෙකටම අයත් වන පරිදි අලුතින් කර්මාන්තපුරයක් ස්ථාපිත කිරීමටත්, එකී කර්මාන්තපුරයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික උපාංග, ඇසුරුම් කරන ද්‍රව්‍ය, අගය එකතු කළ කෘෂිකාර්මික නිෂ්පාදන, රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන, ඇඟලුම් හා ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම, එකලස් කිරීමට ප්‍රමුඛතාව ලබා දීම, ප්‍රතිචක්‍රීකරණය සහ පර්යේෂණ සංවර්ධන කටයුතු සඳහා යෝජිත කර්මාන්තපුරයෙන් ඉඩකඩ වෙන් කර දීම ආදිය සැලසුම් කර තිබෙනවා.

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්තපුර 32ක් මේ වන විට රට පුරා පවත්වාගෙන යනවා. පෞද්ගලික ආයෝජකයන් විසින් රුපියල් මිලියන 36,500ක් පමණ එම කර්මාන්තපුරවල ආයෝජනය කර තිබෙනවා. මේ කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට රජය විසින් රුපියල් මිලියන 4,517ක් පමණ වැය කර තිබෙනවා. ඒවායේ ජනනය වී ඇති රැකියා අවස්ථා ගණන 18,600ක් පමණ වෙනවා.'

රාජ්‍ය ආයතනවලට පත් කළ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ට ඔප්පු වූ චෝදනා කිසිවක් නෑ

› සම කැබිනට් ප්‍රකාශක

බුද්ධිකා ඉඹුලාන සහ සිතාරා සේනානි

ශ්‍රී ලංකා රජය විසින් රාජ්‍ය ආයතනවල ප්‍රධාන තනතුරු සඳහා පත් කළ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ට සාධනීයව ඔප්පු වූ චෝදනා කිසිවක් නොමැති බව ජනමාධ්‍ය ඇමැති, සම කැබිනට් ප්‍රකාශක ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා කියයි.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ ඊයේ (17) පැවති කැබිනට් තීරණ දැනුම් දීමේදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 45 වන සැසිවාරයේ දී එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස්වරිය විසින් දැඩි ලෙස විවේචනය කරන ලද ශ්‍රී ලංකා රජය විසින් රාජ්‍ය ආයතනවල ප්‍රධාන තනතුරු සඳහා ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් පත් කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදියකු නැඟූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'ඉතා විශිෂ්ට සේවයක් සිදු කර හමුදා සේවයේ ධුර කාලය වසර 55ට පෙර අවසන් කරන ලද නිලධාරීන්ගේ පසුබිම සලකා බලමින් ඔවුන්ට සාධාරණයක් ලබා දීමේ අරමුණින් රජයේ පවත්නා සාමාන්‍ය ක්‍රමවේදය තුළ ඔවුන්ට මේ තනතුරු ලබා දීමට කටයුතු කළා. එම නිලධාරීන්ට සාධනීය චෝදනා කිසිවක් එල්ල වී නොමැති බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතවරිය විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම වෙත ඉතාමත් පැහැදිලි පිළිතුරක් ලබාදී තිබෙනවා.

2009 වසරේ මෙරට පැවති යුද්ධය අවසන් කළ අවස්ථාවේ සිට ශ්‍රී ලංකාව මිලේච්ඡ සහ යුද අපරාධ කළ රටක් ලෙස අසත්‍ය චෝදනා එල්ල කිරීමට මානව හිමිකම් යැයි පවසන ආයතන සියල්ල කටයුතු කළා. එහෙත් මානව හිමිකම් කොමිසම පවසන සියල්ල සත්‍යයයි යන්න පිළිනොගන්නා මතයේ ශ්‍රී ලංකාව සිටිනවා. ඔවුන් කෙසේ කුමනාකාරයෙන් මොන දේ පැවැසුවත් මෙරටේ සිදු කර ඇති සාධනීය කටයුතු සහ මානුෂීය මෙහෙයුමත් සමඟ ඇතිවූ ගැටලු, අතුරුදන් වූවන්ගේ ගැටලු ආදිය 2015 සිටි රාජ්‍ය නොවන සංවිධාන විසින් ගෙන ආ න්‍යාය පත්‍රයේ කොටසක්. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම සහ ඔවුන් පවසන දේ පිළිබඳව සම්පූර්ණයෙන්ම පිළිගන්නා තැනක මේ රට පසු වන්නේ නැති බව මා අවධාරණය කරනවා.

ලංකා රජය විසින් රාජ්‍ය ආයතනවල ප්‍රධාන තනතුරු සඳහා කිසිදු සාධනීය චෝදනාවකින් වරදකරුවකු වී නොමැති ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් පත් කිරීම් සිදු කර තිබෙනවා. මෙසේ එල්ල කරන ලද චෝදනා සියල්ල අසත්‍යයි.'

මෛත්‍රී-රනිල් විරසකය රට අස්ථාවර වීමට හේතුවක් වුණා

› පාර්ලිමේන්තු මන්ත්‍රී හරීන් ප්‍රනාන්දු කියයි

සුභාෂිණී සේනානායක

යහපාලන ආණ්ඩුවේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහත්වරුන් අතර පැවති විරසකය රට අස්ථාවර වීමට හේතුවක් වූ බව තමන් පිළිගන්නා බවත්, දින පනස් එකේ සිදු වූ ව්‍යවස්ථා අර්බුදය ඊට බලපෑමක් සිදු කළ බවත් හිටපු ඇමැති, ජාතික සමඟි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හරීන් ප්‍රනාන්දු මහතා පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දක්වමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මෙසේ ද කීය.

'හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතාට දැඩි අකැමැත්තක් තිබුණා. අගමැති රනිල් වික්‍රමසිංහ මහතා මේ ප්‍රහාරය ගැන කිසිවක් නොදන්නා බව මා විශ්වාස කරනවා. ආණ්ඩුවේ තිබූ විරසකය හේතුවෙන් තීරණ ගැනීමට කිසිවකු නොමැති වීම මේ ප්‍රහාරයට හේතු වූ බව මා විශ්වාස කරනවා.

සෑම වසරකම පාස්කු දිනට පෙර ප්‍රධාන කතෝලික සභාව පවත්වන ප්‍රධාන පූජාව 2019 වසරේ නොපැවැත්වීම සම්බන්ධයෙන් සොයා බලන ලෙස කොමිසමෙන් ඉල්ලා සිටිනවා. එම පූජාව සෑම වසරකම කොටහේන සාන්ත ලුසියා දේවස්ථානයේදී පවත්වනවා. එම පූජාව 2019 වසරේ පමණක් නොපැවැත්වීමට හේතුව එම පූජකවරුන් දැන සිටියේද යන්න සොයා බැලිය යුතුයි.

මේ සම්බන්ධයෙන් කොළඹ භාරව සිටි නියෝජ්‍ය පොලිස්පතිවරයා දැනුවත්ව සිටින්නට ඇති. ඔහුගෙන් ඒ බව අහන්න. අගමැති, ජනපති සහ ඇමැතිවරුන්ගේ ආරක්ෂකයන් ද, මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂකයන් ද ඒ බව දැන සිටියා. ඒත් ඔවුන් මහින්ද රාජපක්ෂ මහතා එම සිද්ධිය සම්බන්ධයෙන් දැනුවත් කර නෑ. විමල් වීරවංශ මහතා මාධ්‍ය හමුවකට එක් වෙමින් මේ බව කියා සිටියා. එම මාධ්‍ය හමුවට මහින්ද රාජපක්ෂ මහතාද එක්වී සිටියා.

පසුව අදාළ ප්‍රකාශය සම්බන්ධයෙන් අගරදගුරු හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ශමිල් ප්‍රනාන්දු මහතා විමසා සිටියේ, අගරදගුරු හිමිපාණන් සෑම වසරකම පාස්කු දේව මෙහෙය පවත්වනු ලබන්නේ ඉරු දිනට පෙර සෙනසුරාදා දින මධ්‍යම රාත්‍රියේ බව මම ඔබට යෝජනා කළොත් එය පිළිගන්නේ ද යන්නය.

එහිදී මන්ත්‍රීවරයා කියා සිටියේ එසේ සිදු කර ඇත්නම් එය පිළිගන්නා බවයි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වැඩිදුරටත් සාක්ෂි දෙමින් මෙසේ ද කීය.

'මට සහ මගේ පියාට අයත් දුරකතනවලට ලැබුණු අදාළ ඇමතුම් කොමිසම විසින් නිවැරදිව හඳුනාගෙන තිබීම ගැන සතුටු වෙනවා. රෝහලේ ප්‍රතිකාර ලැබූ මගේ පියා ප්‍රහාරයක් විය හැකි බව මගේ සොයුරියට කියූ කාරණය පියා මට දැන්වූ ආකාරයට ප්‍රකාශ කිරීම මගෙන් වූ අඩුපාඩුවක් සේ දකිනවා. මට වැරැදීමකින් ඒ බව කියැවුණේ. ඒ අවස්ථාවේදී අප කනගාටුවෙන් සිටියේ.

මම විශ්වාස කරන දෙවියන් වහන්සේ සහ මා පැලඳ සිටින කුරුසියේ සත්‍ය අනුව කවදා හෝ සත්‍ය ජය ගන්නවා. අසත්‍ය වපුරන අයට දඬුවම් ලැබෙනු ඇති. පාස්කු ප්‍රහාරය හේතුවෙන් මගේ පියා සහ මම මහත් කම්පනයට පත්ව සිටිනවා.'

රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා, කාදිනල් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා සහ කොමිසම හරීන් ප්‍රනාන්දු මහතාගෙන් හරස් ප්‍රශ්න විමසීය.

කොමිසම:

ඉස්ලාම් අන්තවාදය ගැන කැබිනට් එකේදී සාකච්ඡා කළා ද?

සාක්ෂිකරු:

මෙවැනි ක්‍රියාවක් ගැන කතා කිරීමක් මතක නෑ. මෙවැනි කටයුතු සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් අවධානය යොමු කළා. දිගන සිදුවීම ගැන කතා කළා මතකයි.

කොමිසම:

ඉස්ලාම් අන්තවාදය ගැන කතා කළා ද?

සාක්ෂිකරු:

මට මතක නෑ. ජනාධිපතිවරයාගේ සහභාගීත්වයක් නැතිව අරලියගහ මන්දිරයේ සාකච්ඡවක් තිබුණා. ඒ අවස්ථාවලදීත් අපට අවශ්‍ය වුණේ අගමැතිවරයා සහ ජනාධිපතිවරයා අතර තිබූ විරසකය දුරු කරන්න.

කොමිසම:

විරසකය කුමක් පදනම් කර ගනිමින් ඇති වූවක් ද?

සාක්ෂිකරු:

ඒ සම්බන්ධයෙන් මගේ පෞද්ගලික මතය මෙතැන කියන එක හොඳ නෑ කියලා මා හිතනවා. දේශපාලන පක්ෂ දෙකකින් පැමිණි දෙදෙනෙක් එකට එකතු කිරීම අපහසුයි. මේ නිසා රට අස්ථාවර වුණා.

කොමිසම:

කොච්චිකඩේ පල්ලියට යන්න එපා කියා ඔබේ පියා කිව්වා යැයි ඔබ මාධ්‍ය හමුවේදී කියා තිබුණා නේද?

සාක්ෂිකරු:

ඒක විනාඩි 45ක මාධ්‍ය සාකච්ඡාවක්. එය කෙටි කරලා විකාශය කළේ. මේක පිටුපස හස්තයක් තිබෙනවා. නිර්මාණයක් තිබෙනවා. ජාතිවාදය ඇවිස්සීමක් තිබුණා. කොච්චිකඩේ පල්ලිය කියන්නේ මගේ හදවත වගෙයි. මා යන සෑම අවස්ථාවකම එතැන බැහැලා ඉටි පන්දමක් දල්වා යනවා. මට කියන්න ඕන වුණේ මේක වෙන කෙනෙක් දැනගෙන හිටියා කියලයි. මාධ්‍ය විසින් මේ දේ විකෘති කර විකාශය කළා.

කොමිසම:

ඔබ කියූ දේ නේද මාධ්‍ය පළ කළේ. ඔබ නොකියූ දෙයක් මාධ්‍යයේ පළ කළා ද?

සාක්ෂිකරු:

නෑ.

කොමිසම:

ඔබ කියූ දේ පළ කළ මාධ්‍යයට බරපතළ චෝදනා එල්ල කිරීම හරි ද?

සාක්ෂිකරු:

මා කියූ අදහස්වලින් කොටසක් තමයි පළ කර තිබුණේ. එයත් බොහොම විකෘති ආකාරයට කර තිබුණා.

කොමිසම:

ඉස්ලාම් අන්තවාදය පෝෂණය වීමට යම් තීරණ ගැනීමේ දුර්වලතාවක් හේතුවක් වුණා ද?

සාක්ෂිකරු:

අප කිහිප වතාවක් සාකච්ඡා කළා. අවසාන තීන්දු ගන්නේ ජනපතිවරයා. ජනපති අතේ තිබූ ආරක්ෂක අමාත්‍යාංශය බාධාවක් වූ බව දන්නවා. නායකයන් දෙන්නාගේ ගැටුමත් බලපෑවා. අගමැති සහ ජනපති නිවැරදි තීරණ නොගැනීමෙන් රටේ ජීවිත බිලි දෙන්න සිදු වුණා.

කොමිසම:

කුමන පත්කිරීම් නිසාද රටේ ආරක්ෂාව අනතුරට වැටුණේ ?

සාක්ෂිකරු:

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරුන් කිහිප දෙනකුම සිටියා. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සමඟ වැඩ කරන්න බැරි නිසා මෙහෙම වුණා කියලයි මා හිතන්නේ. රුවන් විජයවර්ධන රාජ්‍ය ආරක්ෂක ඇමැතිවරයාට කිසිම බලයක් ලබාදී තිබුණේ නෑ. බුද්ධි අංශවලට රනිල් වික්‍රමසිංහ මහතාට සම්බන්ධ වෙන්න දුන්නේ නෑ.

කොමිසම:

මුස්ලිම් ඇමැතිවරුන් සහ මන්ත්‍රීවරුන් මේ සඳහා සම්බන්ධ වී සිටියා ද?

සාක්ෂිකරු:

මා ඉන්නේ මුස්ලිම් සම්භවයක් තිබෙන දිස්ත්‍රික්කයක. 52,000ක් මුස්ලිම් අය එහි සිටිනවා. ඒ සියලු දෙනා අන්තවාදීන් නොවෙයි. සාමාන්‍ය ලෙස ජීවත් වීමට නොහැකි වූ විට ඔවුන් අන්තවාදයට යොමු විය හැකියි. ජාතිවාදය සමඟ ඔවුන් අන්තවාදයට යනවා. යහපාලන රජයේ මුස්ලිම් ඇමැතිවරුන් බහුතරයක් සිටියා. සිංහල අන්තවාදයක් සහිත දේශපාලන හස්තයක් නිසා මේ තත්ත්වය ඇති වුණා කියා මා විශ්වාස කරනවා. දේශපලාන වාසි තකා මෙය අවුස්සනවා.

කොමිසම:

මේ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මොනවා ද?

මුස්ලිම් ජනතාව මේ සම්බන්ධයෙන් දැනුවත් කළ යුතුයි. ඒ අය කොන් කිරීම වෙනුවට මහ ජාතිය සමඟ එකට එකතු වී සිටීමට ඔවුන් දැනුවත් කළ යුතුයි. මේ සඳහා රජය විශේෂ වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයි. මටත් මේ සිද්ධිය සම්බන්ධයෙන් යම් යම් තොරතුරු ලැබෙනවා. ඒවා සම්බන්ධයෙන් කොමිසම දැනුවත් කිරීමට මට අවස්ථාවක් ලබා දෙන්න.

හරීන් ප්‍රනාන්දු මහතාගෙන් සාක්ෂි විමසීම අවසන් කරමින් ඔහු මුදා හරින ලෙස කොමිසම නියෝග කළේය.

කොමිසම අද (18) පෙරවරු 10ට යළි රැස් වේ.

පාස්කු ඉරු දින ප්‍රහාරය ගැන සොයන ජනපති කොමිසම

දසක හතරකට පසු කෘෂිකර්ම ඇමැතිවරයකු උතුරේ කළ ප්‍රථම සංචාරය

උතුරුකරයේ ගොවි ජනතාවගේ ගැටලු පිළිබඳව සොයා බැලීමට දසක හතරකට පසු කෘෂිකර්ම ඇමැතිවරයකු උතුරේ කළ ප්‍රථම සංචාරය සලකුණු කරමින් මහින්දානන්ද අලුත්ගමගේ මහතා ඉකුත් දා යාපනයේ සංචාරයක නිරත විය.

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී යාපනය දිස්ත්‍රික් ගොවි සමිති හමු වූ ඇමැතිවරයා ඔවුන් මුහුණ දෙන ගැටලු සහ අවශ්‍යතා පිළිබඳව විමසීම් කළ අතර ඔවුන්ගේ ගැටලුවලට එම මොහොතේදීම විසඳුම් ලබා දෙන්නට ද ක්‍රියා කළේය.

කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධ සියලුම අයතනවල ඉහළ නිලධාරීන් මේ අවස්ථාවට සහභාගී කරවා ගත් ඇමැතිවරයා ගොවි ප්‍රශ්න සෘජුවම ඔවුන්ට යොමු කිරීමට ද අවස්ථාව ලබා දුන්නේය.

දමිළ භාෂාවෙන් කතා කළ හැකි ගොවියාගේ දුක හඳුනා ගත් ඇමැතිවරයකු දුක සැප සොයා බැලීමට පැමිණීම පිළිබඳවත්, උතුරත් දකුණත් යා කරමින් ඇමැතිවරයා සිදු කළ මේ වැඩසටහන පිළිබඳවත් උතුරේ ජනතාවගේ ප්‍රශංසාව හිමි විය.

තිස් වසරක යුද්ධය නිසා වැන්දඹු වූ කාන්තාවන්ට සහ ආබාධිත තත්ත්වයට පත් වූ අයට කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සහන රැසක් ලබා දෙමින් ගොවි සමිති හරහා ඔවුන්ගේ ආර්ථිකය නැංවීමට කටයුතු කරන බව ද ඇමැතිවරයා මෙහිදී කියා සිටියේය.

ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා, රාජ්‍ය ඇමැතිවරුන් වන ඩී. බී. හේරත්, මොහාන් ද සිල්වා, ශෂීන්ද්‍ර රාජපක්ෂ සහ සුරේෂ් රාඝවන් මහත්වරුන්, උතුරු පළාත් ආණ්ඩුකාරවරිය සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනවල සියලු ඉහළ නිලධාරීහු මේ අවස්ථාවට සහභාගී වූහ.

දිනමිණ ලහුඬු දැන්වීම්

රථවාහන

129

ටයර් සහ ටියුබ්

සේවා

ටයර් ටියුබ් 1000x1000x20 මෝටර් ග්‍රේඩර් පිරවූ ටයර් වගකීම් සහිත JCB බැකෝ ටයර් ටියුබ් සියලුම ක්‍රෙඩිට් කාඩ් භාර ගනිමු. 12x5x18 18x4x26 16x9x28 වැඩිපුර මුදල් ගෙවන්නේ ඇයි ඔබ සිටින ප්‍රදේශයට ප්‍රවාහනය. 155, ක්‍රවුන් ටයර්, කොළඹ 14. 0773-134060, 011-2344524, පෝක් ලිෆ්ට් ගල් ටයර්. 053166

වෙළෙඳ

210

ව්‍යාපාරික ස්ථාන

උවමනායි

මහනුවර නගර සභා සීමාවෙන් ව්‍යාපාරයකට සුදුසු දෙමහල් ගොඩනැගිල්ලක් අවශ්‍යයි. 071-8856717 055575

රැකී රක්ෂා

308

ඇබෑර්තු

වෙළඳ/අලෙවිකරණ

වෙළඳ වාහනයක වැඩට 20 නොඉක්මවූ පිරිමි ළමයෙකු උවමනාය. තෝරාගත් අයට නොමිලයේ ඉංග්‍රීසි සහ කොම්පියුටර් හැදෑරීමටද හැකිය. දුරකථන 072-5979163 අමතන්න. 055107

දිනුම් වාරය 614 නිල ප්‍රතිඵල

මුදල් ලෝවුන් Mega POWER මෙගා පවර් மெகா பவர்

NLB NATIONAL LOTTERIES

දිනය: 2020.09.16

බබ දිනුවන බබ විශ්වාසය

ඉංග්‍රීසි අකුර: V | සුපිරි අංකය: 06 10 14 29 35 | ජයග්‍රාහී අංක

	ත්‍යාග රටාව	ත්‍යාග මුදල රු.	ජයග්‍රාහකයන් සංඛ්‍යාව
පවර් සුපිරි ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 4ම ගැළපේ නම්	11,760,656.40	01
1 වන ත්‍යාගය	අංක 4 ක් පමණක් ගැළපේ නම්	1,000,000.00	-
2 වන ත්‍යාගය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000.00	02
3 වන ත්‍යාගය	අංක 3 ක් පමණක් ගැළපේ නම්	1,000.00	170
4 වන ත්‍යාගය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	500.00	376
5 වන ත්‍යාගය	අංක 2 ක් පමණක් ගැළපේ නම්	100.00	9,058
6 වන ත්‍යාගය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40.00	5,929
7 වන ත්‍යාගය	අංක 1 ක් පමණක් ගැළපේ නම්	20.00	147,647
8 වන ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20.00	27,067

ලංකාවේ විශාලම සුපිරි ත්‍යාගය

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 235,234,952.75

මීළඟ පවර් සුපිරි ත්‍යාගය	මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය
රු. 10,000,000.00	රු. 15,461,398.80

දිනා ඇති මුළු මුදල **රු. 16,955,896.40**

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

සඳුදා බදාදා හිත යන්නෙ ජයෝදා

ජයෝදා දැන් සඳුදා හා බදාදා
කෝටි 2න් ඇරඹෙන
සුපිරි ජයමල්ලක්
දස ලක්ෂ ගණන් තවත් තෑගි

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය | මුදල් අමාත්‍යාංශය | www.dlb.lk

Holmes Pollard & Stott

2020-09-16 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 714,366

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 41,893,986.40

රු. 11,760,656.40 පවර් සුපරි ත්‍යාග 01 රු. 2,000,000.00 ත්‍යාග 02 රු. 1,000,000.00 ත්‍යාග 01 රු. 100,000.00 ත්‍යාග 28

www.nlb.lk

දිනුම් වාරය - 4247 නිල ප්‍රතිඵල

මහජන සම්පත

දිනය: 2020-09-16

ජයග්‍රාහී අක්ෂරය: M | ජයග්‍රාහී අංක: 6 8 6 2 1 8

ත්‍යාග රටාව - අග සිට මුලට

			ජයග්‍රාහකයන් ගණන
1 වැනි ත්‍යාගය	6 8 6 2 1 8	රු. 2,000,000/-	01
2 වැනි ත්‍යාගය	8 6 2 1 8	රු. 100,000/-	12
3 වැනි ත්‍යාගය	6 2 1 8	රු. 10,000/-	109
4 වැනි ත්‍යාගය	2 1 8	රු. 1,000/-	1,110
5 වැනි ත්‍යාගය	1 8	රු. 100/-	11,100
6 වැනි ත්‍යාගය	8	රු. 20/-	109,974

ත්‍යාග රටාව - මුල සිට අගට

			ජයග්‍රාහකයන් ගණන
7 වැනි ත්‍යාගය	6 8 6 2 1	රු. 10,000/-	11
8 වැනි ත්‍යාගය	6 8 6 2	රු. 1,000/-	123
9 වැනි ත්‍යාගය	6 8 6	රු. 100/-	1,143
10 වැනි ත්‍යාගය	6 8	රු. 50/-	11,012
11 වැනි ත්‍යාගය	M	රු. 20/-	44,068

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 10,488,740.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 10,803,847.00

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

නිල ප්‍රතිඵල

සෙවිණ

செவன ඔබට ගෙවල් - අතට මුදල් உங்களுக்கு வீடு - கைகளில் காசு

දිනය 2020/09/16

දිනුම් වාරය 296

ඉංග්‍රීසි අකුර: B | ජයග්‍රාහී අංක: 09 37 45 54

	සංයෝග	තෑගි		ජයග්‍රාහකයන් ගණන
1 ත්‍යාගය	අංක 04 ගැළපේ නම්	රු. 1,000,000/-	බැගින්	-
2 ත්‍යාගය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	රු. 100,000/-	බැගින්	06
3 ත්‍යාගය	අංක 3 ක් ගැළපේ නම්	රු. 1,000/-	බැගින්	86
4 ත්‍යාගය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	රු. 200/-	බැගින්	153
5 ත්‍යාගය	අංක 2 ක් ගැළපේ නම්	රු. 100/-	බැගින්	4,091
6 ත්‍යාගය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	රු. 50/-	බැගින්	2,319
7 ත්‍යාගය	අංක 1 ක් ගැළපේ නම්	රු. 20/-	බැගින්	57,340
8 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	රු. 20/-	බැගින්	8,958

- ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම් පත අනිවාර්ය වේ.

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය	මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල
රු. Rs. 14,000,000/-	රු. Rs. 2,567,610/-

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය N.W.J. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථනය: 011 460 70 00 | 011 232 43 24
ෆැක්ස්: 011 4669416
වෙබ්: www.nlb.lk

ජාතික සම්පත

JATHIKA SAMPATHA ஜாதிக சம்பத

නිල ප්‍රතිඵල දිනුම් වාරය: 1055 | දිනය: 2020.09.16

ජයග්‍රාහී ඉංග්‍රීසි අක්ෂරය: H

ජයග්‍රාහී අංක: 7 4 7 8 5 1

අග සිට මුලට ත්‍යාග රටාව

01 ත්‍යාගය	7 4 7 8 5 1	රු: 2,000,000.00	ත්‍යාග	1
02 ත්‍යාගය	4 7 8 5 1	රු: 100,000.00	ත්‍යාග	2
03 ත්‍යාගය	7 8 5 1	රු: 10,000.00	ත්‍යාග	26
04 ත්‍යාගය	8 5 1	රු: 1,000.00	ත්‍යාග	299
05 ත්‍යාගය	5 1	රු: 50.00	ත්‍යාග	3,083
06 ත්‍යාගය	1	රු: 20.00	ත්‍යාග	29,443

මුල සිට අගට ත්‍යාග රටාව

07 ත්‍යාගය	7 4 7 8 5	රු: 10,000.00	ත්‍යාග	2
08 ත්‍යාගය	7 4 7 8	රු: 1,000.00	ත්‍යාග	38
09 ත්‍යාගය	7 4 7	රු: 100.00	ත්‍යාග	319
10 ත්‍යාගය	7 4	රු: 50.00	ත්‍යාග	3,075
11 ත්‍යාගය	H	රු: 20.00	ත්‍යාග	13,522
12 ත්‍යාගය	ජයග්‍රාහී අංක 6ම ඕනෑම පිළිවෙලට ගැලපීමෙන්	රු: 200.00	ත්‍යාග	120

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 4,040,100.00

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස හයක කාලසීමාවකට පමණි. රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යයි වේ.

ලබන සෙනසුරාදා සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 4607000, 011 2324324
ෆැක්ස්: 011 4669416
Web : www.nlb.lk

ගොවි සෙත නිල ප්‍රතිඵල

දිනුම් වාරය: 2542 | දිනුම් අදින ලද දිනය: 2020.09.16

ඉංග්‍රීසි අක්ෂරය: Z | ජයග්‍රාහී අංක: 32 48 70 80

	සංයෝගය	තෑගි මුදල	ජයග්‍රාහකයන් ගණන
1 ත්‍යාගය	අංක 4 ම නිවැරදි	රු. 1,000,000.00	01
2 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි	රු. 100,000.00	06
3 ත්‍යාගය	අංක 3 ක් පමණක් නිවැරදි	රු. 2,000.00	192
4 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි	රු. 1,000.00	440
5 ත්‍යාගය	අංක 2 ක් පමණක් නිවැරදි	රු. 100.00	10491
6 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි	රු. 40.00	6987
7 ත්‍යාගය	අංක 1 ක් පමණක් නිවැරදි	රු. 20.00	172917
8 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි	රු. 20.00	31536

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 222,570

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 7,841,640.00

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 61,546,953.60

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 සහ ඊට වැඩි ත්‍යාග රයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

මැගසින් හන්දියේ කොට්ටං තළන කහටක් නැති මිනිහා

මිනිස්සු

අහම්බෙන් මුණගැහුණු ජීවිත

අපි රුණැල්ල කොළොම්තොටට එබිකම් කරයි. ඒ ඇසිල්ලේ ඇවිස්සෙන කපුටු රෑන් එකම සෝෂාවක. ඔරලෝසුව නොතකන අපේ කතානායකයා දවස අරඹන්නේ ඒ හඬින්.

නවාතැන පේවිමන්ට් එක. ඉදුම් හිටුම් කෑම බීම හෝටල්වලින්. නාන්නෙ කරන්නේ පොදු තැන්වලින්. ඒ තමයි විජේසේනගේ විදිය.

තමන්ගේ කියා දෙයක් ගෙන්ද- ගම් පොළොවේ කොහේවත් නැහැ. ලෙඩට දුකට හවුහර- ණක් වෙන්නටත් කවුරුත්ම නෑ. කොට්ටං කහට ඉහිරිච්ච කමිසය ඉණට තදවෙච්ච කාකි පාට කොට කලිසම වළල්නක් කරලා බොරැල්ල 'ලෙස්ලි' පිට්ටනියේ කළු පාට යකඩ වැටේ එල්ලුව සරොං කෙට්ටිය. මේ තමයි අපේ කතානායකයා සතු සම්පත්. මාරුවෙන් මාරුවට ඒවා ඇඟලාගෙන ගමගේ යෙදෙන බී.ඒ. විජේසේනගේ කතාව සිතුවයි මේ.

අප කරපොවද්දිත් විජේසේන යකඩ වැටට පිටදීගෙන වාසිගෙන අල්ලට හිරවෙච්ච කළු ගල් ගෙඩියට වෙර දීගෙන ලා රෝස පාට කොට්ටං අහුරට බැට දෙන්නයි මාන බලන්නේ.

'කොහොමද මාමා...'

අපේ ඒ ඇමතුමෙන් බිමට හරවන් හිටිය දිගට් මූණ උස්සන් ගිලුණු ඇස්වලින් ඔහු දැන් අපේ දිහා බලාගෙන.

'මං මෙහේ නෙවෙයි. ගම ඇල්පිටියේ. අවුරුදු 6කට කලින් කොළඹ එන්න හිතුණා. ඒ වෙද්දි ගමේ මේසන් බාස්ලාට අත් වැඩ දීගෙන මං හිටියේ.

හා පුරා කියලා කොළඹ වරාය දොරකඩයි මං ඉඳගත්තේ. කොට්ටං ගස් පෙළක් දැකලා මේකෙන් වැඩක් ගන්න ඕනෑය කියලයි මං ගෝණි පඩංගුවකට කොට්ටං එක්කාසු කරන්න ගත්තේ. ඒත් එතැනින් මාව එළෙව්වානේ. ඉතින් මං 103 බස් එකේ නැඟලා ඇවිදින් බොරැල්ලෙන් බැස්සා. එදා ඉඳන් මං මෙහේ.

මුලින් කොට්ටං තැළුවේ මිටිකින්. එයින් හුගක් කල් වැඩ ගත්තා. පස්සෙන් පසු තමයි දැන් මේ තළන ගල අතට ගත්තේ.

විජේපාල ගැමියෙක් නිසාදෝ ආගන්තුක අපේ වග තුග වැඩිදුර නොවිමසා ජීවිතකතාව දිගාරින හැඩයි.

'මං තනිවෙච්ච කෙනෙක් නෙවෙයි. ගමේ මගේ සහෝදර සහෝදරියෝ ඉන්නවා. ඒ අය විවාහ වෙලා. දූ දරුවෝ හදාගෙන හොඳින් ජීවත් වෙනවා. මමත් ඒ අයගේ දුක සැප බලන්න අවුරුද්දකට දෙතුන් වතාවක් තැගි බෝග අරන් යනවා.

එච්චරයි මගේ ගමේ ගමන. ඒ හැරෙන්නට මගේ මුළු ජීවිතේම ගෙවෙන්නේ කොළඹ...

අපි එතැනින් කතාව මැදට එනවා. ඒ විජේසේන කොට්ටං ගෙඩියක් එක්කලා ඔටටු වෙන ඔටටුවීම ගැන කනගාටුවක් වැනි හැඟීමක් හිතේ දරන්. යමක් විමසන්නයි හිත අපට බල කරන්නේ.

'කොහොමද කොට්ටං එක්ක ගෙවෙන ජීවිතේ?'

'අපොයි වරදක් නෑ. වැහි කාලෙට නං එච්චර වාසියක් නෑ. පායන කාලෙට වැටෙන්නේ හොඳට පැහුණු ඒවානේ. වැහිදාට ළපටි ගෙඩිත් ගස් යට වැටිලා තියෙනවා.

කොයිහැටි වෙතත් මං පෝර උරේ අරන් හැමදාම රවුමක් යනවා. කොළඹ ටවුන්හෝල්, බොරැල්ල අවට විතරක් නෙවෙයි මං කොට්ටාවේ පවා කොට්ටං අහුලන්න යනවා. කාගෙන්වත් ආරෝවක් මට නෑ. හැමෝම මා එක්ක හිතවත්.

සමහරදාට පයින් ගිහින් බෑ. කොට්ටාවේ යන්නේ බස් එකේ. මං කවදාවත් කොට්ටං මල්ලේ බර කිරා මැන බලලා නැහැ. අතේ මිම්මෙන් තමයි මං බර මැන ගන්නේ. කොහොමටත් පෝර උරෙන් බාගයකට වඩා පිරෙනකල්ම මං කොට්ටං එකතු කරන එක නවත්වන්නේ නෑ.'

දැන් අපේ කතාබහ මැදට තව අමුත්තෙක් එකතු වෙනවා. ඒ වෙනින් කවුරුවත් නෙවෙයි. ඒ ටිං ටිං කියනා ලේන් පොඩිත්තෙක්. කිසිම බියක් සැකක් නැතිව ඒ සතා විජේසේනට කිට්ටු කළේ කලින් හොඳට හුරු පුරුදු කෙනකුට ළංවෙන ගානට.

තළ තළා කොට්ටං කොළයක් උඩට එක්කාසු කළ කොට්ටං මඳ දෙක තුනක් විජේපාල ලේන් පැංචා දිහැට වීසි කළ පසුවයි අපට ආපිට ලංවෙන්නේ. ඔන්න විජේසේන නැවතත් කතා බහේ.

ලේන්නු විතරක් නෙවෙයි. මයින්නුත් මගෙ යාළුවො. කහට බැඳුණු දත් වැටිය පෙන්වා සිනාසිසී ඔහු එහෙම කියනවා.

'ඇයි පොඩි ළමයි. ඒ අයත් මගෙ යාළුවෝ. අතේ මිටෙ සල්ලි බාගෙ නැති පොඩි උන්ටත් මයින්නන්ට , ලේන්නුන්ට වගේමයි මං නිකං තමයි කොට්ටං දෙන්නේ. පේවිමන්ට් එකේ නිදියන, එහිම වෙසෙන ඒ අවවින්ම ඉවත් වෙන්නට ඕනෑ දේවල් උපයා සපයා ගන්නා අපේ කතානායකයා පිළිබඳ අමුතුම හැඟීමක් වගේම ආඩම්බරයකින් දැන් අපේ හිත් තෙත් වෙනවා.

'කොහොමද ආදායම එහෙම?'

ඒ අපේ පැනයයි. දෙවරක් නොසිතා විජේසේන ඊට මේ විදියට උත්තර බඳින්නේ හිතේ කිසිම කහටක් නැතිව.

'සමහරදාට රුපියල් හය හත්දාහ කිට්ටු කරනවා. ඒත් හැමදාම නෙවෙයි. කොහොමටත් හාරපන්දාහක් නම් මට වැඩි මහන්සියක් නැතිව ලැබෙනවා.

අනෙක මං දවස තිස්සේ මහන්සි වෙන්නේ නැහැ. පෝර ගෝණියෙන් පේවිමන්ට් එකේ බිමට හළා ගන්නා කොට්ටං ගොඩ විකුණා ඉවර වෙද්දි මං පේවිමන්ට් එකෙන් යනවා.

ඒ කතාව ඔහු කියන්නේ පේවිමන්ට් එකේ ගොඩගැසූ තළා ඉවත දැමූ කොට්ටං ලෙලි දිහැ බලාගෙන. එවිටයි අපෙන් නිකම්ම වගේ තවත් පැනයක් පැන නැගුණේ.

'අහක නොදමා කොට්ටං ලෙල්ලෙන් වැඩක් ගන්න බැරිවෙයිද?'

ඒක මගෙන් නෙවෙයි. මේ රටේ ඉන්න ආචාර්ය මහාචාර්ය කට්ටියගෙන් තමයි අහන්න ඕනෑ. පාම් තෙල් විසයි කිය කියා අපේ කට්ටිය ගිලින්නේ අහක දාන රොඩ්ඩෙන් ගන්න පාම් තෙල් ටිකනේ. හොඳ ඒවා ලොකු ලොකු හෝටල්වලටනේ ගන්නේ. ඒ අතින් බලද්දී කොට්ටං ලෙල්ලෙන් කොයි තරම් වැඩ කන්දරාවක් ගන්ඩ පුළුවන්ද කියලා දැන්වත් හොයා බලන්න වටිනවා.කොහොම වුණත් මට එක දෙයක් කියතහැකි. ඒ කොට්ටං ලෙලිවලින් ස්ප්‍රීතු වුණත් ගන්ඩ අමාරු නෑ කියන එකයි (සිනාසෙයි)

අපේ ළෙන්ගතු මිතුරා ළඟ මහ මඟ ගමන් ගන්නා ලොකු කුඩා වාහන බොහොමයක් නවතියි. ඔහු එක් කොට්ටං කොළුයකට එක් කොට එතු කොට්ටං මඳ අහුර තවත් කොට්ටං කොළුයක ඔතා ගන්නේ හරි අපූරුවට. එකම ගැනුම්කරු කොට්ටං මුල් කිහිපයක් වුවද මිලට ගන්නේ නිර්ලෝභීව.

ඒ ඒ කොට්ටං 'මුල' හත අටක් එකට එක්කොට රබර් පටියකින් දවටාගෙන විජේපාල කොට්ටං බණ්ඩල් හදයි.

තවමත් අපට කුහුලක් ඉතිරියි. ඒ හැමදාමත් හොඳ ආදායමක් උපයන අපේ කතානායකයා එකම විදියට එකම තැනක එකම පේවිමන්ට් එකේ වැතිරෙන්නේ ඇයිද?

කොහොම වුණත් ඒ එයාගේ පෞද්ගලික දෙයක්. ඒත් නිකමට වගේ අපි ඇහැව්වේ. දවල් වන විට වෙළෙදාම් අවසන් කරන විජේදාස දවසේ හැන්දෑව ගෙවන විදියයි.

'මං වැඩ ඉවර කරලා ගිහින් සරොං කෙට්ටියයි කමිසෙයි හෝදලා වේළෙන්න දාලා මමත් නගර සභා පයිප්පයෙන් නා ගන්නවා. ඊට පස්සේ කහට කෝප්පයක් එහෙම තොල ගගා රේස් එකට දුවන මිනිස්සු වැඩ ඇරිලා අඩියට දෙකට යන එන දිහැ ඔහේ බලා ඉන්නවා. වෙලාවකට මට ඒ අය ගැන දුකත් හිතෙනවා.

ඔයින් මෙයින් ඉර බැහැගෙන යනවා. මමත් හරි බරි ගැහිලා එතකොට හන්දිය පැත්තට යනවා. අස්සයො දුවනවා බලන්න. ලේනුන්ට මයිනුන්ට වගේමයි අස්සයන්ටත් මං ආදරෙයි. කොච්චර මාව පැරද්දුවත් උන්ටත් මං වෙනසක් කරන්නේ නෑ....' විජේසේන සරලව සිනාසෙයි. දවස තවම තරුණයි. ඔහු නැවත වැඩ අරඹයි.

සටහන - නුවන් ජයවික්‍රම

ඡායාරූප - දමින්ත ගුණරත්න

නරි බියෙන් තැති ගත් මුවපට්ටිය

මිල්ලනිය ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ ගල්පාත, නිව්වැටල් වත්ත, මුවපට්ටිය ගම්මානය ඉතා දිළිඳු ජනතාවක් වාසය කරන ලැයිම් කාමර වලින් සමන්විත ගැමියන් බහුල දුෂ්කර ප්‍රදේශයකි. හොරණ, කළුතර ප්‍රධාන මාර්ගයේ දොඹගොඩ හන්දියේ සිට කි.මී 02 ක් පඹණ දුෂ්කර මාර්ගයේ යන අයකුට මෙම ජනතාවගේ ගරා වැටුණ අබලන් ලැයිම් කාමර පේළිය දැක ගැනීමට හැකියාව ලැබේ. අව්‍යාජ ගැමියන්ගෙන් ගහන මෙම ප්‍රදේශයේ බොහෝදෙනා බඩවියත රැකගන්නේ කුලී රැකියාවෙනි.

අනුන් සතු වතුවල කිරිකැපීම හෝ වතු ආශ්‍රිත එදාවේල රැකියාවල යෙදෙන මෙම මිනිසුන් ජීවිකාව ගෙන යාමට දරන්නේ අසීමිත වෙහෙසකි. කිසිවකුත් කතාබහ නොකළ මේ ගම්මානය ගැන රටම කතා කරන්නට හේතුව සකසන්නේ නරි රැළකි.අලින්ගෙන් කොටින්ගෙන්, රිළවුන්ගෙන් මෙන්ම වඳුරන්ගෙන් බැටකන ගම්මාන පිළිබඳ අප කොතෙකුත් කතාන්දර අසා ඇතත් නරි රංචුවකින් බැටකන ගමක් පිළිබඳ අප මෑත ඉතිහාසයේ අසන්නේ මෙන්ම දකින්නේද පළමු වරටය.

හේමාරාම හිමි

මෙම ගම්වාසීහු හවස් කාලයට එළි බසින්නේ ආරක්ෂාවට පොලු මුගුරු අත දරාගෙනය .නරි ගැටලු නිසා දරුවන්ව පාසැල් යැවීමට අපහසුය. ඇතැම්විට ඔවුන් රැකියාවට යාම පවා යන්නේ දෙගෙඩියාවෙනි.එම ගැමියන්ගේ දෛනික ජන ජීවිතය සම්පූර්ණයෙන්ම අඩාලව ඇත්තේ නරි ප්‍රහාරය කොයි මොහොතේ එල්ල වේදැයි නොදන්නා නිසාය.

මෙම වතුයාය පුරා තිබූ රබර් වගාව විනාශ කර කටුපොල් වගාව ආරම්භ කර තිබුණේ දැනට වසර හත අටකට පෙරය . කටුපොල් වගාව නිසා තම ජීවිත වලට එල්ල විය හැකි උවදුරු රාශියක් ඇති බවට එකල ජනතාව පෙන්වා දීමට කටයුතු කළත් බළධාරින් ඒවා තඹ දොයිතුවකටවත් මායිම් කළේ නැත. මේ වන විට කටුපොල් වගාව බැලු බැලූ අත සරුවට දිස් වුවත් මෙම අහිංසක ගම්වැසියන්ගේ ජීවිත එන්න එන්නම වැටුනේ අගාධයටය. දිනෙන් දින නරින්ගේ රජ දහනක් බවට මෙම වගාව පත්වූයේ කාටත් නොදැනෙන්නටය.

මීට මාස දෙකකට පමණ පෙර මේ ගමේ ජීවත් වූ අව්වාහක 57 හැවිරිදි පුද්ගලයෙකු වන නම්මුනි ආරියදාස මහතා කටුපොල් වගා ප්‍රදේශයට ගියේ ගොම අහුලා ගෙන එම සදහාය. නිවෙසේ සිට ඒ ගිය දුර මීටර් 200ක් පමණ වන්නට ඇත. නරියෙකු සපා කෑම නිසා ඔහු නිවෙසට දුව ආවේ කිසිවක් අදහාගත නොහැකිවය. නරියා එතෙකින් නොනැවතී ඔහු පසුපස හඹා එන්නට විය.එම අවස්තාවේ අවු 1 මාස 03 ක් වයසැති මල්ලිද වඩාගෙන පාරේ ළමයින් සමග සෙල්ලම් කරමින් සිටි අට හැවිරිදි කවිනි දියණිය ආරි මාමා පසු පස එළවා ආ නරියාට බය වී දුවන්නට ගොස් ඇද වැටුණේ මල්ලිද සමගය. බියෙන් තැතිගත් ඇය පසුව පැවසුවේ නරියා ඇයව සපා කෑවේ නැති බවත් ගවුමේ ගෑවුණා පමණක් බවත් ය. නමුත් දැන් ආරි මාමා මෙන්ම කවිනි දියණියද මරු තුරුලේය. ආරි මාමාට තුන්වන එන්නත ලබා ගැනීමට තිබියදී මේ විපත සිදු වුවත් කවිනි දියණියගේ මව්පියන්ගේ නොදැනුවත්කමට එන්නත් ලබා නොගැනීමේ වරදින් මිය ගියා විය හැකිය. නරියා ඈසල නිවසක කුකුලෙකුද සපා කා ඇති අතර ඔවුන් එකතුව නරියාට පහර දී මරා දැමීමට කටයුතු කළෝය. එමෙන්ම ඔවුන් පවසන්නේ නරියන් බලු පැටවෙකුද සපා කා බලු පැටවා මියගිය බවය.

නරි ප්‍රහාරයට ලක් වූ කුකුළෙක්

එලෙස ඇරඹි නරි ප්‍රහාරය දිනෙන් දින වර්ධනය වූයේය.අවසානයේ එතරම් ජවසම්පන්න ගම්මුන් නරියන්ට බියවී ගෙතුළට වී කල් ගෙවන්නට තරම් බිය වූහ.පාරට තොටට බහින ගොම්මන් කළුවරේ මේ ගැමියන් අත පොල්ලක් හෝ වක පිහියක් දක්නට ලැබුණේය.අලි හඹන පාරවල යන පුද්ගලයන් අලි වෙඩිල්ලක් අතැතිව යන්නා පරිද්දෙන් මෙම ගැමියන් අත නිතට ශක්තිමත් මුගුරක් දැකගත හැකිය.තත්ත්වය එන්න එන්නම නරක අතට හැරුණේය.

මේ වන විටද මෙම ගම්මානයට මෙන්ම තවත් ප්‍රදේශ කීපයකටම උදාවී ඇත්තේ එතරම් හොඳ කල දසාවක් නොවන බව පැහැදිලිය .මේ වන විට මී ගවයෙකුද අසාමාන්‍ය රෝග ලක්ෂණ පෙන්වා ඇත. දැනට දින තුනක පමණ සිට මෙම ගවයා ගම්වැසියන්ට පහර දීමට සැරසෙන බවත් තණකොල හෝ ජලය පානය නොකර පස් කන බවත් ඔවුන් පවසති . මේ නිසා කටුපොල් කැල්ලේ කඹ හතරක් දමා ගවයා බැද දැමීමට ඔවුන් කටයුතු කර තිබෙන්නේ අදාල අංශද දැනුම්වත් කරමිනි.

විජයකුමාරි මිය ගිය කවිනිගේ මවයි.තම ආදරණීය දියණියගේ හදිසි වියෝවෙන් ඈ සිටින්නේ අදහාගත නොහැකි දුකක් පපුතුරතුළ සඟවාගනිමිනි.

මගෙ කවිනි දුව තමයි නැති වුණේ. එදා ළමයි දෙන්නම සෙල්ලම් කරමින් හිටියේ. නරියෙක් එළුවන් ආව කියල දරුවා කිව්වා. ළමය කිව්වෙ නරිය කෑවෙ නෑ ගවුමෙ ගෑවුණා විතරයි කියල. අපි දැක්කෙ නැති නිසා ළමය කිපුදේ විශ්වාස කළා. එදා වැටිල ළමයි දෙන්නටම තුවාල වෙලා තිබුණා. ඒවට බෙහෙත් දාගෙන ඇවිත් දුව සාමාන්‍ය විදියට හිටිය. බයිසිකල් පැද්ද, නැටුම් නැටුවා, නෑදෑ ගෙවල් වල ගියා සේරම කළා. එහෙම හිටපු ළමය තමයි හදිසියෙ අසනිප වෙලා නැති වුණේ. ඊට පස්සෙ එම්. ඕ. එච්. එකේ මහත්තුරු ඇවිල්ල ලැයිමෙ කට්ටිය 52 ක් බොරැල්ලට එක්ක ගිහින් දැනුවත් කළා. එතකං ජල හිතිකාව කියන්නෙ මෙච්චර භයානක මාරාන්තික එකක්ද කියල අපි දැනුවත් වෙලා හිටියෙ නෑ. ඊට පස්සෙ අපේ පවුලෙ කට්ටිය ගිහින් බේත් විදගත්තා. ඈ ඒ අඳුරු අතීතය සිහි කරන්නේ කඳුළු මැදිනි.



මියගිය කවිනි

කවිනිගේ පවුලේ අය

මියගිය නරියෙක්

සිහිසන් වූ හරකා

ගෝවින්ද රාජ් මහතා ද නරි කරදරයට මැදිව අසරණ වූ ගැමියෙකි. අද මෙම නරි කරදරය නිසා ඔහුට ජීවිකාව පවා අහිමිවී තිබේ

මම රෝද පුටුවෙන් යන ආබාධිතයෙක්. හොරණ කළුතර ප්‍රධාන පාරේ බංගලාවක් මුර කරල තමයි කීයක් හරි හොයා ගන්නේ. ගෙර ඉදල කිමී 1 1/ 2 ක් විතර ප්‍රධාන පාරට දුරයි. නරි කරදරේ හින්ද රෑට පාරේ යන්න දැන් අපිට බයයි. ඒ හින්ද මම දැන් මුර වැඩේට යන්නෙ නෑ. ඒ පැත්තෙන් කුරුඳු කැලේ මේ පැත්තෙන් කටු පොල් කැලේ. කටුපොල් කැල්ල පැත්තෙ ඉදල තමයි නරි එලි බහින්නෙ. ආරිව කෑවට පස්සෙ අපේ අක්කවත් කාල තිබුණා. කොයි මොහොතේ අපිව කාල පනීද කියල දන්න්නෙ නෑ.

ඇතැමුන් සුළු වශයෙන් තැකුවද ඇතැමුනට අදහාගත නොහැකි විහිළුවක් සේ පෙනුනද මෙය ජන ජීවිතය අඩාල කළ දරුණු ගැටලුවකි.

ඉන්ද්‍රානි ගමගේ මහත්මියද මුවපට්ටිය ගම්මානයේ ජීවත්වන කාන්තාවකි. පළමුවරට නරි ප්‍රහාරයට ලක්වූ ආරි දුවගෙන ආවේ ඇගේ නිවෙසටය.

ආරිට මොලේ ආබාධයක් තියෙනවා. එයා එහා කන්ද පුරා ඇවිදල. එතකොට නරිය කාල තියෙනවා. එයා අපේ ගෙදරට දුවගෙන ඇවිත් හාවෙක් වගේ පූසෙක් ඇඟට පැනල කෑව කිව්වා. ලේ වැක්කෙරෙනවා බලන කොට. ඇහැ ළඟ තමයි ලොකු තුවාලෙ තිබුණෙ කට ඇරිල වගේ. මෙයාව කාල ලේ රහට තමයි නරිය පස්සෙන් ආවෙ. නරියට බයේ ළමයි ටික ගේ ඇතුලට දිව්වා. නැති වුණ ළමයයි පොඩි ළමයයි නරියයි තුන්දෙනාම එක ගොඩේ වැටිල තමයි තුවාල වෙලා තියෙන්නෙ. මිනිසුන්ට පමණක් නොව සතුන්ටද පහර දෙන මෙම නරි රංචුව ගොම්මනේ ගම්වදින්නේ මිනිසෙකු හෝ සතකු ඉලක්ක කර ගනිමිනි. ලෝකයේ ප්‍රචලිත වන දිවි සැරිසර වැඩසටහන්වල අප නරින්ට ගොදුරුවන සතුන් ඕනෑතරම් දැක ඇති නමුත් මෙවැනි කතාන්දරයක් අප අසන්නේ ඉඳහිටය.

සිරිසේන ද සිල්වා මහතා ද මෙම ගමෙහි වැසියෙකි. ඔහු මෙම තත්ත්වය ගැන කියන්නේ මෙවැනි කතාවකි.

මගෙ මල්ලි වත්තෙ රස්සාව කරන අතර මී හරක් 06 දෙනෙකුත් හදනවා. රෑට ගෙදරට අරන් එන්නෙ නෑ මේ සත්තු කවදාවත්. දොඹගොඩ කිරි දෙන තැනකට මී කිරිත් දෙනවා. මේ හරකගෙ දෙවෙනි පැටියට දැන් අවු 02 ක් විතර වයසයි. දැන් කිරි ගන්නෙ නෑ . පොඩ්ඩ් කියල කතා කලාම වෙනදට ඌ හරි හීලැයි ළඟට එනවා. දැන් දවස් තුනක විතර ඉදල මිනිහෙකුට ළඟට එන්න දෙන්නෙ නෑ අනින්න පනිනවා. පස් විතරයි කන්නෙ. තණකොළ කන්නෙත් නෑ. වතුර බොන්නෙත් නෑ . අපි නිලධාරින්ට කිව්වා. පශු වෛද්‍ය මහත්තය ඇවිත් බලල අනිත් සත්තුන්ට බේත් විදීදා. මුට විදින්න බැරිවුණා. අපි දැන් කඹ හතරක් දාල හරකා බැඳල තියෙන්නේ.හරකව නරියෙක් කාල අසනීප වෙලා වෙන්න ඇති.

මෙම ගම්මානය අතිශය දුෂ්කර බව අප මුලින්ම ලියා තැබුවේ මෙම ගම්මානය පිළිබඳ චිත්‍රයක් ඔබට සැපයීමට අවශ්‍ය නිසාමය.

මහේන්ද්‍ර කුමාර මහතා මේ අපට කියන්නේ ඒ සැබෑ කතාවය.

ඉස්කෝලෙ යන ළමයි කි මී 03 ක් විතර දුර පයින් යන්න ඕනෑ. පාරේ පාලමක් තියෙනවා යට ගල් ගැලවිලා බුරුල් වෙලා. ත්‍රීවිල් එකක්වත් යන්න බෑ. ළමයි දැන් තනියෙන් යවන්න බයයි පාරෙ. කොහේ නරි ඉන්නවද කියල දන්නෙ නෑ. මේ පාරේ දිගටම ලයිට් කණු තියෙනවා. ඒත් හුඟක් ඒවයෙ එළිය නෑ. අපිට කිසිම පහසුකමක් නෑ. පවුල් හතරකට පහකට තියෙන්නෙ එක ටොයිලට් එකයි. ඒවත් අබලන්. ඒකටත් පෝලිමේ ඉන්න වෙලා. හැමදාම අපි දුක් විඳපු එක විතරයි වුණේ. මේවටත් විසඳුමක් දෙනව නං හොඳයි .

සැබෑවටම මෙම ගම්මානයේ ජනතාව දැන් සිටින්නේ මර බියෙනි.තමන්ගේ එදිනෙදා ජීවිතය නරින්ගෙන් ආරක්ෂා කරගැනීමට ඔවුහු වෙහෙසෙති. තමන්ගේ දරුවන් තනිපංගලමේ ගමනක් යවන්නට දැන් නොහැකිය.නරි රැළ කොයි මොහොතේ කොයි ඉසව්විවෙන් එළි බහිනවාදැයි කිසිවකු නොදනී. ලේ රහට කට හුරුවූ නරි රැළ දැන් විමසිල්ලෙන් සිටින්නේ ගොදුරු ගැනය .එය එතරමටම භයානක තත්ත්වයකි.

මෙම ගැටලුව නිර්මාණය වී ඇත්තේ අවට කටුපොල් වගාකිරීම නිසාය.කටුපොල් වගාව තහනම් කිරීම පිළිබඳ අධ්‍යනයක් කර ඒ පිළිබඳ වහාම කටයුතු කරන ලෙස ජනාධිපතිතුමන් උපදෙස් දුන්නේ ගාල්ල උඩුගම පැවති සංවර්ධන කම්ටු රැස්වීමක් අමතමිනි. කටුපොල් වගාව පරිසරයට හානි පමුණුවනවා සේම ජනතාවගේ සාමාන්‍ය ජනජීවිතයට වක්‍රාකාරයෙන් හානි පමුණුවන බවට මෙම සිද්ධිදාමය කදිම උදාහරණයකි.

දොඹගොඩ ශ්‍රී විවේකාරාමාධිපති මිල්ලනිය ශාසනාරක්ෂක බළ මණ්ඩලයේ ලේඛකාධිකාරී පූජ්‍ය ඕමත්තේ හේමාරාම හිමියන් මේ පිළිබඳ වැඩිදුරටත් කරුණු පැහැදිලි කරන්නේ මෙලෙසිනි.

දැනට මාස දෙකක පමණ ඉඳල මේ ප්‍රදේශයේ ජන ජීවිතයට පහර එල්ල වෙලා තියෙනවා. විශාල ලෙස නරින් ගම් වල සැරි සැරීමට පටන් අරගෙන තියෙනවා. විශේෂයෙන් නිව් වැටල්වත්තෙ හොරහේන කොටසෙ ඇති කටුපොල් වගාව නරින්ගේ වාස භූමිය බවට පත් වෙලා තියෙනවා. ඒ අවට තියෙන බණ්ඩිගෙ වත්ත, දොඹගොඩ, දහපැලියහේන යන ප්‍රදේශ වල ජනතාවට මේක බලවත් හිරිහැරයක්. දරුවන් පාසැල් යැවීම පවා අනතුරුදායකයි. හවස 5 න් පස්සෙ ජනතාව ගමන් බිමන් යාමට මැලි වෙලා තියෙනවා. මෙය කොරෝනා වයිරසය වගේම භයානක තත්ත්වයක් බවට පත් වෙලා. කටුපොල් නිසා සර්පයො, ඌරො විතරක් නෙමෙයි මොනරුත් රංචු පිටින් ගම් වලට බහුලව එනවා. ඊටත් වඩා භයානක රෑ වෙන කොට ත්‍රීවිල් වලින් ඇවිත් අභිසාරිකාවොත් ඕකට රිංගනවා. මේ නිසා බාල පරපුර නොමග යනවා. සදාචාරය පිරිහෙනවා. මේ පිළිබඳ කළුතර දිස්ත්‍රික් ප්‍රාදේශිය ලේකම් නිලංකා වෙත්තසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් මිල්නිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී 16 දා විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමටද කටයුතු යොදා තිබිණි. මෙහිදී නරි ප්‍රහාර හෝ නරින්ගෙන් සිදුවෙන යම්කිසි බලපෑමක් සම්බන්ධයෙන් දැනුම් දීමට 1992 නැමති දුරකතන අංකය හඳුන්වා දීමට වනජීවී දෙපාර්තුමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යක්ෂක තාරක ප්‍රසාද් මහතා කටයුතු කළේය. වටිස් ඇප් කණ්ඩායමක් හදුන්වා දී ඒපිඑස් තාක්ෂණය ඔස්සේ නරි ගැවසෙන ස්ථාන හඳුනාගැනීම හා ක්ෂණික විසඳුම් ලබා ගැනීමට මේ ඔස්සේ පහසු වෙන බව මෙහිදී අවධානය යොමු කෙරිණි. එමෙන්ම සුනඛයන් හා ගවයින් වැනි සතුන් නරින්ගේ සපා කෑමට ලක්ව ජලභීතිකා රෝගය වැලඳීම පාලනය කිරීම මෙන්ම මෙම තත්වයෙන් ජනතාව මුදා ගැනීම සඳහා ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳවද මෙහිදී අවධානය යොමු කෙරිණ.

කළුතර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති විජිත ගුණරත්න, ප්‍රාදේශිය වසංගත රෝග වෛද්‍ය ප්‍රසාද් ලියනගේ මහතා ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූ අතර ඔවුන් මුවපට්ටිය ගම්මානයේ සංචාරය කර වියරුවැටී සිටි ගවයා නිර්වින්දනය කර දම්වැල් වලින් බැඳ දැමීමත් ජනතාව දැනුවත් කිරීමත් සිදු කළහ.

සැබෑවටම මෙය ඉතා ඉක්මනින් පිළියම් සෙවිය යුතු ගැටලුවකි. ගම්මුන් පවසන්නේ කටුපොල් වගාව තුළ සර්පයන් බෝවීම වැළැක්වීමට යෙදූ මොනරුන් ආහාරයට ගැනීමට පැමිණෙන හිවලුන් මේ ආකාරයෙන් ගම්වදින බවයි. මෙම ප්‍රශ්නයට ඉතා ඉක්මනින් පිළියම් සෙවීමට අපොහොසත්වුවහොත් මුවපට්ටිය ගම්මානයේ මිනිසුන්ගේ හෙට දවස අඳුරුවනු නියතය. එම නිසා කපටි නරියන්ගෙන් මේ මිනිසුන් ගලවාගැනීමට නුවණැති බලධාරින් නොපමාව කටයුතු කළ යුතුමය. එවිට නරින්ගේ හූ හඬ වෙනුවට මේ ගම්මානය නිර්ව්‍යාජ මිනිසුන්ගේ සිනා හඬින් පිරෙනු ඇත.

ඉන්ද්‍රාණී

සිරිසේන

ගෝවින්ද

සටහන හා ඡායාරූප
විනීතා මානෙල් ගමගේ

සාහිත සේසත

සාහිත්‍ය මාසය වෙනුනේ පිදෙන විශේෂ දැන්වීම් අතිරේකය



භව දුක් නිවන - සාහිත පොත්

"සාහිත පොත් පියස" නිර්මාතෘ ශාස්ත්‍රපති චාමික මුණසිංහ

සැබැවින් ම පොත් අපේ මිතුරෝ ද? හැම පොතක් ම හොඳ පොතක් ද? පොත් කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේද? දැවෙන හිත් නිවන පොත් මොනවා ද? බොහොමයක් පොත් දැක්කාට හිත් පිරෙනවා ද? යන ගැටලු අප ඉදිරියේ තිබේ. මහරගම - නාවින්න සහ කොළඹ 10 - මරදාන "සාහිත පොත් පියස" ප්‍රකාශන ජාලයේ නිර්මාතෘ, මාධ්‍යවේදී, ශාස්ත්‍රපති චාමික මුණසිංහ මහතා අපට දුන් පිළිතුරුයි මේ.

පොත් ප්‍රකාශන ක්ෂේත්‍රය කෙරෙහි ඔබේ ආගමනය සිදු වුණේ කොහොම ද?

මුලින් ම නම් මා ලියූ පොත් විතරයි පළ කළේ. ඊට පස්සේ දන්න කියන අයගේ පොතුත් ප්‍රකාශයට පත් කළා. දැන්නම් "සැම හිත සුව පිණිස" වන පොත් පත් පළ කිරීමට බාර ගන්නවා.

මෙවර (2020) සාහිත්‍ය මාසයේ ජනගත කළ පොත් හැර දැනටමත් සාහිත්‍ය ප්‍රකාශන එකසිය විස්සකට වැඩි ප්‍රමාණයක් එළිදක්වා තිබෙනවා.

සාහිත පොත් පියසින් එළි දක්වන්නේ, මොනවගේ පොත්පත් ද?

ප්‍රබන්ධයට වඩා සත්‍යය හැමවිටම ශ්‍රේෂ්ඨයි. එය විස්මයජනකයි නිසා අප පුහුදුන් මනසින් ගොතන සිහින ප්‍රබන්ධ කථා කිසිවක් පළ කරන්නේ නැහැ. ඒ අනුව විසූක දස්සන පොත් වෙනුවට සුවාසූ දහසක් උතුම් ශ්‍රී සද්ධර්මය මුසු වූ සදහම් පොත් තමයි වැඩිපුරම අප පළ කරන්නේ.

කථා වස්තු සහිත සම්පූර්ණ ධම්මපදය, සිතුවම් සහිත සරල සංක්ෂිප්ත 'ත්‍රිපිටකය', විමාන වස්තු, ප්‍රේත වස්තු කථා, ධම්මපදට්ඨ-ජාතකට්ඨ කථා, බුදුන් දවස දහම් කථා, රස බණ කථා සහ භික්ෂු රස කථා යනාදී ධර්ම ග්‍රන්ථ අපේ ප්‍රකාශන අතර වෙනවා.

ප්‍රවීණ, වියත්, ධර්මධර යතිවරුන්ගේ කෘතිත් ඔබේ ප්‍රකාශන අතර තිබෙනවා නේද?

ඔව්. අජාන් චා හිමියන්ගේ නිර්වාණ දේශනා, භාවනා හා නිර්වාණාවබෝධය, කායිව් රහත් තෙරණිය සහ තායි මහරහතන් වහන්සේලාගේ පරිවර්තන කෘති රැසක් පසුගිය කාලයේ අපි එළිදැක්වූවා.

ආනන්ද මෛත්‍රෙය, රේරුකානේ චන්දවිමල, බෙල්ලන ඤාණවිමල ආදී මහා නාහිමිවරුන්ගේ අප්‍රකට මාහැඟි ග්‍රන්ථ කිහිපයකුත් අපට එළි දක්වන්නට වාසනාව ලැබුණා. මීට අමතරව පාතේගම ඤාණිස්සර, අගලකඩ සිරිසුමන, මැදගොඩ අභයතිස්ස හා ඉඳුරාගාරේ ධම්මරතන යනාදී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හිමිවරුන්ගේ කෘති රැසක් අප ජනගත කර තිබෙනවා. ඒ වගේම පූජ්‍යපාද දෙඩම්පහළ ශ්‍රී රාහුල, තලල්ලේ චන්දකිත්ති, මාවරලේ භද්දිය, ගල්කිස්සේ සෝමානන්ද, පිටිගල ධම්මවිනීත, කොළ ඕස්සේ ධම්මානන්ද, පොල්ගහවෙල මිතභාණී, මුලන්නේ ගුණානන්ද, මහරැඹද වැවේ පාලිත හා ආචාර්ය මිරිස්සේ ධම්මික යනාදී ගෞරවණීය යතිවරුන්ගේ මෙන්ම ඔස්ට්‍රේලියාවේ බෝධිචිත්තා මෙහෙණියගේ ග්‍රන්ථත් ලොවට දායාද කිරීමට අපට හැකි වුණා.

මෙවර ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී පාඨකයන්ට විශේෂ අඩු මිලට ලබාගත හැකි ඔබේ නවතම පොත් මොනවා ද?

ප්‍රවීණ මාධ්‍යවේදී අජිත්ලාල් ශාන්ත උදය විසින් සම්පාදනය කළ බුදු වෙන්න පෙරුම් පිරූ - ආනන්ද මෛත්‍රෙය නාහිමි - ආශ්චර්ය අත්දැකීම්' (ඉසිවර ගමන - විමර්ශන ග්‍රන්ථය), නෝමන් සිරිපාල සූරීන් සම්පාදිත මම මහාමායා දේවී නම් වෙමි" (දීපංකර පාද මූලයේ සිට මාතෘ දිව්‍ය පුත්‍රයාණන් දක්වා), වනගත ආරණ්‍ය සේනාසනයක අප්‍රකට යෝගාවචර භාවනායෝගී භික්ෂුවක විසින් විග්‍රහ කරන ලද දහම් කාරණා ඇසුරින්, ධර්ම සන්දනායක සූරීන් සම්පාදිත නිවන දුර නොවේ' සංවාදශීලී ග්‍රන්ථය මෙන්ම මා විසින් සම්පාදනය කෙරුණු "විදු ඇස් පාදන බුදු රැස්" (තුන්කල් දැක්ම) යනාදී අලුත් පොත් රැසක් මෙලෙස ජනගත කර තිබෙනවා.

නැවත මුද්‍රණ කිසිවක් මීට සමගාමීව එළිදැක්වීමක් කළේ නැද්ද?

වැඩි පාඨක ඉල්ලුමක් සහිත, මීට පෙර එළිදැක්වූ කෘති කිහිපයක්, නැවත (නව) මුද්‍රණ කිහිපයක් ලෙස පළ කළා. ආනන්ද මෛත්‍රීය හිමියන්ගේ



අවසන් සාකච්ඡා, 'භාවනා අප්‍රකට ලිපි,' පානදුරේ අරියධම්ම හිමියන්ගේ 'බෝධි පූජා කවි, වන්දනා ගාථා හා පිරිත් දේශනා', පාතේගම ඤාණිස්සර හිමියන්ගේ 'කර්මය පල දෙන හැටි', බෙල්ලන ඤාණවිමල හිමියන්ගේ සිත නිවන ලෝකය, අජරාමර ලෝකය', සෝම හිමි අප්‍රකට ලිපි, සෝම හිමි නම් දිව්‍ය පුත්‍රයා', දෙඩම්පහළ රාහුල හිමියන්ගේ දෙවියෝ සහ භූතයෝ, නිවැරැදි වත් පිළිවෙත්, හලලියේ කරුණාතිලක ලියූ ' පිනෙන් ලබන දෙව් විමන්" සහ අප ලියූ බුද්ධෝත්පාද ලෝකය, අබුද්ධස්ස කාලයේ බුදු සසුන ඇතුළු ග්‍රන්ථ රැසක්, නැවත මුද්‍රණ අතර වෙනවා.

සාකච්ඡා සටහන: ඉරෝෂිණී දීපිකා

පොතට හිත බැඳෙන සාහිත්‍ය වසන්තය

සාහිත්‍ය වසන්තය එළැඹ තිබේ. එනයින්, පොත් ප්‍රකාශකයන්ගේ සංගමය මඟින් පවත්වන පොත් ප්‍රදර්ශනය අදින් ඇරැඹේ. සාහිත්‍යය ඇසුරින් පාඨකයා දුරස් වෙමින් පැවැති වකවානුවක ඇරැඹුණු මේ පොත් ප්‍රදර්ශනය, බාල, තරුණ, මහලු ඈ කිසිදු වයස් භේදයකින් තොරව, පාඨකයා නැවත පොතපතට ඇද බැඳ ගැනීමට හේතු විය. වසර ගණනාවක සිටම, පොත් ප්‍රදර්ශනය පැවැත්වීම සාහිත්‍ය මාසයේ ප්‍රධානතම අංගයක් බවට පත්වී තිබේ.

මේ පොත් මංගල්‍යය මඟින්, මෙරට වෙසෙන පාඨකයන්ට, ඉතා පහසුවෙන්, තමන්ට අවශ්‍ය පොත් ලබා ගැනීමට මඟ විවර කර දෙයි. පොත් කෙරෙහි ඇලුම් කරන පාඨකයා, පොත් ප්‍රදර්ශනය පැවැත්වෙන දිනය පිළිබඳ උනන්දු වන්නේ සැප්තැම්බර් මාසය ආරම්භ වීමත් සමඟමය. පොත් ගැනීමට කැමැති අයට මෙන්ම, පොතපත කියවීමේ රුචියක් ඇත්තන්ට, මේ මාසය අතිශයින්ම වැදගත්ය.

සමහරුන් පොත් ප්‍රදර්ශනය සඳහා යන්නේ, පාසල් පොත්පත්, පාසල් ලිපිද්‍රව්‍ය, වැඩපොත් වැනි දෑ වට්ටම් සහිතව ලබා ගැනීමටය. එය එසේ වූවාටද කම් නැත. එනමුදු, සැබැවින්ම විය යුත්තේ දැනුමෙන් පොහොණි වීමට අවශ්‍ය පොතපත කෙරෙහි පාඨක අවධානය යොමු වීමය. ඒ සඳහා දරුවන් පෙලඹවීමේ වගකීම ඇත්තේ ගුරු දෙගුරුන්ටය.

මෙවර පොත් ප්‍රදර්ශනය වෙනදාට වඩා වෙනස් වන්නේ, නිරෝධායන නීති රීතිවලට අනුගත වෙමින්, පොතපත ගැනීමට සිදුව ඇති නිසාය. වට්ටම් සහිතව පොතපත ලබා ගැනීමට මඟ සැලසෙන මේ අවස්ථාවේදී, තමන්ට අධ්‍යයන කටයුතු සඳහා අවැසි පොතපත ලබා ගන්නා අතරේ, දැනුමෙන් ඥානනය විය හැකි පොතපත තෝරා ගැනීමට මුල්තැන දීමද වෙසෙසින් වැදගත්ය.

සාහිත්‍ය මාසයේදී, පසුගිය වසරේ පළවූ පොත් සඳහා සම්මාන පිරිනැමීමද ප්‍රධානතම සිදුවීමකි. සම්මානයට පත්වූ පොතපත මෙන්ම, සම්මානයට පාත්‍ර නොවූ හොඳ පොත් මිලදී ගැනීමට පාඨකයා යොමු වන්නේ නම්, එයද මෙරට ලේඛකයාට දිරි දීමකි.

අතීත මිනිසුන්ගේ දිවිය, සාහිත්‍ය රසවින්දනය හා අත්‍යන්තයෙන් බැඳී පැවතිනි. හරවත් සාහිත්‍ය නිර්මාණ මඟින් උකහා ගත් දැනුම, අවබෝධය මත, තම ජීවිතය හැඩ ගස්වා ගන්නටත්, ඒ හරහා අවට සමාජ පරිසරය අවබෝධ කර ගන්නටත් අතීත මිනිසුන්ට හැකියාව ලැබුණි.

අතීතයේදී සාහිත්‍ය කලාව අගයමින් ජීවත් වූ මිනිසාට, තම ජීවන පැවැත්ම සංකීර්ණත්වයට පත් වීමත් සමඟම, සාහිත්‍ය කලාවෙන් ඇත් වීමට සිදු විය. සාහිත්‍ය සමඟ තිබුණු සමීප බව, දුරස් විය. එම දුරස් බව නිසාම, අද වන විට සාහිත්‍යය ඇසුරු කරන පිරිස අවම වී තිබේ. එය සැබැවින්ම කනගාටුවට කරුණකි.

එනමුදු, වසරකට වතාවක් හෝ පැවැත්වෙන මේ සාහිතය නැඹුරුව පිළිබඳ යම් තරමකින් හෝ සතුටු විය හැකිය. මිනිසා සාහිත්‍ය කලාවෙන් දුරස් වූ විට, පරිපූර්ණ මිනිසකු බවට පත් වන්නේ නැත. ඔහු පිරිපුන් බවට පත් වන්නේ විදග්ධ සාහිත්‍ය පරිශීලනය කළහොත් පමණි. සාහිත්‍ය ඇසුරේ ජීවිතය ආලොක්වත් කර ගතහොත් පමණි.

අද්‍යතන යුගය වනවිට මිනිසා තාක්ෂණික වශයෙන් අත්පත් කරගෙන ඇති දියුණුවද, විදග්ධ සාහිත්‍යයෙන් සහෘදයා දුරස්ථ වීමට ප්‍රබල හේතුවක් බවට පත්ව තිබේ. අතීතයේදී සාහිත්‍ය කෘති පරිශීලනය කළ පාඨකයා, මේ වනවිට සයිබර් සාහිත්‍ය පාඨකයකු වී ඇත. එම පරිවර්තනය හේතුවෙන් යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵල උදාවී තිබේ. සයිබර් අවකාශය තුළ පළ කෙරෙන අසීමිත සාහිත්‍ය, තාරුණ්‍ය වශී කරවන බව රහසක් නොවේ. එහෙත් එම නිර්මාණ, සාහිත්‍ය පෝෂණයට කෙතරම් දුරට ඉවහල්වේ ද? යන්න ගැටලුවකි. එසේම, බිහිවන සමහර පොත්වල ප්‍රමිතිය පිළිබඳවද ගැටලු පවතී. සමහර පොත්වල අක්ෂර වින්‍යාසයේ වැරැදි ඇත. නිවැරැදි ව්‍යාකරණ විධි අනුගමනය කර නැත. මෙවැනි ප්‍රමිතියෙන් තොර පොත් බිහිවීම, මුළු මහත් සමාජයක්ම භාෂා වැරැදි කෙරෙහි යොමු කරවන්නට හේතු වනු ඇත. මේ නිසා, පොත් මුද්‍රණයට පෙර භාෂාවේ නිරවද්‍යතාව කෙරෙහි ප්‍රකාශකයන් උනන්දු වීමද වැදගත්ය.

කෙසේ වුවද, අදින් ඇරැඹෙන පොත් ප්‍රදර්ශනය, සාහිත්‍ය කලාව පෝෂණය කර ගැනීම කෙරෙහි දායක කර ගැනීමේ මැදිහත්කරුවා විය යුත්තේ ඔබමය. එවිට, පොතපත කෙරෙහි ආශක්ත වන ඔබේ ජීවිතය අමුතුම වෙනසකට ලක්වනු ඇත. ඒ වෙනස විඳ ගැනීමට මේ සාහිත්‍ය මාසයේදී මෙන්ම, එළැඹෙන කියවීමේ මාසයේදීද, ඉන් අනතුරුව මුළු වසර පුරාම ඔබේ කැපවීම අත්‍යවශ්‍ය වනු ඇත.

ඉරෝෂිණී

සාහිත අලුත් පොත්

ලෝක ආශ්චර්ය සහ විනාශය
"විදු ඇස් පාදන බුදු රැස්"
(තුන් කල් දැක්ම)

බුදු වෙන්න පෙරුම් පිරූ
ආනන්ද මෛත්‍රෙය මහා නාහිමි
• ආශ්චර්ය අත්දැකීම්
• අවසන් සාකච්ඡා
• "සක්වළ දැක්ම සහ බඹලොව ගමන"

රු. 280/- රු. 300/- රු. 220/- රු. 100/- රු. 100/-

"නිවන දුර නොවේ"
(යෝගී භික්ෂුවකගේ ධර්ම විග්‍රහය)
"මම මහාමායා දේවී නම් වෙමි"
(මාතෘ දිව්‍ය රාජයා දක්වා)
රු. 240/- රු. 160/-

• මිරිස්සේ ධම්මික හිමි "සසර නිවන සිත", "සුපසන් ජීවිතය" රු. 220/-
• පිටිගල ධම්මවිනීත හිමි "නිවනින් නිවෙන මග" 1, 2 රු. 200/-
• ගල්කිස්සේ සෝමානන්ද හිමි "සුගතිය සහ නිවන" රු. 200/-
• බෝධිචිත්තා මෙහෙණින් වහන්සේ "සසර කතර තරණය කර" රු. 220/-
• "බුද්ධෝත්පාද ලෝකය"
• "අබුද්ධස්ස කාලයේ බුදු සසුන"
• "උදාන කථාව සහිත යසෝදරාවන"
• "සසර නිවුණ රේරුකානේ චන්දවිමල හිමි"
රු. 120/-
• කථා සහිත "සම්පූර්ණ ධම්මපදය"
• "සරල, සංක්ෂිප්ත ත්‍රිපිටකය"
රු. 400/-

• "බුදුන් සරණ ගිය ප්‍රේතයෝ" (ප්‍රේත වස්තු කථා) රු. 160/-
• "පිනෙන් ලබන දෙව් විමන්" - 1, 2 (විමාන වස්තු කථා) රු. 160/-
• "බුදුන් දවස දහම් කථා" - 1, 2 (ධම්මපදට්ඨ කථා) රු. 200/-
• "මහ රහත් කථා" - 1, 2 (ථේර, ථේරී ගාථා කථා) රු. 200/-
• "නිරිසන් කුලයේ උපනත් බෝසත්" (ජාතක කථා) රු. 220/-

රු. 180/- රු. 360/- රු. 220/- රු. 200/- රු. 200/-

• අජාන් චා හිමි "නිර්වාණ දේශනා" රු. 360/-
• අජාන් චා හිමි "භාවනා මාර්ගය සහ නිර්වාණාවබෝධය" රු. 220/-
• "තායි රහතන් වහන්සේලා සහ භාරත යෝගීන්ගේ භාවනා අත්දැකීම්" රු. 225/-
• ථානිස්සරෝ භික්ෂු "සතිය, භාවනාව සහ නිවන් මග" රු. 335/-

මහාචාර්ය
පාතේගම ඤාණිස්සර හිමි ලියූ
"කර්මය පලදෙන හැටි"
1, 2, 3, 4 රු. 220/-

• කොළඹිස්සේ ධම්මානන්ද හිමි ලියූ ඊළඟ භවය - 1, 2" රු. 200/-
• මහරැඹෑවැවේ පාලිත හිමි ලියූ "සසර කථාවේ-සතර අපායේ" රු. 260/-
"පෙර භවයයි-කර්ම විපාකයයි", "බුදු දහමයි-මාර සංකල්පයයි" රු. 200/-

බෙල්ලන ඤාණවිමල මහ නාහිමියන්ගේ
• "සිත නිවන ලෝකය" රු. 225/-
• "අජරාමර ලෝකය" රු. 150/-
• "නොපළ ලිපි" රු. 120/-

දොඩම්පහළ ශ්‍රී රාහුල හිමි ලියූ
• "දෙවියෝ සහ භූතයෝ" 1, 2, 3 රු. 160/-
• "බුදු හිමි පිරිනිවීමට පෙර" රු. 200/-
• "ප්‍රායෝගික බුදු දහම" රු. 220/-
• "නිවැරදි වත් පිළිවෙත්" රු. 240/-

• "සෝම හිමි නම් දිව්‍ය පුත්‍රයා" (-චාමික මුණසිංහ) රු. 220/-
• "සෝම හිමි අප්‍රකට ලිපි" (-ඉන්දු පෙරේරා) රු. 200/-
• "සසර කෙළවර කරන ආරණ්‍ය" රු. 180/-

විශේෂ වට්ටම්..!

මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමියන්ගේ
"ආගම දහම කුමට ද?"
රු. 220/- රු. 360/-
ආචාර්ය මාවරලේ භද්දිය හිමියන්ගේ
"ගිහි ගෙදරට බණ පදයක්"

සාහිත පොත් පියස
සැම හිත - සුව පිණිස
643, මරදාන පාර,
(සම්පත් බැංකුව අසල)
මරදාන, කොළඹ 10.
☎ 011-5 24 54 77, 071-44 14 817, 077-59 77 127
sahithapoth@gmail.com
sahitha-poth-piyasa.wixsite.com/home
BMICH බෞද්ධ මධ්‍යස්ථානයෙන් (R), ඇම්. ඩී. ගුණසේන යන කුටිවලින් හා දිවයිනේ ප්‍රධාන පොත්හල්වලින් සහ තැපෑලෙන් ද ලබාගත හැකි ය.

වර්ෂ 2020 ක්වූ සැප්තැම්බර් මස18 වැනිදා සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමාව ගැන ලත් අත්දැකීම්වලින් බිඳක්

පුස්තකාල විද්‍යාව පිළිබඳ සාධනීය සංකල්පවලින් මනස ආරෝපිත මොහොතක පුවත්පතක පළ වූ ලිපියක් කෙරෙහි මා ආකර්ෂණය වූයේ නිරායාසයෙනි. එය ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මඟින් සංවිධාන කරනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා නවකයන් බඳවා ගැනීම පිළිබඳ ලිපියකි.

ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ පූර්ණ මැදිහත් වීම යටතේ මා මෙම පාඨමාලාව හැදෑරීම ආරම්භයේ 2015 වර්ෂයේදීය. එතැන් සිට ඉකුත් වසර 03ක කාලය තුළ මා ලද ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම් සම්භාරයන් සහ අත්දැකීම් තුළින් මාගේ ජීවිතයේ සාධනීය පරිවර්තනයක් ඇති වූ බව මම විශ්වාස කරමි.

පුස්තකාල සංගමයේ දෘෂ්ටි කෝණයෙන් බැලූ කල මෙම පාඨමාලාව බදුල්ල වැනි කොළඹින් බැහැර පෙදෙසක පැවැත්වීම අභියෝගාත්මක කරුණක් විය යුතුය. විශේෂයෙන් අදාළ ක්ෂේත්‍රය ඉගැන්වීම සඳහා යෝග්‍ය සම්පත් දායකයන් තෝරා ගැනීම මෙන් මූල්‍යමය සහ මූල්‍යමය නොවන බාධක අතිමහත් වන්නට ඇත. තවද මෙම පාඨමාලාවේ තුන් වැනි අදියරෙහි සිංහල මාධ්‍යයේ පන්ති අගනගරයෙන් බැහැරව ක්‍රියාත්මක වූ ප්‍රථම අවස්ථාව ද මෙය බව අපට දැනගන්නට ලැබිණි. තවද යථෝක්ත ක්ෂේත්‍රයට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා පුස්තකාල පහසුකම් ද ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් ද සීමාසහිත වීම අපගේ අධ්‍යාපනික ප්‍රගමනයට කිසියම් බලපෑමක් එක් කළ හැකිව තිබිණි. එහෙත් එම අභියෝග ජය ගනිමින් මෙම පාඨමාලාව සාර්ථකව නිම කිරීමට අපි කටයුතු කළෙමු.

මෙම විෂයය පුළුල් අධ්‍යාපන ක්ෂේත්‍රයකි. එයට සම්බන්ධිතව කළමනාකරණය, තොරතුරු තාක්ෂණය වැනි විෂයයන් ද ග්‍රන්ථ වර්ගීකරණය, සුචිකරය, පුස්තකාල සම්පත් හා සේවාවන්, පුස්තකාලයාධිපතීත්වය, අනුක්‍රමාණිකාකරණය යන විෂයයන් ද මෙම පාඨමාලාවට ඇතුළත් විය.

පුස්තකාල හා විඥාපන විද්‍යා විෂයයන් හැදෑරීම තුළින් අපි පුස්තකාලවේදීන් ලෙස වෘත්තීමය නිපුණතාව ලබා ගැනීම සඳහා හොඳ පන්නරයක් ලබා ගත්තෙමු. නව තාක්ෂණය භාවිත කරමින් වඩා කාර්යක්ෂමව තොරතුරු කෙරෙහි ප්‍රවිශ්ට වීම පිළිබඳ ප්‍රවීණතාවය ඇති කර ගත්තෙමු. එතුළින් දැනුම, ආකල්ප හා කුසලතා යන තෙවැදෑරුම් අධ්‍යාපනික ඉලක්ක කරා යොමු වීමෙන් මනා පරිණත බවක් උකහා ගැනීමට සමත් වූ බව මහත් වූ සොම්නසකින් යුක්තව සඳහන් කරමි.

මෙම කාලය තුළ ලබා ගත් අධ්‍යාපනය වඩාත් තහවුරු කර ගනිමින් එක් එක් වසර තුළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් ඇගයීමට ලක්වීමට අවකාශ සැලසුණි. මෙහිදී ප්‍රථම වසරේදී අප ප්‍රදේශයේ පුස්තකාල ඇසුරේ ලද මූලික පුහුණුවකින් පසු ව්‍යාපෘතියක් සකස් කිරීමටත් දෙවැනි වසරේදී ග්‍රන්ථ නාමාවලියක් සකස් කිරීමටත් තෙවැනි වසරේදී අනුක්‍රමණිකාවක් සහ පාරිභාෂික ශබ්ද මාලාවක් සම්පාදනය කිරීමටත් ඊට අමතරව ස්වයංව නිශ්චය කර ගත් මාතෘකාවක් යටතේ රචනා සම්පාදනයටත් අප වෙත වගකීම පැවරුණි. එම අභියෝගාත්මක ක්‍රියාකාරකම්වලින් ලබා ගත් පරිචය ඉන්දීය ගෝචර ප්‍රත්‍යක්ෂය ඇති කර ගැනීමට මහඟු පිටුවහලක් විය.

සියලු අපේක්ෂාවන් සහ අභිමතාර්ථයන් ජයගෙන ප්‍රථම වසර විභාගයෙන් මා උසස් අන්දමින් සමත් වූ අතර දෙවැනි වසරේදී ලංකාවේ ප්‍රථමයා වශයෙන් අදාළ විභාගයෙන් සමත් වීමෙන් අනතුරුව 'S.C. Blok' අනුස්මරණ ශිෂ්‍යත්වය මා හට හිමි විය. එමඟින් තෙවැනි වසරට අදාළ පාඨමාලාව සඳහා නොමිලයේ ඇතුළත්වීමට අවස්ථාව ලැබුවෙමි. එසේම තෙවැනි වසරේ විභාගය ඉහළින් සමත් වීමට හැකියාව ලැබිණි. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මඟින් ලබා දෙනු ලබන රන් සම්මානය මෙන්ම ශ්‍රීකාන්ත ලක්ෂ්මී අරුලානන්දම් අනුස්මරණ සම්මානය ද මා වෙත හිමි වීම මා ලද භාග්‍යකි.

ඩබ්ලිව්.ඒ. දර්ශිකා තිලිණී විජේසිංහ
(බදුල්ල මධ්‍යස්ථානය)

pwc

FCCISL Sri Lanka

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පුනර්ජීවන අධ්‍යයනය

FCCISL සහ PwC ශ්‍රී ලංකා අතර සහයෝගීතාවයක් ගොඩනැගේ

ඔබේ අදහස් ඉදිරිපත් කරන්න!

දේශීය ව්‍යාපාර වර්ධනයට සහාය වීම සඳහා ව්‍යාපාර මූල පිරිම් සැලසුම් කිරීමට ඔබේ අදහස් බෙදා ගන්න

මේ අධ්‍යයනයට සහභාගී විය යුත්තේ ඇයි?

- අනාගතයේ සංවිධානය කරන ව්‍යාපාරවලට සහාය ලබා දෙන වැඩසටහන් සහ අවස්ථාවලට සම්බන්ධ කරගැනීමට සම්බන්ධතා ගොඩනඟා ගැනීමට.
- විභවතාවයන් ඇති නව ව්‍යාපාරික අවස්ථා හෝ සහයෝගීතා ව්‍යාපාර සම්බන්ධතා ගැන දැනුවත් කිරීමට.
- ව්‍යාපාර සම්බන්ධ අනාගත කාර්මික ප්‍රතිපත්ති සහ සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී ඔබේ ව්‍යාපාරය මුහුණ දෙන අභියෝග සහ ඔබ බලාපොරොත්තු වන වර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම තහවුරු කරගැනීමට මඟ සැලසීම.

මෙය කාටද?

- ශ්‍රී ලංකාවේ සියලුම ලියාපදිංචි ව්‍යාපාර සඳහා
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ සහ විශාල යන සියලුම මට්ටම්වල ව්‍යාපාරවලට
- සමාරම්භක ව්‍යාපාරවල සිට පරිණත සමාගම් දක්වා සියලුම මට්ටමේ පරිණතභාවයන් ඇත ව්‍යාපාරවලට

සහභාගි වන්නේ කෙසේද? www.pwc.com/lk or www.fccisl.lk

අවසාන දිනය 2020 සැප්තැම්බර් 30 වැනිදා

Keshawa Perera | 071 537 4824

Scan for survey

මාධ්‍ය සහකරු

LMD THE VOICE OF BUSINESS | tv දෙරණ | fm ඉදිරණ | LAKE HOUSE | දිනමිණ

© 2020 PricewaterhouseCoopers (Private) Limited. Liability Company incorporated in Sri Lanka.

ඇඹිලිපිටිය නගර සභාව

ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීමයි

1. ඇඹිලිපිටිය නගර සභාවේ කාර්යාලය, නාගරික රථ ගාල, නව නගර සති පොළ, සම්පත් සෙවණ, වාපී උද්‍යානය හා කොම්ෆෝස්ට් අංගනය සඳහා 2020/11/01 වන දින සිට 2021/10/31 දින දක්වා ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් පළමු හා දෙවන පිටපත් සහිතව මුද්‍රා තබන ලද මිල ගණන් ඇඹිලිපිටිය නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් භාර ගනු ලැබේ.

2. නගර සභාවේ ඉහත සඳහන් පරිශ්‍රයන් හයෙන් පහක් (05) සඳහා දිවා හා රාත්‍රී වශයෙන් සේවා මුර දෙක සඳහාම සේවයේ යෙදවීමට ආරක්ෂක නිලධාරීන් (10) දස දෙනෙකු (ලේඛන නඩත්තු කිරීම් හැකියාව හා ආරක්ෂක සේවයේ මනා පළපුරුද්ද ඇති) යෙදවිය යුතු අතර සම්පත් මධ්‍යස්ථානය සඳහා දිවා මුර සේවය සඳහා ආරක්ෂක නිලධාරියෙකුද ඊට අමතරව මහජන සති පොළ සඳහා බදාදා සහ ඉරිදා දිනයන්හි දිවා මුර සේවාව සඳහා හා එම පරිශ්‍රය සඳහාම අඟහරුවාදා හා සෙනසුරාදා දිනයන්හි රාත්‍රී මුර සේවාව සඳහා අමතර ආරක්ෂක නිලධාරියෙකු (01) සේවයේ යෙදවිය යුතුය. ආරක්ෂක සේවා ආයතනය ස්ථාන භාර නිලධාරීන් එක් මුර සේවාවක් සඳහා එක් අයෙකු බැගින් මුර සේවාවන් දෙක සඳහා දෙදෙනෙකු ද අධීක්ෂණ කටයුතු සඳහා ඉහත සියලු පරිශ්‍රයන් සඳහා සේවයේ යෙදවිය යුතුයි.

3. ලංසු ඇපකරය මුදලින් ලබා දෙන්නේ නම් ඔබ ඉදිරිපත් කරන මිල ගණනේ වටිනාකමින් 1%ක මුදලක් හෝ පිළිගත් වාණිජ බැංකුවකින් ඇපකරය ඉදිරිපත් කරන්නේ නම් ඔබ ඉදිරිපත් කරන මිල ගණනෙන් 2% මුදලකට සමාන ඇපකරයක් සභාපති, ඇඹිලිපිටිය නගර සභාව නමින් 2021.01.08 දින දක්වා වලංගු වන පරිදි ලබාදිය යුතුය. (ලංසු ඇපකරයේ මුල් පිටපත අමුණා තිබිය යුතු අතර එසේ නොවන විට මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.)

4. ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගන්නා ආයතනය අදාළ ආරක්ෂක සේවාව සම්බන්ධව ගිවිසුම්ගත විය යුතු අතර ගිවිසුම්ගත වීමේදී අදාළ ප්‍රසම්පාදන වටිනාකමින් 10%ක කාර්යය සාධන ඇපකරයක් සභාපති, ඇඹිලිපිටිය නගර සභාව නමින් ඉදිරිපත් කළ යුතුය.

5. මිල ගණන් ඉදිරිපත් කරන ආයතනය ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම පිළිබඳව ලියාපදිංචිය හා අවම වශයෙන් වසර පහක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර ඒ බව සනාථ කිරීමේ ලේඛන මිල ගණන් සමඟ ඉදිරිපත් කර තිබිය යුතුය.

6. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ස්ථාන භාර නිලධාරීවරයෙකුගේ ආරක්ෂක සේවා නිලධාරියෙකුගේ දෛනික වැටුප වෙන වෙනම පැහැදිලිව සඳහන් කළ යුතු අතර රට තුළ බල පවත්නා කම්කරු නීති වලට අනුකූලව වැටුප් ඉදිරිපත් කිරීමට බැඳී සිටිය යුතුය.

7. සතියේ කාර්යාල දින පෙ.ව. 9.00 සිට සවස 3.00 දක්වා අදාළ පරිශ්‍රයන් පරීක්ෂා කර බැලීම හා ටෙන්ඩර් පෝරමය සහ එයට අදාළ ටෙන්ඩර් ලේඛන ලබා ගැනීම ද (ආපසු නොගෙවෙන රු.1000.00 මුදල ගෙවා) සිදු කළ හැකි අතර ටෙන්ඩර් ලේඛන නිකුත් කිරීම 2020/ 10/21 සිට 2020/10/08 දින දක්වා සතියේ වැඩ කරන දින වල පෙ.ව. 9.00 සිට 3.00 දක්වා පමණක් සිදු කරනු ලැබේ. මෙම ආයතනය මඟින් නිකුත් කරන අයදුම්පත්‍රය හා කොන්දේසි ලේඛනය සම්පූර්ණ කර ඉල්ලා ඇති අනෙකුත් ලේඛන සමඟ ඔබගේ මිල ගණන් බහාලන කවරයේ ඉහළ වම්පස කෙළවරේ **"2020/2021 වර්ෂය සඳහා ආරක්ෂක සේවාව සැපයීම සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කර **2020/10/09 දින පෙ.ව 10.00 හෝ ඊට පෙර සභාපති, නගර සභාව, ඇඹිලිපිටිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් දෙන මෙන් දන්වන අතර ප්‍රමාදවී ලැබෙන ලංසු ලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබේ. පෙ.ව.10.30ට එම අවස්ථාවට පැමිණ සිටින ලංසු කරුවන් ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් (බලය පවරන ලේඛනය රැගෙන පැමිණිය යුතුය) ඉදිරියේ නගර සභා ශ්‍රවණාගාරයේදී ලංසු විවෘත කරනු ලැබේ.

8. වැට් (VAT) අය කරන්නේනම් එම වටිනාකමද පැහැදිලිව මිල ගණන් තුළ සඳහන් කළ යුතුය.

9. ලංසු ප්‍රදානය සම්බන්ධයෙන් ඇඹිලිපිටිය නගර සභාවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

10. අදාළ ටෙන්ඩරය පිළිබඳ තොරතුරු සතියේ වැඩ කරන දින වල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා 0472230275/0702518698 දුරකතන අංකය අමතා ලබාගත හැකිය.

ලලිත් ගමගේ
සභාපති,
ඇඹිලිපිටිය නගර සභාව

2020.09.18 වන දින
ඇඹිලිපිටිය නගර සභා කාර්යාලයේ දීය.

තරුණියන්ගේ
කාන්තාවන්ගේ
මවුවරුන්ගේ
හඳ බැඳි කාන්තා පත්තරය
තරුණී
සෑම බදාදාවකම

රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථාවල තනතුරු සඳහා පත් කෙරෙන/ නම් කෙරෙන පුද්ගලයන්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව මඟින් මෙහි පහත දක්වා ඇති තනතුරු සඳහා නම් කර ඇති /පත්කර ඇති අයගේ යෝග්‍යතාවය පරීක්ෂා කර බැලීමට නියමිතය.

අංකය	නම සහ ලිපිනය	තනතුර
01.	ආචාර්ය මොහාන් පීරිස් මහතා අංක 3/14, ඩී, කිංසි පාර, කොළඹ 08.	ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නානාපති/ නිත්‍ය නියෝජිත වශයෙන් මී කරත ලද
02.	ජගත් පී. විජේවීර මහතා අංක 221/28 ඒ, සුහද පෙදෙස, කඩවත.	ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත් කරත ලද
03.	ආර්. ඩබ්. ආර්. පේමසිරි මහතා අංක 98/38, කොට්ටතවත්ත පාර, පරණ කැස්බෑව පාර, නුගේගොඩ.	මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත් කරත ලද
04.	එස්. හෙට්ටිආරච්චි මහතා අංක 153/2-4-2, ට්‍රිලියම් නිවාස සංකීර්ණය, ඇල්විටිගල මාවත, කොළඹ 08.	සංචාරක අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත් කරත ලද
5	එන්. බී. මොන්ටි රණතුංග මහතා අංක. 280/27, තිසර පෙදෙස, ගොඩගම පාර, අතුරුගිරිය.	ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත් කරත ලද
6	වසන්තා පෙරේරා මහත්මිය අංක 142, වෙලුවන පාර, කොළඹ 09.	විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත් කරත ලද
7	කේ. ඩී. ආර්. ඔල්ගා මහත්මිය අංක 23/සී, හොරණ පාර, රිලාවල, පොල්ගස්ඕවිට.	බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත් කරත ලද

ඉහත නම් කිරීම් / පත්කිරීම් සම්බන්ධයෙන් කරුණු දක්වීමට කවර හෝ සංවිධානයක් හෝ පුද්ගලයෙකු කැමැත්තේ නම්, යථා පරිදි අත්සන් කරන ලද ලිඛිත සංදේශ 2020 **ඔක්තෝබර් මස 02** වැනි දින හෝ ඊට පෙර **"ලේකම්, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, කාරක සභා කාර්යාංශය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් එසේ කළ හැකි ය. එසේ නැතහොත්, ෆැක්ස් අංක 011-2777300 වෙත ෆැක්ස් මඟින් හෝ **highposts_c@parliament.lk** යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන්ද එවිය හැක.

එකී ලිඛිත සංදේශවලට අමතරව වාචික සාක්ෂි ඉදිරිපත් කරන ලෙසට ද කාරක සභාව විසින් නියම කළ හැකිය. මෙම දැන්වීම පාර්ලිමේන්තු වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත. (www.parliament.lk)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.
2020 සැප්තැම්බර් 18

කාරක සභාවේ ලේකම්,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

LITRO GAS

දැන්වීමයි

අයන්ත ප්‍රනාන්දු
NIC - 882080579V

කිත්සිරි පලන්සූරිය
NIC - 750521320V

සියලුම ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ ව්‍යාපාරික හවුල්කරුවන්, පාරිභෝගිකයන් සහ මහජනයා වෙත කෙරෙන දැනුම්දීමයි.

ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ, අලෙවි අංශයේ සේවය කල, අලෙවි විධායක, **කිත්සිරි පලන්සූරිය** (NIC - 750521320V, අවසන් පදිංචිය 143/11, ගන්නොරුව, පේරාදෙණිය, මහනුවර), සහ ප්‍රාදේශීය අලෙවි කළමනාකරු **අයන්ත ප්‍රනාන්දු** (NIC - 882080579V අවසන් පදිංචිය 289/1, හිල් ස්ට්‍රීට්, නැදිමාල, දෙහිවල), 2020 අගෝස්තු මස සිට ආයතනයේ සේවයෙන් ඉවත් වී ඇත. එබැවින් මින් ඉදිරියට ඔවුන් විසින් සිදුකෙරෙන ගනුදෙනු සම්බන්ධයෙන් ලිට්රෝ ගෑස් සමාගම කිසිදු වගකීමක් නොදරන බවට මෙයින් දන්වමු.

Litro Gas Lanka Ltd,
No 267, Union Place, Colombo 02, Sri Lanka

අපනයන කෘෂිබෝග මිල ගණන්

2020.09.15 දිනෙන් අවසන්වූ සතිය තුල පැවති සාමාන්‍ය මිල (කිලෝ ග්‍රෑමයට රුපියල්)

බෝගය \ දිස්ත්‍රික්කය		මඩකලපුව	මාතලේ	කුරුණෑගල	කෑගල්ල	රත්නපුර	බදුල්ල	මඩකලපුව	මීපිය	කුරුවිට	ගාල්ල	මාතර	හම්බන්තොට	මොණරාගල
කුරුඳු	Alba					2,666	-	-	-	-	2,865	3,050	2,838	-	-
	C-5 Sp					2,366	-	-	2,400	-	2,480	2,375	2,417	-	-
	C-5					2,266	-	-	2,300	2,100	2,295	2,235	2,288	2,300	-
	C-4					2,050	-	-	2,150	1,675	2,070	2,190	2,210	2,200	-
	M-5					1,950	-	-	-	-	1,865	-	2,185	-	-
	M-4					1,950	-	-	-	-	1,770	-	2,165	-	-
	H-1					1,900	-	-	2,100	-	1,660	2,095	2,120	2,100	-
ගම්මිරිස්	1 ශ්‍රේණිය	577	584	553	593	577	570	583	538	596	567	570	589	577	596
	2 ශ්‍රේණිය	500	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
කරාබු 1 ශ්‍රේණිය		890	904	923	900	725	796	850	938	890	933	850	858	800	850
කෝපි 1 ශ්‍රේණිය		741	717	743	766	655	725	758	708	780	775	725	700	650	645
කොකෝවා 1 ශ්‍රේණිය		390	400	-	325	-	400	340	-	-	-	-	-	-	350
කරදමුංගු ලංකා ග්‍රීන්		-	12,500	-	-	-	-	11,250	-	-	-	-	-	-	-
සාදික්කා 1 ශ්‍රේණිය		701	615	500	650	615	-	640	-	-	-	500	-	-	-
වසාවාසි 1 ශ්‍රේණිය		3,435	3,454	3,000	3,350	-	-	3,450	-	-	-	2,700	-	-	-
බුලත් කොළ 1000ක්		-	-	-	-	-	-	4,000	-	2,500	-	-	-	-	-
පුවක් කරුණක්කා කි.ග්‍රෑ.1ක්		790	808	587	783	792	627	850	713	885	890	800	758	700	875

නිෂ්පාදනය	හ'කොට	ර' පුර	ගාල්ල	මාතර
කුරුඳු කොළ තෙල් (කි.ග්‍රෑ./රු.)	-	-	3,920	3,900
පැඟරු තෙල් (කි.ග්‍රෑ./රු.)	2,900	0	-	-

දත්ත සැකසුම - අපනයන කෘෂිකර්ම ආර්ථික පර්යේෂණ අංශය
අපනයන කෘෂිකර්ම බෝග විගාකිරීම හා සැකසීම පිළිබඳ සියළු තාක්ෂණික තොරතුරු සහ උපදෙස් නොමිලේ ලබාගැනීම සඳහා අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී හමුවන්න.
ස්ථානය - ගොවිජන සේවා මධ්‍යස්ථය දිනය - බදාදා
වේලාව -පෙ.ව. 8.30 සිට ප.ව. 4.15

වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.dca.gov.lk

සන්නිවේදන අංශය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 1095, නුවර පාර, පේරාදෙණිය
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - අතමිට සරු හෙට දිනකට

☎ 081 2388651

දිනමිණ ක්‍රීඩා

2020 සැප්තැම්බර් 18 සිකුරාදා

sports.dinamina@lakehouse.lk

එල්පීඑල් තරගාවලියට අයිපීඑල් කණ්ඩායම් 2ක්

4ක් මිල දී ගන්න 12ක් සටනක

ප්‍රින්ස් ගුණසේකර

දෙස් - විදෙස් ක්‍රිඩකයන්ගේ සහභාගිත්වයෙන් නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියට එක්වීමේ අදහසින් ඉන්දීය ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ කණ්ඩායම් 2ක් තරගාවලියේ අලෙවිකරණ සහ සංවිධාන අයිතිය හිමි ඩුබායි හි පිහිටි අයි.පී.ජී සමාගම හා එක්ව සාකච්ඡා පවත්වමින් සිටින බව වාර්තා වේ.

ලංකා ප්‍රිමියර් ලීග් තරගාවලියට කණ්ඩායම් 5ක් තරග වදින අතර, ඉන්දීය ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ කණ්ඩායම් 2 එක් කර ගැනීමේ සාකච්ඡා සාර්ථක වුවහොත් තවත් කණ්ඩායම් 3කට පමණක් ක්‍රිඩක වෙන්දේසිය සිදු කෙරේ. හෙට ඩුබායි හිදී ආරම්භ වන අයි.පී.එල් තරගාවලිය නොවැම්බර් මස 10 වැනිදා අවසන් වන හෙයින් එම කණ්ඩායම් දෙකට ලංකා ප්‍රිමියර් ලීග් තරගාවලියට සහභාගීවීමේ බාධාවක් ඇති නොවේ. සාකච්ඡා ආරම්භ කොට ඇති ඉන්දීය ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ කණ්ඩායම් 2ක සහභාගිත්වය ස්ථිර වුවහොත් ලංකා ප්‍රිමියර් ලීග් තරගාවලියේ දින වකවානු සුලු සංශෝධනයක් කිරීමට සිදු වනු ඇත.

මේ පිළිබඳ ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපති ෂම්මි සිල්වා මහතාගෙන් 'දිනමිණ' කළ විමසීමකදී පැවැසුවේ ලංකා ප්‍රිමියර් ලීග් තරගාවලියට විශාල ඉල්ලුමක් පවතින බවට තොරතුරු ලැබෙමින් පවතින බවය.

"ඩුබායිහි පිහිටි අයි.පී.ජී සමාගමට අප සියලු දේ හාරදී තිබෙනවා. දැන ගන්න ඇති පරිදි කණ්ඩායම් 4ක් මිලදී ගන්න පුද්ගලයන් 12ක් පමණ සිටිනවා. එක් කණ්ඩායමක් පාකිස්තාන ජාතිකයකු දැනටමත් මිලදී ගෙන අවසන්. ඉන්දීය ප්‍රිමියර් ලීග් කණ්ඩායම් 2 කැමැත්ත පළ කළොත් තරගාවලිය හොඳ තත්ත්වයකට එනවා. ඉදිරි දින හතර ඇතුළතදී මේ සම්බන්ධ නිවැරදි තීරණ අපට ලැබෙනවා" ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපතිවරයා පැවැසීය.

ලංකා ප්‍රිමියර් ලීග් තරගාවලියේ ක්‍රීඩකයන් වෙන්දේසි කිරීම ලබන මස 1දා විඩියෝ තාක්ෂණය ඔස්සේ 'ඔන් ලයින් ක්‍රමයට' සිදු කෙරෙන හෙයින් මේ මස අවසානයේ කණ්ඩායම් අයිතිය පිළිබඳ අවසන් තීරණවලට එළැඹිය යුතු වේ. ලොව විවිධ ස්ථානවල සිටින කණ්ඩායම් අයිතිකරුවන් හා ඔවුන්ට අදාළ අනුග්‍රාහක ආයතන එක්ව ලංසු තබන ක්‍රීඩකයන් සජීව ලෙස මිලට ගැනීම ක්‍රීඩක වෙන්දේසියේදී සිදු කෙරේ.

ලංකා ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලිය නොවැම්බර් මස 14 වැනිදා සිට දෙසැම්බර් 06 වැනිදා දක්වා පල්ලේකැලේ ක්‍රීඩාංගණය, හම්බන්තොට සූරියවැව ක්‍රීඩාංගණය හා රංගිරි දඹුලු ක්‍රීඩාංගණය කේන්ද්‍ර කොට පැවැත්වෙන අතර, කණ්ඩායම් 5ට විදෙස් ක්‍රීඩකයන් 6 දෙනා බැගින් ක්‍රීඩකයෝ 30ක් එක් කර ගැනෙති.

පාකිස්තාන ක්‍රීඩක සහිඩ් අෆ්රිඩි, ෂොයිබ් මලික්, මොහොමඩ් ආමීර්, මොහොමඩ් අෆීස්, වහාබ් රියාස්, කොදෙවි ක්‍රීඩකයන් වන ක්‍රිස් ගේල්, ෂැනන් ගේබ්‍රියෙල්, ඩැරේන් බ්‍රාවෝ, ඩැරන් සම්මි එංගලන්තයේ ජොනී බෙයාස්ටෝ, ලූක් රයිට්, රවි බොපාරා, දකුණු අප්‍රිකාවේ ෆෆ් ඩු ප්ලෙසිස්, වර්නන් පිලැන්ඩර්, නවසීලන්තයෙන් කොලින් මුන්රෝ, ඉන්දියාවේ මුනාෆ් පටෙල්, ප්‍රවීන් කුමාර්, ඉර්ෆාන් පතාන්, යූසුප් පතාන් හා බංග්ලාදේශයේ ෂකීබ් අල් හසන් වැනි ක්‍රීඩකයන් මේ වන විටත් කැමැත්ත පළ කොට ඇති විදෙස් ක්‍රීඩකයෝ වෙති.

ලෝක මලල ක්‍රීඩා හිටපු ලොක්කා වසර හතරක් සිරයට

ජාත්‍යන්තර මලල ක්‍රීඩා සම්මේලනයේ හිටපු ප්‍රධානී ලැමීන් ඩයැක් රුසියානු තහනම් උත්තේජක නඩු වසන් කිරීමේ චෝදනාව සම්බන්ධයෙන් ප්‍රංශ අධිකරණය වැරදිකරු කරමින් වසර හතරක සිර දඬුවමක් නියම කළ අතර, ඉන් වසර දෙකක් අත්හිටුවන ලදී.

ජාත්‍යන්තර මලල ක්‍රීඩා සම්මේලනයට නායකත්වය දුන් 87 හැවිරිදි සෙනෙගාල ජාතික ඩයැක්ට අමෙරිකානු ඩොලර් 600,000ක දඩ මුදලක් නියම විය. පැරිස් උසාවියේ විනිසුරු රෝස්-මාරි හුනෝල්ට් මහත්මිය පැවසුවේ ඩයැක්ගේ ක්‍රියා කලාපය තහනම් උත්තේජකවලට එරෙහි සටනට බරපතළ හානියක් සිදු කර ඇති බවයි.

"ඔබේ වයස අනුව ඔබට කොන්දේසි සහිත නිදහස් කිරීමක් අපේක්ෂා කළ හැකියි," ඇය පැවසුවාය. මේ සම්බන්ධ අභියාචනයක් විභාග ඉදිරිපත් කරන බව ඩයැක් පැවැසීය. මීට පෙර ලෝක මලල ක්‍රීඩාවේ වඩාත්ම බලගතු චරිතයක් වූ ඩයැක් 1999 සිට 2015 දක්වා ජාත්‍යන්තර මලල ක්‍රීඩා සම්මේලනයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ අතර, ඔහු වෙනුවට 2015 අගෝස්තු මාසයේදී බ්‍රිතාන්‍යයේ සෙබස්තියන් කෝ පත් විය.

SINCE 1978 42nd

OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020

Recognizing talent, inspiring greatness.

Sri Lanka Telecom Mobitel

42 වන ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : .....

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: .....

(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)

පාසල : .....

ඔබේ නම : .....

ලිපිනය : .....

ජංගම දුරකථන අංකය : .....

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

කූපන්පත් එවා සහිපතා ත්‍යාග දිනාගන්න.

ප්‍රථම ත්‍යාගය : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-

තෙවන ත්‍යාගය : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

කොන්දේසි :

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරඟයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

දිනය 2020-09-19 **අංකය** 28

UNLIMITED YouTube HD quality up to 25GB*

මාසෙටම රු.249+බදු

#170# අමතන්න

Sri Lanka Telecom Mobitel

4G LTE

අවුරුදු 23න් පහළ අන්තර් සමාජ ක්‍රිකට්

අමිෂි - හරිත් දස්කම් දක්වති

නිරෝෂාන් ප්‍රියංකර

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධාන කරන අවුරුදු 23න් පහළ අන්තර් සමාජ එක්දින ක්‍රිකට් තරගාවලියේ පළමු දිනයේදී පන්දුවෙන් දස්කම් දැක්වීමට සී.සී.සී ක්‍රීඩා සමාජයේ අමිෂි ද සිල්වා සමත් වූ අතර, යුද හමුදාවේ හරිත් ප්‍රනාන්දු ඉහළම ඉනිමට හිමිකම් කියමින් කැපී පෙනෙන පිහි හරඹයක නිරත විය.

අමිෂිගේ විශිෂ්ට පන්දු යැවීම් හේතුවෙන් තරගාවලියේ පළමු ජයග්‍රහණය වාර්තා කිරීමට සී.සී.සී පිල සමත් වූයේ බලූමිෆීල්ඩ් පිලට එරෙහිවය. බලූමිෆීල්ඩ් පිටියේ පැවැති තරගයේ පළමුව පන්දුවට පහර දුන් සත්කාරකයන්ගේ ඉනිම ලකුණු 97කට සීමා කළ සී.සී.සී ක්‍රීඩකයෝ කඩුලු 2ක් දැවී තිබියදී ජය හිමි කර ගත්තේ ඔවර 13.1ක් පමණක් වැය කරමිනි.

තරගාවලියේ පළමු දිනයේ පැවැති තරගවලදී කඩුලු 5ක් බිඳ දැමූ එකම පන්දු යවන්නා වූ දකුණත් පන්දු යවන අමිෂි ඒ සඳහා ලබා දුන්නේ ලකුණු 12ක් පමණි.

පළමු දිනයේ වැඩිම ලකුණු වාර්තා කළ පිතිකරු වූ හරිත් ප්‍රනාන්දුගේ ලකුණු 88 සමඟින් යුද හමුදා පිල නුගේගොඩ ක්‍රීඩා සමාජයට ලකුණු 305ක ඉලක්කයක් ලබා දුන්නද එම ඉලක්කය හමුවේ ඔවුන්ට ඔවර 45.4කදී සියල්ලන් දැවී රැස් කර ගත හැකි වූයේ ලකුණු 244ක් පමණි.

මේ අතර, පළමු දිනයේ කැපී පෙනෙන තරග වූයේ පොලීසිය සහ නාවික හමුදාව අතර තරගයයි. එම තරගයෙන් ලකුණක තියුණු ජයක් අත් කර ගැනීමට පොලීසිය සමත් විය. තරගයේ පළමුව පන්දුවට පහර දුන් පොලිස් පිල ලකුණු 225ක් රැස් කළ අතර, නාවික හමුදා පිළිතුරු ඉනිම ලකුණු 224කට සීමා විය.

පළමු දිනයේ පැවැති අනෙක් තරගවලදී හලාවත මේරියන්ස් (කඩුලු 6කින්), ටැම්ල් යුනියන් (කඩුලු 4කින්), බදුරලිය (කඩුලු 4කින්), එස්.එස්.සී. (කඩුලු 7කින්), මුවර්ස් (කඩුලු 4කින්), මීගමුව (ලකුණු 68කින්) සහ කළුතර නාගරික පිල (ලකුණු 79කින්) ජයග්‍රහණ අත්කර ගත්තේය.

මේ තරගවලදී මලින්ද ජයෝද් (බදුරලිය), බිෂාන් මෙන්ඩිස් (යුද), නිපුන් ධනංජය සහ ශම්මු අශාන් (එස්.එස්.සී), මලිඳු මදුරංග (සී.සී.සී), කම්දු මෙන්ඩිස් (හලාවත), සකුන ලියනගේ (නුගේගොඩ), භාග්‍ය දිසානායක (නාවික), මුදිත ලක්ෂාන් (නුගේගොඩ), සංතුෂ් ගුණතිලක (මුවර්ස්), නවෝද් පරණවිතාන (ටැම්ල් යුනියන්) සහ විනුර දුල්සර (ගාල්ල) අර්ධ ශතක වාර්තා කළහ.

බදුරලිය පිලේ තම්දු වික්‍රමආරච්චි, යුද හමුදාවේ හෂාන් සංදීප සහ නුගේගොඩ කණ්ඩායමේ නිපුන් ලක්ෂාන් කඩුලු 4 බැගින් දවා ගැනීමට සමත් වූහ.

මේ තරගාවලියේ දෙවැනි සතියට අදාළ තරග 12ක් හෙට (19) පැවැත්වීමට නියමිතය.

ග්ලේන් මැක්ස්වෙල්

කේරී සහ මැක්ස්වෙල් ඔස්ට්‍රේලියාවට ජය ගෙනේ

ග්ලේන් මැක්ස්වෙල් සහ ඇලෙක්ස් කේරී දියත් කළ විශිෂ්ට පිති හරඹයන් හේතුවෙන් එංගලන්තය සමඟ මැන්චෙස්ටර්හිදී පැවැති තෙවැනි එක්දින තරගය කඩුලු 3කින් ජය ගැනීමට සංචාරක ඔස්ට්‍රේලියානු පිල සමත් විය.

මේ සමඟින් තරග 3කින් සමන්විත එක්දින තරගාවලියේ ජය 2-1ක් ලෙස ඔස්ට්‍රේලියාව සතු විය.

මේ තරගාවලිය අයිසීසී හඳුන්වා දුන් එක්දින ලෝක ශූරතාවලියට ඇතුළත් වන අතර, එක් ජයකට ප්‍රසාද ලකුණු 10ක් බැගින් පිරිනැමීම නිසා ඔස්ට්‍රේලියාව තරග 2ක් ජය ගනිමින් ලකුණු 20ක් ලබා ප්‍රසාද ලකුණු සටහනේ දෙවැනි ස්ථානයේ පසු වන අතර, එංගලන්තය පළමු ස්ථානයේ පසු වන්නේ ලකුණු 30ක් සමඟිනි. ඔවුන් අයර්ලන්තයට එරෙහිව තරග 2ක් ද ජය ගෙන තිබේ.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් එංගලන්තය කඩුලු 7ක් දැවී ලකුණු 302ක් රැස් කළ අතර, පන්දු 2ක් ඉතිරිව තිබියදී ජය හිමි කර ගත් ඔස්ට්‍රේලියාවට ද කඩුලු 7ක් අහිමි විය.

ලකුණු 73කට කඩුලු 5ක් බිඳ වැටී අසීරු තත්ත්වයකට පත්ව සිටි ඔස්ට්‍රේලියානු පිල වෙනුවෙන් පිටියේ එක් වූ අලේක්ස් කේරී සහ ග්ලේන් මැක්ස්වෙල් 6 වැනි කඩුල්ලට පන්දු 184කින් ලකුණු 212ක සබඳතාවක් ගොඩනඟමින් ජයග්‍රහණයේ අඩිතාලම දැමූහ.

කේරී පන්දු 114කදී හතරේ පහර 7ක් සහ හයේ පහර 2ක් සමඟින් ලකුණු 106ක් රැස් කළ අතර, වේගවත් ඉනිමක් දියත් කළ මැක්ස්වෙල් ලකුණු 108ක් ලබා ගත්තේ පන්දු 90ක් පමණක් වැය කරමිනි. ඔහුගේ ඉනිම හතරේ පහර 4කින් සහ හයේ පහර 7කින් වර්ණවත් විය. අවසන් තරගයේ මෙන්ම තරගාවලියේ වීරයා සම්මානය ද මැක්ස්වෙල්ට හිමි විය.

පළමුව ලකුණු රැස් කළ එංගලන්තය වෙනුවෙන් අගනා ඉනිමක් දියත් කළ ජොනී බෙයාර්ස්ටෝව් ලකුණු 112ක් වාර්තා කළ අතර, සෑම් බිලින්ග් (57) සහ ක්‍රිස් වෝක්ස් (53) අර්ධ ශතක රැස් කළහ. බෙයාර්ස්ටෝව් පන්දු 126කදී හතරේ පහර 12ක් සහ හයේ පහර 2ක් එල්ල කළ අතර, හතරේ පහර 6ක් ඇතුළත් වූ වෝක්ස්ගේ ඉනිමට වැය වූයේ පන්දු 39ක් පමණි.

ළමා දිනය දා ක්‍රීඩා වැඩසටහනක්

ලෝක ළමා දිනය නිමිත්තෙන් ක්‍රීඩා අමාත්‍යාංශය ළමා ක්‍රීඩා ක්‍රියාකාරකම් ඇතුළත් වැඩසටහනක් සම්පාදනය කරයි. ළමා දිනය ඔක්තෝබර් 1 දිනට යෙදී තිබුණද ඒ වෙනුවෙන් මේ මස 30 වැනිදා පෙරවරුවේ මේ වැඩ සටහන ටොරින්ටන් ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

පාසල් ක්‍රීඩකයෙක් සහ ක්‍රීඩිකාවක් ජාතික චෙස් ශූරතාවලියේ ඉදිරියෙන්

ශ්‍රී ලංකා චෙස් සම්මේලන සංවිධාන කරන ජාතික චෙස් ශූරතාවලියේ පළමු භාගය නිමා වන විට කැපී පෙනෙන සිදු වීමක් වූයේ පිරිමි හා කාන්තා ඉසව්වන්ගෙන් පාසල් ක්‍රීඩකයෙක් සහ ක්‍රීඩිකාවක් පෙරමුණ ගෙන තිබීමය. ආනන්ද විද්‍යාලයේ රනිඳු ලියනගේ සහ මහනුවර උසස් බාලිකාවේ නෙත්මි ප්‍රනාන්දු මෙලෙස ඉදිරියෙන් පසු වෙති.

මේ තරගාවලිය කොරෝනා වසංගතය හේතුවෙන් සියලු සෞඛ්‍ය හා ආරක්ෂණ රෙගුලාසි පිළිපදිමින් චෙස් සම්මේලන මුලස්ථානයේදී පැවැත්වේ.

තරගාවලිය ආරම්භයේ පිරිමි ඉසවුවේ කැපී පෙනෙන සිදු වීමක් වූයේ මෙරට ප්‍රවීණ චෙස් ක්‍රීඩකයන් දෙදෙනා වන රොමේෂ් වීරවර්ධන සහ චින්තක අනුරුද්ධ (මහනුවර වයිඑම්සී) පිළිවෙළින් සුසල් ද සිල්වා (නාලන්ද වි.) සහ රනිදු දිල්ෂාන් ලියනගේ (ආනන්ද වි.) හමුවේ පරාජයට පත්වීමය.

පළමු සතිය අවසානයේදී රනිඳු ලකුණු 6ක් ලබා ගනිමින් මිනුල් දොලුවීර ලකුණු 5ක් සහ සුසාල් ලකුණු 4.5ක් ලබා ශූරතාව සඳහා සටනේ ඉදිරියෙන් පසු වෙති. ප්‍රවීණයන් වන අනුරුද්ධ සහ රොමේෂ් පිළිවෙළින් 4 සහ 5 වැනි ස්ථානවල රැඳී සිටිති.

කාන්තා අංශයේදී නෙත්මි ප්‍රනාන්දු ශූරතාව අභියසට පැමිණ සිටින්නීය. ඇය මේ වන විටත් ශූරතාව සඳහා ඇය පසුපස හඹා එන ඊළඟ ක්‍රීඩකයන් දෙදෙනාට එරෙහිව මෙන්ම ජාතික ශූරිය සමඟ ද ක්‍රීඩා කර තිබීම විශේෂත්වයකි. අශ්විනි පවලචන්දන් (විවර්ලි ජාත්‍යන්තර පාසල) නෙත්මිට වඩා ලකුණු 1.5ක් පසුපසින් සිටින අතර, වත්මන් ශූරිය වන සයුනි ගිහන්සා (ධර්මාසෝක වි.) තරගාවලියට තරමක් මන්දගාමී ආරම්භයක් ලබා ඇති අතර, ලකුණු සටහනේ මදක් පසුපසින් සිටී. හිටපු ජාතික ශූරියක වන සචිනි රණසිංහ මේ වන විට ක්‍රීඩිකාවන් තිදෙනකු සමඟ 5 වැනි ස්ථානයට සමව සිටින්නීය.

තරගාවලියේ දෙවැනි භාගය 19 වැනිදා සිට 21 දා දක්වා පැවැත්වෙන අතර, සම්මාන ප්‍රදානය ද 21 දා පැවැත්වේ. තරගාවලියේ ජයග්‍රාහකයන්ට රු. 320,000ක මුදල් ත්‍යාග පිරිනැමෙන අතර, ජාතික ශූරයාට රු. 100,000ක් ප්‍රදානය කිරීමට චෙස් සම්මේලනය කටයුතු යොදා තිබේ.

2020 සැප්තැම්බර් 18 සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

නගරයේ කොටසක් වහලා මන්නාරම ලංගමය පාරට

මන්නාරමේ ලංගම සේවකයෝ පෙරේදා (16) බස් ධාවනයෙන් ඉවත් වී නගරය මැද විරෝධතාවක නිරත වූහ. මන්නාරම් මාර්ග ඉදිකරන සමාගමක අවශ්‍යතාවක් මත නගරයේ කොටසක් වසා දැමීම හේතුවෙන් එය බස් ධාවනයට බාධාවක් වී ඇතැයි විරෝධතාකරුවෝ පවසා සිටියහ.

ලංගම සේවකයන්ගේ විරෝධතාව හේතුවෙන් බස් ධාවනය අඩාළ වී පාසල් හා රජයේ කාර්යාල අවසන් වී නිවෙස්වලට යෑමට පැමිණි බොහෝ පිරිසක් අපහසුතාවට පත් වී තිබුණහ. කොන්ත්‍රාත් සමාගම මඟින් වසා දැමූ මෙම කොටස ලංගම බස් නැවතුම්පළට අයත් ප්‍රදේශයක් වීම හේතුවෙන් විරෝධතාකරුවන් ඉල්ලා සිටියේ වහාම එම කොටස යළි විවෘත කර දෙන ලෙසටයි. මන්නාරම නගර සභාවේ සභාපතිවරයා ඇතුළු පිරිසක් දෙපාර්ශ්වය සමඟ සාකච්ඡා කොට ප්‍රශ්නය සමථයකට පත් කොට ඇතත් එම තීරණයට ලංගම සේවකයන් එකඟතාවක් ද පළ කර නොතිබිණි.

■ ගයාන් සංජය

"පාසල් ළමයින්ට කාමර දුන්නොත් වැඩ වරදී"

ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්දික ද සිල්වා

ගම්පහ කොට්ඨාසයේ සියලුම හෝටල් හිමිකරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ගම්පහ ශ්‍රීබෝධි පාපන්දු ක්‍රීඩාංගණ සම්මන්ත්‍රණ ශාලාවේදී පෙරේදා (16) ගම්පහ කොට්ඨාස පොලිස් අධිකාරී කාර්යාලය මඟින් පවත්වන ලදී.

මෙහිදී ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්දික ද සිල්වා මහතා මෙසේ පැවසීය.

"ගම්පහට පිටින් පැමිණෙන අය ගොඩක් නවාතැන් සඳහා ඔබ පවත්වාගෙන යන හෝටල් තමයි භාවිත කරන්නේ. කුඩු බිස්නස් කරන මිනිස්සු, පාතාල සාමාජිකයන් වගේම කුමන හෝ අපරාධයකට සම්බන්ධ කෙනෙක්ට ඔබ ආයතනයෙන් පහසුකම් සපයන්න එපා. ඉතින් අද මෙතන ඉන්න හෝටල් හිමියන්ට මම මතක් කරනවා ඔබ නවාතැන් පහසුකම් දෙන අය ගැන හොඳට සොයා බලන්න කියලා. ඒ වගේම පාසල් ළමයින්ට, සෙනසුරාදා ඉරිදා උපකාරක පන්තිවලට පැමිණෙන ළමයින්ට කාමර දීම සම්පූරණයෙන් නවත්තන්න ඕනෑ. මින් ඉදිරියට බාලවයස්කාරයන්ට කාමර දුන්නොත් වැඩ වරදිනවා. අපි පොලිස් නිලධාරීන් සිවිල් ඇඳුමින් යොදවා ඒ පිළිබඳ සෑම සතියකම සොයා බැලීම් සිදු කිරීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා."

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් මත බස්නාහිර උතුර භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ මහතාගේ මෙහෙයවීමෙන් ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්දික ද සිල්වා, සහකාර පොලිස් අධිකාරී i තුසිත කුමාර, සහකාර පොලිස් අධිකාරී iii චින්තක පීරිස්, සහකාර පොලිස් අධිකාරී ප්‍රභාත් දයානන්ද යන මහත්වරුන් එහිදී දේශන පැවැත් වූ අතර ගම්පහ කොට්ඨාසයේ පොලිස් ස්ථානාධිපතිවරු ඇතුළු හෝටල් හිමිකරුවෝ වැඩසටහනට සහභාගි වී සිටියහ.

■ ප්‍රසාද් පුර්ණමාල් - පුත්තලම දිසා සමූහ

සුපිරි නිවෙසක සුපිරි පෙරීල්ලක්

කොස්වත්ත පොලිස් වසමට අයත් හාල්දඬුවන ග්‍රාමයේ සුවිසල් නිවෙසක පවත්වාගෙන ගිය මහා පරිමාණ නීති විරෝධී මත්පැන් (කසිප්පු) නිෂ්පාදනාගාරයක් වැටලීමට හලාවත කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ පොලිස් නිලධාරීන් පෙරේදා (16) සමත් වී තිබේ.

මෙම කසිප්පු නිෂ්පාදනාගාරය පවත්වාගෙන ගිය අයිතිකරු එහිදීම අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරු විසින් කෝටි තුනක් පමණ වටිනා සුපිරි නිවෙසක් කුලී පදනම මත ගෙන මෙය සූක්ෂ්ම ලෙස පවත්වාගෙන ගොස් ඇත.

මෙහිදී නීති විරෝධී මත් වතුර බෝතල් 580ක්, ගෝඩා බැරල් 21ක් හා මත් වතුර නිෂ්පාදනය කරමින් තිබූ බැරල් තුනක් සමඟ පෙරුම් උපකරණ රැසක් පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන තිබේ. නිෂ්පාදනය කරනා මත් වතුර නිවෙසේ ඉදිරිපස

ගේ ඇතුළේ කසිප්පු පෙරලා සෙල්ලම් ගෙදරක නංගලා

සෙල්ලම් ගෙයක සඟවා රාත්‍රී කාලයේ ප්‍රදේශ රැසකට ප්‍රවාහනය කර ඇති අතර කුලී පදනම මත ගත් වාහන ඊට යොදාගෙන ඇත. නිවෙසේ සැකකරුට අමතරව සැකකරුගේ බිරිය හා දරු දෙදෙනා ද ජීවත්ව ඇති අතර මෙම නිවෙස මොවුන් කුලී පදනම මත ගෙන ඇත්තේ මීට මාස දෙකකට පමණ පෙර බව ද පොලිස් විමර්ශනවලදී අනාවරණය වී තිබේ.

හලාවත කොට්ඨාස භාර පොලිස් අධිකාරී වයි. එල්. ලිලවංශ මහතාගේ උපදෙස් මත හලාවත කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක වර්ණසූරිය මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් සැරයන්වරුන් වන (18022) විජේකුමාර, (66070) සුභසිංහ, පොලිස් කොන්ස්තාපල්වරුන් වන (65303) රත්නායක, (77280) මධුසංක, (84280) ස්වර්ණතිලක යන පොලිස් නිලධාරීහු වැටලීමට එක් වූහ.

■ ගයාන් සංජය

එකම දවසෙ පින් පෙට්ටි 3ක් කඩලා

ගම්පහ නගරයේ මැදගම පන්සල, ගල් පල්ලිය සහ ඔරුතොට පාරේ දේවාලයක පින් පෙට්ටි තුනක් කඩා මුදල් සොරකම් කළ සැකකරුවන් දෙදෙනකු දිනක් තුළ අත්අඩංගුවට ගැනීමට පෙරේදා (16) ගම්පහ පොලීසිය සමත් වී තිබේ.

සී.සී.ටී.වී. කැමරා ඔස්සේ සැකකරුවන් දෙදෙනා පැමිණි යතුරුපැදියේ අංකය අනුව පරීක්ෂණ පවත්වා මිනුවන්ගොඩ ප්‍රදේශයේදී සැකකරුවන් දෙදෙනා පැය 24ක් ඇතුළත අත්අඩංගුවට ගැනීමට ගම්පහ පොලීසිය සමත් වී තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් මත බස්නාහිර උතුර භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්දික ද සිල්වා, සහකාර පොලිස් අධිකාරී i තුසිත කුමාර යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන් ගම්පහ මූලස්ථාන පොලිස් පරීක්ෂක සමන් ජයසිංහ, උප පොලිස් පරීක්ෂක ලක්ෂිත ඇතුළු නිලධාරීහු පරීක්ෂණ සඳහා එක් වූහ.

■ සී. එම්. ආරියපාල - තඹුත්තේගම

තඹුත්තේගමට රාජ්‍ය ඔසුසලක් නෑ

මහවැලි පවුල් 25,000කට අධික පිරිසක් ජීවත් වෙන මහවැලි එච කලාපය කේන්ද්‍රස්ථානගතව පිහිටි තඹුත්තේගම නගරයේ මූලික රෝහලක් හා පෞද්ගලික ඔසුසල් බොහෝ තිබුණත් ජනතාවට අඩු මුදලකට බෙහෙත් මිල දී ගැනීමට රාජ්‍ය ඔසුසලක් නැති වීම හේතුවෙන් තමන් අපහසුතාවට පත්ව ඇතැයි ප්‍රදේශවාසීහු පවසති.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැති ඇමැතිවරුන් රැසක් සිටියත් මහවැලි ව්‍යාපාරය ආරම්භ කොට වර්ෂ 40කටත් වඩා ඉක්ම ගොස් ඇති අතර ඉදිරියේදී හෝ තඹුත්තේගම නගරයට රාජ්‍ය ඔසුසලක් දෙන්නැයි අදාළ බලධාරීන්ගෙන් ප්‍රදේශවාසීහු ඉල්ලා සිටිති.

■ නන්දසිරි වැලිගමගේ - ගාල්ල දිසා සමූහ

උඩුගම මෙහෙයුමකින් 6ක් අල්ලයි

සතුන් දඩයම් කිරීම සඳහා අටවා තිබූ බඳින තුවක්කු 05ක් සමඟ විවිධ වැරදි සම්බන්ධයෙන් සැකකරුවන් 06 දෙනකු අත්අඩංගුවට ගැනීමට උඩුගම පොලීසිය සමත් වී තිබේ.

උඩුගම පොලීසිය මඟින් පෙරේදා (16) රාත්‍රියේ සිදු කළ විශේෂ මෙහෙයුමකදී මෙම සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති අතර බඳින තුවක්කු 05ක් උඩුගම දකුණු ප්‍රදේශයේ කැලෑබද ප්‍රදේශයක සතුන් දඩයම් කිරීම සඳහා අටවා තිබියදී සැකකරුවන් තිදෙනකු සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

මෙම සෝදිසියේදී බලපත්‍රයක් නැතිව ට්‍රැක්ටර් රථයකට වැලි පටවමින් සිටි සැකකරුවකු ට්‍රැක්ටර් රථය ද සමඟ අත්අඩංගුවට ගෙන ඇති අතර බිමත් රියැදුරකු හා අධිකරණය මඟහරිමින් සිටි වරෙන්තුකරුවකු අත්අඩංගුවට ගෙන ඊයේ (17) අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

උඩුගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අයි. ඩී. සී. ක්‍රිෂාන්ත, පො. ප. පුෂ්පකුමාර, පො.කො. වනරූන් වන (82551) එකනායක, (45332) විජේනායක, (91163) චන්ද්‍රසේකර යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

■ නවරත්න බංඩාර - මහවැලි කලාපීය සමූහ

පවුල් 800කට ජල ගැටලු

රඹකැන්ඔය මහවැලි කලාපීය පදියතලාව නගරයටත් එය අවට පිහිටා තිබෙන උණගස්ලන්ද, ගල්ඔඩේ, නාවින්න, නාවින්න හන්දිය, තපස්සිකයාය හා ළිඳගල ඇතුළු තවත් ගම්වලටත් ජලය බෙදා හරින පදියතලාව පානීය ජල යෝජනාක්‍රමය හරියාකාරව ක්‍රියාත්මක නොකෙරෙන බව එහි ප්‍රතිලාභී ජනයා චෝදනා නඟති.

පවුල් 800කට පමණ මීට මාස කිහිපයකට පෙර ආරම්භ කරනු ලැබූ මෙම ජල යෝජනාක්‍රමය මඟින් ඒ ඒ පවුල්වලට ප්‍රමාණවත් ජලය කලටවේලාවට නොලැබෙන බව ඔවුහු පවසති.

මෙම තත්ත්වය ගැන තොරතුරු ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලීය පදියතලාව හා අම්පාර කාර්යාලවලටත් පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් පදියතලාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයටත් ඉදිරිපත් කිරීමටත් ඔවුන් කටයුතු කර තිබේ. ඉහත කී තත්ත්වය මඟහරවාලීමට හැකි පුළුල් වැඩපිළිවෙළක පියවරක් හැටියට රඹකැන්ඔය මහවැලි ජලාශය කේන්ද්‍රීය ජල යෝජනාක්‍රමයක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන තුරු පදියතලාව ජල යෝජනාක්‍රමය යථාතත්ත්වයට පත් කරලීමටත් එතෙක් ජලය බෙදා හැරීමට ජල බවුසරයක් යෙදවීමටත් හැකි වෙතැයි බලධාරීහු කියා සිටිති.

■ ඊ. සී. ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

හලාවත මුහුදු තීරයේ නිදහස නැති වෙලා

යාචකයන් හා අත බලා සාත්තර කියන්නන් හේතුවෙන් හලාවත මුහුදු වෙරළ වෙත නිදහසේ කාලය ගත කිරීමට පැමිණෙන ජනතාවට බාධාවන් සිදුවන බවට ප්‍රදේශවාසීහු පවසති.

හිරු උදාවෙන් පසු කාලයේ පටන් හිරු බැස යන හෝරාව තෙක් විවිධ පුද්ගලයන් හලාවත මුහුදු වෙරළට පැමිණ නිදහසේ කාලය ගත කිරීමට පුරුදුව ඇති අතර බොහෝ පෙම්වතුන් හා පෙම්වතියන් මෙහි කාලය ගත කරනු දැකගත හැකිය. මේ අතර විවිධ ප්‍රදේශවල සිට මෙහි එන අභිගුණ්ඨික කාන්තාවන් හා පිරිමින් මුහුදු වෙරළේ රැඳී සිටිනා තරුණ තරුණියන්ට නිදහසේ කාලය ගත කිරීමට ඉඩ නොදෙමින් ඔවුන්ට ශාස්ත්‍ර කීමට අවශ්‍ය බව පවසමින් විවිධ බලපෑම් එල්ල කරනා බවත් ශාස්ත්‍ර නොඇසුවොත් ඔවුන්ට ඉල්ලා සිටින මුදලක් දීමට සිදු වී ඇති අතර එයද නොදුනහොත් අවලාද නඟමින් අපහාස කරමින් ඔවුන්ව අපහසුතාවට පත් කරන බවත් ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.

ඊට අමතරව මෙහි ගැවසෙන යාචකයන්ගෙන්ද නිතර හිරිහැර සිදු වන බවත් දිවයිනේ ඈත පෙදෙස්වල සිට පැමිණෙන මෙම යාචකයන් හා අභිගුණ්ඨිකයන් මුන්නේශ්වරම පුද බිමේ වන්දනාකරුවන් සඳහා වෙන් කර ඇති නවාතැන්වල තාවකාලිකව රැඳී සිටීමින් දිවා කාලයේ හලාවත මුහුදු වෙරළට පැමිණ මෙලෙස බලපෑම් කිරීම් නතර කර දෙන මෙන් ප්‍රදේශවාසීහු බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

■ යටියන්තොට විශේෂ - සමන් එස්. රත්නායක, බුලත්කොහුපිටිය සමූහ සහ කුරුවිට සමූහ

සබරගමුවේ මාධ්‍යවේදීන්ට නිදහස් ගමන් බලපත්‍ර

"මාධ්‍යවේදීන්ට සුදු කළු කරන්නත් කළු සුදු කරන්නත් පුළුවන් නිසා මාධ්‍යවේදීන් හැටියට දෙපැත්තම බලලා මාධ්‍යකරණය කිරීම ඉතාම වැදගත් වෙනවා" යැයි සබරගමුව පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ සබරගමුව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් සබරගමුව පළාතේ මාධ්‍යවේදීන්ට 2020 හා 2021 වර්ෂයන් වෙනුවෙන් නිදහස් ගමන් බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා පෙරේදා (16) සබරගමු පළාත් සභා ශ්‍රවණාගාරයේදී පැවති උත්සවයකදීය.

ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා වැඩිදුරටත් එහිදී මෙසේ පැවසීය.

"මාධ්‍යවේදීන් කියන සියලු දෙනා මා දන්නා පරිදි හෘද සාක්ෂියට එකඟව මේ රටේ දියුණුව සඳහා තමයි කටයුතු කරන්නේ. සමහර වෙලාවට ඒවා සමහර අයට අහුණ වුණත් මම නම් ඒවා සියල්ලම භාර ගන්නෙ ඒවා තුළින් අපි ජනතාවට දෙන සේවාව මීට වඩා වැඩි දියුණු කිරීමට ලබා දෙන ශක්තිය හා ආධාර උපකාර ලෙසයි.

■ ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

ගමේ පන්සල අපි හදමු
gamepansala@lakehouse.lk

පුරාවිද්‍යා තැන්පතු ගිණුමට සල්ලි දාලත් චෛත්‍යයේ වැඩ තාම ඉවර නෑ

සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දෙහිවත්ත සිරිවඩ්ඩනාරාමයේ සංරක්ෂණ කටයුතු සිදු කරද්දී එහි කටයුතු අතරමඟ නැවතුණු දෙවන ගෝඨාභය රජු දවස ඉදි කළ චෛත්‍යය දවසින් දවස විනාශ මුඛයට පත්වන බව විහාරාධිපති පූජ්‍ය කලවානේ කෝසලතිස්ස හිමියෝ පැවසූහ.

පුරාවිද්‍යා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සංරක්ෂණ කටයුතු සිදු කළ චෛත්‍යය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අරමුදල් නැති වීම හේතුවෙන් දායක දායිකාවන්ගේ ආධාර ඇතිව මෙම සංරක්ෂණ කටයුතු පටන් ගත් බව හිටපු පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂවරයා විශ්‍රාම යෑමෙන් පසු සංරක්ෂණ කටයුතු නැවතුණු බවත් විහාරාධිපති හිමියෝ පවසා සිටියහ.

මේ සම්බන්ධයෙන් තවදුරටත් අදහස් දැක්වූ පූජ්‍ය කලවානේ කෝසලතිස්ස හිමියෝ,

"මේ චෛත්‍යය දෙවන ගෝඨාභය රජු දවස ඉදි කළ එකක් බවට සඳහන් වෙනවා. මේක සංරක්ෂණය කරන්න දෙපාර්තමේන්තුවට සල්ලි නැහැ කිව්වම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමට අපි වරින් වර මුදල් දාලා සංරක්ෂණ වැඩ කරගෙන ගියා. එහෙම තියෙද්දී හිටපු සහාකර අධ්‍යක්ෂවරයා විශ්‍රාම ගියාට පසුව වැඩ නැවතුණා. දළදා මාලිගාවෙන් මෙහි සංරක්ෂණ කටයුතුවලට ඉංජිනේරු ගල් ගන්න මුදල් දුන්නා. ගල් වැලි ගෙනත් දාලා බලන් ඉන්නවා වැඩ පටන්ගන්න. මේ වෙනකොට චෛත්‍යයේ සංරක්ෂණය කළ තැන්වල ගල් පවා මතුවන මට්ටමට විනාශ වෙමින් පවතිනවා. වැලි ටික සේරම වැස්සට සේදිලා යනවා. මම ඒවා දවස ගාණේ එකතු කරනවා. මේ ගැන කියලා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ට කථා කළාම හරි හාමුදුරුවනේ පොඩ්ඩක් ඉන්න කියනවා. මේ සම්බන්ධයෙන් ලිපි පවා යවලා තියනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමට මුදල් බැර කරලා ත්‍රිකුණාමලයේ හැදෙන එකම චෛත්‍ය තමයි මේක. මේ චෛත්‍යය දැක්කාම මට හරි වේදනාවක් දැනෙනවා. නිලධාරීන් මෙහෙමද වැඩ කරන්නේ කියලා."

මේ සම්බන්ධයෙන් කළ විමසුමකට පිළිතුරු දුන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සහාකර අධ්‍යක්ෂ ආනන්ද විතානගේ මහතා මෙසේ පැවසීය.

"චෛත්‍යයේ වැඩ පටන් ගන්න තාක්ෂණික නිලධාරියකු ඉන්න ඕනෑ. අපට මෙහෙට එවැනි නිලධාරියෙක් නැහැ. අනිත් එක තමයි සංරක්ෂණ ක්‍රමවේදය මොකක්ද කියලා අපට උපදෙස් ලැබෙන්න ඕන. ඒවා මොකුත් නැහැ. අනික පොදු තැන්පත් ගිණුමේ තිබෙන මුදල් ප්‍රමාණය හාමුදුරුවෝ හරියට පැහැදිලි කිරීමක් කරන්නේ නැහැ. තව තව කාරණා තියනවා. මම ඒවා කියන එක හරි නැහැ. ඊට වඩා වැඩි යමක් දැන ගන්න ඕන නම් ප්‍රධාන කාර්යාලයේ මාධ්‍ය ඒකකයට හෝ අධ්‍යක්ෂ ජනරාල්ට කථා කරන්න."

කලවානේ කෝසලතිස්ස හිමි

සහකාර අධ්‍යක්ෂ ආනන්ද විතානගේ

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

මත් ද්‍රව්‍ය සමඟ පිරිසක් අසුවේ

කතුන් දෙදෙනෙක් ඒ අතර

යුද හමුදාව හා පොලිස් විශේෂ කාර්ය බළකාය විසින් මන්නාරමේ උයිලන්කුලම පුදුකුඩ්ඉරිප්පු ප්‍රදේශයේ වැටලීමක් සිදු කොට කේරළ ගංජා කිලෝ 52ක් සහ කහ කිලෝ 920ක් සමග පුද්ගලයන් හතර දෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් පිරිස අතර කාන්තාවන් දෙදෙනකුද සිටින අතර ඔවුන් මේවා නීති විරෝධී ලෙස වෑන් රථයකින් ප්‍රවාහනය කරමින් සිටියදී අත්අඩංගුවට ගෙන ඇත. ඔවුන් සතුව තිබී කහ සහ කේරළ ගංජාවලට අමතරව අමෙරිකානු ඩොලර් 100 යේ නෝට්ටු 5ක්, රුපියල් 1,725,000ක මුදලක්, ලොරි රථයක්, ටේලරයක් සහිත ට්‍රැක්ටර් රථයක් ආරක්ෂක අංශ භාරයට ගෙන තිබේ.අත්අඩංගුවට ගත් සැකකරුවන් සහ සැකකාරියන් වැඩිදුර විමර්ශන සඳහා මන්නාරම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

ඔවුන් සම්බන්ධයෙන් සිදු කළ මූලික විමර්ශනවල දී ඔවුන් මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම් වලට සම්බන්ධ බවට තොරතුරු අනාවරණය වී ඇති බව පොලිස් විශේෂ කාර්යය බළකාය සඳහන් කළේය.

■ වැලිමඩ විශේෂ - එස් එම් ෆාරුක්

වැලිමඩට නව පාලමක්

වාහන තදබදය අඩුවන හැඩක්

වැලිමඩ නගරයේ ප්‍රධාන පාලම අබලන් වී තිබූ අතර ඒ සඳහා නව පාලමක් ඉදිකිරීමේ කටයුතු සිදු කරමින් පැවතියද නගරයේ විශාල වාහන තදබදයක් පැවතිණි .මේ වන විට නව පාලමේ වැඩකටයුතු සියයට අනූවක් පමණ නිමකර පාලම මතින් වාහන ධාවනයට ඉඩ සැලසීමෙන් නගරයේ වාහන තදබදය අඩුවීම පිළිබඳ නගරවාසීහු සිය සතුට පළ කරති.

■ ඩබ්ලිව් .ඒ පියතිලක මැදිරිගිරිය සමූහ සහ එච්.එල් සොයිසා ලංකාපුර සමූහ

ගිරිතලේ වැවේ මාළු අල්ලන්න ගිය අයෙක් දියේ ගිලී මරුට

ගිරිතලේ වැවේ මාළු ඇල්ලීමට ගිය පුද්ගලයකු දියේ ගිලී මියගොස් සිටියදී හමු වූ බව මින්නේරිය පොලිසිය කියයි.

මෙසේ මියගොස් ඇත්තේ 1 කණුව, දියබෙදුම පාර, ගිරිතලේ. යන ලිපිනයේ කලගේ ගර්ජි හේවගේ ප්‍රසාජිත් ඉන්දික තිලකරත්න (48) හැවිරිදි විවාහක අයෙකි.

මෙම මියගිය පුද්ගලයා පිළිබඳ කළ විමර්ශන වලදි මියගිය අයගේ බිරිය විසින් පොලීසියට පවසා ඇත්තේ මාගේ මහත්තයා තවත් මිතුරන් දෙදෙනකු සමග පෙරදින රාත්‍රි හතට පමණ මාලුවෙක් අල්ලාගෙන කමු යැයි පවසමින් වැවට පැමිණි බවත් පසුදින වනතුරුත් තම ස්වාමියා නිවසට නොපැමිණීම පිළිබඳ සොයා බැලීමේ දී වැව අයිනේ ගලක් උඩ ස්වාමියාගේ කමිසය දැකීම නිසා අසල්වාසීන්ට කතා කර වැවේ සොයා බැලීමේ දී වැව තුළ මියගොස් සිටින බව දැක තිබේ. පසුව ඒ පිළිබඳ පොලීසියට දැනුම් දුන් බව මියගිය අයගේ බිරිය පවසා තිබේ.

උතුරුමැද පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහතාගේ සහ පොලොන්නරුව ප්‍රදේශය භාර නියෝජ්‍යපොලිස්පති වසන්ත කිත්සිරි ජයලත් මහතාගේ නියෝග පරිදි පොලොන්නරුව කොට්ඨාශස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඔෂාන් හේවාවිතාරණ මහතාගේ උපදේස් පරිදි මින්නේරිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක සි.එස් රත්නායක මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් කණ්ඩායමක් වැඩිදුර පරික්ෂණ පවත්වයි.

■ ලංසගේ සිරිවර්ධන - පුත්තලම දිසා විශේෂ

පුත්තලමේ පානීය ජල ගැටලුවට විසඳුම්

පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජලය පිළිබඳ ගැටලු සොයා බැලීමට ආණමඩුව සුදම්පාය ශාලාවට ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සැපයුම් මෙහෙයවන රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත මහතා පැමිණෙන බව දැනගන්නට ඇත.

මේ සඳහා පුත්තලම් දිස්ත්‍රික්කයේ පානීය ජල ප්‍රජාමූල සංවිධාන නියෝජිතයන්ට තම සංවිධානයේ ඇති ගැටලු ලිඛිතව රැගෙන එන ලෙස ජාතික ජල දෙපාර්තමේන්තුවේ පුත්තලම් දිස්ත්‍රික් ස්ථාන භාර නිලධාරීවරිය දැනුම් දෙයි.කලක පටන් පැවැති පානීය ජලය පිළිබඳ තිරසාර විසඳුමක් වසර තුනකින් පුත්තලමට ලබාදෙන බව රාජ්‍ය ඇමතිවරයා ප්‍රකාශ කරයි.

■ චන්ද්‍රදාස මලවරආරච්චි - මිහින්තලේ විශේෂ
වෝල්ටර් දයාරත්න - අනුරාධපුර දිසා විශේෂ

මහවිලච්චිය මහවැවේ මාළු ගමේ අපට නැද්ද?

ඒකාබද්ධ ගොවි සංවිධාන

මහවිලච්චිය මහවැවෙන් මිරිදිය ධීවරයන් අල්ලන මාළු තම ප්‍රදේශයේ ජනතාවට මිලදී ගෙන කෑමට අවස්ථාව සලසාදෙන ලෙස ඒකාබද්ධ ගොවි සංවිධානය ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ බලධරයන්ගෙන් ඉල්ලා සිටී. මහවිලච්චිය ඒකාබද්ධ ගොවි සංවිධාන සභාපති ආර්.එස්. එම්. ඒකනායක මහතා අනුරාධපුර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීමට සහභාගි වූ අවස්ථාවේ දී පැවසීය.

අපේ මහ වැවෙන් මිරිදිය ධීවර සමිති මාළු අල්ලනවා. ඒවා ප්‍රදේශයෙන් පිටට ගෙන ගොස් ඉහළ මිල ගණන් වලට විකුණනවා. හොඳ ආදායමක් මාළු වෙළෙඳුන් උපයනවා. නමුත් අපේ ගමට මාළු විකුණන්නේ නැහැ. මේක අසාධාරණයි. අපටත් මාළු කිලෝවක් මිල දී ගන්න ක්‍රමයක් හදාදෙන්න. තොටුපළට ගියත් ලැබෙන්නෙ නෑ.

දිසාපති ආර් .එම් . වන්නිනායක මහතා - මහවිලච්චිය වැවේ මාළු අල්ලාගෙන ගිහින් රටපුරාම බෝඩ් දාගෙන විකුණනවා. ලංකාවේ බොහෝතැන්වල මේක වෙනවා. ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය ඒකට මැදිහත් වී කටයුතු කරන්න.

ජල ජීවී වගා ව්‍යාප්ති නිලධාරී සිසිත කුමාර මහතා- හොඳයි. අපට මේකට අවස්ථාව ලබාදෙන්න පුළුවන්. ඒ ප්‍රදේශයට මාළු වෙළෙඳාම් කිරීම සඳහා මාළු ලෑල්ලක් ස්ථානගත කරදීමට පියවර ගන්නම්. ජනතාව ඉල්ලන ස්ථානයකට ඒක දාන්නම්.

දිනමිණ දසත දස අත ම එක තැන

■ ඒ.ඒ.එල්.ඩයස් - මාතලේ දිස්ත්‍රික් සමූහ

මාතලේ සුළු වාරිරක්ෂිත වල යෝධ නිදිකුම්බා

මේවනවිට මාතලේ දිස්ත්‍රික්කයේ සුළු වාරිරක්ෂිතයන් තුළ යෝධ නිදිකුම්බා ශාඛය වේගයෙන් පැතිරයාමට පටන්ගන ඇති බැවින් එය ඉදිරියේදී විශේෂයෙන් ග්‍රාමීය කෘෂිකර්මාන්තයේ කඩාවැටීමට සෘජුව බලපෑම් එල්ල වී ඇතැයි පෙදෙසේ ගොවිසංවිධාන නියෝජිතයෝ පවසති. මෙම ශාඛය මර්දනය කිරීමට රජය කඩිනම් පියවර ගතයුතු බව සඳහන් කරති.

මේවනවිට දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග රක්ෂිතයන් ගෙන් සියයට විසිපහකට (25%) වඩා වැඩි ප්‍රමාණයක් මෙම යෝධ නිදිකුම්බා ශාඛයේ ග්‍රහණයට හසුවී ඇති අතර එය ක්‍රමයෙන් අවට ගොවිබිම් කරාද විහිදීයමින් පවතින බව මොවුන් පෙන්නාදෙයි.

මේ අතර බොහෝ ස්ථානයන්හි පෙදෙස්වාසීන් යන්ත්‍රසූත්‍ර යොදා මෙම යෝධ නිදිකුම්බා ශාඛය ඉවත් කිරීම සඳහා පියවර ගෙන ඇතත් එය අසාර්ථක බව ඔවුන්ගේ මතයවී ඇත.

එමෙන්ම දිස්ත්‍රික්කයේ මහජලාශ රක්ෂිතයන්ද මෙම ආගන්තුක ශාඛයට ක්‍රමයෙන් ගොදුරුවෙමින් පවතින බව කියා සිටින මෙම නියෝජිතයෝ මෙම යෝධ නිදිකුම්බා ශාඛය විනාශ කිරීමේ ස්ථිර වැඩපිළිවෙළක් රජය විසින් වහා ක්‍රියාත්මක කළ යුතු බවද අවධාරණය කරති.

ග්‍රාමීය කෘෂිකර්මාන්තය වැනසෙන හැඩ

■ සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

මාතලේට දෙන ජලය 78%ක අපිරිසිදුයි

මාතලේ දිස්ත්‍රිකයේ ජාතික ප්‍රජා ජල දෙපාර්තමේන්තුව මගින් ලබාදෙනු ලබන ජල සැපයුම් වලින් 78% ක පමණ පානීය ජලය අපිරිසිදු තත්ත්වයේ පවතින බව වාර්තාකර ඇතැයි මාතලේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී අනාවරණය විය.

මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යු. ගමගේ මහතාගේ හා මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නාලක කොට්ටේගොඩ මහතාගේ සම සභාපතිත්වයෙන් මාතලේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී රැස්වූ අවස්ථාවේදී මේ කරුණු වාර්තා විය.

2011 වසරේදී ග්‍රාමීය ප්‍රදේශයන්හි ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීමට රජය විසින් ආරම්භ කරන ලද දෙවන ප්‍රජා ජල ව්‍යපෘති 232ක් මාතලේ දිස්ත්‍රික්ය තුළ ක්‍රියාත්මක කර තිබේ.

ඒ අතර මේ වනවිට ව්‍යපාති 108ක් පමණ අක්‍රිය මට්ටමේ පවතින බව වාර්තවේ. එම ව්‍යපෘති රැසක් දේශපාලනීකරණයවීම හේතුවෙන් පසුගිය කාලය තුළ විවිධ අක්‍රමිකතාවන් සිදුව ඇති බවට කරුණු අනාවරණය වී ඇතැයි පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ දිසානායක මහතා කමිටුවේදී සඳහන් කළේය. යම් ගැටළුකාරි තත්ත්වයක් පවතින් බවත් පිරිසුදු පානීය ජලය ලබාදීමට දැනටමත් ක්ලෝරීන් යන්ත්‍ර 50ක් යොදවා ඇති බවත් එය 100 දක්වා වැඩි කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇති බවය.

■ සරත් වෙලගෙදර - ඇලහැර සමූහ

වන අලි පහරින් අසරණ වූ පවුලට අපිත් සරණක් වෙමු

වන අලියකු පහරදී බරපතළ තුවාල ලබා අබාධිතවී අන්ත අසරණ තත්ත්වයට පත්වී සිටින තිදරු කාන්තාවක් පිළිබඳ දුක්බරකථා පුවතක් බකමුණ සිරිකදුරුයාය ගම්මානයෙන් වාර්තාවේ.

වන අලියකුගේ පහරදීම නිසා කකුලකට හා අතට බරපතළ තුවාල ලැබ එක්තැන්ව අන්ත අසරණ තත්ත්වයට පත්වී සිටිනුයේ සිරිකදුරුයාය ගම්මානයේ පදිංචි ඩබ්ලිව් .ඒ .ඉරේෂා නිශාන්ති නමැති 37 හැවිරිදී කාන්තාවකි.

විශාල සටනක් කර ජීවිතය බේරාගත් ඉෂාරා නිශාන්ති සිය සිදුවූ බිහිසුණු සිදුවීම විස්තර කළේ මේ අයුරිනි.

සිද්ධිය වූ දින වෙලාව උදේ 6 .30 විතර ඇති මගේ ලොකුදුවටත් පොඩි දුවටත් උණ හැදුනා. බකමුණ රෝහලෙන් බෙහෙත් ගන්න මමත් දුවලා දෙන්නත් එක්ක නිවසින් පිටවුණා . අපේ ගමේ සිට බකමුණට බස් එක පිටත්වෙන්නේ උදේ 6 .45 ට. එනිසයි අපි උදෙන්ම නිවසින් පිටවිගියේ . අපි තිදෙනා මාර්ගයේ යනවිට සුසාන භූමිය අසලින් ගමන් කරද්දී වත්තක සිට අලියකු දුවගෙන අවා. අලියා මට පහර දුන්නා . මම පාරේම වැටුණා .

මට පහරදුන් අලියා දරුවන් දෙදෙනා පස්සේ එලෙව්වා. ලොකු දුවත් පොඩි දුවත් ගහක් යට සැඟවුණා.මේ අවස්ථාවේ තාත්තා දුවගෙන ඇවිත් කෑගැසුවා. අලියා නැවතත් මා ළඟට එනවිට නැවතත් තාත්තා කෑගැසුවා අලියා නැවත කැලෑවට ගියා. මගේ තාත්තා අවනිසයි මාත් දරුවන් දෙදනත් ජීවිත බේරාගත්තේ .

තාත්තා සමග මගේ මහත්තයා එක්වී අපි රෝහලට ගෙනාවා. අලියාගෙන් බේරීමට ගසක් යට සැඟවී ජීවිත බේරාගත් ඉරේෂාගේ වැඩිමහල් දියණිය වන සදලි චාලිකා අවුරුදු 14 මෙම බිහිසුනු අත්දැකීම විස්තර කරමින් මෙසේ කීවාය.

උදෙන්ම අම්මත් මමත් නංගියි බකමුණට යන්න අතුරු පාරේ දිගේ යනවිට අලියා වත්තක ඉඳලා පාරට ආවා .ඇවිත් අම්මට අලියා පහර දුන්නා. අම්මා බිම වැටුණා .මම දුවලා ගහක් යට සැඟවුණා. නැවත වටපිට බලා ගෙදරට දුවලා ගිහින් තාත්තාට කිව්වා . තාත්තා ඇවිත් අම්මා රෝහලට අරන් ගියා .

හත්හැවරදී නිපුනි ශානිකා- අපි තිදෙනා යනවිට වත්තක ඉඳලා අලියා පාරට ඇවිත් අම්මට පහරදී අක්කාගේ පස්සේ එළවව්වා . අක්කා ගහක් යට සැඟවුණා . මම දුවගෙන ඇවිත් වරා ගහක් යට සැඟවුණා . මේ අවස්ථාවේ තමයි සීයා දුවගෙන ආවේ .

සීයා ඇවිත් අලියා එලවා දැම්මා . සීයා නාවානම් අපිට මෙහෙම් කථා කරන්නවත් ලැබෙන්නේ නෑ. අම්මයි තාත්තයි තමයි කුලී වැඩට ගිහින් අපිට කන්න අඳින්නත් පාසල් යන්නත් උදවු කළේ. දැන් පොත් පත් ගන්න මුදල් නොමැති නිසා පාසල් යන්නේ නෑ. ඇලහැර ප්‍රදේශීය ලේකම් කාර්යාලයට හා ඇලහැර වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලයට වන්දියක් ඉල්ලා අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කළත් මේවනතෙක් වන්දි මුදලක් ලැබී නැත . දරුවන් ජීවත් කරන්න

දරුවන් පාසල් යවන්න අදායම් මාර්ගයක් නොමැතිව අසරණ වී සිටින ඇය ප්‍රතිකාර ලබනුයේ පොලොන්නරුව මහ රෝහලෙනි . ඇයට උදව් උපකාර කිරීමට කැමති අයකු සිටීනම් හැකි ලෙස උපකාර කරන්නැයි කාරුණික ඉල්ලීමක් කර සිටී.

■ ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

නිදන් සෙවූ පිරිසට වැඩවරදී

නිදන් වස්තු සෙවීමේ අරමුණෙන් බිබිල-තිත්තවැල්කිවුල ප්‍රදේශයේ රක්ෂිත වනයේ කැණීම් කටයුතු කරමින් සිටි පුද්ගලයන් සිව්දෙනකු බිබිල පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

පොලීසියට ලද තොරතුරක් මත කරන ලද මෙම වැටලීමේදී කැණීම් කටයුතු කිරීමට යොදාගත් උපකරණ,වතුර මෝටරයක් සහ පූජා භාණ්ඩ රැසක් පොලීසිය භාරයට ගෙන තිබේ. සැකකරුවන් බිබිල රතුපස්කැටියේ අයිවෙල-නන්නපුරාව ප්‍රදේශවල පදිංචි අවුරුදු 23, 41,47,57 යන වයසේ සිටින පුද්ගලයන් වේ. සැකකරුවන් සහ නඩු භාණ්ඩ බිබිල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. මොනරාගල සහකාර පොලිස් අධිකාරී (ii) එස්.පී.කේ ගාල්ලගේ මහතාගේ උපදෙස් පිට බිබිල පොලිස් ස්ථානාධිපති ඒ.එස්.පී.සී.කේ සෙනරත් මහතාගේ මෙහෙයවීම යටතේ උප පොලිස් පරික්ෂක වසන්ත උදයකුමාර මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් වැටලීම සිදුකැර ඇත.

■ තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ

හැවන්දෙණියට සංඥා කුලුනක් නෑ

මාතර දිස්ත්‍රික්කයේ මුලටියන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් අතපත්තුකන්ද, හැවන්දෙණිය ප්‍රදේශයේ සන්නිවේදන කුලුනක් නොමැතිවීම හේතුවෙන් හොරේහේන , පරපාමුල්ල නැගෙනහිර, මුරුතහේන ඇතුළු අවට ගම්මාන රැසක ජනතාව දැඩි දුෂ්කරතාවයට පත්ව සිටිති.

දුරකථන හරහා තොරතුරු හුවමාරු කර ගැනීමේ දී මෙන් ම අධ්‍යාපනය ලබන පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් මාර්ගගත (online) ක්‍රමය යටතේ අධ්‍යාපන කටයුතු සිදුකර ගැනීමේ දී මෙම තත්ත්වය විශාල බාධාවක් වී ඇතැයි එම සිසුන් පෙන්වාදෙති.

මේ සම්බන්ධයෙන් වගකිවයුතු අය දැනුවත් කළ ද මෙතෙක් විසඳුම් ලබා දීමට අවශ්‍ය පියවර ගෙන නොමැති බවද ප්‍රදේශවාසීහු සඳහන් කරති.

මේ පිළිබඳව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අවධානය යොමුකර මෙම ප්‍රදේශය ආවරණය වන පරිදි සන්නිවේදන පහසුකම් ලබා ගැනීම සඳහා සංඥා කුලුනක් ලබා දීමට පියවර ගන්නා ලෙසද ඔවුහු බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

■ කැබිතිගොල්ලෑව සමූහ

ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යළිත්

ශෙහාන් සේමසිංහ

අකර්මන්‍ය වූ ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය වැඩසටහන් මාලාව නැවත රජරටින් ආරම්භ කිරීමට බලා පොරොත්තු වන බවත් ඒ තුළින් රජරට සිටින රැකියා විරහිත ස්වංරැකියා ලාභින්ට ශක්තියක් වීමට අවශ්‍යය සියලු කටයුතු සූදානම් කරන බවත් සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂද්‍ර මූල්‍ය , ස්වං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන, රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතා පැවසීය.

පසුගියදා අනුරාධපුර නගරයේ , අනුරාධපුර දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂක සුගත් නයනානන්ද මහතා සමග පැවති සාකච්ඡාවෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඒ මහතා මෙසේද කීය.

පළමු අදියර වශයෙන් මෙය අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කර දෙවනුව රට පුරා තෝරාගත් ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාස ආවරණය කරමින් දිරිමත්ව, සවිමත්ව, විධිමත්ව සංවිධානය වී දිළිඳුකමින් මිදී දියුණුවේ මාවතට පිළිපන් ජනතා සමාගම් බිහිකර ඒවාට වෙළෙඳපොළ ජය ගැනීමේ අවස්ථාව සලසා දීම ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය හරහා සිදු කිරීමට අපි බලා පොරොත්තු වෙනවා. මේ පිළිබඳ මා අනුරාධපුර දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂක සුගත් නයනානන්ද මැහතා සමග සාකච්ඡා කළා.

අපේ රටේ කාලීන අවශ්‍යතාවක් යුගයේ අවශ්‍යතාවක් ජාතික වශයෙන් අනිවාර්යයෙන්ම කළ යුතු කාර්යයක් වූ දුගී බවෙන් නිදහස් වීම සඳහා මුළු මහත් ජනතාව තුළ ආර්ථික සමෘද්ධිය ඇති කිරීම සඳහා සමාජ සාධාරණත්වය තුළ සෑම මිනිසකුටම දරිද්‍රතාවයෙන්, බඩගින්නෙන්, කුසගින්නෙන් තොරව ජීවත්වීම සඳහා ආරම්භ කරනු ලබන ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය පසුගිය ආණ්ඩු කාලයේ අකර්මන්‍ය වෙලා තිබුණා. එය අපි නැවත නිවැරදිව ආරම්භ කිරීමට කටයුතු කරනවා. ඒ පිළිබඳ තවත් සාකච්ඡා වාර කිහිපයක් අපි කරනවා.

■ ඩබ්.ඒ්. පියතිලක - මැදිරිගිරිය සමූහ

මින්නේරිය රක්ෂිතය කෙලෙසුවොත් බලාගෙනයි!

දිනමිණ දැස්ත දැස අත ම එක තැන

ගිරිතලේ මින්නේරිය ස්වභාව රක්ෂිතය අස්වාභාවික ව්‍යාපාරිකයන්, නිවැසියන් මෙන්ම ගිරිතලේ වනජීවී පශු වෛද්‍ය එකකයත් එක්ව හානි සිදු කර තිබීම නිසා ගිරිතලේ මින්නේරිය ස්වභාව රක්ෂියත් ඒ අවට ඇති ගිරිතලේ වැවට සහ ජල මූලාශ්‍රවලට විශාල හානියක් සිදුව ඇති බව පොලොන්නරුව, මාතලේ සහ ත්‍රිකුණාමලය වනජීවී සහකාර අධ්‍යක්ෂ ඩබ්.එම්.කේ.එස්. චන්ද්‍රරත්න මහතා පවසයි.

ඒ මහතා මේ බව පවසා සිටියේ ගිරිතලේ වනජීවී පශු වෛද්‍ය රෝහල විසින් ප්‍රතිකාර කිරීම සඳහා රැගෙන එන සතුන් ප්‍රතිකාර අසාර්ථක වීමෙන් පසු මිය යන සියලු සතුන් සෞඛ්‍ය ආරක්ෂික පිළිවෙත් අනුගමනය නොකර ගිරිතලේ මින්නේරිය ස්වභාව රක්ෂිතයට මුදාහරින බවට ප්‍රදේශවාසීන්ගෙන් ලද පැමිණිලි කිරීම් හමුවේ ඒ පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා පසුගියදා (14) එම රක්ෂිතයට පැමිණි අවස්ථාවේදීය.

එම නිරීක්ෂණ කිරීමෙන් පසු සභාකාර අධ්‍යක්ෂවරයා මෙසේද පැවසීය.,

'මේ ගිරිතලේ මින්නේරිය ස්වභාව රක්ෂිතය පිහිටා තිබෙන්නේ ගිරිතලේ බකමුණ ප්‍රධාන මාර්ගයේ එක්පසකින්ය. අනික් පසින් පිහිටා ඇත්තේ අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයයි. ගිරිතලේ මින්නේරිය ස්වභාව රක්ෂිතය සහ අංගම්මැඩිල්ල ජාතික උද්‍යානය ගිරිතලේ බකමුණ මාර්ගය දෙපස කිලෝමීටර් 10ක පමණ ප්‍රමාණයක් තිබෙනවා. මෙම උද්‍යානයට සහ රක්ෂිත තුළට වනජීවී රෝහල විසින් සහ විවිධ පාර්ශ්වයන් විසින් පරිසර පද්ධතියට හානි වන ලෙස අපද්‍රව්‍ය මුදාහරින බවයි. ඒ අනුව අපි එම ස්ථාන දැඩි පරීක්ෂාවට ලක් කළා. එහිදී ගිරිතලේ පශු වෛද්‍ය එකකය විසින් මැරුණු සතුන්ගේ මළ සිරුරු සහ එහි විවිධ අපද්‍රව්‍ය ගෙනත් දමා ඇති බවට අපට දක්නට ලැබුණා. ඊට අමතරව අවට ගම්මානවල නිවාස හිමියන් විසින් ඉවත් කරන විවිධ අපද්‍රව්‍යත් ගෙනත් දමා තිබෙනවා. මේ පිළිබඳව වනජීවී රෝහලට දැනුම් දීමක් කළා. මින් ඉදිරියට මෙම රක්ෂිතයට කිසිදු අපද්‍රව්‍යක් මුදා නොහරින ලෙසත් දමා ඇති මැරුණු සතුන්ගේ මළසිරුරු වහාම වළ දමන ලෙස දැනුම් දුන්නා' යැයි පැවසීය.

මෙම ගිරිතලේ මින්නේරිය රක්ෂිතය විනාශ කර ඇති ස්ථාන නිරීක්ෂණය කිරීම සඳහා ගිරිතලේ වනජීවී පුහුණු පාසලේ සහකාර අධ්‍යක්ෂ ඩබ්.ඩී.එම්.පී. වික්‍රමසිංහ මහතා ඇතුළු වනජීවී නිලධාරීන් පිරිසක් පැමිණ සිටිහ.

■ අයි.එම්.වි.සී. ගුණසේකර - ඇල්පිටිය සමූහ

නිරෝද රියකින් ගිහින් ගමේ ගංජා බෙදූ ගැබිනි කත දැලේ

කාලයක් තිස්සේ ගංජා ජාවාරම් කළ බව කියන ගැබිනි කාන්තාවක් කේරළ ගංජා තොගයක් සමඟ අත්අඩංගුවට ගත් බව බෙන්තොට පොලීසිය පවසයි.

බෙන්තොට පහුරුමුල්ල ප්‍රදේශයේදී මෙම කාන්තාව අත්අඩංගුවට ගෙන ඇති අතර ඇය සන්තකයේ තිබී පැකට් කරන ලද කේරළ ගංජා පැකට් 58ක් සහ පැකට් නොකරන ලද ගංජා තොගයක් සොයා ගත් බව පොලීසිය පවසයි.

සංගම දුරකතන හයක්, බැංකු කාඩ්පත් සහ රුපියල් තිස්පන් දහසක මුදලක්ද සැකකාරිය ළඟ තිබී පොලීසිය අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම කාන්තාව ගංජා තොගය තවත් කාන්තාවකට අලෙවි කිරීම සඳහා ලබාදීමට ත්‍රීරෝද රථයකින් රැගෙන යමින් සිටියදී අත්අඩංගුවට ගත් බවද පොලීසිය කියයි.

මෙම ගංජා කොළඹ ප්‍රදේශයේ අයෙක් තමන්ට ගෙනවිත් දෙන බවත් දැනට මාස දෙකක පමණ කාලයක සිට තමන් මෙම ජාවාරම කරගෙන ගිය බවත් පොලීසිය කළ ප්‍රශ්න කිරීමේදී ඇය පවසා තිබේ. සිද්ධිය සම්බන්ධයෙන් සැකපිට ප්‍රශ්න කිරීම සඳහා ඇයගේ සැමියාද අත්අඩංගුවට ගත් බවද පොලීසිය කියයි.

ඇල්පිටිය පොලිස් අධිකාරි සනිස් ගමගේ මහතාගේ උපදෙස් මත බෙන්තොට පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ ප්‍රසන්න පත්මසිරි - උඟව පළාත් සමූහ

නිධානයක් ගැනීමට වළක් හාරමින් සිටි 4ක් අල්ලයි

බිබිල, තිත්තවැල්කිවුල ගම්මානයේ ළඳු කැලෑවක නිධානයක් ගැනීමට විශාල වළක් කපමින් සිටි යැයි කියන පුද්ගලයන් සිව් දෙනකු ජල මෝටර්, පූජා භාණ්ඩ, කැණීම් ආයුධ ඇතුළු උපකරණ සමඟ පසුගියදා (14) අත්අඩංගුවට ගත් බව පොලීසිය කියයි.

අත්අඩංගුවට ගත් සැකකරුවන් මෙම ස්ථානයේ අඩි පනහ පනහ ප්‍රමාණයේ අඩි 18ක් ගැඹුර වළක් කපමින් සිටියදී පොලීසිය වැටලීම සිදු කර තිබේ. එම වළ මත පුජවන් පවත්වා තිබෙන බවත් මෙම ස්ථානයේ නිධානයක් තිබෙන බව ප්‍රදේශවාසීන් කියන බව පොලීසිය කියයි.

අත්අඩංගුවට ගත් සැකකරුවන් බිබිල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. බිබිල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනක මහතාගේ උපදෙස් මත උප පොලිස් පරීක්ෂක උදයකුමාර මහතා ඇතුළු නිලධාරීන් වැටලීම සිදු කර තිබේ.

■ සී. ගමගේ - සොරණාතොට සමූහ

හොරට බියර් විකිණූ පුද්ගලයා බඩුත් එක්ක කොටු වෙයි

බදුල්ල අරාවත්ත ප්‍රදේශයේ නිවෙසක බලපත්‍ර නොමැතිව හොර රහසේ බියර් ටින් මුදලට විකුණූ පුද්ගලයකු බියර් ටින් 13ක් සමඟ පසුගියදා (14) අත්අඩංගුවට ගත් බව රිදීමාලියද්ද පොලීසිය පවසයි.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ බදුල්ල අරාව, අරාවත්ත පදිංචි 70 හැවිරිදි පුද්ගලයකු යැයි පොලීසිය පැවසීය. රිදීමාලියද්ද පොලිසියේ නිලධාරීන් ලැබුණු තොරතුරක් මත වෙස්වලාගෙන ගොස් මෙම වැටලීම සිදු කර මෙසේ බලපත්‍ර නොමැතිව හොර රහසේ මුදලට බියර් ටින් විකුණූ සැකකරු සමඟ බියර් ටින් අත්අඩංගුවට ගනු ලැබිනයි පොලීසිය සඳහන් කළේය.

ඌව පළාත භාර නියෝජ්‍ය පොලිස්පති කේ.වී.ඩී.ඒ.ජේ. කරවිට, බදුල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වසන්ත කන්දේවත්ත, සහකාර පොලිස් අධිකාරි 1 ප්‍රදීප් වීරසේකර යන මහත්වරුන්ගේ උපදෙස් මත රිදීමාලියද්ද පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රුවන් චන්දික විරකෝන් මහතා ඇතුළු නිලධාරීන් වැඩිදුර පරීක්ෂණ පවත්වති.

■ ටී.එල්.ඒ.පී. හේමපාල - නාගොඩ සමූහ

කැප්පිටියාගොඩ උඩවැලිවිටිය පාලම අබලන්

නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කැප්පිටියාගොඩ උඩවැලිවිටිය සම්බන්ධ කරමින් ගිං ගඟ හරහා ඉදි කර තිබෙන පාලම දැඩි ලෙස අබලන් වී තිබේ. වසර ගණනාවක සිට නිසි නඩත්තුවක් නොමැති වීම නිසා පාලමේ යකඩ දිරා ඇති අතර කොන්ක්‍රීට් තහඩු පහත්වී සෙලවෙන තත්ත්වයක් උද්ගතවී ඇත. විශාල පිරිසක් දිනපතා එගොඩ මෙගොඩ යන මෙම පාලම කඩිනමින් ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ප්‍රදේශවාසීහු අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

ඇම්.පී. චන්ද්‍රපාල තංගල්ල විශේෂ

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ සමරු දින රැස්වීමදා

ලංකාවේ සියලු දහම් පාසල් පිහිටුවා වසර 125ක් පිරීම නිමිත්තෙන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද සමරු දින රැස්වීමක් ඉකුත්දා අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ විරකැටිය උඩයාල ඓතිහාසික කසාගල රාජමහා විහාරස්ථානයේදී පැවැත්විණි.

එහිදී අගමැති මහින්ද රාජපක්ෂ මහතා විසින් දහම් පාසල් නිල වෙබ් අඩවිය විවෘත කිරීම සහ දහම් පාසල් දරුවන්ට සහතික පත්‍ර ප්‍රදානය කිරීම චමල් රාජපක්ෂ මහතා අතිනුත් සිදු කෙරිණි. මෙම අවස්ථාවට පරිසර අමාත්‍ය මහින්ද අමරවීර, රාජ්‍ය අමාත්‍ය විජිත බේරුගොඩ රාජ්‍ය අමාත්‍ය ඩී.වී. චානක, පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය උපුල් ගලප්පත්ති, පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් රාජපක්ෂ යන මහත්වරු සමඟ මහා සංඝරත්නය ඇතුළු දහම් පාසල් ගුරුවරුන් සිසු දරුවන් විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

■ සී. ගමගේ - සොරණාතොට සමූහ

බීමතින් අශෝභනව හැසිරුණු 3ක් අත්අඩංගුවට

පස්සර නගරයේ බීමතින් අශෝභන ලෙස හැසිරුණු පුද්ගලයන් තිදෙනකු පසුගියදා 14 අත්අඩංගුවට ගත් බව පස්සර පොලීසිය පවසයි. මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ පස්සර සඟබෝ මාවත පදිංචි තිදෙනකු යැයි පොලීසිය පවසයි.

මොහුන් බීමතින් අශෝභන ලෙස පස්සර නගරයේ හැසිරෙමින් සිටියදී නගරයේ රාජකාරියේ නිරතව සිටි පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් බවද පොලීසිය සඳහන් කළේය.

ඌව පළාත භාර නියෝජ්‍ය පොලිස්පති කේ.වී.ඩී.ඒ.ජේ. කරවිට, බදුල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වසන්ත කන්දේවත්ත, සහකාර පොලිස් අධිකාරි 1 ප්‍රදීප් වීරසේකර යන මහත්වරුන්ගේ උපදෙස් මත පස්සර පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පාලිත සෙනෙවිරත්න මහතා ඇතුළු නිලධාරීන් වැඩිදුර පරීක්ෂණ පවත්වති.

■ එම්.පී. කුමාර - කොටදෙණියාව සමූහ

සද්ධාතිස්ස සකලසූරිය ආදර්ශයේ සිසු නියමුවන්ට පදක්කම්

දිවුලපිටිය හපුගහගම සද්ධාතිස්ස සකලසූරිය ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ සිසු නියමුවන් දිවුරුම් දීම පසුගියදා සිදු කෙරිණි. ඒ විදුහල්පතිනි ඩබ්ලිව්.ඒ.එන්.පී. වික්‍රමආරච්චි මහත්මියගේ ප්‍රධානත්වයෙනි.

ඉදිරි වසර සඳහා දහසය දෙනකුගෙන් යුත් ශිෂ්‍ය නායක මණ්ඩලයක් මෙහිදී දිවුරුම් දෙනු ලැබිය. සෑම ශිෂ්‍ය නායකයකු හා නායිකාවක සඳහාම නිල ලාංඡන පැලඳවීම ඔවුන්ගේ මවුපියන් අතින් සිදු කිරීම විශේෂත්වයකි.

ගුරු මණ්ඩලය සමඟ විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා මවුපියෝ ද මේ අවස්ථාවට එක්ව සිටියහ. ප්‍රධාන ශිෂ්‍ය නායක ලෙස ඉසුම් නෙත්මිණ සිසුවා හා ප්‍රධාන ශිෂ්‍ය නායිකාව ලෙස සඳලි නවෝද්‍යා සිසුවිය ද මෙහිදී පත්වීම් ලැබූහ.

■ ජී.අයි.ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ

ඉත්තෑ මස් කිලෝ 5ක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට

ඇතිමලේ බිටිටු වනජීවී කාර්යාල බල ප්‍රදේශයට අයත් ඇතිමලේ 5 කණුව ප්‍රදේශයේ පිහිටි හෝටලයක් තුළ තිබූ ඉත්තෑ මස් කිලෝ පහක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට ඇතිමලේ බිටිටු වනජීවී කාර්යාලයේ නිලධාරීහු පිරිසක් සමත්වූහ.

අත්අඩංගුවට පත් සැකකරු එම ප්‍රදේශයේම පදිංචිකරුවකු වන අතර ඔහු සියඹලාණ්ඩුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රුපියල් හතළිස් දහසක දඩ මුදලක් නියම කරන ලදී.

මෙම වැටලීම ඇතිමලේ බිටිටු වන කාර්යාලයේ වන සත්ත්ව අඩවි සහකාර ඩබ්.ඒ.ඕ. වර්ණසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් වන සත්ත්ව නියාමක එස්.සී. සමරකෝන් ඒ.ජී.අයි.එස්. හර්ෂ කුමාර ක්ෂෙත්‍ර සහකාර එල්.ජී. ශාන්ති ලාල්, කේ.කේ. චන්ද්‍රපාල ආර්.එම්. හර්ෂ චතුරංග යන නිලධාරීහු සිදු කළහ.

■ බී.ඒ. ගරුසිංහ - වැලිපතයාය විශේෂ

වැලිපතයාය වාරි ඇළක පුද්ගලයකුගේ සිරුරක්

බළන්ගොඩ, කල්තොට, වැලිපතයාය ප්‍රදේශයේ ප්‍රධාන වාරිමාර්ග ඇළේ තිබී පුද්ගල මළ සිරුරක් සමඟ පාපැදියක් පසුගියදා (14) සොයාගත් බව පොලීසිය පවසයි.

කල්තොට පොලිස් බල ප්‍රදේශයට අයත් වැලිපතයාය විල්ලාර, අංක 08 ප්‍රදේශයේ පදිංචිව සිටි ඒ.ඩී. ප්‍රේමසිරි නමැති 39 හැවිරිදි දෙදරු පියකු මෙලෙස මියගොස් ඇති බවට අනාවරණය වී තිබේ. පාපැදියක් සමඟ එම පුද්ගලයා ප්‍රධාන වාරිමාර්ග ඇළේ දිය නාන ස්ථානයක් අසලට වැටී තිබෙන අයුරු මාර්ගයේ ගමන් කළ ප්‍රදේශවාසීන් පිරිසක් පසුගියදා (14) දැක තිබෙන අතර ඔවුන් විසින් මේ සම්බන්ධයෙන් කල්තොට පොලිස් ස්ථානය වෙත දැනුම්දීමක් සිදු කර ඇත. ඔහු පාපැදියකින් ගමන් කරන විට වාරිමාර්ග ඇළට ඇද වැටී මිය ගියාද නැතහොත් වෙනත් හේතුවකි මිය ගියාද යන්න මෙතෙක් අනාවරණය කර ගෙන නොමැති බව කල්තොට පොලීසිය පැවැසීය.

සිරුර සම්බන්ධයෙන් පශ්චාත් මරණය පරීක්ෂණ පසුගියදා බළන්ගොඩ මූලික රෝහලේ දී පැවැත්වීමට නියමිතව තිබිණි. සිද්ධිය සම්බන්ධයෙන් කල්තොට පොලීසියේ ස්ථානාධිපති තරංග හපුගස්වත්ත මහතාගේ උපදෙස් පරිදි වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

කිරිහට්ටි හදන ගමන් කසිප්පු පෙරලා

හම්බන්තොට පොලිස් වසමේ ගොන්නොරුව 04 කණුව හා 6 කණුව ප්‍රදේශවල සිදු කළ වැටලීම්වලදී කසිප්පු මිලිලීටර් 5,000ක් හා ගෝඩා මිලිලීටර් ලක්ෂ 2ක් හා කසිප්පු පෙරීමට යොදාගත් උපකරණ සමඟ සැකකරුවන් දෙදෙනකු තංගල්ල කොට්ඨාස දුෂණ මර්දන ඒකකයේ නිලධාරීන් විසින් පසුගියදා (14) අත්අඩංගුවට ගෙන තිබේ.

හම්බන්තොට ගොන්නොරුව පාරේ, කැලියවලාන 04 කණුව ප්‍රදේශයේ කිරිහට්ටි නිෂ්පාදනය කරන නිවෙසක් තුළ පවත්වාගෙන ගිය කසිප්පු නිෂ්පාදනාගාරයක් වටලා එය පවත්වාගෙන ගිය 64 හැවිරිදි නිදරු පියකු සමඟ ගෝඩා මිලිලීටර් 20,000ක්, කසිප්පු ස්ප්‍රිතු මිලිලීටර් 5,000ක් සමඟ කසිප්පු පෙරීමට යොදාගත් උපකරණ තොගයක් අත්අඩංගුවට ගෙන තිබේ.

තංගල්ල කොට්ඨාසභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රවීන්ද්‍ර අඹේපිටිය, තංගල්ල කොට්ඨාස දුෂණ මර්දන ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නිශාන්ත ලාල් යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි වැටලීම සිදු කර තිබේ.

■ කල්පිටිය සමූහ

ලක් විජය බලාගාරයෙන් කල්පිටිය කතෝලික විදුහලකට පරිත්‍යාගයක්

පුරා වසර 39කට පසු,කල්පිටිය අධ්‍යාපන කොට්ඨාසයේ පනයඩිය රෝමානු කතෝලික විදුහල සඳහා ගොඩනැඟිල්ලක් පිරිනැමීම,නොරොච්චෝල ලක් විජය ගල් අඟුරු බලාගාරයේ පූර්ණ අනුග්‍රහයෙන් එම විදුහල් පරිශ්‍රයේ දී සිදු විය. රුපියල් ලක්ෂ 44ක වියදමින් ඉදිකළ කාර්යාලයක් සහිත මේ පන්ති කාමරය සඳහා ඩෙස් පුටු සහ සියලු උපකරණ සහිත සෙල්ලම් මිදුලක් ද පාසලට පිරිනැමිණි. ලංකා විදුලි බල මණ්ඩලයේ ජනතා අංශයේ අතිරේක සාමාන්‍යාධිකාරී එච්.එම්.ඒ. හේරත් සහ ලක් විජය බලාගරයේ බලස්ථාන කළමනාකාර ඉන්ද්‍රසිරි ගාල්ලගේ යන නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති මේ උත්සවය සඳහා කල්පිටිය කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂිකා දීප්ති ප්‍රනාන්දු මහත්මිය ද සහභාගී වූවා ය.

■ ඩබ්ලිව්.පී ධර්මසේන - මාතර සමූහ

දික්වැල්ලෙන් ගිනි අවි සොයාගනී

දික්වැල්ල පොලිස් වසමෙන් සතියක් ඇතුළතදී තුන්වෙනි වතාවටත් ගිනි අවි සොයා ගැනීමට විශේෂ කාර්ය බළකාය සමත් වී ඇත. හොරණ පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් විසින් පසුගියදා දික්වැල්ල පොලිස් වසමේ කොන්දෙණියවත්ත, ගල්ගම, වලස්ගල යන ප්‍රදේශවල සිදුකළ වැටලීම්වලදී ගිනි අවි සමඟ සැකකරුවන් තිදෙනකු අත්අඩංගුවට ගෙන ඇත.

දික්වැල්ල කොන්දෙණියවත්ත පදිංචි 39 හැවිරිදි පුද්ගලයකු ස්පාඤ්ඤයේ නිෂ්පාදිත රිවොල්වරයක් සහ මිලිමීටර් 3.8 වර්ගයේ ජීව උණ්ඩ 05ක් සමඟ මෙසේ අත්අඩංගුවට ගෙන ඇත.

ගලගම නාකුළුගමුව බටහිර පදිංචි 45 හැවිරිදි පුද්ගලයෙක් මිලිමීටර් 3.8 වර්ගයේ රිවොල්වරයක් සමඟ අත්අඩංගුවට ගෙන ඇති අතර වලස්ගල වලස්ගලවත්තේ පදිංචි 60 හැවිරිදි අයෙක් බෝර 12 මෙරට නිෂ්පාදිත ගල්කටස් අවියක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් දික්වැල්ල පොලීසියට භාරදී ඇති අතර මාතර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

■ ඩබ්ලිව්.පී ධර්මසේන - මාතර සමූහ

දන්දෙණියේ නිවෙසකින් ජංගම දුරකතන 2ක් කොල්ල කලා

දන්දෙණිය රත්මලේ ප්‍රදේශයේ පොලිස් විශේෂ කාර්ය බළකායේ සෙබළකුගේ නිවෙසට ඇතුළු වී ඇති සොරෙක් එම සෙබළ බිරියගේ අත තිබූ රුපියල් 30000ක් වටිනා ජංගම දුරකථන 2ක් උදුරාගෙන පලාගොස් ඇත.

සැමියා රාජගිරියේ සේවයට ගිය පසු බිරිය දරුවන් දෙදෙනා සමඟ නින්දට වැටී ඇත. රාත්‍රී කාලයේ නිවෙස ඇතුළින් ශබ්දයක් ඇසීම නිසා ඇය ජංගම දුරකථන දෙකේ ආලෝකය දල්වාගෙන කාමරයට යන විට කාමරයේ සිටි පුද්ගලයකු ඉදිරියට පැන ඇයගේ ජංගම දුරකථන දෙක උදුරාගෙන ජනේලයෙන් පැන දිවගොස් තිබේ. එක් ජංගම දුරකථනයක් රුපියල් 26000ක් බවත් අනිත් ජංගම දුරකථනයේ වටිනාකම රුපියල් 4000ක් බවත් පැමිණිල්ලේ සඳහන් වේ. සිද්ධිය පිළිබඳ තිහගොඩ පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

දිනමිණ
දස අත ම එක තැන

■ ලංකින්ද නානායක්කාර - ඉමදුව සමූහ

දකුණේ ගුරු සේවයට අලුත් පත්වීම් 46ක්

අධ්‍යාපනවේදී උපාධිය හදාරණ ලද 46 දෙනෙකු දකුණු පළාත් ගුරු පද්ධතියට බඳවා ගැනීම පසුගිය 15 වැනි දින දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලී ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් ගාල්ල දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

මේ අවස්ථාව සඳහා දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වයි. වික්‍රමසිරි, දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නිමල් දිසානායක, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් රනිල් වික්‍රමසේකර, නියෝජ්‍ය ලේකම් සුදත් සමරවික්‍රම යන මහත්ම මහත්මිහු ඇතුළු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරු, අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරියන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

එහිදී පත්වීම්ලාභී ගුරු හවතුන් ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාරවරයා මෙසේ පැවැසීය.

ඔබ අද පටන් භාර ගන්නේ දරුවන්ගේ අනාගත දරුවන්ගේ අනාගතය කියන්නෙ රටේ අනාගතය. එසේම අපටත් ඔබ සුවිශේෂයි. ඔබ මේ භාර ගන්නේ දකුණු පළාතේ අනාගතය නිසා. පිට පිට 06 වතාවක් සාමාන්‍ය පෙළ විභාගයෙන් දිවයිනේ ප්‍රථම ස්ථානය ලබාගත් දකුණු පළාතේ ගුරු පද්ධතියට එකතු වෙන ඔබට ඉතා භාරදූර වගකීමක් පැවරෙනවා. අධ්‍යාපනය ලබා දීමේ විෂය පිළිබඳ ඉතා ඉහළ ප්‍රවීණත්වයක් ලබා තිබෙන ඔබට මේ අභියෝගය ජය ගැනීම අපහසු කරුණක් නොවෙයි.

■ ප්‍රියදර්ශනී කහවල - ඉංගිරිය මධ්‍යම සමූහ

මෙට්ටේ ඇතුළේ මත්කුඩු

තම නිදන ඇඳේ මෙට්ටය අස්සේ මත්කුඩු සඟවා තැබූ සැකකරුවෙක් මත්කුඩු ග්‍රෑම් 4යි මිලිග්‍රෑම් 700ක් සමඟ ඉංගිරිය පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ ඉංගිරිය පොලිස් වසමට අයත් ගැටකොස්සාව ප්‍රදේශයේ පදිංචි 33 හැවිරිදි පුද්ගලයෙකි.

■ සරත් වෙලගෙදර - ඇලහැර සමූහ

රාජ්‍ය ඇමැති රොෂාන් ගල් විහාරය වැඳපුදා ගනී

ඉඩම් කළමනාකරණ කටයුතු රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන ඇමැති රොෂාන් රණසිංහ මහතා පොලොන්නරුව ඓතිහාසික ගල් විහාර පූජා භූමියට පැමිණි මහා සංඝ රත්නයේ ආශිර්වාදය ලබා ගත්තේය. ගල් විහාරයට පැමිණි රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතා පළමුව උතුම් සම්බුද්ධ පූජා පිංකමට සහභාගි විය. මේ අවස්ථාවට සියම් මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශවයේ ජ්‍යෙෂ්ඨ අනුනායක ධූරන්දර ඓතිහාසික පොලොන්නරුව සොළොස්මස්ථාන රජමහා විහාරාධිපති අස්ගිරිය ගෙඩිගේ රාජමහා විහාරාධිපති වේඩරුවේ උපාලි අනුනායක හිමිපාණන් වහන්සේ ප්‍රධාන මහා සංඝ රත්නය වැඩම කර සිටියහ. මේ අවස්ථාවට පොලොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති අමරකීර්ති අතුකෝරල මහතා, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාව ඇතුළු විශාල පිරිසක් එක්වී සිටියහ.

මින්නේරිය වැවේ මැරුණු මාළු කරවලවලට විකුණලා

■ ඩබ්ලිව්. ඒ. පියතිලක මැදිරිගිරිය සමූහ

කල්පනාකාරී වෙන්න හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය

මින්නේරිය වැවේ සිටින මසුන් රෝගී තත්ත්වයක් හේතුවෙන් සති කීපයක සිටි මියයමින් ගොඩට ගසාගෙන එන බවත් එම කිසිදු සත්ත්වයෙකු ආහාරයට නොගන්නා අතර එම මසුන් ධීවරයන් සහ විවිධ පුද්ගලයන් විසින් එක් කොට ජනතාවට මාළු ලෙස සහ කරවල නිෂ්පාදනය කර පරිභෝජනය සඳහා අලෙවි කරන බව ප්‍රදේශයේ ජනතාව කියති.

සති කීපයක සිටි වැවේ සිටින විශාල සහ කුඩා මසුන් මිය යෑමට පටන් ගෙන ඇති අතර ඇතැම් ධීවරයන් විසින් මේ මිය ගොස් ගොඩට ගසාගෙන එන මත්ස්‍යයන් අලෙවි කිරීම සිදු කරති. මේ මසුන් මිනිසුන් විසින් පරිභෝජනයට ගැනීම පිළිබඳ හිඟුරක්ගොඩ ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය අධ්‍යක්ෂක කාර්යාලයේ වෛද්‍ය ටී.එන්.කේ. විජේකෝන් මහත්මිය මෙසේ කීවාය. මින්නේරිය වැවේ මාළු මිය යන බව තොරතුරක් අපිට ලැබුණා.

ඒ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා ඒ ප්‍රදේශයට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් යොමු කරලා තියෙන්නේ. ඊට අමතරව හේතුවක් නොමැතිව මියයන මසුන් පරිභෝජනය සඳහා නොගන්නා ලෙස ජනතාව දැනුවත් කිරීමක් ද කිරීමට නියමිතව තියෙනවා.

මේ මසුන් මිය යන්නේ කුමන හේතුවක් මත ද යන්න රසායනික පරීක්ෂණයක් ද සිදු කිරීමට කටයුතු කරමින් සිටින්නේ. එතෙක් අපි ධීවරයන් දැනුවත් කරනවා දැල් දමා අල්ලන මසුන් ආහාරයට සහ අලෙවිය සිදු කරන ලෙසත් ස්වාභාවික ලෙස මිය යන මසුන් අලෙවිය සහ ආහාරයට නොගන්නා ලෙසත්. මින්නේරිය වැවේ ධීවරයන් පවසා සිටින්නේ වැවේ මසුන් මැරි පාවෙමින් සිටින බවත් එම මසුන් ආහාරයට නොගන්නා බවත්ය.

■ සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

තඹලගමුවේ තල් ප්‍රදර්ශනයෙන්...



තඹලගමුව පත්තිණිපුරම් ප්‍රදේශයේ දී තල් ආශ්‍රිත නිර්මාණ ප්‍රදර්ශණයක් හා මධ්‍යස්ථානයක් ත්‍රිකුණාමලය දිසාපති අසංක අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

දේශීය නිශ්පාදනවලට අතහිත දීමක් ලෙස තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඩු ආදායම් ලාභී ජනතාවගේ ජීවන චක්‍රය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා තල් කොළ උපයෝගී කරගෙන නිෂ්පාදනය කරනු ලබන විවිධ භාණ්ඩ වෙළෙඳපොළක් ලෙස මෙය ආරම්භ කොට ඇත.

■ ජගත් ජනප්‍රිය - ගඟ ඉහළ සමූහ

උඩුනුවර ගෝනාධිකාරීවත්ත ගමේ පවුල් 150ක් අපා දුකේ

නිදහස ලබා වසර 70ක් ගත වුවත් 21 වැනි සියවසට පා තැබූ අප රටේ මාර්ග, පානීය ජලය, නිවාස නැති කලියුග කාලේ ගම්මානයක් මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ආසනයේ ඇත.ගෝනාධිකාරි වත්ත නම් වෙන මේ ගම්මානයේ පවුල් 150ක් පමණ ජීවත් වෙති. මහවැලි ගඟ ඇළවල ගම්මානය අසලින් ගලා ගියත් මේ ජනතාවට තම අවශ්‍යතා සපුරා ගැනීමට ජලය නැත. අනිත් ආසනවල අතුරු මාර්ග කාපට් කරත් මේ ගම්මානයට ඒවා නැත. හිටපු ජනපතිවරු, නිවාස ඇමැතිවරු, නිවාස ගම්මාන දහස් ගණනක් ලංකාවෙ සංවර්ධනය කරත් මේ ජනතාවට එහි ප්‍රතිලාභ නැත.

රාම ක්‍රිෂ්ණා මෙසේ කීය. අප උපන්දා සිට ජීවත් වෙන්නේ මේ ගම්මානයේ. අපට ඉන්න හරියට නිවෙසක්, ඉඩමක් නෑ. එක නිවෙසක පවුල් දෙක තුනක් ජීවත් වෙනවා. දැඩි අපහසුතාවකින් අප සිටින්නේ.දරුවන්ට ඇති එකම පාසලේ ගුරුවරු නෑ. උඩුනුවර ප්‍රාදේශීය සභාවෙන් අපට ලැබෙන්නේ කුඩම්මාගේ සැලකිලි. ප්‍රාදේශීය සභා, පළාත් සභා මහා මැතිවරණයට ගමට එන විවිධ පාට පාට සංවිධායකයන් අපව රවටා යනවා.

එන්. ජී. සෝමාවති - අප අහසින් වැටුණා සේ ජීවත් වෙනවා. වත්තේ වැඩ කර ගන්නා වැටුප නිවාස හදන්න මදි. දරුවන්ගේ අධ්‍යාපනය අතරමඟ නවතිනවා. ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු, හිමිවරු හිටියත් අපට වැඩක් නෑ. පානීය ජලය ඉල්ලා ලිපි 150ක් පමණ සභාවට භාර දී තිබෙනවා.

කේ.ජී කන්නම්මා - මම පරම්පරා තුනක දරුවන් හදා තිබෙනවා. නමුත් තවම ජීවත් වෙන්නේ මේ ලයිමෙ තමයි. අපට කිසිම සහනයක් නෑ. කැලේට ගොස් ඇති ඉඩම් බෙදා දී නිවාස, ජලය මාර්ග පහසුකම් ලබා දෙන ලෙස ඉල්ලනවා.

■ රූපිකා කේ.බණ්ඩාර - කුරුවිට සමූහ

වැල්පාලමේ ගමන අවදානම් කුරුවිට ගම් දෙකක වැසියන්ට කුඩම්මාගේ සැලකිලි

කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සූදාගල හා ඇදිරියන්වල වසම් දෙකේ ජනතාව තවමත් කුරුගඟ තරණය කරන්නේ වැල්පාලමක ආධාරයෙනි. මේ වසම් දෙක යා කරමින් පාලමක් ඉදිකර දෙන ලෙස දිගුකලක සිට කරන ඉල්ලීම් බලධාරීන්ගේ අවධානයෙන් ගිලිහී ගොස් අති බැවින් තවමත් මේ මාරක ගමනේ යෙදෙන්නට සිදුවී ඇති බව ජනතාව අවධාරණය කරති. ගඟේ වතුර අඩු කාලයට ගඟට බැස එගොඩ වීමට හැකි වුවද වර්ෂා දිනවලට වැල්පාලමද යටකරගෙන ජලකඳ ගලායයි. මොරකොටේ,මොරකොටේවත්ත, ගල්ගොඩ, ඇඳිරියන්වල, දෙවිපහල, හේන්යාය, බටතොට ඇතුළු ගම්මාන රැසක වැසියෝ මේ අවදානම් ගමනේ යෙදෙති.බටතොට පුරාණ ගල්ලෙන් විහාරයට(දිවාගුහාව) ඉතාම කෙටි මාර්ගයද මෙය වෙයි.මේ පිළිබඳ අවට වැසියෝ මෙසේ කීහ. මේ ස්ථානයට පාලමක් ඉල්ලන්නේ දිගුකලක සිටය. මේ ආසන්නයේ කුඩා ජලවිදුලි බලාගාරයේ ඉදිකිරීම් නිසා පාලමක් හදන්න බඩුගෙනයාමට අපහසු බව කියනවා. එය සාධාරණ නෑ. එයට ක්‍රමයක් යොදාගන්න ඕනෑ. නැතිනම් අනෙක් පැත්තෙන් බඩු ගෙන එමට ක්‍රමවේදයක් සකස් කරගන්න ඕනෑ.අපි කියන්නේ දැනට මෙම ස්ථානයට මෙහා තැනින් කොන්ක්‍රීට් පාලමක් හෝ හදාදෙන්න කියලයි.

ගඟ දක්වා එගොඩ පැත්තෙන් පාරක් කැපීමට ප්‍රතිපාදන ලැබුණොත් ඒ හරහා පාලමට බඩු ගේන්න පුළුවන්.මේක විශාල ගම්මානයක්. කෘෂිකාර්මික මාර්ගයක්ද වෙනවා. සුළු ගොවිතැන් කටයුතු කරන අය පොහොර හා එම නිෂ්පාදනයන් ගෙන එන්නේද මෙතැනින් පාලමක් ඉදිකිරීමට අවධානය යොමුවිය යුතුයි.

දේශවංශය

දේශයේ පාලන මාවත

1953 හර්තාලයේ අවස්ථා

හාල් සේරුවට ආණ්ඩුව පෙරළූ 53 හර්තාලය

ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ නොමැකෙන නමක් සඳහන් වූ දිනයක් ලෙස 1953 අගෝස්තු 12වැනි දින ලියැවී තිබේ. මෙරට බලයේ පැවති ආණ්ඩුවකට ජනතාව විසින් සිදු කරන ලද සුවිශාලතම විරෝධතාව එදින සිදු වූ බැවිනි. සමස්ත රටක් ම එක් දිනක් තුළ අකර්මන්‍ය කිරීමට රට පුරා ජනතාව පෙළ ගැසුණහ. තමනට සිදු වන අසාධාරණය වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් සටන් කිරීමට පාරට බහින්නට කම්කරු ජනතාව තීරණය කළහ. ආණ්ඩුව හෝ රටේ ආරක්ෂක අංශ කිසිවක් නොසිතූ පරිදි ඉතිහාසයේ දැවැන්තම ජනතා නැගිටීම මෙරට සිදුවූයේ එසේ ය. එය 'හර්තාලය' ලෙස ද කොල්වින් ආර්.ද සිල්වා මහතාට අනුව 'නොනගතය' ලෙස ද තවත් කම්කරු නායකයන්ට අනුව 'සුවිශාලත ම ජනතා නැගිටීම' ලෙස ත් හැඳින්විණ. 'හර්තාලය' යන නම ඉන්දියාවේ මහත්මා ගාන්ධි තුමා විසින් භාවිතා කරන ලද්දක් වුව ද එය ලංකාවේ හර්තාලය සේ දැඩි සටනක් නොවී ය. 'හර්තාලය' යන්නට අලුත් ම අර්ථකථනයක් ඒ නිසා ලැබුණි.

1950 වර්ෂය වනවිටත් ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් කිසියම් ස්ථාවරත්වයක් පවත්වා ගත් රටක් විය. කොතරම් දේශපාලන ඇඟිලි ගැසීම් පැවතිය ද බ්‍රිතාන්‍ය යකඩ සපත්තුවට පැගී සිටිය ද ශ්‍රී ලංකාවේ රබර් සඳහා තිබුණු ඉල්ලුම නිසා රටට සල්ලි ගලා ආවේ ය. බ්‍රිතාන්‍යයට පවා ණය ලබා දුන් භාණ්ඩාගාරයක් එවක ලංකාවට පැවතිණි. නමුත් ලෝක යුද්ධය සහ කොරියානු යුද්ධයේ බලපෑම නිසා රබර් වෙළඳපොළ පිළිබඳ ගැටලුවක් ඇති විය. සහල් නිෂ්පාදනය ද එවක පහත වැටී පැවතිණි. රට ආර්ථිකයෙන් කඩාගෙන වැටෙන විට එවක ඩී.එස්. සේනානායක ආණ්ඩුවට කළ හැකි කිසිවක් නොවී ය. ඩී.එස්. සේනානායකගේ මරණයෙන් පසු අග්‍රාමාත්‍ය පදවියට පත්වූයේ ඔහුගේ පුත් ඩඩ්ලි සේනානායක මහතා ය. මුදල් ඇමතිවරයාව සිටියේ 'යැංකි ඩික්' අන්වර්ත නාමයෙන් හඳුන්වන ලද ජේ.ආර්. ජයවර්ධන මහතා ය. 1953 වසර එළඹෙන විට රටේ මූල්‍ය තත්ත්වය තවත් අයහපත් වන්නට පටන් ගෙන තිබිණි. කොරියානු යුද්ධයේ මුල් කාලයේ ඇතිවූ වාසිදායක තත්ත්වය හේතුවෙන් 1952 ජනවාරි වන විට ශ්‍රී ලංකාව සතු විදේශ වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 1209ක් දක්වා ඉහළ ගිය නමුත් 1953 ජූලි අයවැය ඉදිරිපත් කරන විට එය රුපියල් මිලියන 676 දක්වා පහත වැටී තිබුණි. මුදල් ඇමතිවරයාට මෙන් ම රජයට ද සහාය දක්වන්නට වෙනත් රටවල් ද ඉදිරිපත් නොවිණි. ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ඉල්ලා තිබූ ණය මුදල ද අහිමි වීම නිසා රජයට සිදු වූයේ ලෝක බැංකුවේ උපදෙස් පතන්නට ය. ලෝක බැංකුවෙන් උපදෙස් ලැබුණේ රටේ ජනතාව වෙනුවෙන් සිදු කරගෙන යන සුභසාධන කටයුතු අඩු කරන ලෙස ත් සහනාධාර කප්පාදු කරන ලෙස ත් ය. මැතිවරණයට පෙර ආණ්ඩුව පැවසුයේ 'ඉර හඳ තරු පවතින තුරු හාල් සේරුව ශත 25ට' ලබා දෙන බව ය. නමුත් මැතිවරණය අවසන් වූ විගස හාල් ශත 70 දක්වා වැඩි විය. සීනි මිල ශත 15කින් වැඩි විය. පාසල් ළමයි වෙනුවෙන් ලබා දුන් දිවා ආහාරය අහෝසි විය. විදුලි පණිඩුබුඩ, තැපැල් හා දුම්රිය ගාස්තු ද වැඩි විය. ජනතාවගේ ද ඉවසීමේ සීමාව පනින්නට එය ම හේතු භූත විය.

මේ වනවිට කම්කරු පක්ෂ, සමිති සමාගම් ආණ්ඩුවට එරෙහි සටනක ඇරඹුමක් පිළිබඳ සැලසුම් සකසනු පෙනෙන්නට විය. සමසමාජ පක්ෂ මැදිහත්වීම මත අත්සන් 70 000ක විරෝධතා පත්‍රයක් ඉදිරිපත් කරන ලදී. ඒ ආණ්ඩුවට ඉල්ලා අස්වීමට ය. අනතුරුව ගාල්ල රන්දොඹේ ජනතා උද්ඝෝෂණ ඇති විය. ඉන් අනතුරුව එය මොරටුව, වාද්දුව, යාපනය, බලපිටිය, මාඳම්පේ, අකුරල, තොටගමුව, කරන්දෙණිය, ඌරගහ අහුන්ගල්ල දක්වා වර්ධනය විය. අහුන්ගල්ලේ දී ඇති වූ ගැටුමකදී පොල්ලෙලි තළන කාන්තාවන් සිය කිතුල් පොල්ල පොලිසියේ බැටන් පොල්ලට එරෙහි ව එසවූහ. එක් කාන්තාවක පොලිස් නිලධාරියකුට 'කනේ' පහරක් ගැසූ බව ප්‍රසිද්ධ ය. ඒ අතර විපක්ෂ නියෝජිතයන් විසින් ද අති විශාල ජන සහභාගිත්වයකින් ගාලු මුවදොර පිටියට පැමිණීමට කටයුතු සැලසුම් කොට තිබිණි. 'ආණ්ඩුව ගෙදර යැවීමේ' මෙහෙයුමට පුළුල් ලෙස ජනතා සහභාගිත්වය අන් කවරදාටත් වඩා ලැබිණි.

ජූලි 23වැනි දින ගාලු මුවදොර පිටියේ මහා ජනතා උද්ඝෝෂණයට එවක විපක්ෂ නායක එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා ද සහභාගී විය. ඔහු විපක්ෂයේ කාර්යභාර්යය නිසි ඉලක්කගත වැඩපිළිවෙළක් අනුව ඉටු කරමින් යන බැව් පෙනෙන්නට තිබිණි. මේ පිළිබඳ එවක ඩේලි නිවුස් පුවත්පතේ ද සඳහන් වී තිබිණි.

මුළු රට පුරා ම බහුතර ජනතාවක් එක තීරණයකට ගෙන එන්නට සමත් සටන ඇරඹෙන්නේ 1953 අගෝස්තු 11වන දින මධ්‍යම රාත්‍රී 12.00ට ය. ඊට ද පෙර සරසවි සිසුහු පේරාදෙණියේ දී සහ මහනුවර දී උද්ඝෝෂණ මෙන් ම පොලිසිය සමඟ ගැටුම් ද ඇතිකොටගෙන තිබිණි. කලක් යන තුරු ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජයතිලක නේවාසිකාගාරයේ 'හර්තාල් ඇවනියු' වෙන ම ගෞරවනීය තැනක් ලෙස සැලකුයේ ද එබැවිනි. කෙසේවෙතත් හර්තලයේ සිදු කරන්නට යන දේ පිළිබඳ ජනතාවට කළ ඉල්ලීමේ ඇත්තේ මෙසේ ය.

"තම කඩ සාප්පු සහ වෙනත් ආයතන වසා දැමීමෙන් ද වැඩපොළවල්වලට, පාසල්වලට නොයෑමෙන් ද, රැස්වීම් පැවැත්වීමෙන් සහ කළු කොඩි එසවීමෙන් ද මේ විරුද්ධත්වය පළ කිරීමට එකතු වෙන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිමු. ආපන ශාලා, ඩිස්පෙන්සරි සහ වෛද්‍ය ආයතනවල වැඩ කරන්නා වූ ද ඒ ආයතනවල කෑම සහ බෙහෙත් සපයන්නා වූ ද සියලු ම අයගෙන් එදිනට වැඩ නොනවත්වන ලෙස ත් කළු සලකුණු පැලඳීමෙන් තම විරෝධය පල කරන ලෙසත් ඉල්ලා සිටිමු."

මෙම ලියැවිල්ලට වමේ නියෝජිතයන් සහ වෘත්තීය සමිති නායකයන් රැසක් අත්සන් කර තිබිණි.

11වන දින රාත්‍රී කොටුවෙන් ඇරඹී සටන 12වැනි දින උදේ වන විට කම්කරුවන් 75 000කින් සමන්විත දැවැන්ත ව්‍යාපාරයක් බවට පත් වී තිබිණි. ඒ වනවිටත් තිගැස්සී තිබුණු ආණ්ඩුව හදිසි කැබිනට් රැස්වීමක් පැවැත්වීමට තීරණය කළේ ය. ජනතාවගේ වීදි බැසීම නිසා ආරක්ෂාව පිළිබඳ ගැටලු ද සලකා එම රැස්වීම පැවැතුණේ 'නිවු සවුත්ලන්ඩ්' නෞකාවේ ය. පසුකාලීන ව නව පාර්ලිමේන්තුව දියවන්නාවේ ඉදිකිරීමට එය සෘජු ව බලපෑ බැව් ජේ.ආර්.ජයවර්ධන මහතා වරක් පවසා තිබේ.

මෙවන් දැවැන්ත ජනතා නැගිටීමක් පිළිබඳ අත්දැකීමක් නොතිබුණු ආරක්ෂක අංශවලට පවා කරකියා ගත හැකි දෙයක් නොවී ය. ඔවුන්ට ඒ පළපුරුද්ද ද මීට පෙර ලැබී තිබුණේ ම නැත. එදින පෙ.ව. 11.43ට පමණ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්නට ආණ්ඩුව කටයුතු කළේ ය. මේ වනවිට ත් මිනිස් ඝාතන රැසක් සිදු වී තිබිණි. සමස්ත ඝාතන ප්‍රමාණය 21ක් පමණ ලෙස ගණන් බලා තිබුණ ද එය තහවුරු කොට නොතිබිණ. 1500ක පමණ කම්කරු ජනතාවක් අත්අඩංගුවට පත් විය. මේ පිළිබඳ දිගින් දිගට ම දෝෂාරෝපණය ඩඩ්ලි සේනානායක මහතාට එල්ල විය. සැප්තැම්බර් 01වැනි දින එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා විසින් ආණ්ඩුවට විරුද්ධ ව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළේ ය. සේනානායක මහතා සිය මහත්මා ගතිය පෙන්වමින් ගෞරවාන්විත ව සිය ධුරයෙන් ඉල්ලා අස් වූයේ ය. එවක මුදල් ඇමති ව සිටි ජේ.ආර්. ජයවර්ධන මහතාට අනතුරුව හිමි වූයේ කෘෂිකර්ම අමාත්‍ය ධුරය යි. අග්‍රාමාත්‍යවරයා බවට සර්. ජෝන්. කොතලාවල මහතා පත් විය. හාල් සේරුවක මිල ශත 55 දක්වා පහළ දමනු ලැබිණි.

අදටත් 'ලංකාවේ හර්තාලය' යනු ආණ්ඩුවක දණහිස් වෙවුලවන වචනයකි.

ගයාන් පීරිස්

මහජන මුදලින් සුර සැප විඳි තමිල්නාඩුවේ 'අම්මා'

ඉන්දීය දේශපාලන ඉතිහාසයේ වඩාත්ම දූෂිත දේශපාලන චරිතය ලෙස අපකීර්තියට පත්ව සිටිය ද, ජයලලිතා තරම් ජන හද සොරාගත් දේශපාලන නායිකාවක් එරට සිටියේම නැත. ඉන්දියාවේ රජයක් පිහිටුවීමෙහිලා කවදත් තීරණාත්මක සාධකයක් වන ඇගේ තමිල්නාඩුව ඇගේ බලකොටුවේ දී ඇය සොරා ගත්තේ කෝටි හතකට අධික ජනතාවගේ හදවත් පමණක් නොවේය. දශක ගණනාවක් තමිල්නාඩුවේ ප්‍රධාන ඇමැති පදවියේ වැජඹෙමින් කෝටි ගණනින් මහජන මුදල් ද ඇය හිතේ හැටියට සොරා කෑවාය. තමිල්නාඩුව පුරා 'අම්මා' නමින් ප්‍රචලිතව සිටි මේ යකඩ ගැහැනිය මීට වසර හතරකට පෙර 2016 දෙසැම්බරයේ හදිසි හෘදයාබාධයකින් මෙලොවින් සමුගන්නා විට 6වැනි වතාවටත් මහ ඇමති තනතුරෙහි කටයුතු කරමින් සිටියාය.

මේ විශාලතම දකුණු ඉන්දීය ප්‍රාන්තයේ ආධිපත්‍යය පතුරුවාලමින් ද, ප්‍රාන්ත මැතිවරණ ඉතිහාසය උඩුයටිකුරු කරවමින් ද, ස්වකීය බලපරාක්‍රමයේ දිග පළල ඉන්දීය මධ්‍යම රජයට පෙන්වා දුන් ජයලලිතා මිය යනවිට 68 හැවිරිදි වියෙහි පසු වූවාය.

සිය දේශපාලන ජීවිතය පුරා ඇය විසින් නාස්ති කරනු ලැබූ මුදල් කන්දරාව ගිණිය නොහැකිය. මහජන මුදල් සොරා කෑමටම උපන් මේ ගැහැනියට අනිසි ලෙස ධනය රැස් කිරීමේ චෝදනාව මත විරුද්ධ පක්ෂය වූ කරුණානිදිගේ ඩීඑම්කේ පක්ෂය ඇයට එරෙහිව නඩු පවරා තිබුණේ ඇය පළමුවරට 1991දී තමිල්නාඩුවේ මහ ඇමති ධුරයට පත් වූ කාලයේදීමය. එහෙත් එම නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට තවත් වසර 18ක්ම ගතවී තිබිණි. ඒ අතරතුර කාලයේ ඇය තවදුරටත් දේශපාලන කටයුතුවල නිරත වූ අතර, අන්නා ද්‍රවිඩ මුන්නේත්‍රම් කලහම් පක්ෂය නියෝජනය කරමින් පස්වැනි වරටත් තමිල්නාඩුවේ මහ ඇමති ධුරයෙහි කටයුතු කරමින් සිටියාය. 2015දී එම නඩු තීන්දුව ප්‍රකාශයට පත් වූයේ ඇයට සිවු වසරක සිර දඬුවමක් අත් කර දෙමිනි. බැංගලෝරයේ විශේෂ අධිකරණයකදී නඩු තීන්දුව ප්‍රකාශයට පත් වූ අතර, එහි උණුසුම තමිල්නාඩුව පුරා ව්‍යාප්තව ගියේ ඉන් සිත් තැවුලට පත් ඇගේ හිතවාදීන් 244ක දෙනකු සිය දිවි හානි කරගැනීමේ සිදුවීමත් සමගිනි. එය වූකලී මේ දූෂිත යැයි කී ගැහැනියගේ අසීමිත ජනප්‍රියත්වයට කදිම නිදසුනකි.

තමිල්නාඩුවේ මහ ඇමැති පදවියට පත් වන විට ඉන්දීය රුපියල් කෝටි 3ක පමණ ධනයකට හිමිකම් කී ජයලලිතා තනතුරට පත් වූ පළමු වසර 5 ඇතුළත සිය ධන සම්භාරය රුපියල් කෝටි 66 දක්වා ඉහළ දමාගැනීම අනිසි ලෙස මුදල් උපයාගැනීමක් බවට චෝදනා කරමින් ගොනු කළ නඩුව අපතේ ගියේ එලෙසටය.

ඇය සමඟ මේ චෝදනාවට හසුවී සිටි ඇගේ සමීපතම මිතුරිය වන ශෂිකලා නඩරාජන් සමඟ ඇය හදාගත් පුත්‍රයා වන සුදාකරන් හා ඔහුගේ බිරිය ඉලවරසි ද ඒ අනුව නිදහස ලැබූහ.

සැබැවින්ම ජයලලිතා යනු තමිල්නාඩුවේ ධනවත්ම කාන්තාවය. තමිල්නාඩුවේ ස්ථාන දෙකක ඇය සතුව අක්කර දහසක බැගින් විශාල වතු දෙකක් තිබිණි. ඊට අමතරව රත්රන් කිලෝ 28කට, රිදී කිලෝ 90කට, සාරි 12,000කට, පාවහන් 1000කට හා අත් ඔරලෝසු සියයකට අධික සංඛ්‍යාවකට ඇය හිමිකම් කීවාය.

ඉන්දීය දේශපාලනයේ ආන්දෝලනාත්මක චරිතයක් බවට පත්වූ ජයලලිතා උපන්නේ 1948 පෙබරවාරි 24 වැනිදා මයිසූර් ප්‍රාන්තයේ (වත්මන් කර්නාටක) දීය. කුඩාවියේදීම ඇගේ පියා මියගිය අතර පසුව ඇගේ මව වන සන්ධ්‍යා සිය දියණිය කැටුව චෙන්නායි නුවර පදිංචියට ගියාය. එහි දී දම්ළ චිත්‍රපට නිළියක ලෙස ජීවිතය ඇරඹූ ජයලලිතාගේ මව සිය දියණියට වසර 15ක් පිරෙද්දී ඇයව ද නිළියක බවට පත් කළාය. මුල් අවධියේ සිටම ජනප්‍රිය චිත්‍රපට රැසකට රංගනයෙන් දායක වූ ජයලලිතා දම්ළ සිනමාවේ නිම්වළලු පුළුල් කරගත්තේ එකළ දම්ළ සිනමාවේ සුපිරි නළුවකු ලෙස අතිශය කීර්තියට පත්ව සිටි එම්.ජී.රාමචන්ද්‍රන් (එම්.ජී.ආර්) සමග රඟපෑමට පටන් ගැනීමත් සමගය. 60 දශකයේ සහ 70 දශකයේ දම්ළ සිනමාවේ චිත්‍රපට සියයකට අධික සංඛ්‍යාවක රඟපෑමෙන් ජනකාන්ත නිළියක බවට පත් වූ ජයලලිතා පසුව එම්.ජී.ආර්. සමග අනියම් පෙම් සම්බන්ධතාවක් ද ගොඩනගා ගත්තාය. එය ඇගේ ජීවිතයේ ඉරණම තීන්දු කළ එකකි.

ඒ වනවිට තමිල්නාඩුව පුරා ජනප්‍රියත්වයට පත්ව සිටි එම්.ජී.ආර්. දේශපාලනයට අවතීර්ණවීමත් සමග ඔහු සමග ඉතා සමීපව කටයුතු කළ ජයලලිතා පසුව ඔහු 1977 දී තමිල්නාඩුවේ මහ ඇමැති ධුරයට පත්වීමත් සමග සමස්ත ඉන්දීය ද්‍රවිඩ මුන්නේත්‍ර කලහම් පක්ෂයේ නිත්‍ය සාමාජිකාවක බවට පත්වූවාය. ඒ වනවිට එම්.ජී.ආර්. සහ ජයලලිතා අතර පෙම් සම්බන්ධතාව තමිල්නාඩු දේශපාලන ලෝකයේ ප්‍රසිද්ධ රහසක් බවට පත්වී තිබූ අතර ඔහුගේ බිරිය ජානකී රාමචන්ද්‍රන් හා ජයලලිතා අතර සීතල යුද්ධයක් ද හටගෙන තිබිණි. 1987 වසරේ දී එම්. ජී.ආර්.ගේ අභාවයෙන් පසුව පක්ෂය දෙකඩ වූ අතර එක් පාර්ශවයක් ඔහුගේ බිරිය ජානකී රාමචන්ද්‍රන්ට සහාය දුන් අතර අනික් පාර්ශ්වය ජයලලිතාට සහාය පළ කළේය. එහෙත් 1988 දී තමිල්නාඩු මහ ඇමැති ධුරයට පත් වූයේ එම්. ජී.ආර්.ගේ බිරිය ජානකීය. කෙසේවෙතත් එවකට ඉන්දීය අගමැති ධුරය දැරූ රජීව් ගාන්ධි එරට ව්‍යවස්ථාවේ එක්තරා වගන්තියක් උපක්‍රමශීලීව භාවිතා කරමින් තමිල්නාඩු ප්‍රාන්තය මධ්‍යම රජය යටතට ගැනීමත් සමග ජානකීගේ මහ ඇමැති පදවිය අහෝසි විය.

1991 වසරේ දී රජීව් ගාන්ධිගේ ඝාතනයෙන් පසුව ඒ වනවිට ඉන්දීය කොංග්‍රස් පක්ෂය හා සන්ධාන ගතවී සිටි ජයලලිතාට නැවත තමිල්නාඩුවේ බලය තහවුරු කරගැනීමට හැකි විය. ඒ අනුව ඇය 1991 වසරේ දී තමිල්නාඩුවේ ළාබාලතම මහ ඇමැතිනිය ලෙස එම තනතුරට පළමුවරට පත් වූවාය. අවිවාහක කාන්තාවක් වූ ජයලලිතා දේශපාලන කටයුතු සඳහා කැප කිරීමට ඕනෑතරම් කාලය තිබිණි. එහෙත් ඇය තමිල්නාඩුවේ මහ ඇමැති පදවියට පත් පළමු අවස්ථාවේදීම බලය අනිසි ලෙස භාවිතා කිරීමට පටන්ගත් අතර මූල්‍ය වංචා රැසකට මුල් වූවාය. ඒ අතර වඩාත් කතාබහට ලක් වූයේ ඇය හදාවඩාගත් සුදාකරන් නැමැති තරුණයාගේ විවාහ උත්සවය සඳහා රාජ්‍ය දේපළ හා මුදල් අයථා ලෙස පරිහරණය කිරීමය.

තමිල්නාඩුවේ මහ ඇමැති පදවිය දරමින් ඇය කෙතරම් රාජ්‍ය දේපළ හා මුදල් අයථා ලෙස පරිහරණය කළ ද එහි ජනතාව අතර ඇයට ඇති ජනප්‍රියත්වයේ නම් කිසිදු අඩුවක් නොවීය.

එය තව දුරටත් පැහැදිලි වූයේ 2016 දී ඇය 6 වැනි වරටත් තමිල්නාඩුවේ මහ ඇමැති ධුරයට පත්වීමෙනි. එහෙත් එවර ඇගේ ධුරකාලයට වැඩි ආයුෂ නොතිබිණි. එම වසරේදීම සැප්තැම්බරයේ හදිසියේම රෝගාතුර වූ ජයලලිතා දින 75ක කාලයක් පුරා රෝහල්ගතව සිටි අතර, දෙසැම්බරයේ 5 වැනිදා මෙලොවින් සමුගත්තාය.

අවිවාහක කාන්තාවක වූ ජයලලිතාගේ සමීපතම යෙහෙළිය වූයේ සසිකලාය. 62 හැවිරිදි සසිකලා දශක තුනක් පුරා ජයලලිතාගේ ප්‍රතිරූපයට මුවා වී තමිල්නාඩුවේ නිල නොවන මහ ඇමැතිනිය ලෙස කටයුතු කළ බව ප්‍රසිද්ධ රහසකි. ජයලලිතා සහ සසිකලා අතර පැවැතියේ මිත්‍රත්වයෙන් ඔබ්බට ගිය අසාමාන්‍ය ඇසුරකි. දෙදෙනා අතර අසම්මත පෙම් සබඳතාවක් පැවැති බව ද ප්‍රකට කරුණකි. මහජන මුදල් කොල්ලකෑමේ චෝදනා මත ඇය ද මේ වන විට පසු වන්නේ සිරගතවය.

ෆවුස් මොහොමඩ්

චතෙර මතකි

දේශවංශය
දේශයේ පාලන මාවත

උපතිස්ස ගමනායක මහතා

ලයනල් බෝපගේ මහතා

71 කැරැල්ලෙන් පසු
ප්‍රජාතන්ත්‍රවාදයට පැමිණි ජවිපෙ

1971 කැරැල්ල සමග තහනම් දේශපාලන සහ අවි ආයුධ කෙරෙහි විශ්වාස කළ ජනතා විමුක්ති පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය තෝරා ගැනීමට වැඩි කලක් ගත වූයේ නැත. 1977 මහ මැතිවරණය මෙරට දේශපාලනයේ අමුතු වෙනසක් සිදු කළ වසරක් විය. එතෙක් රට පුරා පැතිරුණු බලයක් සහිතව සිටි සම සමාජ කොමියුනිස්ට් සහ මහජන එක්සත් පෙරමුණ වැනි වාම වාදී දේශපාලන කණ්ඩායම් දැඩි පසුබෑමකට ලක් වූයේ මෙම මැතිවරණයෙනි. එතෙක් පැරණි වම ලෙස හැඳින්වුණු මෙම කණ්ඩායම් වෙනුවට සම්ප්‍රදාය බැහැර කළ නව වාමාංශික ව්‍යාපාරයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ කෙමෙන් ස්ථාපිත වූයේ 1977 මහ මැතිවරණයෙනි.

1977 මහ මැතිවරණයත් සමග මැතිවරණ ක්ෂේත්‍රයට පා තැබුවද ඔවුනට රට තුළ නිසි මැතිවරණ ව්‍යුහයක් නොතිබිණි. හෞතික සම්පත් හා පහසුකම් ද අවම විය. ඒ අනුව රෝහණ විජේවීරගේ උපදෙස් මත උපතිස්ස ගමනායකගේ ප්‍රධානත්වයෙන් රැස් වූ ජවිපෙ තාවකාලික මධ්‍යම කාරක සභාව තීරණය කළේ තෝරාගත් ආසන හතරකට තරග කිරීමය. ඒ අනුව තංගල්ල ආසනයට විජිත රණවීර, බටහිර අනුරාධපුරයට ජේරාදෙණිය සරසවියේ මහාචාර්ය සංගමයේ සභාපති කේ. එච්. චන්ද්‍රපාල, රොබට් ආර් ජයසේකර හක්මන ආසනයට හා හොරොව්පොතානට කේ. වයි. එම්. රණතුංග යන අය ස්වාධීන අපේක්ෂකයන් ලෙස නාම යෝජනා බාර දුන් අතර ශන්ද ලකුණ වූයේ සීනුවය. පක්ෂය ලියාපදිංචි කර නොතිබීම නිසා ජවිපෙ නමින් තරග කිරීමට අවස්ථාව අහිමි වී ගියේය.

ඒ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට දැවැන්ත ජයග්‍රහණයක් හිමි වූ අතර තරග කළ ආසන 168 න් 140 ක්ම ජයගත්තේ එක්සත් ජාතික පක්ෂය විසිනි. එහිදී ජවිපෙටද සතුටු විය හැකි ප්‍රතිඵලයක් ලැබුණි. තරග කළ ආසන හතරෙන් ශන්ද 3371 ක් ලබා ගැනීමට ඔවුනට හැකියාව ලැබිණි. තංගල්ල හා බටහිර අනුරාධපුර ආසනවලදී වාමාංශික එක්සත් පෙරමුණ පසෙකට කරමින් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කළ ස්වාධීන අපේක්ෂකයන්ට ලබා ගැනීමට හැකියාව ලැබිණි.

සිරගත කර ඇති රෝහණ විජේවීර ඇතුළු සෙසු ජවිපෙ ක්‍රියාකාරීන් නිදහස් කරන්නැයි නව ආණ්ඩුවට විවිධ පාර්ශ්වවලින් දිගින් දිගටම බලපෑම් එල්ල වන්නට විය. වාමාංශික සංවිධාන, බලපෑමක් සහිත දේශපාලනඥයෝ, සමාජ ක්‍රියාකාරිනු, බුද්ධිමත්හු රැසක් ඒ අතර වූහ. මේ අතර උපතිස්ස ගමනායක ප්‍රධාන තාවකාලික මධ්‍යම කාරක සභාව දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙස ඉල්ලා උද්ඝෝෂණ, රැස්වීම් මාලාවක් දිවයින පුරා පැවැත්වීමට තීරණය කළේය. මුල්ම රැලිය පැවැත්වීමට තෝරා ගත්තේ කොළඹ හයිඩ්පාක් පිටියේදීය. මෙම රැලියට උපතිස්ස ගමනායක ඇතුළු ජවිපෙ නියෝජිතයෝ පිරිසක් එක් වූහ.

එම උද්ඝෝෂණයේ ප්‍රතිඵලය වූයේ සමගි පෙරමුණු ආණ්ඩුව විසින් අත්අඩංගුවට ගෙන සිර දඬුවම් ලැබූ ජවිපෙ නායකයා ඇතුළු පිරිස් නිදහස් කරනු ලැබුවේ 1977 නොවැම්බර් විසි දෙවනදාය.

එහිදී නායකයා සහ ඉදිරිපෙළ සාමාජිකයන් නිදහස් වීමත් සමග පක්ෂ දේශපාලනය ව්‍යාප්ත කිරීම සඳහා ජවිපෙ පක්ෂ අරමුදලක් පිහිටුවනු ලැබූ අතර 1978 අවුරුද්දේ මුල් කාර්තුව වන විට අරමුදල රුපියල් 100,000කින් තරව තිබිණි. ජවිපෙ නිල පුවත්පත වූ නියමුවා හා සමාජවාදී කම්කරු සංගමයේ නිල පුවත්පත වූ රතු ලංකා පළ කිරීම ඒ වන විට ආරම්භ කර තිබූ අතර ප්‍රචාරක ලේකම්වරයා වූ උපතිස්ස ගමනායක සහෝදරයා ඉතාමත් නිර්මාණශීලී ලෙස මෙම කටයුතු ඉදිරියට පවත්වා ගෙන ගියේය.

ජවිපෙ ප්‍රජාතන්ත්‍රවාදී මාවත නැවත අවතීරණය වීමෙන් පසු ඉදිරිපත් වූ පළමු පළාත් පාලන මැතිවරණය වූයේ 1978 කොළඹ මහ නගර සභා මැතිවරණයයි. එහිදී එම පෙරමුණ උපතිස්ස ගමනායකගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් ඉදිරිපත් කරමින් තරග වැදිණි. එහිදී නියෝජිතයන් පත් කර ගැනීමට නොහැකි වුවද සමසමාජ, කොමියුනිස්ට් ඇතුළු වමේ පක්ෂවලට වඩා ශන්ද ලබා ගෙන කොළඹ නගරයේදීත්, ජවිපෙ වමේ ප්‍රධාන ව්‍යාපාරය බවට පත් විය. 77 මැතිවරණය නිමාවීමත් සමග අතුරු මැතිවරණ කිහිපයක් ද පැවැත්විණි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සමානුපාතික ශන්ද ක්‍රමය හඳුන්වා දී තිබුණද 77 දී කේවල ක්‍රමයට පැවැත් වූ ශන්දයේ ආසනවලට අතුරුමැතිවරණ පැවැත්වීමට සිදු වූ විට ඒවා පැරණි කේවල ක්‍රමයට පැවැත්වීමට නීති සකසා තිබිණි. ඒ අනුව 77 නොවැම්බර් දෙහිවල, 78 මාර්තු බටහිර කොළඹ, 79 දෙසැම්බර් ගාල්ල, 80 මැයි ආණමඩුව හා 81 ජනවාරි කලවාන යන ආසනවල අතුරු මැතිවරණ පැවැත්විණි. මෙහිදී ජවිපෙ ගාල්ල හා ආණමඩුව යන ආසන දෙකේ අතුරු මැතිවරණවලට පමණක් තරග වැදුණේය. ඒ සීනුව ලකුණින් ස්වාධීනවය. ගාල්ල සඳහා ලයනල් බෝපගේ ඉදිරිපත් කළ අතර ඔහු ශන්ද 3366ක් ලබා ගනිමින් තුන් වැනියා බවට පත් විය. ආණමඩුව අතුරු මැතිවරණයට පක්ෂය වෙනුවෙන් උපතිස්ස ගමනායක තරග වැදුණු අතර ලබා ගත හැකි වූයේ ශන්ද 857කි. ගාල්ලේ දී ලංකා සමසමාජ පක්ෂය අභිබවමින් ගාල්ලේ තුන්වන බලවේගය බවට ජවිපෙ ට හැකියාව ලැබිණි. එය ජවිපෙ දේශපාලනයේ සුභ නිමිත්තක් බවට පත් විය.

අතුරු මැතිවරණය නිමාවට පත් වීමෙන් පසු ඇති වූ ජුලි වර්ජනය ජවිපෙට හුස්මක් කටක් ගැනීමටවත් ඉඩක් නැති කාලයක් ඇති කළේය. කම්කරු සටන් හා අරගලවලදී ව්‍යාත්තීය සම්බන්ධයෙන් ජවිපෙ ස්ථාවරය වූයේ එක් ව්‍යාත්තියකට එක් සම්තියක් කම්කරු පන්තියට එක් මූලස්ථානයක් වශයෙනි. මේ අනුව ජවිපෙ සමාජවාදී කම්කරු සංගමය ගොඩනඟා තිබූ අතර කම්කරු සංගමය යනු ව්‍යාත්තිය සම්තියක් නොව කම්කරු පංතිය තුළ පංති දේශපාලනය තහවුරු කරමින් ඊට නායකත්වය දෙන පක්ෂයේ නිල සංවිධානය විය. සමාජවාදී කම්කරු සංගමය ගොඩනඟා එහි මංගල සමුළුව පැවැත් වූ පක්ෂය සමාජවාදී කම්කරු සංගමයේ ලේකම් ධුරයට උපතිස්ස ගමනායක පත් කර ගන්නා ලදී. ඒ අනුව සමාජවාදී කම්කරු සංගමය ගමනායකගේ නායකත්වයෙන් ක්‍රියාත්මක විය. ඒ වන විට ලංකාවේ පෞද්ගලික අංශයේ ව්‍යාත්තිය සම්තිවල වැඩි බලය පවත්වාගෙන ගියේ බාලා තම්පෝගේ වෙළෙඳ සේවක සංගමය විසිනි. වෙළඳ සේවක සංගමයට අයත් ආයතන රැසක තම බලය තහවුරු කර ගැනීමට ජවිපෙ සමත් වූ අතර කොළඹ අලියා බීම සමාගමේ තිබූ ව්‍යාත්තිය සම්තිය ඊට හොඳම නිදසුන විය.

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ප්‍රථම වරට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයන් විශාල පිරිසක් ගෙදර යවා ලක්ෂ 3 කට අධික දරු පවුල් අනාථ වූ මහා වැඩ වර්ජනයක් වූයේ 1980 ජූලි මහා වැඩ වර්ජනයයි. 80 ජූලි වැඩ වර්ජනය ජවිපෙට විශාල බලපෑමක් එල්ල කළේය. එය විසින් ඉතිරි කරන ලද අතුරු ඵල බොහෝ බැවින් අවලාද, ගැරහීම්, කඩා වැටීම් වලින් යුතු සියලු දෙට මුහුණ පෑමට ජවිපෙට සිදු විය.

රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන් ලක්ෂ 4කට ආසන්න පිරිසක් 1980 ජූනි 05 වැනිදා තම ඉල්ලීම් ලබා ගැනීම සඳහා ආයතන ඉදිරිපිට පිකටින්, විරෝධතා, උද්ඝෝෂණ, රැස්වීම් පැවැත්වූ අතර ඒවා පුළුල් සහභාගීත්වයක් සහිතව සටන්කාමී ස්වරූපයක් ගනු ලැබීය. එජාප ආණ්ඩුව, හිතවාදී ව්‍යාත්තිය සම්තිය එදිනම එම මොහොතේදීම රජයට සහයෝගිතාව දක්වමින් පිකටින් සහ උද්ඝෝෂණ පවත්වනු දක්නට ලැබිණි. කොළඹ සිත්තම්පලම් ගාඩ්නර් මාවතේ රජයේ සැපයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපිට පිකටින් ව්‍යාපාරයේ යෙදී සිටි ව්‍යාත්තිය සම්තිවල සාමාජිකයින් වෙත කොළඹ කොටුව දෙසින් පැමිණි පිරිසක් ප්‍රහාරයක් එල්ල කළ අතර මෙහිදී සැපයුම් දෙපාර්තමේන්තුවේ සේවකයකු වන පොදුසේවක ව්‍යාත්තිය සම්ති ශාඛාවේ දෙද්දුවගේ සෝමපාල මරුමුවට පත් විය. ජූලි වර්ජනය බේදවාචකයකින් අවසන් වූ පසු පැරණි වමේ පක්ෂ හා එම පක්ෂවලට අයිති ව්‍යාත්තිය සම්තිවල වැඩ වර්ජනය කඩා කප්පල් කිරීමේ චෝදනාව පැටවුයේ ජවිපෙ මතය.

1977 මහ මැතිවරණයේදී ආසන 4කට අපේක්ෂකයින් ඉදිරිපත් කරමින් මැතිවරණ දේශපාලනයට පිවිසි ජවිපෙට 1981 වනතුරුම මහජන නියෝජිතයන් පත් කරගැනීමේ ජයග්‍රහණයක් ලබා ගැනීමට නොහැකි විය. 1981 ජූනි දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණය පැමිණියේ ඒ අතරය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය යන පක්ෂ තුනම මෙම මැතිවරණය වර්ජනය කිරීමට තීරණය කරන ලදී. ජවිපෙ තීරණය කරන ලද්දේ සංවර්ධන සභාවලට තරග කිරීමටය. මේ වන විටත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ජවිපෙ ලියාපදිංචි කර තිබුණේ නැත. ඒ සඳහා කිහිප වරක්ම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ ද ජයවර්ධන පාලනය ජවිපෙට එම අයිතිය ලබා දීම දිගින් දිගටම ප්‍රමාද කළේය. එබැවින් 1981 සංවර්ධන සභා මැතිවරණයට ඉදිරිපත් වීමට ජවිපෙට සිදු වූයේ ස්වාධීන කණ්ඩායම් ලෙසටය. ඒ අනුව ජවිපෙ දිස්ත්‍රික් කිහිපයකටම කණ්ඩායම් ඉදිරිපත් කරමින් තරග වැදිණි. එහිදී කොළඹ දිස්ත්‍රික් කණ්ඩායමේ නායකත්වය දරන ලද්දේ උපතිස්ස ගමනායකය. සංවර්ධන සභා ශන්දයෙන් සාර්ථක ප්‍රතිඵලයක් අත් කර ගැනීමට ජවිපෙට හැකි විය. තරග කළ දිස්ත්‍රික්ක අටෙන් ලක්ෂ තුනකට වැඩි ශන්ද ප්‍රමාණයක් ලබාගෙන උපතිස්ස ගමනායක ඇතුළු නියෝජිතයන් 13 දෙනෙකු පමණ පත් කර ගැනීමට අවස්ථාව ලැබිණි.

◣ උදිත ගුණවර්ධන

රජුන් තනන්නන් තැනූ වතුකරයේ කතාව

දෙවන කොටස

නාගරික කම්කරුවෝ වතුකරයට පිටුපාති

ලංකාවට ඉන්දියාවෙන් කම්කරුවන් ගෙන්වා 1920 දශකය උදාවන විට වසර සියයකට ආසන්න වෙමින් තිබිණි. එහෙත් ඒ වන විටත් වතුකම්කරුවන් තමන් මුහුණ දී සිටි බේදවාචකයෙන් ගොඩ එන මාවතකට ප්‍රවිශ්ඨ වී සිටියේ නැත. වතු ආශ්‍රිත කම්කරුවන්ගේ කේවල ශක්තිය අඩු වීම, ඔවුන් සෙසු ජනතාවගෙන් දේශපාලන වශයෙන් කොන් වී සිටීම, වතු පාලකයන් පනවා තිබූ දැඩි විනය නීති ආදිය නිසා කම්කරු හිඟය උග්‍ර පැවැති කාලවලදී පවා ඔවුන්ගේ වැටුප පැවතියේ පහත් අඩියකය.

මෙහිදී වතු කම්කරුවන් මුහුණ දුන් තවත් සමාජ අර්බුදයක් පිළිබඳ අවධානය යොමු කළ යුතුය. ඒ කුලය පිළිබඳ සාධකයයි. නාගරික කසළ ගෝධක පිරිස් මෙන්ම වතුකම්කරුවන් ද සැලකුණේ දකුණු ඉන්දීය කුල ධුරාවලියේ පහළම ස්තරවලින් ප්‍රභවය වූ පිරිසක් ලෙසය. මේ කම්කරුවන්ගෙන් 75%කටත් වැඩි පිරිසක් අයත්වූයේ පල්ලන්, පරයන් සහ චක්කිලියාර් වැනි දකුණු ඉන්දියාවේ පීඩිත කුලවලටය. එහෙත් ඔවුන් අධික්ෂණය සඳහා කංගානිවරු පත් කරගත්තේ කුඩියානවර් නමැති ඉහළ සමාජයෙනි. කුල හීනයන් ස්පර්ශ නොකළ යුතුයි යන මතය ලංකාවේ වතු සමාජයේ දක්නට නොලැබුණ ද, පන්ති භේදය, කුල භේදය, වාර්ගික භේදය ඉවත්ව නොවිණි. මේ තත්ත්වය තුළ කංගානිවරුන්ට ශ්‍රමිකයන් පීඩාවට පත් කිරීමටත් ඒ ඔස්සේ සූරා කෑමටත් මඟ පෑදී තිබිණු බව පෙනේ.

මෙලෙස නිසි වැටුපක් නොලබමින්, සූරා කෑමට ලක්වෙමින්, අර්ධ වහලුන් ලෙස ගෙවුණු වසර 100ක සම්බන්ධයෙන් වතු හාමිපුතුන්ට මෙන්ම යටත්විජිතවාදීන්ට ද ඉන්දියාවෙන් නොයෙක් චෝදනා එල්ල වන්නට විය. 1921 ජනවාරි 20 වැනි දින ශ්‍රමිකයන් ලංකාවට ගෙන යෑම තහනම් කරන බවද ඉන්දියාවේ ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත්කරන ලදී. මේ තත්ත්වය මත 1925 වන විට වතු කම්කරුවන්ගේ වැටුප් පිළිබඳ සෙවීමට කමිටුවක් පත් කෙරිණි.

ඉන්දියානු ආණ්ඩුවේ මෙරට නියෝජිතයා වූ ඇස්. රෙන්ගනාදන්ගේ උපදෙස් මත කටයුතු කෙරුණු මේ කමිටුවට ජන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ධුරය දැරූ ඇල්.ජේ.බී. ටර්නර් ද ඇතුළත් විය. එහිදී රෙන්ගනාදන්ගේ උපදෙස් මත වතු කම්කරුවන් උඩරට, මැදරට, පහත රට ලෙස කලාප තුනකට බෙදා ඔවුන්ගේ දෛනික වියහියදම් පිළිබඳ වාර්තාවක් සකස් කෙරිණි. අදාළ වාර්තා පදනම් කරගෙන 1927 දී අවම වැටුප් පිළිබඳ ආඥා පනත ගෙන එනු ලැබිණි. මේ අතර වතු කම්කරුවන්ගේ ජීවන වියදම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉන්දීය ආණ්ඩුවෙන් බලපෑමක් එල්ල විය. ඒ අනුව ලංකාවේ සිටි ඉන්දීය ආණ්ඩුවේ නියෝජිතයා පවුලක අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන ලදී. ඉන්දීය කම්කරුවන්ගෙන් 40%ක් ජීවන වැටුපක් උපයා ගැනීමට අසමත් බව ඔහුගේ නිගමනය විය. ඒ සමඟම අවම වැටුප් පනත ක්‍රියාත්මක කරන ලෙස ඉන්දියාවෙන් බලපෑම් එල්ල විය. වතු හාමිපුතුන්ගේ විරෝධතා මැද ඉදිරිපත් කෙරුණු එම පනත සක්‍රිය වූයේ තවත් වසර දෙකකට පසුවය. ඒ 1929 ජනවාරි පළමු වැනිදා සිටය. මින් කෙටිකලක් යන තෙක් කම්කරුවන්ගේ වැටුප්වල යම් ප්‍රගතියක් ඇති විය. යලිත් කම්කරුවන්ගේ දුර්භාග්‍ය කාලය එළැඹියේ තේ, රබර්, පොල් කර්මාන්තය කඩා වැටීමෙනි. ඒ අනුව එතෙක් දිනකට ශත 54ක් වූ උඩරට කම්කරුවන්ගේද, දිනකට ශත 52ක් වූ මැදරට කම්කරුවන්ගේද, දිනකට ශත50ක් වූ පහතරට කම්කරුවන්ගේද අවම වැටුප අඩු කිරීමට යෝජනා විය. මේ සමයේදී ලංකාවට පැමිණ සිටි ජවහලාල් නේරු වැටුප් අඩු කිරීමේ යෝජනාවට තරයේ විරෝධය පෑවේය. නේරුගේ එම ප්‍රකාශය 1931 ජූලි 13 සිලෝන් ඩේලි නිවුස් පුවත්පත මෙසේ වාර්තා කර තිබිණි.

"ඉකුත් අවුරුදුවලදී, සියයට 80, 90 නැතහොත් 100යේ ලාභාංශ ප්‍රකාශ කරන ලද වේලේ ඉන් කොපමණ ප්‍රමාණයක් කම්කරුවන්ට ලැබුණේද?... එහෙත් පරිහානිය එළැඹි විට, පළමුවෙන්ම පාඩු විදිය යුත්තේ කම්කරුවාය. ආර්ථික පරිහානියක් පවතින මේ වකවානුවේ දී පවා සියයට 35ක ලාභාංශයක් ප්‍රකාශකොට, ඒ සමඟම අවම වැටුප් අඩු කිරීමට යෝජනා කිරීම, මගේ කල්පනාවේ හැටියට, සමාජයට අන්තරාදායක වූ මානසික හැඩ ගැසීමක් පෙන්නුම් කරන ක්‍රියාවකි. වැටුප් අඩු කිරීමේ යෝජනාවට එකඟ නොවුණද, එවක ව්‍යාත්තීය සම්තිව්‍යාපාරයේ මෙරට ප්‍රමුඛයා වූ ඒ.ඊ. ගුණසිංහ මහතා ද වතු කම්කරුවන් වෙනුවෙන් පැහැදිලි සහයෝගයක් තිබුණේ නැත. 1928 දී ලංකා ව්‍යාත්තීය සම්තී සම්මේලනය ආරම්භ කළ අවස්ථාවේ ඔහු සියලු කම්කරුවන් වෙනුවෙන් සිය සහයෝගීතාව පළ කළේය. තම ව්‍යාපාරය කුලය, ජාතිය, ආගම මත පදනම් නොවන බව ද පැවසීය. ලංකාවේ පදිංචි ඉන්දියානුවන්ට ඡන්ද බලය ලබාදීමට ද පක්ෂ විය. කොළඹ නගරයේ ද්‍රවිඩ හා මලයාලි කම්කරුවන්ගේ සහයෝගය ද කැමැත්තෙන් ලබා ගත්තේය. මේ සියල්ල වෙනුවෙන් ඔහු පෙනී සිටියේ අනගාරික ධර්මපාල තුමාගේ හා සිංහල බෞද්ධ සම්ප්‍රදායේ දැඩි බලපෑමට ලක්ව සිටියදී වීමද විශේෂය. එහෙත් 1928දී ඔහුට ලංකා කම්කරු සංගමයේ උප සභාපතිවරයා වූ කේ. නාතේස අයියාර්ගෙන් ප්‍රබල චෝදනාවක් එල්ල විය. එහිදී අයියාර් කියා සිටියේ ලංකාවෙන් ඉන්දියානුවන් පන්නා දැමිය යුතුයැයි ගුණසිංහ මහතා ප්‍රකාශ කර ඇති බවයි. එය ප්‍රතික්ෂේප කළ ගුණසිංහ, නාතේස අයියාර් කම්කරු සංගමයෙන් නෙරපා දැම්මේය.

මේ වන විට ඒ.ඊ. ගුණසිංහ මහතාගේ නායකත්වය යටතේ ලංකා කම්කරු ව්‍යාපාරය හිනි පෙත්තටම පැමිණ තිබිණි. එහෙත් රටෙහි ඇතිවී තිබූ ආර්ථික පරිහානිය ඔහුගේ ව්‍යාපාරයට ද තදින් බලපෑවේය. රැකියා හිඟය නිසා ඇතිවූ තත්ත්වය මත කම්කරු ව්‍යාපාරයේ කඩා වැටීම වළක්වා ගැනීම සඳහා ගුණසිංහ මහතා ක්‍රියා මාර්ග කිහිපයක් ගත්තේය. පළමුව ආණ්ඩුවේ ආර්ථික වැඩපිළිවෙළට එරෙහිව සටන් ව්‍යාපාරයක් ආරම්භ කළේය. එය අසාර්ථක වූ තැන ඔහුගේ ඊළඟ උත්සාහය වූයේ වර්ජන රැල්ලක් ඇරඹීමය. එයද ලේක්හවුස් වර්ජනයේදී ලැබූ දැවැන්ත පරාජයත් සමඟ අසාර්ථක විය. මෙහිදී දකුණු ඉන්දියාවෙන් කම්කරුවන් ගෙන්වා වර්ජනය අසාර්ථක කිරීමට ඩී.ආර්. විජයවර්ධන සමත්විය. තවද ඉන්දියානු කම්කරුවන් අඩු වැටුපට වැඩ කළ නිසා බොහෝ සේව්‍යයෝ ඔවුන් සේවයට බදවා ගත්හ. සිංහල කම්කරුවන්ට රැකියා අහිමිවීම සහ රැකියා හිඟයක් ඇති විය. මෙයට ඉන්දියානුවන්ගේ පැමිණීම බලපෑ බවට ප්‍රකාශ කළ ගුණසිංහ එය ලංකාවේ ඉන්දියානු කම්කරුවන්ට විරුද්ධ සටන් ව්‍යාපාරයක් බවට පත් කර ගත්තේය.

ගුණසිංහ මහතා "වීරයා" නමින් සිංහල පුවත්පතක් ආරම්භ කර තිබිණි. මෙහිදී ඔහු වෙනත් ජාතීන් පිළිබඳ කතා කළේ චෝදනා මුඛයෙනි. වීරයා පුවත්පත 1930දී පළකළ ලිපියක;

"සුද්දන්, මරක්කලයන්, බෝරාකාරයන් හා මලයාලීන් සිංහලයන්ගේ පිරිහීමට වගකිව යුත්තන්" බැව්, ඔහු ප්‍රකාශ කළේය. 1931 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් වූ ගුණසිංහ මහතා ඉන්දීය කම්කරුවන්ට එරෙහිව කටයුතු කළේය. 1931 අයවැය විවාදයේදී අදහස් දැක්වූ ඔහු;

"සිය ගණනින් මෙහි පැමිණෙන මලයාලීන් අඩු පඩියට වැඩකිරීමට කැමැති වීම මගින්, ලාංකීය කම්කරුවන්ගේ රක්ෂාවල් පැහැර ගන්නා."යැයි චෝදනා කළේය. එතැනින් නොනැවතුණු ඔහු 1933 මැයි දින පෙලපාලියේදී මලයාලීන් කෙරෙහි දබරකාමී ආකල්පයෙන් කටයුතු කළ බව පොලිස් වාර්තාවල සඳහන් ය. මෙලෙස ඉන්දීය විරෝධයක් මගින් කම්කරු ව්‍යාපාරය යළි පණ ගැන්වීමට ගත් උත්සාහය තාවකාලික උද්යෝගයක් වුවද එය ගිලිහෙමින් තිබුණු ගුණසිංහගේ අසිපත නගා සිටුවීමට සවිමත් සටන් පාඨයක් වූයේ නැත. ඒ සමඟම 1933 වන විට 'ගුණසිංහ යුගය'ද අවසානය කරා ගියේය.

මෙලෙස ලාංකික නාගරික කම්කරු පන්තිය අතර ඉන්දීය විරෝධී හැඟීම උග්‍ර වන විට, ඊට සාපේක්ෂව වතුකරයේ කම්කරු ව්‍යාපාරය ස්වාධීනව සංවර්ධනය විය යුතු බව පෙනෙන්නට තිබිණි. එවැනි ව්‍යාපාරයක් ලංකාවේ ඉන්දීය මධ්‍යම පන්තිය ඔස්සේ බිහිවී ආරම්භ විය යුතු බව ද පැහැදිලිව පෙනෙන්නට තිබිණි. එහිදී කලක් ගුණසිංහයන් සමඟ කම්කරු ව්‍යාපාරයට සම්බන්ධ වී සිටි නාතේස අයියාර් මුල් වී ක්‍රියා කරන්නට විය.

ලබන සතියට...

◣ මලික් චමින්ද ධර්මවර්ධන

වමට බර

මාතර මැති-ඇමැති වත-ගොත

1936-1947 රාජ්‍ය මන්ත්‍රණ සභා මාතර මන්ත්‍රී රාජා හේවාවිතාරණ

මේ රටේ ප්‍රබල දේශපාලන චරිත හා ව්‍යාපාරික ක්‍රීඩා චරිත බිහි කිරීම පිළිබඳ මාතර ප්‍රසිද්ධය. මුලින්ම මාතර ආසනයට මහජන ඡන්දයෙන් නියෝජිතයකු පත් වන්නේ 1931 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයෙන්ය. 1931 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයට මාතර ආසනය නියෝජනය කරමින් නීතිඥ ජී.කේ.ඩබ්ලිව්. පෙරේරා, ඉදිරිපත් වී ඡන්ද 13232ක්ද, ජේ.එච්.පී. විජේමාන්න ඉදිරිපත්වී ඡන්ද 9773ක්ද, ඩබ්ලිව්.ජේ. බුල්ජන්ස් ඉදිරිපත්වී ඡන්ද 2589ක්ද ලබාගෙන වැඩි ඡන්ද 3459ක් ලබා ජී.කේ.ඩබ්ලිව්. පෙරේරා මාතර ආසනයේ මහජන මන්ත්‍රී විය. ඔහු කොළඹ නාලන්දා විදුහලේ 1927-28 වසරවල විදුහල්පති ලෙස කටයුතු කළ නීතිඥ මහතෙකි.

1931 වන විට මාතර දිස්ත්‍රික්කයටම තිබුණේ ආසන තුනකි. වැලිගම හා මොරවක හා මාතරයි.

නැවතත් මාතර ආසනයට රාජ්‍ය මන්ත්‍රණ සභා නියෝජිතයන් තෝරාගන්නා මැතිවරණයක් එන්නේ 1936දීය. මේ දෙවන රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයට මාතර හිටපු මන්ත්‍රී ජී.කේ.ඩබ්ලිව්. පෙරේරා මහතා ඉදිරිපත් වී ඡන්ද 12654ක් ලබාගත් අතර අනගාරික ධර්මපාල තුමාගේ සොයුරාගේ පුතා වූ රාජා හේවාවිතාරණ මහතා ඉදිරිපත් වී 25895ක් ඡන්ද ලබාගත්තේය. එස්.පී.ඒ. ද සිල්වා මහතා ඉදිරිපත්වී ඡන්ද 2331 ලබා ගනී. වැඩි ඡන්ද 13241ක් ලබා අනගාරික ධර්මපාල තුමාගේ ඥාති පුතු රාජා හේවාවිතාරණ මාතර ආසනය නියෝජනය කරමින් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් විය.

මෙම 1936 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයෙන් පත්වූවන් වසර 11ක් මාතර ආසනය නියෝජනය කරමින් සිටි අතර නැවත මැතිවරණයක් පවත්වන්නේ 1947දිය. එය 1947 ජුලි 23 සිට සැප්තැම්බර් 20 දක්වා විටින් විට දින 19ක් පවත්වයි.

සොල්බරි කොමිසමේ නියමයන්ට අනුව පවත්වන මේ මහා මැතිවරණයට මාතර මන්ත්‍රී ලෙස වසර 11ක් කටයුතු කළ රාජා හේවාවිතාරණයන් ඉදිරිපත් නොවී එජාපයෙන් කෝට්ටේ ආසනය තෝරා ගනී. ඒ වෙනුවට කොමියුනිස්ට් පක්ෂයෙන් මාතරට ඉදිරිපත් වන්නේ එච්.ඩී. අබේගුණවර්ධන මහතාය. ඔහු කොමියුනිස්ට් පක්ෂයෙන් ඡන්ද 11970ක් ලබා ගනී. ඩබ්ලිව්. ගුණසේකර ස්වාධීනව ඡන්ද 5279ක් ලබා ගනී. ජී. වීරතුංග ස්වාධීනව ඡන්ද 2661ක් ලබා ගනී. කේ.කේ.ඩී. සිල්වා ස්වාධීනව ඡන්ද 442ක් ලබා වැඩි ඡන්ද 6691ක් ලබා කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂකයා මාතර ආසනයෙන් පළමු පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් තේරීපත් වෙයි. මේ සොල්බරි කොමිසමේ නිර්ණයන්ට අනුව ආසන 3කට තිබූ මාතර දිසාව ආසන 5 දක්වා වැඩි වෙයි.

ඉන් පසු එළඹෙන්නේ 1952 පාර්ලිමේන්තු දෙවන මහ මැතිවරණයයි.

මෙයට මාතර මන්ත්‍රිව සිට සිරදඬුවම් විඳ සිට 1948 නිදහස්දා පොදු සමාවක් ලැබූ කොමියුනිස්ට් පක්ෂයේ හැරි අබේගුණවර්ධනයන් මාතර ආසනයට ඡන්දයට ඉදිරිපත් නොවේ. කොමියුනිස්ට් පක්ෂයෙන් ඉදිරිපත් කෙළේ තරුණ නීතිඥ මහතකු වූ වත්මන් ඇමැති මංගල සමරවීරගේ පියාවූ මහනාම සමරවීරය. මහනාම සමරවීරයන් 1917 ඔක්තෝබර් 12 මාතරදී උපත ලබා වෘත්තීය ලෙස නීතිඥ වෘත්තීය තෝරාගත් තරුණ දේශපාලනඥයෙකි. 1940 මාතර නීතිඥයකු ලෙස දිවුරුම් දෙන ඔහු පොඩි මිනිසුන් වෙනුවෙන් නඩුවලට නොමිලයේ කතා කොට ජනප්‍රසාදය දිනාගත් කෙනෙකි. 1943 මාතර නගර සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තේරීපත්වන ඔහු දැඩි කොමියුනිස්ට් පාක්ෂිකයෙකි. සුදු අධිරාජ්‍යවාදයට විරුද්ධව සටන් කළ ඔහු කොමියුනිස්ට් පක්ෂයේ අධ්‍යාපන හා ප්‍රචාරක කටයුතු භාරව ක්‍රියා කෙළේය.

1952 මහ මැතිවරණයේදී මාතර ආසනයෙන් මහානාම සමරවීර ඡන්ද 11861ක් කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරමින් ලබා ගති. එඩ්වින් බෙන්ජමින් සේනාරත්න එජාපයෙන් ඡන්ද 10785ක් ලබාගති. එස්.පී. ඒ. ද සිල්වා ස්වාධීන 2565ක් ලබාගති. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයා ලබාගන්නේ වයි.එස්. රාජපක්ෂ ඡන්ද 2265කි. වැඩි ඡන්ද 1076 ලබා කොමියුනිස්ට් පක්ෂයේ මහානාම සමරවීර මාතර මන්ත්‍රී විය.

නැවතත් මාතරට මහා මැතිවරණයක් වන්නේ 1956 දීය. ඒ වන විට මාතර මන්ත්‍රිව සිටි මහානාම සමරවීරයන් කොමියුනිස්ට් පක්ෂයෙන් ඉවත් වී බණ්ඩාරනායක මහතා ගේ මහජන එක්සත් පෙරමුණට එක් වී සිටියේය. 1955 කොමියුනිස්ට් පක්ෂයෙන් ඉල්ලා අස්වන මහානාම සමරවීර 1955 රට පුරා සැරිසැරූ සිංහල භාෂා පෙරහරට මාතරදී එක් වෙයි. මාතර බෝධිය අසලදී එයට එක්වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක් වෙයි.

1956 මැතිවරණයේදී මජන එක්සත් පෙරමුණහි මහානාම සමරවීර ඡන්ද 18571ක් ලබා ගනී. එජාපයේ ඩී.එච්. පණ්ඩිත ගුණවර්ධන ඡන්ද 7342ක් ලබා ගනී. කොමියුනිස්ට් පක්ෂ අපේක්ෂක ඊ.එච්. ගෞරවපාල ඡන්ද 4894ක් ලබා ගනී. වැඩි ඡන්ද 11129ක් ලබා මහානාම සමරවීර මාතර මන්ත්‍රී බවට තේරී පත් වෙයි.

මාතර ආසනය නියෝජනය කරමින් තේරී පත් වූ මහානාම සමරවීරයන් 1956 අප්‍රේල් මස 21 දින කොළඹ රජ ගෙදරදී බණ්ඩාරනායක මහතාගේ රජයේ අධිකරණ උප ඇමැති ලෙස දිවුරුම් දෙමින් සිටි මෙහොතේ දී ඔහුගේ බිරිය වන ඛේමා සමරවීර මහත්මියට ඇයගේ තෙවන දරු උපත සිදුවන අතර එදින සමූපකාර රෝහලේ දී උපත ලද සමරවීර යුවළගේ දරුවා මංගල සමරවීරය.

1959 සැප්තැම්බර් 26 බණ්ඩාරනායක මහතා ඝාතනය විය. ටික කලක් දහනායක මහතා අගමැති විය. නැවත මැතිවරණයක් එන්නේ 1960 මාර්තු මහ මැතිවරණයයි. මෙහිදී මාතර ආසනයට එජාපයෙන් ඉදිරිපත් වන ජස්ටින් සී. විජේවර්ධන ඡන්ද 8409ක් ලබා ගති.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් වන මහානාම සමරවීර ඡන්ද 6533ක් ලබා ගනී. කොමියුනිස්ට් පක්ෂයෙන් ඉදිරිපත්වන බී.වයි. තුඩාවේ ඡන්ද 5702ක් ලබා ගනී.

ලංකා පුත්‍ර ජන පක්ෂයේ කේ.කේ.ඩී. සිල්වා ඡන්ද 2151ක් ලබා ගති. දයානන්ද කුමාරප්පෙරුම ඡන්ද 204ක් ලබා ගති. වැඩි ඡන්ද 1876 ලබාගෙන මහානාම සමරවීර මහතා මාතරින් පරාජය කර ජස්ටින් සී. විජේවර්ධන එජාප අපේක්ෂකයා ජයග්‍රහණය ලබයි.

1960 මාර්තු මැතිවරණයේදී වොල්ටර් තල්ගොඩපිටිය නිර්දේශ අනුව මාතරට තවත් ආසන දෙකක් අලුතින් එක් වෙයි. ඒ කඹුරුපිටිය හා දෙවිනුවරයි. එක් දිනයකදී ලංකාව පුරා මහ මැතිවරණයක් පවත්වපු මුල් අවස්ථාව මෙය විය.

මෙම මන්ත්‍රීවරුන්ට ධුරය දරන්න හැකි වූයේ දින 30ක් පමණි. පාර්ලිමේන්තුව විසුරුවා හරින්න සිදු විය. නැවතත් 1960 ජුනි 20 නැවතත් මහ මැතිවරණයක් පවත්වන්නට සිදු විය.

මාතර ආසනයට ඉදිරිපත් වූ මහානාම සමරවීර ශ්‍රී ලනිප යෙන් ඡන්ද 13105ක් ලබා ගත් අතර සී. ජස්ටින් විජයවර්ධන එජාපයෙන් ඡන්ද 8433ක් ලබා ගනී. වැඩි ඡන්ද 2905ක් ලබා මහනාම සමරවීර මාතරින් තේරී පත් වෙයි.

අගමැතිනිය ලෙස වැඩ භාරගත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 1960 ජුනි 23 දා එකොළොස් දෙනකුගෙන් යුත් කැබිනට් මණ්ඩලයක් පත්කර ගන්නා ලදී. එහි පළාත් පාලන හා නිවාස ඇමැති ධුරය හිමි වන්නේ මහානාම සමරවීරයන්ටයි. නැවතත් බණ්ඩාරනායක මැතිණිය කරන ලද කැබිනට් සංශෝධනය අනුව ඔහුට 1962 අගෝස්තු 24 දින හිමිවන්නේ ප්‍රවාහන ඇමැති ධුරයයි. 1964/06/11 දින ශ්‍රීලනිප, ලසසප හවුල් ආණ්ඩුවක් ඇති කරන මැතිණිය එහි ඇමැතිකමක් මහනාම සමරවීරයන්ට ලබා නොදෙයි.

1964 දෙසැම්බර් 3දා මැතිනියගේ රජයේ සභානායකව සිටි සී.පී. ද සිල්වා මහතා ඇතුළු පිරිසක් සමඟ මැතිනියගේ රජයෙන් ඉවත්ව විපක්ෂයට ගියේය. පසුව සී.පී. ද සිල්වා මහතාගේ නායකත්වයෙන් පිහිටුවන ශ්‍රී ලංකා නිදහස් සමාජවාදී පක්ෂයේ උප සභාපති ධුරයට මහනාම සමරවීර පත් වෙයි.

1965 මහ මැතිවරණයට මාතර ආසනයට එජාපයෙන් අපේක්ෂකයකු ඉදිරිපත් නොකරයි. මහනාම සමරවීරයන් ඉදිරිපත් වන්නේ ශ්‍රී ලංකා සමාජවාදී පක්ෂයෙන්ය. ශ්‍රී ලංකා කොමියුනිස්ට් ලසසප අතර නිතරඟ ගිවිසුම නිසා එම හවුලෙන් මාතරට ඉදිරිපත් වන්නේ කොමියුනිස්ට් පක්ෂයේ බී. වයි. තුඩාවේ මහතාය. ඔහු පාසල් ගුරුවරයෙකි.

බී.වයි. තුඩාවේ මහතා 1965 මාර්තු 22 මෙම මැතිවරණයේදී ඡන්ද 15207ක් ලබාගත් අතර මහානාම සමරවීර ඡන්ද 14287ක් ලබාගත් අතර බී.වයි. තුඩාවේ වැඩි ඡන්ද 920කින් මාතර මන්ත්‍රී විය.

බී.වයි. තුඩාවේ මහතාට ඡන්ද 920කින් පරාජයට පත් මහානාම සමරවීරයන්ට 1965 ඩඩ්ලි සේනානායක රජයෙන් එකල තිබූ කන්තලේ ස්කාගාර සංස්ථාවේ සභාපති ධුරයට පත් කරන ලදී. මාතර අමිල සේවාවක් කළ මාතරට අභිමානයක් වූ මේ මහා යුග පුරුෂයා 1966 මාර්තු 19 දින වයස අවුරුදු 49ක් තරම් තරුණ වියේදී මාතර ජනයා අඬවමින් අවසන් ගමන් ගිය අතර අයුක්තියට අසාධාරණයට විරුද්ධව තනතුරු අතහැර දැමූ මොහු ගැන මාතකය මාතර පුරවරේ සැම හට නොමැකෙන එක් සිහිවටනයක් නම් මාතර නිල්වලා ගඟ හරහා ඉදි කර ඇති දැවැන්ත මහානාම පාලමයි.

ඉන්පසු 1970 මහ මැතිවරණයෙන් මාතර ආසනයේ මන්ත්‍රී වනුයේ බී. වයි. තුඩාවේ මහතායි. ඔහු ඡන්ද 20764ක් ලබා ගනී. ප්‍රතිවිරුද්ධ එජාප අපේක්ෂකයා ඇස්.කේ. පියදාස ඡන්ද 14580ක් ලබා ගනී. බී.වයි. තුඩාවේ එම රජයේ අධ්‍යාපන නියෝජ්‍ය ඇමැති වෙයි. 1977 මාතර ආසනයේ මන්ත්‍රී වනුයේ එස්.කේ. පියදාස මහතායි. බී.වයි. තුඩාවේ මහතා එස්.කේ. පියදාස මහතාට පරාජයට පත් වේ. එස්.කේ. පියදාස මහතා ඡන්ද 23222ක් ලබා ගත් අතර බී.වයි. තුඩාවේ ලබා ගන්නේ ඡන්ද 12585කි. වැඩි ඡන්ද 10637කින් එස්.කේ. පියදාස මහතා මාතර ආසනය ජයගෙන මන්ත්‍රී වෙයි. එස්.කේ. පියදාස මහතා පසු කලෙක ග්‍රාමීය කර්මාන්ත නියෝජ්‍ය ඇමැති විය.

මේ මාතර ආසනය වෙනුවෙන් පත්වූ අවසාන මන්ත්‍රීවරයාය. 1989 සමානුපාතික ක්‍රමය අනුව මාතර ආසනයට වෙනම මන්ත්‍රීවරයෙක් පත් නොවීය.

නන්දික බැද්දේගම

1947
එච්.ඩී. අබේගුණවර්ධන මහතා

1952-1960 / 1960 ජුනි -1965
මහානාම සමරවීර මහතා

1960 මාර්තු - 1960 ජුනි
ජස්ටින් විජයවර්ධන මහතා

1965 - 1977
බී.වයි. තුඩාව මහතා

1977 - 1989
එස්.කේ. පියදාස මහතා

මැලේරියාවට සහන ගෙනා සූරිය මල් ව්‍යාපාරයේ යටියන්තොට ගමන

ආචාර්ය
කොල්වින් ආර්. ද සිල්වා මහතා



ආචාර්ය
ඇන්.ඇම්. පෙරේරා මහතා



දොස්තර
එස්.ඒ. වික්‍රමසිංහ මහතා

ඩොරීන් වික්‍රමසිංහ මහත්මිය

ජාතිකවාදී දේශපාලන කටයුතුවලට වේගයෙන් අවතීර්ණ වීමට මේ රටේ තරුණ සංගම්වලට උපකාරී වූයේ පොපිමල් දිනයට විරුද්ධ ව්‍යාපාරයයි. 1926 දී රැඩිකල්වාදී ශිෂ්‍ය කණ්ඩායමක් ආරම්භ කළ මෙම ව්‍යාපාරය, 1931 දී ලංකා සේවා මුක්ත භට සංගමය හා තරුණ සංගම් ඉදිරියට ගෙන ගියහ. 1933 දී පමණ මැද කොළඹ තරුණ සංගමයේ නායකත්වය යටතට පත් වීමෙන් පසු මෙම ව්‍යාපාරය පැහැදිලි වශයෙන්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට විරුද්ධ වූ සටන්කාමී ස්වරූපයක් ගත්තේ ය. එහෙත් 'පළමු වන ලෝක යුද්ධයේ අවසානය සිහි කරමින් නොවැම්බර් 11 වැනිදාට යෙදුණු යුද්ධ සමාදාන දිනය (පොපි මල් දිනය) පිළිබඳ උත්සවය ලංකාවේ රජයේ නිලධාරීහු හා බ්‍රිතාන්‍ය ජාතික පදිංචිකරුවෝ මහත් උද්‍යෝගයෙන් යුතුව පැවැත්වූහ. මේ දිනයේදී පොපි මල් විකුණා ලැබෙන ආදායම එංගලන්තයට යැවිණි. පල්ලියේ පුද පූජා සහ යුද්ධ පෙළපාළි මඟින් අධිරාජ්‍යය කෙරෙහි වූ භක්ති යළි සහතික කරන ලදී. මේ අතර, වාර්ෂික පොපි මල් අරමුදලට ආධාර වශයෙන්, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත්ව තිබූ බොහෝ රටවලින් ලැබුණු මුදලට වඩා විශාල මුදලක් ලංකාවෙන් යැවීම ගැන තරුණ ශිෂ්‍යයෝ තදින් විරුද්ධ වූහ.

මෙයට ප්‍රතිචාරාත්මක ව්‍යාපෘතියක් වශයෙන් පොපිමල් විකිණීමේ දිනයෙහි සූරිය මල් විකිණීම ආරම්භ කෙරුණු අතර, එය ජනතාවගේ සුබසිද්ධිය සඳහා කටයුතු කරන අධිරාජ්‍ය විරෝධී සංවිධානයක් ලෙසින් ක්‍රියා කළේය. සූරිය මල් විකිණීමෙන් එකතු කරන ලද මුදල් සමාජ සුබසාධන කටයුතු සඳහා ද බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට විරුද්ධව පත්‍රිකාවක් මුද්‍රණය කැර ප්‍රසිද්ධ කිරීම සඳහා ද ප්‍රයෝජනයට ගනු ලැබිණි. 1934 මැලේරියා වසංගත සමයේදී සූරිය මල් ව්‍යාපාරයේ සාමාජිකයෝ මහජනයාගේ මුදල් එකතු කර, එම මුදලින් ගත් බෙහෙත් හා ආහාර ද්‍රව්‍ය බෙදා දෙමින් වසංගතයෙන් පීඩා විඳි ගම්වැසියනට ආධාර කළෝය.

එකල සූරිය මල් ව්‍යාපාරයේ සිටි වාමාංශිකයන් අතර දොස්තර ඇස්.ඒ. වික්‍රමසිංහ, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ලෙස්ලි ගුණවර්ධන, ටෙරන්ස් ඇන් ද සිල්වා, ඇම්. ජී. මැන්දිස්, ටී. දොරෙයිසිංහම්, බී. ජේ. ප්‍රනාන්දු සහ රෙජි සේනානායක ද වූහ. සූරිය මල් ව්‍යාපාරයේ ප්‍රථම සභාපතිනිය වශයෙන් ඩොරීන් වික්‍රමසිංහ මහත්මිය තෝරා පත් කැර ගනු ලැබිණි.

සූරිය මල් ව්‍යාපාරයේ ක්‍රියාකාරී වැඩ කොටසක් කළ මේ රැඩිකල් වාමාංශික තරුණ කොටස් වෘත්තීය සමිති පිහිටුවීමටත්, කම්කරු සටන්වලට නායකත්වය දීමටත් පටන් ගත්හ. වැඩි කල් යන්නට පෙර කම්කරු නායකයකු වශයෙන් ගුණසිංහට තිබූ තත්ත්වය නැතිව ගියේ ය. වැල්ලවත්තේ රෙදි මෝලේ කම්කරුවන් සංවිධානය කිරීම මේ රැඩිකල් වාමාංශික තරුණ කොටස් යටතේ සිදු විය. මෙහිදී සේවක අයිතීන් කප්පාදුවට එරෙහිව 1933 දී වැඩ වර්ජනයක් ආරම්භ කෙරුණු අතර, කම්කරුවෝ 1400ක් පමණ මාස හයකට ආසන්න කාලයක් එම වැඩවර්ජනයෙහි යෙදී සිටියහ. මෙම කාලසීමාවේදී වාමාංශිකයෝ මීරිගම හා ලුණුවිල වැවසියර් සමාගමේ පොල් හා කොහු මෝල්හි වැඩ වර්ජන ද කොමර්ෂල් කොම්පැනියේ කැලණියේ හා හුණුපිටියේ පොහොර මෝල්හි වැඩ වර්ජන ද එවැනි වෙනත් කම්කරු පන්ති අරගලද සංවිධානය කර ඒවාට නායකත්වය දුන්නෝය. මේ අවධියේ කොල්වින් ආර්. ද සිල්වා සහ දකුණු කොළඹ තරුණ සංගමයේ සාමාජිකයෝ එක්ව, කම්කරුවන් වෙනුවෙන් සටන් කිරීම සඳහා පෙරමුණ ගත්හ. 1933 පෙබරවාරි 23 වනදා පවත්වන ලද කම්කරුවන්ගේ මහා සභා රැස්වීමකදී වැල්ලවත්තේ කම්කරු සංගමය පිහිටුවන ලදී.

කොල්වින් ආර්. ද සිල්වා එහි සභාපති වශයෙන් ද ක්‍රියාශීලී තරුණ සංගම් සාමාජිකයන් දෙදෙනකු වූ වර්නන් ගුණසේකර හා ජේ. ඩබ්ලිව්. සේනානායක සම ලේකම්වරුන් වශයෙන් ද පත් වූහ. පිලිප් ගුණවර්ධන, ඇන්. ඇම්. පෙරේරා, එස්. ඒ. වික්‍රමසිංහ, රොබට් ගුණවර්ධන, සූසන් ද සිල්වා යනාදීහු ද අප්පුහාමි, කුට්ටන් සහ රාමයියා යනාදි සටන්කාමී කම්කරුවෝ ගණනාවක් ද වැඩ වර්ජන සංවිධානය කිරීම, මහජන රැස්වීම්වල කථා කිරීම, අරමුදල් එකතු කිරීම සහ සහනාධාර බෙදා දීම ආදි කටයුතුවලදී ආධාර කළහ.

ත්‍රිකුණාමල වරායේ කම්කරුවන්ගේ වැඩ වර්ජනය වාමාංශික නායකත්වයකින් සිදු වූ ප්‍රථම වරාය වැඩ වර්ජනය ලෙස සැලකෙයි. යටත් විජිත ආණ්ඩුවත්, ස්වාමි පක්ෂයත් මෙම වැඩ වර්ජනවලට හතුරුකම් කළ නමුත්, කාර්මික කොම්පැනිවල වැඩ වර්ජනවලට, වඩා දැඩි විරුද්ධත්වයක් දක්වන ලද්දේ ඊ.ඒ. ගුණසිංහ විසිනි. පොදු වශයෙන් වැඩ වර්ජන නොකිරීමට ඔහු ස්වාමි පක්ෂය සමඟ ගිවිසුමකට එළඹ සිටියේ ය. කෙසේ වුවත් වැටුප් හා කම්කරුවන්ගේ ජීවන තත්ත්වය බොහෝ පහළ තත්ත්වයක පැවැති බැවින් කම්කරුවෝ වාමාංශිකයන්ගේ නායකත්වය හා ආශීර්වාදය නොඅඩුව ලබමින් එම කටුක තත්ත්වයට විරුද්ධව සටන් කිරීමට ඉදිරිපත් වූහ.

ඉහත සඳහන් කැර ඇති පරිදි ස්වාමිවරුන්ගේ පක්ෂය ගත් ගුණසිංහ වැඩ වර්ජන බිඳහෙළීම සඳහා මැර බලය පවා යෙදවී ය. කොළඹ වැඩපොළ රැසක එකල සේවයේ යොදවා සිටි ඉන්දීය කම්කරුවන්ට විරුද්ධව වර්ග භේදය ඇවිස්සීමෙන් ද ඔහු කම්කරු පන්තිය භේද කැර දුර්වල කෙළේ ය.

වැඩ වර්ජන ගණනාවක් ම කඩාකප්පල් කිරීමට ස්වාමි පක්ෂයට සහාය දීම හේතුවෙන් ගුණසිංහගේ කම්කරු පන්ති නායකත්වය හා ඔහු කෙරේ වූ ප්‍රසාදය අහෝසි වන්නට පටන් ගත්තේ මේ අවධියේදීය. ඔහුගේ වෘත්තීය සමිති සඳහා සාමාජි මුදල් එකතු කැර දීමෙන් කොම්පැනිකරුවෝ ගුණසිංහට ආධාර කළහ. ගුණසිංහගේ සමිතිවලින් තුණ්ඩු රැගෙන එන ඉල්ලුම්කරුවන්ට පමණක් රක්ෂා දීමෙන් ස්වාමි පක්ෂය තවදුරටත් ගුණසිංහට අනුබල දුන් අතර, එමඟින් හීලෑ කම්කරු පිරිසක් ඇති කැර ගැනීමට අපේක්ෂා කැරිණි.

1935 දී වෘත්තීය සමිති ආඥා පනත නීතිගත කරන ලදී. එංගලන්තයේ මෙන් නොව, ලංකාවේ වෘත්තීය සමිති ලියාපදිංචි කිරීමට නීතියෙන් බල කළේ ය.වෘත්තීය සමිති ආඥා පනතෙහි ඇති පූර්විකාවෙහි සඳහන් වන්නේ එම ආඥා පනත වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම හා පාලනය සඳහා පිළියෙල යොදන බව ය. එබැවින් ලංකාවේ ලියාපදිංචි නොකරන ලද වෘත්තීය සමිතියක් වෙතොත් එය නීති විරෝධී සංවිධානයක් වන්නේ ය.

වෘත්තීය සමිති ආඥා පනත පිළිබඳ යෝජනාවට විරුද්ධත්වය දැක්වීමේ නායකත්වය ගත්තේ දොස්තර ඇස්.ඒ. වික්‍රමසිංහ ය. එම පනතේ ඇති ප්‍රතිගාමී ස්වභාවයත්, එයින් කම්කරුවන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොසැලසෙන බවත්, එය මුළුමනින් ම ස්වාමි පක්ෂයට පක්ෂපාතී ව සකස් වී තිබෙන බවත් ඔහු රාජ්‍ය මන්ත්‍රණ සභාවට දැන්වී ය. ප්‍රධාන වශයෙන් මේ පනතට විරුද්ධ වූයේ වෘත්තිය සමිති ලියාපදිංචි කිරීමට බල කිරීම සඳහාත්, වෘත්තීය සමිති මුදල් දේශපාලන කටයුතු සඳහා වියදම් කිරීම වැළැක්වීම සඳහාත් එහි අඩංගු වූ කොටස් නිසා ය. යම් කිසි වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා නිසි කල්හි ඉල්ලුම් නොකළ හොත්, නැත් නම් යම් කිසි වෘත්තීය සමිතියක ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ හොත්, ඉල්ලා අස් කැරගත හොත් හෝ අවලංගු කළ හොත් එවිට එම වෘත්තීය සමිතිය නීති විරෝධී සංවිධානයක් ලෙස සලකනු ලැබේ.

මේ පනතේ නියම ස්වභාවය කලින් නොදුටු රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරු කීපදෙනෙක් පසුව දොස්තර වික්‍රමසිංහ සමඟ එක්ව ඊට විරුද්ධ වූහ. වෘත්තීය සමිති පිහිටුවීම නීති විරෝධී කරන්නා වූ සහ වෘත්තීය සමිති මඟින් එකතු කරනු ලබන මුදල් වැය කිරීම සීමා කරන්නා වූ මෙම පනතේ වගන්තිවලින්ම පැහැදිලි වන්නේ මේ පනතින් වෘත්තීය සමිතිවලට කිසිම අයිතිවාසිකමක් නොදෙන බව සහ ඒ වෙනුවට එම සමිතිවල සාධාරණ හිමිකම් උදුරාගනු ලබන බව යයි. ඔහු ප්‍රකාශ කෙළේය.

මුල් අවධියකදී එම පනතට පක්ෂ වූ ඊ.ඒ. ගුණසිංහ ද පසු ව ඊට විරුද්ධ විය. ඒ සම්බන්ධයෙන් ඔහු මෙසේ කීවේ ය. 1923 වර්ෂයේ අපි ප්‍රථම පොදු මහ වැඩ වර්ජනය පැවැත්වූ තැන් පටන් මේ මොහොත දක්වාම වෘත්තීය සමිති පාලනය කිරීම සඳහා වෘත්තීය සමිති රජයේ පාලනයට යටත් කිරීම සඳහා යම් මාධ්‍යයක් තිබිය යුතු යැයි ධනපති පංතිය හඬ නැඟූහ. මේ සඳහා නීති සම්පාදනය කරන ලෙස අවුරුද්දක් නැරම ධනපති පන්ති මුර ගෑ හ.

කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි හෝ කම්කරුවන්ට ආධාර දුන් හැම කෙනෙක් ම මෙම පනතට විරුද්ධ වූහ. ඊට විරුද්ධ වූ අය අතර, ඇස්. ඩබ්ලිව්. ඩී. බණ්ඩාරනායක ද විය. මේ විරුද්ධත්වය පවා නොතකා එය සැණෙකින් සම්මත කර 1935 දී නීතිගත කරනු ලැබිණි. ප්‍රතිගාමී ආණ්ඩුවෙන් හා අකැමැති ස්වාමි පක්ෂයෙන් මූලික වෘත්තීය සමිති අයිතිවාසිකම් ප්‍රතිලාභයන් දිනාගැනීම සඳහා වූ සටනෙහි ආරම්භය මෙය විය. මෙම ආඥා පනතෙන් වෘත්තීය සමිතිවලට දෙන ලද අයිතිවාසිකම් අතර, දේපළ අයිති කරගැනීම හා තබාගැනීම සඳහා අයිතිය ද ස්වකීය ලියාපදිංචි නමින් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට අයිතිය ද විය. එමෙන් ම එංගලන්තයේ බලපැවැති තත්ත්වයෙන් ම වන්දි ගෙවීමට බැඳීමෙන් ආරක්ෂාව ද එම නීතියෙන් සැලසිණි.

චන්දන විජේකෝන්



රටෙහි පළමුවැන්නා වූ පන්තියේ තුන් වැන්නා

1815 මාර්තු 02 වැනිදා ඉංග්‍රීසින් විසින් ලක් ධජය පහතට ඇද දමා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ධජය ඉහළට ඔසවා ලක්දිව පුරා සිය අණසක පතුරාලීය. එයින් පසුව වසර 133ක්ම ලක්දිව පුරා ලෙළ දුන්නේ ඉංග්‍රීසි ධජයයි. 1815න් පසු නැවතත් ලංකා ධජය සිරිලක් දෙරණෙහි එසැවී ලෙළ දෙන්නේ 1948 පෙබරවාරි 04 වැනි දිනය. එය එසවෙන්නේ අපගේ කතාවේ නායකයා වන ඩී.එස්. සේනානායක හෙවත් නිදහස් සිරිලක ප්‍රථම අග්‍රාමාත්‍යවරයාගේ සුරතිනි. ඩී.එස්. සේනානායක මහතා වසර 133 ක් ම ලක් දෙරණ තුළ අඩකුඹුව පැවති ලක් ධජය එසවීම උදෙසා සිදු කළ කැපකිරීම සුළුපටු නොවේ. ඔහු සිය ජීවිත කාලයෙන් අඩකටත් වඩා ඒ වෙනුවෙන් කළ කැපකිරීම අතිමහත් වේ. ඩී.එස්. සේනානායක මහතා උපත ලබන්නේ 1884 වසරේ ඔක්තෝම්බර් 20 වැනිදා ය. ඔහුගේ පියා ඉඩම් හිමි වැවිලිකරුවකු වූ දොන් ස්ටෙපන් සේනානායක මුදලිතුමා වූ අතර මව නමින් දෝන කැතරිනා එලිසබත් ගුණසේකර සේනානායක විය. දරුවන් සිවු දෙනකුගෙන් යුතු පවුලේ බඩ පිස්සා වූ ඩී.එස්.ට වැඩිමහල් සොහොයුරන් දෙදෙනෙක් සහ සොයුරියක් විය. ඔවුන් අතරින් වැඩිමහල් සොහොයුරා එෆ්.ආර්.සේනානායක වූ අතර අනෙක් සොහොයුරා ඩී.සී.සේනානායක නම් විය. සොහොයුරිය මාරියා ෆැන්සිස් සේනානායක වූවාය.

ඩී.එස්. ඇතුළු සොයුරන් තිදෙනාම අධ්‍යාපන කටයුතු සඳහා පිටිසෙන්නේ ගල්කිස්සේ ශාන්ත තෝමස් විද්‍යාලයටය. ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ නේවාසිකව ඉගෙනුම ලබන ඔවුන් සාමාන්‍යයෙන් සිය නිවෙස වූ මීරිගම බෝතලේ වලව්වට පැමිණෙන්නේ වාර අවසාන පාසල් නිවාඩුවට පමණි. වාර අවසාන නිවාඩුව ලබා තුන් සොහොයුරන් වලව්වට පැමිණෙන තුරු දොන් ස්ටෙපන් මුදලිතුමා බලා සිටින්නේ ඉවසුම් රහිතව ය. එවන් එක්තරා දිනක තුන් සොහොයුරෝ පාසල් නිවාඩුව ලබා වලව්වට පැමිණ සිටියහ. සිය දරුවන් තමා අසලට කැඳවා ගත් මුදලිතුමා දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය විමසන්නට විය.

එෆ්.ආර්. මේ පාර ඔබ පන්තියේ කී වැනියාද?

මේ වතාවෙ නම් පළවෙනියා වෙන්න බැරි වුණා. මං මේ පාර දෙවැනියා.

පුතා ඩී.සී. නුඹ කී වැනියාද? මේ වතාවේ

මම හතරවැනියා

ඩී.එස්.නුඹේ තත්ත්වය කොහොමද?

තුන්වැනියා

ඉගෙනීමට අනෙක් පුතුන් තරම් හපන්කමක් නොදැක්වූ ඩී.එස්. පන්තියේ තුන්වැනියා වීම ගැන මුදලිතුමා විස්මයට පත් විය. නමුත් පසුව දැන ගන්නට ලැබුණේ ඩී.එස්. ගේ පන්තියේ සිටින්නේ සිසුන් තිදෙනකු පමණක් බවයි. කුඩා කල සිටම දඩබ්බර ගති පෙන්වූ ඩී.එස්. ශිෂ්‍යයා පතපොත අධ්‍යාපනයේ එතරම් දක්ෂයකු නොවූවත් ක්‍රීඩාවට ශූරයෙක් විය. ක්‍රිකට්, මලල ක්‍රීඩා, පෝලෝ ආදී ක්‍රීඩාවලින් ශාන්ත තෝමසුවන් අතර කැපී පෙනෙන්නට ඩී.එස්. සේනානායක සිසුවා සමත් විය. අධ්‍යාපනයෙන් වඩාත් පරතෙරට ගමන් නොකළ ඩී.එස්.තරුණයා ලිපිකරුවකු වශයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයට පිවිසෙන්නේය. හැඩ දැඩි ප්‍රතාපවත් තරුණයෙක් වූ ඩී.එස්ගේ ප්‍රතාපවත් තේජස කාර්යාලයට අදින යුරෝපීය ඇඳුමෙන් තව තවත් ප්‍රතාපවත්ව දිස් විය. පැහැදිලි උච්චාරණය සහිත ඉංග්‍රීසි භාෂාවේ චතුර කථිකත්වය ඔහු සමග කතා බහ කරන කාගේත් සිත් ඇද බැඳ ගැනීමට හේතු විය. නමුත් ඩී.එස්. ගේ මෙම සුවිශේෂී ලක්ෂණ නොරිස්සූ අයෙක් කාර්යාලය තුළ සිටියේය. සුදු ජාතිකයෙක් වූ ඔහු නිතරම ඩී.එස්. ව අවඥාවට ලක් කරන්නට විය. ඩී.එස්.කිහිපවිටක්ම ඔහු විසින් කළ නෝක්කාඩු කතා ඉවසීය. නමුත් දිනක් තමාට නිකරුණෙ අපහාස කළ සුදු ජාතිකයාට පා පහරක් එල්ල කළ ඩී.එස්. තරුණයා නිවෙසට පැමිණියේ කාර්යාලයට අස්වීමේ ලිපිය ද බාර දෙමින් ය.

නිවෙසට පැමිණි ඩී.එස්. කාර්යාලයේදී සිදු වූ දේ සිය පියාට පවසා සිටියේය. එය සාවධානව ඇසූ මුදලිතුමා මෙතැන් පටන් නිවෙසේ සිට තමාගේ වතුපිටි බලා ගන්නැයි ඩී.එස්.පුතුට කියා සිටියේය. දොන් ස්ටෙපන් මුදලි සතුව වතුපිටි මෙන්ම ව්‍යාපාර කිහිපයක්ම විය. එම ව්‍යාපාර අතර මිනිරන් සහ කොප්පරා ව්‍යාපාරය ප්‍රධාන තැනක් ගත්තේය. මිනිරන් සහ කොප්පරා ව්‍යාපාර පිළිබඳව සොයා බැලුවේ පවුලේ මද්දුමයා වූ ඩී.එස්. සේනානායක විසිනි. ඒ වනවිට පවුලේ වැඩිමලා වූ ඇෆ්.ආර්. සේනානායක උසස් අධ්‍යාපන කටයුතු සඳහා එංගලන්තයට ගොස් සිටියේය.

1910 වසරේදී ඩී.එස්. සේනානායක තරුණයා විවාහ දිවියට එළැඹුණේ උඩරට දුනුවිල පරම්පරාවේ මොලී දුනුවිල කුමාරිහාමි සමඟය. 1911 වර්ෂයේදී ඔවුන් දෙපළට ඩඩ්ලි සේනානායක නමින් පුත්‍ර රත්නයක් උපන්නේය. පසුව ඩී.එස්. පවුලට තවත් පුත් රුවනක් එක් වන අතර ඔහුට රොබට් සේනානායක යන නම තබනු ලැබිය. මේ අතර කාලයේදී නිවසේ වතුපිටි බලා කියාගෙන සිටින ඩී.එස්. සේනානායක මහතාට අගනා තනතුරක් ලැබිණි. එවකට ලංකාවේ සිටි ආණ්ඩුකාරවරයා ශ්‍රී ලංකාවේ සහ මැඩගස්කරයේ මිනිරන් පිළිබඳ සොයා බලන්නට රාජකීය කොමිසමක් පත් කළේය. එය ත්‍රිපුද්ගල කමිටුවකි. සිය පවුලේ ව්‍යාපාරයක් වූ මිනිරන් පිළිබඳව සැලකිය යුතු දැනුමක් ඩී.එස්. සේනානායක තරුණයා සතු විය. එම කොමිසමේ සාමාජික ධුරයක් ඩී.එස්. සේනානායක මහතාට හිමිවන්නට එය හේතු විය.

මේ කාලය තුළ ඉංග්‍රීසින් විසින් ලක්දිව සිදු කළ සංස්කෘතික විනාශය එන්න එන්නම උත්සන්න වෙමින් පැවතිණි. ලක්දිව සෑම නගරයක් පාසාම තැබෑරුම් ව්‍යාපෘති කරමින් ලක්වැසියන් සුරා සොඬුන් බවට පත් කරවන්නට ඉංග්‍රීසිහු කටයුතු කළහ. ඒ තත්ත්වය තුළ ලක්දිව නායකයන් විසින් රට පුරාම අමද්‍යප ව්‍යාපාරයක් ගොඩනැගූ අතර හාපිටිගම කෝරලයේ අමද්‍යප සභාවේ නායකත්වයට ඩී.එස්. සේනානායක මහතා තේරී පත් විය.

තමුන්නාන්සේ හොඳ ව්‍යාපාරිකයෙක්, බෞද්ධයෙක්, ඒ වගේම හුගක් විසේ තියෙන මිනිහෙක් කියලත් ප්‍රකටයි. හැබැයි තමුන්නාන්සේ මේ තානාන්තරය බාර ගන්නවා කියන්නේ රහමෙර පානයෙන් වළකින්න ඕන කියන එකත් මතක තියා ගන්න යැයි අමද්‍යප ව්‍යාපාරයේ නායක තනතුර ඩී.එස්. සේනානායක මහතාට ලබා දෙන අවස්ථාවේ සංඝයා වහන්සේ නමක් කියා සිටියේය.

ඩී.එස්. සේනානායක එම අවවාදය තරයේම පිළිගත්තා සේම පිළිපැදීමද සිදු කළේය. අමද්‍යප උද්ඝෝෂණ ආදිය තුළින් බ්‍රිතාන්‍ය රජයට බලපෑම් කිරීමට ඩී.එස්. අමද්‍යප ව්‍යාපාරය හරහා නායකත්වය ලබා දෙන ලදී. ඩී.එස්.සේනානායක මහතා ජනතාව අතර වඩාත් ප්‍රසිද්ධියට පත් වන්නට හේතු වන්නේ 1915 වසරේ සිංහල, මුස්ලිම් කෝලාහාලයේදී ඇති වූ තත්ත්වයයි. අධිරාජ්‍යවාදීන් විසින්ම ඇති කළ මෙම කෝලාහලය ආණ්ඩු විරෝධී එකක් යැයි කියමින් අත්අඩංගුවට ගත් පිරිස අතර ඩී.එස්. සේනානායක මහතාද සිටියේය. එසේ අත්අඩංගුවට ගැනීමට රාජකීය පොලිසිය පැමිණෙන විටත් ඩී.එස්. සේනානායක මැතිඳුන් කුඩා ඩඩ්ලිව වඩාගෙන සිටි බව වාර්තාවල සඳහන් වෙයි. එසේ අත්අඩංගුවට පත් ව මාස හයක් පමණ සිර ගතව සිටී. ඩී.එස්. සේනානායක මහතාගේ ජනප්‍රියත්වය වර්ධනය වීමට එම සිද්ධිය හේතු විය.

1919 වර්ෂයේ නිර්මාණය වූ ලංකා ජාතික සංගමයේ ප්‍රබල ක්‍රියාකාරිකයන් අතර ඩී.එස්. සේනානායක මහතා ද ප්‍රමුඛත්වයක් ඉසිලීය. අමද්‍යප ව්‍යාපාරයේ මෙන්ම ලංකා ජාතික සංගමයේ ජාතික නායකයෙක් වූ තම සොහොයුරු එෆ්.ආර්. සේනානායකට අගනා සහයක් ඩී.එස්.සේනානායකයෝ ලබා දුන්හ.

ඩී.ඇස්. සේනානායක මහතා ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකු ලෙස සිදු කළ කාර්ය භාරය සුළුපටු නොවේ. එහිදී ඩී.ඇස්. සේනානායකයෝ වාරි කර්මාන්තය සහ කෘෂි කර්මාන්තය සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී. එසේම කෘෂි කර්මාන්තය ජීවනෝපාය කරගෙන ජීවත්වන ගැමි ජනයාගේ ජීවන තත්ත්වය නගාසිටුවීම උදෙසා ව්‍යවස්ථාදායක සභාවේ ඩී. එස්. ප්‍රකාශ කළ අදහස් ද කැපී පෙනෙන්නට විය. ඒ හේතුවෙන් 1927 වර්ෂයේදී ආණ්ඩුකාර හියු ක්ලිෆර්ඩ් විසින් ඩී.එස්. සේනානායක මහතාව ඉඩම් කොමිසමේ සාමාජිකයෙක් වශයෙන් පත් කරන ලදී. ඩී. එස්. මහතා එවකට ව්‍යවස්ථාදායක සභාවේ දැරූ සාමාජිකත්වය නිල නොලත් ධුරයක් වූ අතර, නිල නොලත් අයෙකුට කොමිසමක සාමාජිකත්වයක් හිමි වූයේ කලාතුරකින් බව ද සඳහන් කළ යුතුය.

මේ අතර, රජරට දුම්රිය මාර්ගය මඩකලපුව දක්වා දීර්ඝ කිරීම නිමිත්තෙන් සිදු වූ මංගල දුම්රිය ගමනට ඩී.එස්. සේනානායක මහතා ද එක්විය. මංගල ගමනට එක් වූ දුම්රියවල වැසිකිළි පහසුකම් නොවීම නිසා ප්‍රහුන්ට එම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා දුම්රිය හතමුණේ ප්‍රදේශයේ නවත්වනු ලැබිය. එහිදී බොහෝදෙනා අසල කැලෑ රොදවල්වලට රිංගා තම බර සැහැල්ලු කර ගත් අතර, එහිදී ඩී. එස්. සේනානායක මහතාගේ නෙත ගැටුණු දර්ශනයකින් ඔහු අතිශයින්ම කම්පාවට පත් විය. මින්නේරිය වැව් කණ්ඩිය බිඳී ජලය අපතේ යන අයුරු ඩී. එස්. සේනානායක මහතාගේ නෙත ගැටිණි. අතීත රජ දරුවන්ගේ මහන්සිය අපතේ යෑමට ඉඩ නොදීම, එම සම්පත්වල ප්‍රයෝජනය අනාගත පරපුරට ද දායාද කිරීමට කටයුතු කිරීම පිළිබඳව සිතුවිල්ලක් ඩී.එස්.ගේ සිතෙහි උපන්නේ එම අහඹු දසුන නෙත ගැටීමෙන් පසුවය.

වසර ගණනාවක් සිතේ රඳවාගෙන තිබූ එම අදහස ක්‍රියාවට නැංවීමට ඩී. එස්. සේනානායකයන්ට අවස්ථාවක් ලැබෙන්නේ 1931 වසරේ එතුමා කෘෂිකර්ම හා ඉඩම් ඇමැති ධුරයේ දිවුරුම් දීමෙන් අනතුරුවය. ඒ සඳහා 1931 වර්ෂයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඔහු තේරී පත්වන්නේ මිනුවන්ගොඩ ආසනයෙනි. 1931 වර්ෂයේ ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ පිහිටු වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ළාබාලතම අමාත්‍යවරයා වීමට ද ඔහුට වාසනාව උදා විය. එවකට ඩී. එස්. සේනානායකයෝ 47 වැනි වියේ පසු වූහ.

ඩී. එස්. කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය ධුරයට පත් වන විට එම ක්ෂේත්‍ර තුළ ගැටලු රාශියක්ම උද්ගතව තිබුණි. නියඟය, ශ්‍රම බළකායේ අඩුව, වන සතුන්ගෙන් වගාවන්ට සහ මිනිසුන්ට ඇති වන උවදුරු, මැලේරියා වසංගතය ආදී ප්‍රශ්න රාශියකට ඩී. එස්. පිළිතුරු සෙවිය යුතු විය.

අපට ගැලවෙන්නට ඇති එකම මඟ වියළි කලාපයේ ගොවි ජනපද පිහිටුවීම පමණියි. රටේ විවිධ ප්‍රදේශවල ජනගහනය බෙදී ඇති ආකාරය කෙබඳු ද යත් අනවශ්‍ය ලෙස අධික ජනගහනයක් ඇති ප්‍රදේශවලින් අඩු ජනගහනයක් ඇති ප්‍රදේශ කරා සංක්‍රමණය වීම අප තෝරා ගන්නා විකල්පයක් නොව අප්‍රසන්න වුවත් අනිවාර්යයෙන්ම කළ යුත්තක් බවට කල් නොගොස්ම වැටහෙනු ඇත.

ඩී.එස්. සේනානායක මහතා 1932 වර්ෂයේදී එසේ තර්ක කොට තිබුණි. ඩී.එස්.ගේ යෝජනාවලට ව්‍යවස්ථාදායක සභාවේ ඇතැමුන්ගේ විරෝධතා එල්ල වූවත් වාද විවාද කොට ඒවා ජය ගැනීමට ඩී.එස්. සේනානායක මහතා සමත් විය. 1930 දශකයේ ඇති වූ ආර්ථික අවපාතය ජය ගැනීමට එකම මාර්ගය ගොවි ජනපද ඇති කිරීමය යන ඩී.එස්. ගේ අදහසට ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතිය හිමි විය.

මඩකලපුව දුම්රිය ගමනේදී ඩී.එස්. සේනානායකයන්ගේ සිතෙහි නැඟුණු සිතිවිල්ල යථාර්ථයක් බවට පත් වන්නේ 1934 වර්ෂයේදීය. එනම් ගොවි ජනපද ව්‍යාපාර ව්‍යාපෘතියේ පළමු පියවර වශයෙන් මින්නේරිය ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කිරීමට ඩී. එස්. මැතිඳුන්ට හැකියාව ලැබීමයි. එහිදී මින්නේරිය වැව් ජලය ගොවියන්ගේ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීමට අවකාශය සැලසුණි. එතුළින් පොළොන්නරු දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමට කටයුතු සැලසීම ඩී. එස්.ගේ අභිප්‍රාය විය.

මුල සිටම ලක්දිව නිදහස් අරගලයේ, පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ ඩී.එස්.සේනානායක ඇමැතිවරයා 1946 වර්ෂයේදී සිය කැබිනට් අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස් විය. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙන් පසු හඳුන්වා දීමට නියමිතව තිබූ සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ඇතැම් ප්‍රතිපත්තිවලට විරෝධය පළ කිරීම, අධිරාජ්‍යවාදීන්ගෙන් රටට නිදහස ලබාගැනීම යන අරමුණු පෙරදැරි කරගෙන ඩී.එස්. ගේ ඉල්ලා අස්වීම සිදු විය. ඒ සමඟ එවකට ලක්දිව ප්‍රබලව ඉස්මතුව පැවති සිංහල මහා සභාව, ලංකා ජාතික සංගමය, මුස්ලිම් සංගමය වැනි ජාතික සංවිධාන රැසක් එක් කරමින් එක්සත් ජාතික පක්ෂය නිර්මාණය කිරීමට මෙතුමා කටයුතු කළේය. ඩී.එස්. ගේ නායකත්වය ඇතිව රටේ ප්‍රධාන සංවිධාන එකමුතුවෙන් නිර්මාණය කළ එක්සත් ජාතික පක්ෂය තුළින් ලක්දිව නිදහස් සටනට පුරෝගාමී මෙහෙවරක් ඉටු කරන ලදී. ඩී.එස්. සේනානායක මහතා එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට පත් වූ අතර, එහි කැඳවුම්කරු වූයේ ජේ.එල්.කොතලාවල මහතාය. පක්ෂයේ සභාපති ලෙස ඩී.එස්. සේනානායක මහතා තේරී පත් වූ අතර, උප සභාපතිවරු ලෙස ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, ටී.බී.ජයා, අරුණාචලම් මහාදේව, ජෝන් කොතලාවල, ජෝර්ජ් ආර්. සිල්වා යන මහත්වරු තේරී පත් වූහ. මහ ලේකම් ලෙස එච්.එම්. අමරසූරිය මහතාත් භාණ්ඩාගාරිකවරුන් ලෙස ජේ.ආර්. ජයවර්ධන සහ ඒ.ආර්.ඒ. රෂීක් යන මහත්වරු තේරී පත් වූහ.

අධිරාජ්‍යවාදීන්ගෙන් ලක්දිව ලැබූ නිදහස, ගල් ඔය ව්‍යාපාරයෙන් පල ලැබූ කෘෂි කර්මාන්තයේ රන් අස්වනු මෙන්ම සේනානායක සමුද්‍රය, කොළඹ නිදහස් චතුරස්‍රය, එතුමා විසින් බිහි කළ එක්සත් ජාතික පක්ෂය ආදිය ඩී.එස්.සේනානායක නාමයේ ඊවමාන සිහිවටන වෙයි. එතුමා නිර්මාණය කළ උක්ත සංවිධාන, ව්‍යාපාර තුළින් අදට ද ජාතියට සිදුකෙරෙන සේවාව අති මහත්ය. 1952 වර්ෂයේදී එතුමා ජාතිය හැර නික්ම ගියත් මෙලොව පවතින තුරු එතුමාගේ නාමය නොනැසී පවතිනු , කිසිදු සැකයක් නැත.

පසිඳු මිහිරාන් රුවියල

කට නිසා පැරදුණු නාත්තණ්ඩියේ අතුරු ජන්දය

ආර්. ඇස්. පෙරේරා මහතා

එක්දහස් නවසිය හැට සිට හැත්තෑ පහ දක්වා කාලය තුළ දේශපාලන රැස්වීම් සඳහා ජනතාව සහභාගි වූයේ අදට වඩා මහත් වුවමනාවකිනි. ප්‍රධාන දේශපාලන පක්ෂ සියල්ලක්ම රැස්වීම්වලට බස් පුරවා සෙනඟ ඇදීම දැන් පුරුද්දක් වී තිබේ. එක්සත් ජාතික පක්ෂයට හිතවත් අය ඩඩ්ලි සේනානායක මහතා බැලීමටත්, ශ්‍රීලනිපයට හිතවත් අය සිරිමා බණ්ඩාරනායක මහත්මිය බැලීමටත් දැක්වූ උනන්දුව වැඩිහිටි අයට හොඳින් මතකයේ රැඳී තිබෙනු නිසැකය.

1960 ජූලි මැතිවරණයේදී මැතිනිය විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ලොව ප්‍රථම අගමැතිනිය ලෙස දිවුරුම් දුන්නාය.

මේ තුළින් මෙරට ජන සමාජයේ ඇති වූ පිබිදීමත් සමඟ මැතිනිය සහභාගි වන දේශපාලන රැස්වීම් බලන්නට, මැතිනිය දැකගන්නට පැමිණෙන ජනතාව අතර කාන්තා ප්‍රතිශතය ඉහළ යෑමට ද පටන් ගත්තේය.

මේ දිනවල රැස්වීම් බැලීම සඳහා ජනතා සහභාගිත්වය ඉහළ යාමට හේතු වූ ආකර්ෂණීය කථිකයෝ ද තදින් බලපෑවෝය.

මෙම කථිකයන් අතර යටිදැරියේ වජිරබුද්ධි, දැවමොටිටාවේ අමරවංශ වැනි හිමිවරු ද, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ස්ටැන්ලි තිලකරත්න, ආර්. ඇස්. පෙරේරා, එච්. ඊ. ඇස්. රත්නවීර, අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල වැනි කථිකයන් මෙන්ම විවියන් ගුණවර්ධන, නන්දා ද සිල්වා වැනි කාන්තා චරිතයන් ද සිහියට නැඟෙති.

මේ අතරින් කැලණියේ මන්ත්‍රීවරයාව සිටි ආර්. ඇස්. පෙරේරා මහතාගේ කතා කෙරෙහි විවිධ පාර්ශ්වයන්ගෙන් දෝෂාරෝපණ ද එල්ල වන්නට විය. ඊට හේතු වූයේ එතුමා විසින් බෞද්ධ ජනතාව වන්දනා මානයට යොදාගන්නා ගාථා වර්තමානයට ගළපා දේශපාලන වේදිකාවේදී ව්‍යවහාරයට ගැනීම නිසාය.

වරක් කොළොන්නාව අතුරු මැතිවරණයකදී එතුමා කළ කතාවක් බලවත් තර්ක විතර්කයන්ට ලක් විය.

ශ්‍රී ලංකා - සමසමාජ - කොමියුනිස්ට් පක්ෂ වෙනුවෙන් කොළොන්නාව ආසනයට ඉදිරිපත් කර තිබුණේ ටී. බී. ඉලංගරත්න මහතාය. එජාපය ඇතුළු පක්ෂවලින් ඉදිරිපත් කළ අපේක්ෂිකාව වූයේ කුසුමා ගුණවර්ධන මහත්මියයි.

කොළොන්නාව රැස්වීම් වේදිකාවකදී ආර්. ඇස්. පෙරේරා මහතා සිය කතාව අතරමැද මිත්‍රවරුනි, මේ මැතිවරණ ජයග්‍රහණය අපට එතරම් ප්‍රශ්නයක් නොවෙයි. බුද්ධාගමේ ගාථාවකිනුත් කියල තියෙනවා කුසුමා දිනන්නේ නැත කියල. කුසුමේන නේන කියල. පූජේමි බුද්ධං කුසුමේන නේන' කියන ගාථාව කියවල බලන්න.

බුද්ධාගමේ ගාථාවක් විකෘති කළේ යැයි එජාප වේදිකාවෙන් ආර්. ඇස්. පෙරේරා මහතාට චෝදනා එල්ල වුණේය. එහෙත් ජනතාව ඔහුගේ මේ කතාවලට රිසියක් දැක්වූ බව පෙනෙන්නට තිබිණි.

මේ අතර තවත් අතුරු මැතිවරණයක් එළඹිණි. ඒ 1968 ජනවාරි 5 දින පැවැත්වූ නාත්තන්ඩිය අතුරු මැතිවරණයයි. එක්සත් ජාතික පක්ෂයෙන් මැතිවරණයට තරග කළේ හිටපු කතානායකවරයකු ද වන හියු ෆනාන්දු මහතාය. ශ්‍රී ලංකා - සමසමාජ කොමියුනිස්ට් කඳවුරු වෙනුවෙන් ප්‍රෝටස් තිසේරා මහතා ඉදිරිපත් විය.

මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වූයේ ටී. බී. සුබසිංහ මහතායි. මමත් වත්තල ආසනයේ එවකට ශ්‍රීලනිප සංවිධායකවරයාව සිටි දොස්තර ඒ. ඩී. ජේ. එල්. ලියෝ මහතාත් කිසියම් කාරණයකට සුබසිංහ මහතා හමුවීමට ගිය මොහොතක තරුණයා නාත්තන්ඩියට ගිහිල්ල ප්‍රෝටස්ට උදව් කරන්න යැයි සුබසිංහ මහතා මට කීවේය. මම කැමැති වීම්. ප්‍රෝටස්ට දෙන්නැයි මාව හඳුන්වා දෙමින් ලියුමක් ද දුන්නේය.

නාත්තන්ඩියට ගිය මා මාසයක පමණ කාලයක් එහි නතර වී ඡන්ද වැඩ කළෙමි.

මාත් සමඟ රටේ විවිධ ප්‍රදේශවලින් පැමිණි තරුණයන් රැසක් විය. අපි උදේ දහවල් නොබලා ගෙයින් ගෙට කැන්වසින් ගියෙමු. රැස්වීම් සංවිධානයට ගම්වල පක්ෂ සංවිධානවලට උදව් කළෙමු. සැන්දෑවේ රැස්වීම් ද ඇමතුවෙමු.

එහි මරඳ නමින් ගමක් විය. නාත්තණ්ඩිය ආසනයේ වැඩි ජනතාවක් කතෝලික වුවද බෞද්ධ ගම්මාන රැසක් ද විය. මරඳ බෞද්ධ ජනයා වැඩියෙන් වාසය කළ ගමකි. ප්‍රදේශයේ ගම්වල කොටස් කොටස් වෙන් කර ගෙන නිතර නිතර ගෙවල්වලට ගොස් ජනයා සමඟ හිතවත්කම් ගොඩනංවා ගනිමින් කටයුතු කිරීම නිසා ඔවුන් සමඟ දැඩි ඇඟැලුම්කමක් අපි ඇතිකරගෙන සිටියෙමු.

මරඳ ගමේ ද රැස්වීමක් සූදානම් විය. ආර්. ඇස්. පෙරේරා මහතා ද කතිකයෙක් විය. රැස්වීම අමතමින් සිටියදී කතාව අතරතුර ආර්. ඇස්. පෙරේරා මහතා ධම්ම පදයේ එන ගාථාවක් කියා වර්තමානයට ගැළපුවේය.

අසේව නාව බාලානං - ඒ කියන්නේ මෝඩයෝ, අනුවණයෝ ආශ්‍රය කරන්නට එපා. හාල් කපල. බඩු මිල නග්ගල මිනිස්සු විපතට දාපු යූ. ඇන්. පී. කාරයෝ වගේ අය ආශ්‍රය කරන්න එපා කියන එකයි.

පණ්ඩිතානංච සේවනා - පණ්ඩිතයෝ ආශ්‍රය කරන්න. කවුද පණ්ඩිතයෝ කියන්නෙ. මේ ශ්‍රී ලංකා කාරයෝ - මිනිස්සු වෙනුවෙන් සේවයට කැප වෙලා ඉන්න අපි වගේ අය. ප්‍රෝටස් තිසේරා වගේ අය ආශ්‍රය කරන්න.

පූජාව පූජනීයානං - අන්න බලන්න පිදිය යුත්තන් පුදන්න. ඡන්දය දෙනකොට යූ. ඇන්. පී. කාරයො වගේ බාලයන්ට ඡන්දය නොදී ප්‍රෝටස් තිසේරා වගේ ශ්‍රී ලංකා කාරයන්ට ඡන්දය දෙන්න.

ඒතං මංගල මුත්තමං - යූ. ඇන්. පී. කාරයො වගේ බාලයන්ට ඡන්දය පාවිච්චි නොකර ප්‍රෝටස් තිසේරා ජයග්‍රහණය කරවන්න. ප්‍රෝටස්ට ඡන්දය දෙන්න. ඒක මංගල කාරණයක් කියලයි මේ ගාථාවෙන් කියල තියෙන්නෙ. හාල් කපල - බඩු මිල නංගල මේ අය ගෙවල්වලට ඒවි. කොස්ස, ඉදල ගන්නයි වවින්නේ

රැස්වීමේ සිටි ජනතාව ඔහුගේ කතාවට වශී වී සිටියේ. වරින්වර අත්පොළසන් නැඟිය. අපි ද අත්පොළසන් දෙමින් සිනාසෙමින් ඔහුගේ රසබර කතාවෙන් සතුටට පත්ව සිටියෙමු.

පසුදින අපි සුපුරුදු ලෙස ගෙවල්වලට කැන්වසින් ගියෙමු. වෙනදා හිතවත්කමින් කතා කළ ගම්මු අපව නුරුස්නා බවක් පෙන්වූහ.

එක් ගෙදරකට ගිය විට වෘත්තියක් ලෙස රා නිෂ්පාදනයට යාමට සූදානම් ඇඳුමින් ලැහැස්තිව විශාල පිහියක් ද ඉනේ ගසා සිටි අයෙක් අන්න මහත්තයො කොස්ස, අර තියෙන්නෙ ඉලපත. ඕව අතට අරන් එලවන්නයි වවින්නෙ. ඒත් අපි එහෙම කරන්නෙ නෑ කියා අපිව ගණන් නොගෙනම ඔහු යාමට සැරසී සිටි ගමන යන්නට ගියේය.

වී ඇති සිද්ධිය අපට විස්තර කළේ ඒ පුද්ගලයාගේ බිරිඳයි.

මහත්තයො... ඊයේ රෑම පන්සලේ හාමුදුරුවො සීනුව ගහල ගමේ මිනිස්සු කැන්දුවා. අර ආර්. ඇස්. පෙරේරා කියන කතෝලිකයා ඇවිත් ඊයේ අපේ බුද්ධාගමට නිග්‍රහ කළා. බුදුහාමුදුරුවන්ගෙ කාලෙ යූ. ඇන්. පී. කාරයො හිටියද? ශ්‍රී ලංකා කාරයො හිටියද? යූ. ඇන්. පී කාරයො හරි කවුරු හරි ආශ්‍රය කරන්න එපා කියල ඒ ගාථාවෙ කියල තියෙනවාද? නෑ. ඒ කතෝලිකයා කළේ අපේ ආගමට නිගාවක්. දැක්කනේ ගෙවල්වලට ආපුවම ඉලපත, කොස්ස ගන්න කියල මිනිස්සුන්ට උගන්වනවද? අපේ ආගමට නිග්‍රහ කරන එවුන්ට ඡන්දය දෙන්න එපා කියල හාමුදුරුවො කිව්වා.

අවසන් මොහොතේ ගමේ ජනයාගේ තීරණය වෙනස් වී ඇති බව අපට පැහැදිලි විය. මැතිවරණයේ ජයග්‍රහණයට එය විශාල බලපෑමක් වී තිබුණු බව ද මැතිවරණ ප්‍රතිඵලයෙන් පැහැදිලියි. ප්‍රෝටස් තිසේරා මහතා පැරදී තිබුණේ ඡන්ද දෙසිය ගණනකිනි.

දයා සෝමසිරි

දේශවංශය
දේශයේ පාලන මාවත

සංස්කරණය - උදිත ගුණවර්ධන

දේශවංශය ගැන ඔබේ අදහස් අපට කියන්න

"දේශවංශය" දිනමිණ

ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.

deshawanshaya@lakehouse.lk

අවශ්‍ය ඕනෑම මොහොතක ක්‍රියාත්මක වෙන්න අප සූදානම්

ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුමංගල ඩයස්

මහින්ද අලුත්ගෙදර

රටේ ජාතික ආරක්ෂාව පසුගිය කාලයේ යම් කිසි ආකාරයකින් අභියෝගයකට ලක් වුවද අද වන විට ඒ සම්බන්ධව සිදු විය යුතු සියලු දෑ නියමාකාරයෙන් සිදු වන බව ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුමංගල ඩයස් මහතා 'දිනමිණ' ට පැවසීය.

අවශ්‍ය ඕනෑම අවස්ථාවක ක්‍රියාත්මක වීම සඳහා ශ්‍රී ලංකාවේ හමුදාවන් සූදානම්න් සිටින බව පෙන්වා දුන් ඒ මහතා, පසුගිය සමයේ ඇති වූ තත්ත්වයන් හෝ ඉදිරියේ දී යම්කිසි ආකාරයකින් සිදු විය හැකි තත්ත්වයන් මෙන්ම ආපදා තත්ත්වයකදී වුවද කටයුතු කිරීම සඳහා හමුදාවක් ලෙස සූදානම්න් පසුවන අවස්ථාවක ශ්‍රී ලංකා ගුවන් හමුදාවද ඕනෑම මොහොතක ඕනෑම අභියෝගයකට මුහුණ දීමට සූදානම් බවයි.

රටේ ජාතික ආරක්ෂාව සහතික කිරීම වෙනුවෙන් මේ වන විට සියලු පියවර ගෙන තිබෙන බව පෙන්වා දුන් ගුවන් හමුදාපතිවරයා, රට අභ්‍යන්තරයේ මෙන්ම ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවේ සිදු වන දේ නිරීක්ෂණය කිරීමද ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කරනු ලබන බවද කියා සිටියේය. හෙතෙම වැඩිදුරටත් පෙන්වා දුන්නේ, මෑතකදී ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාවේ ගිනි ගැනීමකට ලක් වුණු එම්.ටී. නිව් ඩයමන්ඩ් නෞකාවේ ගින්න පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සුවිශේෂී දායකත්වයක් ලබා දුන් බවයි. හමුදාවක් වශයෙන් මේ දක්වා ගුවන් හමුදාව පැමිණි ගමන් මග ලෙහෙසි පහසු නොවන බව සිහිපත් කරන සුමංගල ඩයස් මහතා, දශක තුනකට ආසන්න කාලයක් මේ රටේ පැවැති ත්‍රස්තවාදය සම්පූර්ණයෙන්ම අවසන් කරන්නට විශාල කැපකිරීම් සිදු කර තිබෙන බවත් මේ දක්වා කාලය තුළ රටට අවශ්‍ය සේවය ගුවන් හමුදාව විසින් උපරිමයෙන් ලබා දී තිබෙන බවත් පෙන්වා දුන්නේය.

යුද්ධයකින් පසුව රටක් සාමයට අවතීර්ණ වූ පසුව ගුවන් හමුදාවකින් ඉටු විය යුතු යුතුකම් කොටස මේ වන විට ඉටු කරමින් සිටින බවද අද වන විට ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඉතාම ඉහළ තාක්ෂණයෙන් යුතු මෙවලම් ප්‍රයෝජනයට ගන්නා බවද පැවසූ ඒ මහතා, මේ වන විට තම හමුදාවට පැවරී තිබෙන කාර්යය ඉටුකිරීම වෙනුවෙන් පියවර ගෙන තිබෙන බවද කීවේය. හෙතෙම වැඩිදුරටත් කියා සිටියේ, රටේ ඇති වන ආපදා තත්ත්වයකදී ඊට මුහුණ දීමට සූදානමින් සිටින අතරතුර ගුවන් හමුදාව ආවේක්ෂණ හා නිරීක්ෂණ කටයුතු සිදු කරන බවයි. අපේ රට තුළ මෙන්ම අපට අයත් මුහුදු තීරයේ සිදු වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් හොඳින් නිරීක්ෂණය කරන බවද පැවසූ ගුවන් හමුදාපතිවරයා, මේ සඳහා අවශ්‍ය පහසුකම් සලසන අතර එම කටයුතු අඛණ්ඩවම ක්‍රියාත්මක බවද පෙන්වා දුන්නේය.

කොවිඩ් වසංගතය මෙරටට පැමිණි අවස්ථාවේ සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සෑම අංශයක්ම එම වසංගතයේ ව්‍යාප්තිය නතර කිරීම වෙනුවෙන් අවශ්‍ය සෑම සහයෝගයක්ම ලබා දුන් බවත් චීනයේ වුහාන්හි සිට සිසුන් 33 දෙනා මෙරටට ගෙන්වා ගත් මොහොතේ සිට අවශ්‍ය සෑම සහයෝගයක්ම ලබා දෙන බවද මේ සඳහා ගුවන් හමුදාව සතු දැනුම, හැකියාව, පුහුණුව ආදිය බෙහෙවින් ඉවහල් වූ බවද හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.

පාතාල හා ව්‍යාපාරික වුවමනාවන්ට කෙරෙන ගම්පහ අනවසර ගොඩ කිරීම් වහා නවත්වන්න

මහින්ද අලුත්ගෙදර

ගම්පහ දිස්ත්‍රික්කයේ සිදු වන අනවසර ගොඩ කිරීම්වලට එරෙහිව වහා පියවර ගන්නැයි සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට උපදෙස් දී තිබේ.

ඉතා කුඩා වැස්සකදී වුවද ගම්පහ දිස්ත්‍රික්කයේ ඇතැම් ස්ථාන ජලයෙන් යට වෙන බව පෙන්වාදෙන ඒ මහතා, දිස්ත්‍රික්කය පුරා ඇති අනවසර ගොඩකිරීම් මේ තත්ත්වයට හේතුවක් වී තිබෙන බවත් මෙම අනවසර ගොඩකිරීම්වලට ජනතාව දේශපාලනඥයන්ට ඇඟිල්ල දිගු කළද දේශපාලනඥයන්ගේ විරෝධය පවා නොතකා ව්‍යාපාරිකයන්ගේ හා පාතාලයේ මැදිහත් වීම් මත ඉඩම් ගොඩකිරීම් සිදුව ඇතැයි ද පෙන්වා දුන්නේය.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට එක් වෙමිනි. මෙම රැස්වීම එම කමිටුවේ සම සභාපතිවරුන් වන බස්නාහිර පළාත් ආණ්ඩුකාර එයාර් මාෂල් රොෂාන් ගුණතිලක, ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප් විතාන යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙවර ගම්පහ දිස්ත්‍රික්කයේ ජල ගැලීම් හේතුවෙන් පවුල් 6,490ක් පීඩාවට පත්ව තිබෙන බවට මෙහිදී කරුණු අනාවරණය වූ අතර මෙම ජල ගැලීම්වලට හේතුව සොයා බලන ලෙසත් මේ සඳහා බලපා තිබෙන කරුණු 185 වෙන් වෙන් වශයෙන් විමර්ශනය කර ඒවාට කඩිනමින් විසඳුම් ලබා දෙන ලෙසත් ඒ මහතා මෙහිදී උපදෙස් දී තිබේ.

හිටපු ඇමැති බැසිල් රාජපක්ෂ මහතා ගම්පහ දිස්ත්‍රික්කයේ නායකයා වශයෙන් කටයුතු කළ සමයේ සෑම ඇළ මාර්ගයක්ම ශුද්ධ පවිත්‍ර කළ බව සිහිපත් කරන ඒ මහතා, යහපාලනය ඒ සියල්ල අතහැර දැමූ බවත් චත්මන් රජය විසින් එම ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීමේ වැඩසටහන යළි ආරම්භ කරන ලද බවත් කියා සිටියේය. ඒ වෙනුවෙන් මුදල් වෙන් කිරීමටද සූදානම් බව පෙන්වා දෙන සංචාරක ඇමැතිවරයා නැවත ගම්පහ ජලයෙන් යට වීමට ඉඩදිය යුතු නැතැයිද එසේ වුවහොත් ජනතාව දොස් නඟන්නේ දේශපාලනඥයන්ට බවද කියා සිටියේය. මෙම අනවසර ගොඩ කිරීම්වලට අනුමැතිය හෝ දී නොමැති අතර මේ සඳහා අනුමැතිය දුන්නේ කවුරුන්දැයි ප්‍රශ්න කරන ප්‍රසන්න රණතුංග මහතා කෙසේ අනුමැතිය දෙන්නේ දැයිද විමසීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා අවධාරණය කර සිටියේ, ආයතන ප්‍රධානීන් ආසනයෙන් ආසනයට ගොස් මේ විනාශය වළක්වා ගැනීමට කටයුතු කළ යුතු අතර අනවසර ගොඩකිරීම්වලට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස බොරු පවසා නොමඟ යැවීමෙන් වැළකී සිටින ලෙසයි.

ශ්‍රී ලංකාවේ ඇෆ්ගන් තානාපති නාවික හමුදාපති හමු වෙයි

රක්ෂණ ශ්‍රියන්ත

ශ්‍රී ලංකාවේ ඇෆ්ගනිස්ථානු ඉස්ලාමීය ජනරජයේ තානාපති, එම්. අෂ්රෆ් හයිදාරි (M Ashraf Haidari) මහතා පෙරේදා (16) නාවික හමුදා මූලස්ථානයේදී නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා හමු විය.

මෙම හමුවේදී ඇෆ්ගනිස්ථානු තානාපතිවරයා විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ 24 වැනි නාවික හමුදාපති ලෙස පත්වීම සම්බන්ධයෙන් උළුගේතැන්න මහතා වෙත සිය සුභාශිංසන පිරිනැමීය. අනතුරුව ඔවුන් දෙපළ ශ්‍රී ලංකාව සහ ඇෆ්ගනිස්ථානය අතර ඇති දිගුකාලීන සබඳතාවය හා සහයෝගීත්වය සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් කරුණු පිළිබඳ සුහද පිළිසඳරකද නිරත වූහ.

සුහද හමුව සනිටුහන් කරමින් නාවික හමුදාපතිවරයා සහ ඇෆ්ගනිස්ථානු තානාපතිවරයා අතර සමරු තිළිණ හුවමාරුවක්ද සිදු විය.

වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උමාඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

පහළ නිමින සංවර්ධනය

2020 වසර සඳහා ට්පර් රථ (3,5 Cube) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2020 වසර සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් විසින් සපයා ඇති ට්පර් රථ (3,5 Cube) දැනට සිදුකෙරෙමින් පවතින ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බැවින්, මෙම වසරේ ඉදිරි කාලය සඳහා ට්පර් රථ සැපයීමට සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන්, ආයතන වලින් හෝ ප්‍රජා මූල සංවිධාන වලින් ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවීමට නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇත.

2020 වසර සඳහා මේ වන විට අනුමත වී ඇති මිල ගණන් යටතේ ට්පර් රථ (3, 5 Cube) සැපයීමට එකඟතාවයක් දක්වනු ලබන සැපයුම්කරුවන්, ආයතන හෝ ප්‍රජා මූල සංවිධාන වලට මේ සඳහා අයදුම් කළ හැකිය.

අයිතමය	ඒකකය	2020 වසර සඳහා අනුමත මිල ගණන් රු. (වැට් රහිත)
ට්පර් රථ (කියුබ් 03)	මීටර් පැය 01 ට	1,450.00
ට්පර් රථ (කියුබ් 05)	මීටර් පැය 01 ට	2,630.00

01. ලියාපදිංචි වීම සඳහා අයදුම්පත්‍ර නැවත නොගෙවෙන රු. 1,000.00 මුදලක් ගෙවීමෙන් පහත සඳහන් ලිපිනයේ පිහිටා ඇති උමාඔය පහළ නිම්න සංවර්ධන නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කර්යාලයෙන් ලබාගත හැකිය.

02. දැනට පවතින ඉදිකිරීම් අවශ්‍යතා අනුව කුලී පදනම මත ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉහත සඳහන් ධාරිතාවයන් සහිත ට්පර් රථ ප්‍රමාණය සීමාසහිත වේ. එබැවින් ලියාපදිංචි කර ගැනීම පළමුව අයදුම් කරන සැපයුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබාදීමේ පදනම.

03. ට්පර් රථ සේවයේ යෙදවීමට බලාපොරොත්තු වන වැඩබිම් පිහිටි ස්ථාන පහත පරිදි වේ.
- අ) අලිකොටආර ජලාශය හා ඇළ මාර්ග ඉදිකිරීමේ වැඩබිම් – වැල්ලවාය නගරයේ සිට කි.මී. 05 දුරින් පිහිටා ඇත.
- ආ) හඳපානාගල ජලාශය හා ඇළ මාර්ග ඉදිකිරීමේ වැඩබිම – වැල්ලවාය නගරයේ සිට කි.මී. 15 දුරින් පිහිටා ඇත.
- ඇ) කුඩාඔය ජලාශය හා ඇළ මාර්ග ඉදිකිරීමේ වැඩබිම – තණමල්විල නගරයේ සිට කි.මී. 25 දුරින් පිහිටා ඇත.
- ඈ) තණමල්විල හා වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි අනෙකුත් වැඩබිම්.

04. කුලී පදනම මත සපයනු ලබන ට්පර් රථ සඳහා ඉන්ධන, ලිහිසි තෙල්, රියදුරු, රිය සහායක යනාදිය සැපයුම්කරු විසින් සැපයිය යුතුය. අවශ්‍යවන අලුත්වැඩියාවන් ද සැපයුම්කරු විසින් ඉටුකළ යුතුය.

05. මේ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන්ට වැඩිදුර තොරතුරු නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැක. (දුරකථන අංකය : 071-9567353)

06. ලියාපදිංචිය සඳහා අවශ්‍ය ලිපි ලේඛන පරීක්ෂා කිරීම, ලබා ගැනීම හා භාරදීම සතියේ වැඩ කරන දිනවල පැය 9.00 ත් පැය 15.00 ත් අතර කාලයේදී නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයට ඉහත සඳහන් මුදල මුදලින් ගෙවීමෙන් සහ අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කිරීමෙන් සිදු කරගත හැකිය.

07. කුලී පදනම මත ලබා ගන්නා ට්පර් රථ සඳහා ගිවිසුම් අත්සන් කිරීම ලියාපදිංචි ආයතන හෝ පුද්ගල නාම යටතේ පමණක් සිදුකරනු ලැබේ.

08. ට්පර් රථ සැපයීම සඳහා අයදුම්කරුගේ නමට එම රථ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

09. සැපයුම්කරුවන් මීට පෙර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය ආයතනයක අසාධු ලේඛනගත නොවී තිබිය යුතුය.

10. වැට් ගෙවීමේ ප්‍රතිශතය රජය විසින් ඒ ඒ අවස්ථාවල ප්‍රකාශයට පත් කරන ආකාරයට ගණනය කරනු ලැබේ.

11. ට්පර් රථ සැපයුම්කරුවන් ලියාපදිංචිය සිදුකිරීම සඳහා තීරණ ගැනීම නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ.

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය,
උමාඔය පහළ නිම්න සංවර්ධනය,
කිතුල්කොවේ, තණමල්විල.
තැ. අංකය (91300)

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
දුරකථන අංකය : 071-9567353
2020.09.18

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහාමාර්ග අමාත්‍යාංශය
මාර්ග සංවර්ධන අධිකාරිය

ලංසු කැඳවීම (IFB)

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය සඳහා ප්‍රභූවරුන්ගේ ප්‍රවේශ මාර්ගය සම්බන්ධ කරමින් කුළුණු මතින් ඉදිවන මාර්ගය (VIADUCT) ඉදි කිරීම පිළිබඳ කොන්ත්‍රාත්තුවේ ලංසු කැඳවීමේ කාලසීමාව දීර්ඝ කිරීම පිළිබඳ දැන්වීමයි

කොන්ත්‍රාත් අංක : RDA/DC/WP/IR-GOSL/2020/39

1. ඉහත ව්‍යාපෘතිය සඳහා 2020.08.31 වෙනි දින පල වූ ලංසු කැඳවීමේ කාලසීමාව 2020.09.23 වෙනි දින සිට 2020.09.29 වෙනි දින දක්වා දීර්ඝ කර තිබේ.

2. ලංසු ආරක්ෂණය 2021.02.24 වෙනි දින දක්වා වලංගු වේ.

3. සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, මහාමාර්ග අමාත්‍යාංශය, ප්‍රසම්පාදන අංශය, 07 වෙනි මහල, "මග නැඟුම මහ මැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට 2020.09.30 වෙනි දින ප.ව. 02.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම එහි පැමිණෙන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

4. ලංසුව වලංගු වන්නේ 2021.01.27 වෙනි දින දක්වා ය.

5. කොන්ත්‍රාත් කාලය දින 273 කි.

6. 2020.08.31 වෙනි දින පල කරන ලද ලංසුව සඳහා වන ආරාධනයේ ලංසු කැඳවීමේ අනෙකුත් කොන්දේසි නොවෙනස්ව පවතී.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
මහාමාර්ග අමාත්‍යාංශය
ප්‍රසම්පාදන අංශය,
7 වන මහල, "මගනැඟුම මහමැදුර"
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල

උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2020/2021 වර්ෂය

උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට අදාළව 2020/2021 වර්ෂය සඳහා සැපයුම් හා සේවා සැපයීම පිණිස ලියාපදිංචි වීමට කැමති පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සැපයුම් :

අනු අංකය

01. ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා.
02. කාර්යාල උපකරණ – යතුරු ලියන/ අනුපිටපත් යන්ත්‍ර/ ඡායා පිටපත් යන්ත්‍ර/ කැල්කියුලේටර් වෙනත්
03. පරිගණක/ පරිගණක උපාංග හා ආශ්‍රිත ද්‍රව්‍ය
04. ශ්‍රව්‍ය/ දෘශ්‍ය උපකරණ
05. පණිවිඩ හුවමාරු උපකරණ
06. කාර්යාල ගෘහ භාණ්ඩ – දැවමය/ වානේ/ ප්ලාස්ටික්/ වෙනත්
07. බැටරි වර්ග – වාහන/ වෙනත්
08. රථ වාහන අමතර කොටස්
09. ටයර් සහ ටියුබ්
10. යකඩ බඩු/ ගොඩනැගිලි ද්‍රව්‍ය
11. විදුලි මෙවලම්/ ස්විච්/ හෝල්ඩර්ස්/ බල්බ වර්ග/ වෙනත්
12. උපකරණ (විදුලිමය) – විදුලිපංකා/ විදුලි පහන්/ වැකුම් ක්ලීනර්/ වායු සම්කරණ යන්ත්‍ර/ වෙනත්
13. ගොවිපල/ පැළ තවාත් අවශ්‍යතා – උපකරණ/ යන්ත්‍රෝපකරණ/ මෙවලම්/ වෙනත්
14. ගොවිපල/ පැළ තවාත් අවශ්‍යතා – සෙවන දැල්/ පොලිතීන් වර්ග
15. තවාත් බඳුන් මිශ්‍රණ – ගොම පොහොර/ කොහුබත්/ ගංගා වැලි/ මතුපිට පස්
16. රසායනාගාර සැපයුම් – රසායනික ද්‍රව්‍ය/ උපකරණ සහ වෙනත්
17. රබර් සහ සම් ආශ්‍රිත නිෂ්පාදන – ක්ෂේත්‍ර ගමන්මළු/ විධායක ගමන්මළු/ රබර් හෝස්/ ගම්බූට් / වැහිකබා/ වෙනත්
18. පිහන් භාණ්ඩ/ විදුරු භාණ්ඩ/ සන්නිපාරක්ෂක උපකරණ
19. සන්නිපාරක්ෂක ද්‍රව්‍ය – සබන්/ විෂබීජ නාශක/ නිවාරක/ වෙනත්
20. රෙදිපිළි/ T-Shirt
21. සමරු ඵලක
22. රබර් මුද්‍ර,
23. CCTV කැමරා සහ අනෙකුත් උපාංග
24. දිවා රාත්‍රී ආහාර/ කෙටි ආහාර/ පානීය ජල බෝතල්

2. සේවා / වැඩ

25. ආර්ට්වර්ක් ඇතුළු ප්‍රචාරණ සේවා
26. මුද්‍රණ වර්ණ/ විභේදන කටයුතු
27. මුද්‍රණ කටයුතු/ පොත්බැඳීම් කටයුතු
28. අත්පිටපත් ලිවීම ඇතුළු වීඩියෝ චිත්‍රපට/ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය
29. පරිගණක වැඩසටහන් සම්පාදනය
30. අලුත්වැඩියා/ සේවා කිරීම – විදුලි උපකරණ/ යන්ත්‍රෝපකරණ
31. අලුත්වැඩියා/ සේවා – රසායනාගාර උපකරණ
32. අලුත්වැඩියා/ සේවා – (විදුලි උපකරණ) පරිගණක/ පරිගණක මුද්‍රණ යන්ත්‍ර/ ඡායා පිටපත් යන්ත්‍ර/ ෆැක්ස් යන්ත්‍ර
33. අලුත්වැඩියා/ සේවා – යතුරුලියන
34. කැමරා (නිශ්චල/ වීඩියෝ) අලුත්වැඩියා හා සේවා කිරීම.
35. වායුසම්කරණ අලුත්වැඩියා (ගෘහස්ථ)
36. වායුසම්කරණ අලුත්වැඩියා (වාහන)
37. වාහන අලුත්වැඩියාව – කාර්මික/ චිත්කරත් වැඩ/පේන්ට් වැඩ/ විදුලි
38. වාහන සේවා කිරීම
39. ගොඩනැගිලි ඉදි කිරීම් හා අලුත්වැඩියා කිරීම
40. කුෂන් වැඩ (කාර්යාල පුටු/ වාහන ආසන කුෂන් කිරීම)
41. ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පිළියෙල කිරීම හා ප්‍රදර්ශන භාණ්ඩ සැපයීම / නිශ්චල ඡායාරූපකරණය හා වීඩියෝකරණය
42. ඇලුමිනියම් භාවිතයෙන් ගොඩනැගිලිවල සැකිලි/ ආකෘති සැකසීම
43. ලෝහ වැඩ (ග්‍රිල් වැඩ හා වෙල්ඩින් වැඩ)
44. පවිත්‍රතා සේවා
45. රෙදිපිළි පිරිසිදු කිරීම (ලොන්ඩ්‍රි වැඩ)
46. වාහන කුලියට ගැනීම

කොන්දේසි :

- පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් ද සමඟ 2020-10-09 දින ප.ව. 3.00 ට පෙර රාජ්‍ය ලේකම්, උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, 16 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2020/2021"** යනුවෙන් සඳහන් කළ යුතුය.
- උක්ත සඳහන් එක් එක් සැපයුම් සේවා අනු අයිතමය සඳහා රු. 500 ක් බැගින් ආපසු නොගෙවනු ලබන මුදලක් අමාත්‍යාංශ කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත අයදුම්පතට ඇමිණිය යුතුය. (චෙක්පත් හෝ මනිඕඩර් භාරගනු නොලැබේ.)
- ඉල්ලුම් කළ විට මිල ගණන් ඉදිරිපත් නොකරගත්තා වූ හෝ නියමිත ප්‍රමිතීන්ට අනුව භාණ්ඩ/ සේවා නොසපයන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.
- මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 0112-879352 මඟින් විමසීම් කළ හැකිය.

උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2020/2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත

01. සැපයුම්කරුගේ නම : .....
02. ව්‍යාපාරයේ නම සහ ලිපිනය : .....
03. දුරකථන අංකය / ෆැක්ස් අංකය : .....
04. ඊ-මේල් ලිපිනය : .....
05. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය : .....
06. මුදල් නැමිපත් කළ කාර්යාලය හා රිසිට්පත් අංකය : .....
07. සපයනු ලබන භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර : .....

අනු අංකය	සපයනු ලබන භාණ්ඩ හා සේවාව

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් මේ සමඟ අමුණා ඇති බවත් සහතික කරමි.

....
දිනය අත්සන

PQ 92

ARPICO FINANCE COMPANY PLC
Estd. 1951

ආර්පිකෝ ෆිනෑන්ස් කම්පනි පී එල් සී

ආර්පිකෝ ෆිනෑන්ස් කම්පනි පී එල් සී
විස්තීරණ ආදායම් ප්‍රකාශය

මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා	2019/2020 රු.	2018/2019 රු.
දළ ආදායම	2,905,318,138	4,195,406,967
පොලී ආදායම	2,699,131,354	4,042,781,943
අඩුකළා-පොලී වියදම	(1,694,434,523)	(2,299,026,102)
ශුද්ධ පොලී ආදායම	1,004,696,831	1,743,755,841
ගාස්තු හා කොමිස් ආදායම	77,167,564	122,941,283
ශුද්ධ වෙළඳ ආදායම / වියදම	23,827,636	(3,745,655)
වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)	105,191,584	33,429,397
මුළු මෙහෙයුම් ආදායම	1,210,883,614	1,896,380,866
අඩුකළා-මූල්‍ය වත්කම් මත හානි හා වෙනත් අලාභ	(542,427,067)	(928,239,007)
ශුද්ධ මෙහෙයුම් ආදායම	668,456,547	968,141,859
අඩුකළා-මෙහෙයුම් වියදම්		
කාර්යය මණ්ඩල පිරිවැය	(337,798,589)	(367,443,242)
දේපල , උපකරණ ක්ෂයවීම් හා භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් ක්‍රමක්ෂය කිරීම	(51,363,615)	(29,402,291)
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	(5,378,327)	(4,863,668)
අනෙකුත් මෙහෙයුම් වියදම්	(265,677,961)	(271,024,637)
මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බද්දට පෙර ලාභය	8,238,056	295,408,020
අඩුකළා-මූල්‍ය සේවා මත බදු	(83,282,629)	(133,130,244)
ආදායම් බද්දට පෙර ලාභය / (අලාභය)	(75,044,573)	162,277,776
අඩුකළා - ආදායම් බදු (වියදම්) ආපසු හැරවීම්	(92,714,675)	210,317,907
වර්ෂයට ශුද්ධ ලාභය (අලාභය)	(167,759,249)	372,595,683
බදු වලින් පසු වෙනත් විස්තීරණ ආදායම්/වියදම්		
ලාභ අලාභ සඳහා පසුව නැවත වර්ගීකරණය කළ අයිතමයන්		
ලාභ අලාභ සඳහා පසුව නැවත වර්ගීකරණය නොකළ අයිතමයන්		
මූල්‍ය වත්කම් තුලින් උපයනලද විස්තීරන ආදායම		
වර්ෂය තුල සාධාරණ වටිනාකමෙහි ශුද්ධ වෙනස	(2,097,176)	(1,140,617)
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණය තුළින් වූ ලාභ / අලාභ	237,790,469	-
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ලාභ / අලාභ	9,033,700	(3,871,718)
බදු ගෙවුපසු අදාල කාල පරිච්ඡේදයට ලැබූ වෙනත් විස්තීරණ ආදායම්	244,726,993	(5,012,335)
කාලච්ඡේදය සඳහා මුළු විස්තීරණ ආදායම්	76,967,745	367,583,348
කොටසක් සඳහා ඉපැයීම		
සාමාන්‍ය කොටසක මූලික ඉපැයීම (රු.)	(22.56)	50.10

ආර්පිකෝ ෆිනෑන්ස් කම්පනි පී එල් සී
මූල්‍ය තත්ව ප්‍රකාශය

මාර්තු 31 දිනට	31.03.2020 රු.	31.03.2019 රු.
වත්කම්		
මුදල් හා මුදල් වලට සමාන දෑ	1,059,515,359	221,717,261
ක්‍රමක්ෂය කල මනින ලද මූල්‍ය වත්කම්	1,394,597,315	1,036,998,760
ලාභය හෝ අලාභය මත හඳුනාගත් සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම්	19,114,384	10,904,749
ණය හා අත්තිකාරම්	1,140,029,971	1,478,560,792
ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු කල්බදු වාරික	8,493,626,612	11,802,800,444
වෙනත් විස්තීරණ ආදායම් මත හඳුනාගත් සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම්	17,330,977	19,726,224
වෙනත් වත්කම්	69,470,462	294,618,370
දේපල , උපකරණ හා භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම්	1,040,335,766	805,314,319
අස්පෘශ්‍ය වත්කම්	13,785,291	18,103,066
පවත්නා බදු වත්කම්	137,215,625	110,021,710
විලම්බිත බදු වත්කම්	49,875,323	148,307,535
මුළු වත්කම්	13,434,897,087	15,947,073,231
වගකීම්		
බැංකු වලට හා මූල්‍ය සමාගම්වලට ගෙවියයුතු	2,573,869,772	5,452,964,238
ගණුදෙනුකරුවන්ගේ තැන්පතු	8,702,003,780	8,695,436,982
වෙළඳ හා අනෙකුත් ගෙවියයුතු	485,499,863	194,652,267
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	69,826,383	76,917,514
මුළු වගකීම්	11,831,199,798	14,419,971,001
හිමිකම්		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	245,062,500	245,062,500
රඳවාගත් ඉපැයුම්	624,904,205	783,257,069
වෙනත් සංචිත	733,730,584	498,782,661
මුළු හිමිකම්	1,603,697,289	1,527,102,230
මුළු වගකීම් සහ හිමිකම්	13,434,897,087	15,947,073,231
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	215.62	205.32

මෙම මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කරන ලදී.

.....
ප්‍රධාන විධායක නිලධාරි
(චන්දීන් ප්‍රනාන්දු මයා)

මෙම මූල්‍ය ප්‍රකාශ, පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය වගකීම දරනු ලබයි.

අධ්‍යක්ෂණ මණ්ඩලය වෙනුවෙන්

.....
කළමනාකාර අධ්‍යක්ෂක
(ශානිල් දයාවංශ මයා)

.....
අධ්‍යක්ෂක
(ඊ. එම්. ඒ. සඟේ මයා)

03 සැප්තැම්බර් 2020
කොළඹ

ආර්පිකෝ ෆිනෑන්ස් කම්පනි පී එල් සී
තෝරාගත් කාර්ය සාධක දර්ශකයන් (ව්‍යවස්ථානුකූල වාර්තාකරණයට අනුව)

අයිතම	31/03/2020	31/03/2019
නියාමක ප්‍රාග්ධනය ප්‍රමාණාත්මතාව		
මූලික ප්‍රාග්ධනය (පළමු පෙළ ප්‍රාග්ධනය), රු. '000	1,239,775	1,398,630
මුළු ප්‍රාග්ධන පදනම, රු.'000	1,277,321	1,477,036
මූලික ප්‍රාග්ධනය අවශ්‍යතා අනුපාතය(අවදානම මත බර තබූ වත්කම් වලින්)% (අවම අවශ්‍යතාවය 6.5%) *	7.97%	6.83%
මුළු ප්‍රාග්ධනය අවශ්‍යතා අනුපාතය (අවදානම මත බර තබූ වත්කම් වලින්)% (අවම අවශ්‍යතාවය 10.5%) *	9.19%	8.23%
ප්‍රාග්ධන අරමුදල් සහ තැන්පතු වගකීම් අනුපාතය (අවම අවශ්‍යතාවය 10%) *	14.25%	16.08%
වත්කම් වල තත්වය (ණය කළඹේ තත්වය)		
දළ අකීය ණය පහසුකම් රු. '000	1,696,230	2,214,465
දළ අකීය ණය අනුපාතය %	15.52	14.87
ශුද්ධ අකීය ණය අනුපාතය %	3.69	4.03
ලාභදායීත්වය (%)		
පොලී ආන්තිකය	7.93	11.50
වත්කම් මත ප්‍රතිලාභය (බදු පෙර)	(0.51)	0.96
හිමිකම් මත ප්‍රතිලාභය (බදු පසු)	(10.72)	27.26
නියාමක ද්‍රවශීලතාව : රු. '000		
අනුමත අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණය	871,293	869,376
පවතින ද්‍රවශීල වත්කම් ප්‍රමාණය	2,415,193	1,161,252
අනුමත අවම රාජ්‍ය සුරැකුම් පත් ප්‍රමාණය	1,203,947	952,343
පවතින අවම රාජ්‍ය සුරැකුම් පත් ප්‍රමාණය	1,217,653	965,154
වෙනත් තොරතුරු		
සේවක සංඛ්‍යාව	333	403
ශාඛා සංඛ්‍යාව	10	10
සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව	0	0

ආර්පිකෝ ෆිනෑන්ස් කම්පනි පී එල් සී
හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	ප්‍රත්‍යා ගණන සංචිත රු.	සාමාන්‍ය සංචිත රු.	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල් රු.	විකිණීම් සඳහා ඇති සංචිත රු.	රඳවාගත් ඉපැයීම් රු.	එකතුව රු.
2018 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා	245,062,500	120,307,712	22,035,535	273,754,578	9,306,317	535,576,616	1,206,043,257
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	-	-	-	372,595,683	372,595,683
වෙනත් විස්තීරණ ආදායම් (බදු පසු)	-	-	-	-	(1,140,617)	(3,871,718)	(5,012,335)
වර්ෂය තුල මාරුකිරීම්	-	-	-	74,519,137	-	(74,519,137)	-
2018/2019 සඳහා අවසාන ලාභාංශ							
සාමාන්‍ය කොටස්	-	-	-	-	-	(46,484,375)	(46,484,375)
නිදහස් කල නොහැකි සමුච්චිත වරණීය කොටස්	-	-	-	-	-	(40,000)	(40,000)
2019 මාර්තු 31 දිනට ශේෂය	245,062,500	120,307,712	22,035,535	348,273,715	8,165,700	783,257,069	1,527,102,230
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය)	-	-	-	-	-	(167,759,249)	(167,759,249)
වෙනත් විස්තීරණ ආදායම් (බදු පසු)	-	237,790,469	-	-	(2,469,861)	9,033,700	244,354,308
වර්ෂය තුල මාරුකිරීම්	-	-	-	-	(372,685)	372,685	-
2020 මාර්තු 31 දිනට ශේෂය	245,062,500	358,098,181	22,035,535	348,273,715	5,323,154	624,904,205	1,603,697,289

Deloitte.

INDEPENDENT AUDITOR'S REPORT
TO THE SHAREHOLDERS OF ARPICO FINANCE COMPANY PLC

REPORT ON THE AUDIT OF THE FINANCIAL STATEMENTS

Opinion
We have audited the financial statements of Arpico Finance Company PLC ("the Company"), which comprise the statement of financial position as at 31 March 2020, and the statement of profit or loss and other comprehensive income, statement of changes in equity and statement of cash flows for the year then ended, and notes to the financial statements, including a summary of significant accounting policies.

In our opinion, the accompanying financial statements give a true and fair view of the financial position of the Company as at 31 March 2020, and of its financial performance and its cash flows for the year then ended in accordance with Sri Lanka Accounting Standards.

Basis for opinion
We conducted our audit in accordance with Sri Lanka Auditing Standards (SLAuSs). Our responsibilities under those standards are further described in the Auditor's Responsibilities for the Audit of the Financial Statements section of our report. We are independent of the Company in accordance with the Code of Ethics issued by CA Sri Lanka (Code of Ethics), and we have fulfilled our other ethical responsibilities in accordance with the Code of Ethics. We believe that the audit evidence we have obtained is sufficient and appropriate to provide a basis for our opinion.

Key audit matters
Key audit matters are those matters that, in our professional judgement, were of most significance in our audit of the financial statements of the current period. These matters were addressed in the context of our audit of the financial statements as a whole, and in forming our opinion thereon, and we do not provide a separate opinion on these matters.

Allowance for impairment of leases , loans and receivables
Risk description:
As at 31 March 2020, 72% of its total assets of the company consisted of Net investment in leases and hire purchase and Loans and receivables from customers amounting to LKR 9,633,656,584 (Note 25 and 26), net of impairment allowance of LKR 1,292,934,588 (Note 25 and 26).

Recognition of expected credit loss (ECL) under SLFRS 9, is a complex accounting policy which requires considerable judgement in its implementation. ECL is dependent on management judgements in assessing the level of credit risk and classification of credit facilities in to various stages, determine when a default has occurred, determining probability of default (PD) of customers, estimating cash flows from recovery procedures or realisation of collateral and the impact of outbreak of COVID- 19 pandemic on the economically impacted customers and key assumptions used in ECL model.

Due to the significance of Financing facilities and the related estimation uncertainty and judgement in the impairment calculation, this was considered as a key audit matter

How the matter was addressed in our audit
Our audit procedures to assess impairment of leases and hire purchase and Loans and receivables from customers included the following:

• Obtaining an understanding, testing the design, and operating effectiveness of key controls within the management process of determination of impairment of financial assets under ECL model.
•Challenging and evaluating the key assumptions and management judgements used in the ECL models, including staging, PD and Loss given in default (LGD) etc.
• Testing the arithmetical accuracy of the underlying calculation in the ECL model.
• Testing the accuracy and completeness of the data inputs including the testing of reconciliations between source systems and the ECL model
• Verifying the economic factor inputs, used in the models to compute the forward-looking scenarios and management overlays (including the impact of COVID- 19), against the market information and economic statistics to assess whether they were aligned with the current macro-economic scenario.
• In addition to above , the following focused procedures were performed ; For contracts individually assessed for impairment;
- We assessed the main criteria used by the management for determining whether an impairment event had occurred.
- Where impairment indicator' s existed, we assessed the reasonableness of management's estimated future cash flows, discount rates and the valuation of collateral held.
•Assessing the disclosures made in note 44 with reference to the requirements of SLFRS 7.

Revaluation of land and buildings

Risk description:
As at 31 March 2020, Land and Buildings are carried at fair value, classified as Property, Plant & Equipment amounted to Rs.888,500,000 and the fair value gain recognized in Other Comprehensive Income and Profit or Loss amounted to Rs.237,790,469 respectively. The fair value of such property was determined by external valuers engaged by the Company. The valuation of land and buildings was significant to our audit due to the use of significant assumptions disclosed in note .30 to the financial statements.

How the matter was addressed in our audit
Our audit procedures focused on the valuations performed by external valuers engaged by the company, and included the following;
•We assessed the competency, capability and objectivity of the external valuers appointed by the management.
•We checked the valuation report to obtain an understanding of the work done by the valuer and evaluated the appropriateness as audit evidence for the recorded valuation of freehold land and buildings in the financial statements.
• We engaged internal specialized resources to assess the appropriateness of the valuation techniques and reasonableness of assumptions/estimates of the valuation techniques, per perch price and value per square foot.
•In addition, we evaluated the overall appropriateness of the related financial statement disclosures in note .30.

Management's use of significant judgements relating to the impacts of the evolving COVID 19 pandemic on the company

Management has assessed the impact of the evolving COVID 19 pandemic on its business and financial statements of the company
We considered the management's assessment in the wake of the evolving COVID 19 pandemic as a key audit matter, since it involve the use of significant management judgments and estimates considering future events circumstances and impacts on cash flows based on available information

Our audit procedures included the following;
• We gained an understanding of the significant judgements used by the management related to the impact assessment of the COVID 19 pandemic on the business of the company
• We obtained an understanding of the procedures adopted by the management to manage and mitigate the prevailing business interruption and possible effects on going concern ability of the company.
• We obtained an understanding of the management's practices in response to COVID-19, which are extended debt relief to borrowers and specific guidance issued by governments or regulators.
• We assessed the adequacy of qualitative disclosures made in financial statements in note number 44 focusing on credit risk and liquidity risk in the light of objective of SLFRS 7.

Other information
Management is responsible for the other information. The other information comprises the information included in the annual report, but does not include the financial statements and our auditor's report thereon.

Our opinion on the financial statements does not cover the other information included in the annual report and we will not, express any form of assurance conclusion thereon.

In connection with our audit of the financial statements, our responsibility is to read the other information identified above and, in doing so, consider whether the other information is materially inconsistent with the financial statements or our knowledge obtained in the audit, or otherwise appears to be materially misstated. If, based on the work we have performed, we conclude that there is a material misstatement of this other information, we are required to report that fact. We have nothing to report in this regard.

Responsibilities of management and those charged with governance for the financial statements
Management is responsible for the preparation of financial statements that give a true and fair view in accordance with Sri Lanka Accounting Standards, and for such an internal control, as management determines is necessary to enable the preparation of financial statements that are free from material misstatement, whether due to fraud or error.

In preparing the financial statements, management is responsible for assessing the Company's ability to continue as a going concern, disclosing, as applicable, matters related to going concern and using the going concern basis of accounting unless the management either intends to liquidate the Company or to cease operations, or has no realistic alternative but to do so.

Those charged with governance are responsible for overseeing the Company's financial reporting process.

Auditor's responsibilities for the audit of the financial statements
Our objectives are to obtain reasonable assurance about whether the financial statements as a whole are free from material misstatement, whether due to fraud or error, and to issue an auditor's report that includes our opinion. Reasonable assurance is a high level of assurance, but is not a guarantee that an audit conducted in accordance with SLAuSs will always detect a material misstatement when it exists. Misstatements can arise from fraud or error and are considered material if, individually or in the aggregate, they could reasonably be expected to influence the economic decisions of users taken on the basis of these financial statements.

As part of an audit in accordance with SLAuSs, we exercise professional judgement and maintain professional skepticism throughout the audit. We also:
• Identify and assess the risks of material misstatement of the f inancial statements, whether due to fraud or error, design and perform audit procedures responsive to those risks, and obtain audit evidence that is sufficient and appropriate to provide a basis for our opinion. The risk of not detecting a material misstatement resulting from fraud that is higher than for one resulting from error, as fraud may involve collusion, forgery, intentional omissions, misrepresentations, or the override of internal control.
• Obtain an understanding of internal control relevant to the audit in order to design audit procedures that are appropriate in the circumstances, but not for the purpose of expressing an opinion on the effectiveness of the Company's internal control.
•Evaluate the appropriateness of accounting policies used and the reasonableness of accounting estimates and related disclosures made by management.
•Conclude on the appropriateness of the management's use of the going concern basis of accounting and, based on the audit evidence obtained, whether a material uncertainty exists related to events or conditions that may cast significant doubt on the Company's ability to continue as a going concern. If we conclude that a material uncertainty exists, we are required to draw attention in our auditor's report to the related disclosures in the financial statements or, if such disclosures are inadequate, to modify our opinion. Our conclusions are based on the audit evidence obtained up to the date of our auditor's report. However, future events or conditions may cause the Company to cease to continue as a going concern.
•Evaluate the overall presentation, structure and content of the financial statements, including the disclosures, and whether the financial statements represent the underlying transactions and events in a manner that achieves fair presentation.

We communicate with those charged with governance regarding, among other matters, the planned scope and timing of the audit and significant audit findings, including any significant deficiencies in internal control that we identify during our audit.

We also provide those charged with governance with a statement that we have complied with ethical requirements in accordance with the Code of Ethics regarding independence, and to communicate with them all relationships and other matters that may reasonably be thought to bear on our independence, and where applicable, related safeguards.

From the matters communicated with those charged with governance, we determine those matters that were of most significance in the audit of the financial statements of the current period and are therefore the key audit matters. We describe these matters in our auditor's report unless law or regulation precludes public disclosure about the matter or when, in extremely rare circumstances, we determine that a matter should not be communicated in our report because the adverse consequences of doing so would reasonably be expected to outweigh the public interest benefits of such communication.

REPORT ON OTHER LEGAL AND REGULATORY REQUIREMENTS
As required by Section 163 (2) of the Companies Act No. 07 of 2007, we have obtained all the information and explanations that were required for the audit and, as it far as appears from our examination, proper accounting records have been kept by the Company.
CA Sri Lanka membership number of the engagement partner responsible for signing this independent auditor's report is 2347.

SJMS ASSOCIATES
Chartered Accountants
No 11, Castle lane,
Colombo 04
3 September 2020

රැකියා ඇබෑර්තු

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2020

** විශේෂයෙන් සැලකිය යුතුයි **

මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ දී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) හරහා අනිවාර්යයෙන්ම ලියාපදිංචි වී අයදුම් කළ යුතුය.

අධ්‍යාපන සුදුසුකම් :

(අ). සිංහල/ දෙමළ, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාත සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

වයස :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

විභාගය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සියලු උපදෙස් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) මඟින් ලබා ගත හැකිය. අන්තර්ජාලය හරහා අනිවාර්යයෙන්ම විභාගය සඳහා ලියාපදිංචි විය යුතු අතර, A4 (සෙ.මී.21X29) ප්‍රමාණයේ කඩදසි භාවිත කරමින් අයදුම්පත්‍රයෙහි දඩ පිටපතක් (Hard Copy) අපේක්ෂකයින් විසින් 2020.10.09 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පමණක් පහත ලිපිනයට යොමු කරන්න.

ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල.

කේ.එල්. දයානන්ද,
ලේකම්.

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න - 091-2248450

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොවූ ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

දකුණු පළාත් සභාව

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය

(ද.ප.ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය)

"ස්ථානභාර නිලධාරී" තනතුර සඳහා බඳවා ගැනීම

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය සඳහා මධ්‍යස්ථාන භාරව කටයුතු කිරීම උදෙසා ස්ථානභාර නිලධාරීවරයකු බඳවා ගැනීම වෙනුවෙන් පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අධ්‍යාපන සුදුසුකම්

1.1 බාහිර අයදුම්කරුවන්

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ,
   I. සිංහල
   II. ගණිතය
   III. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම **සහ**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

1.2 අතිරේක සුදුසුකම්

1. දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් හෝ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පවත්වනු ලබන වෘත්තීය පුහුණු (වඩු කාර්මික, ලුහු ඉංජිනේරු ,දැව කැටයම්, උද්‍යාන අලංකරණ) පාඨමාලාවක් හදාරා තිබීම.

1.3 අභ්‍යන්තර අයදුම්කරුවන්

අ. ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, ශිල්පීය සේවා ගණයන්හි පහත (ආ) සහ (ඇ) සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

ආ. සේවයෙහි ස්ථිර පත්වීම දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

ඇ. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

පොදු කොන්දේසි

2. වයස: අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය.(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.)

3 වෙනත් : I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

4. වැටුප් කේතය හා පරිමාණය :

(MA 1-1) 27,910- 300x10 - 350x7 -495x4 - 660x20 - 48,540 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 මත පදනම්ව) මූලික වැටුප වන රු.27,910/= 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. 2020.01.01 දිනට ආරම්භක වැටුප් තලය රු. 27,910 වේ. මූලික වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

5. පත්වීමේ ස්වභාවය : ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ.

6. තෝරාගැනීමේ ක්‍රමවේදය : විවෘත තරඟ විභාගයක් හා /හෝ පත්වීම් බලධරයා විසින් පත් කරන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

සම්පූර්ණ විස්තර සහිතව ඔබ විසින් සකස් කරන ලද ජීව දත්ත සහිත අයදුම්පත් (සහතික කරන ලද සහතිකවල ඡායා පිටපත්ද සහිතව) 2020/10/05 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි "සභාපති, ද.ප. කාර්මික සංවර්ධන අධිකාරිය, අංක 349 ½ , මාතර පාර, කටුගොඩ, ගාල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. ඉහත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ හා නියමිත පරිදි ඉදිරිපත් නොකරන හා අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
ද.ප. කාර්මික සංවර්ධන අධිකාරිය,
අංක 349 1/2 , මාතර පාර, කටුගොඩ, ගාල්ල
091-2226296/091-3789290

සුභසේන
සත වෙත සිරිසෙන සලසන සත්පත
පලාඵල | හස්තරේඛා | වාස්තුවිද්‍යා | යෝගවිද්‍යාව | ආයුර්වේද
වෙදකමටද හෙදකමටද - ගුරු කමටද හුරුකමටද
ජ්‍යොතිෂායුර්වේද පන්හිද

ඇබෑර්තු

කාර්මික තාක්ෂණ ආයතනය

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - තාක්ෂණ සේවා
අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත්, ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2020.10.02
වැඩි විස්තර සඳහා

2020.09.18 Daily News පුවත්පත බලන්න.

අධ්‍යක්ෂ ජනරාල් / ප්‍ර.වී.නි.
කාර්මික තාක්ෂණ ආයතනය

සී.ස. ගලිගමුව විවිධ සේවා සමුපකාර සමිතිය

තනතුරු පුරප්පාඩු

සී.ස. ගලිගමුව විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සබරගමුව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් සමිති අභ්‍යන්තරයෙන්, සමිති බල ප්‍රදේශයේ හා කැඟල්ල දිස්ත්‍රික්කයෙන් ප්‍රමුඛතා අනුපිළිවෙළට කැඟල්ල දිස්ත්‍රික්කයේ අවම වශයෙන් වසර 02 ක් හෝ ඊට වඩා ස්ථිර පදිංචි වයස අවුරුදු 18-45 ත් අතර (සමුපකාර සමිති සේවකයින්ට සහ සමිති අභ්‍යන්තර සේවකයන්ට වයස් සීමාව බලපානු නොලැබේ.)

අයදුම්පත් 2020.10.05 දින දක්වා මා විසින් කැඳවනු ලැබේ. පහත සඳහන් තනතුරුවල වැටුප් පරිමාණයට අමතරව සබරගමුව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව අනුමත කරන ලද වැටුප් වැඩිකිරීම් සහ දීමනා ගෙවනු ලැබේ. විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් හිමි වේ.

(තනතුරුවලට අදාළ සුදුසුකම් සහිත වක්‍රලේඛය සබරගමුව පළාතේ ඕනෑම සමුපකාර සමිතියකින් බලාගත හැකිය.)

1. **තනතුර** : III **ශ්‍රේණියේ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුර**
   වැටුප් පරිමාණය : රු.16800 - 10 X 110 - 10 X 120 - 19100
   ඊට අමතරව රු. 3500.00 ක දීමනාවක් හිමි වේ. පුරප්පාඩු 03
2. **තනතුර** : III **වන ශ්‍රේණියේ ප්‍රාදේශික කළමනාකාර තනතුර**
   වැටුප් පරිමාණය : රු.15600 - 10 X 110 - 10 X 120 - 17900
   ඊට අමතරව රු. 3500.00 ක දීමනාවක් හිමි වේ. පුරප්පාඩු 04
3. **තනතුර** : III **වන ශ්‍රේණියේ මුදල් අයකැම් තනතුර**
   වැටුප් පරිමාණය : රු.15600 - 10 X 110 - 10 X 120 - 17900
   ඊට අමතරව රු. 3500.00 ක දීමනාවක් හිමි වේ. පුරප්පාඩු 01
4. **තනතුර** : III **වන ශ්‍රේණියේ වාණිජ කළමනාකාර තනතුර**
   වැටුප් පරිමාණය : රු.22800 - 10 X 190 - 10 X 210 - 26800
   ඊට අමතරව රු.3500.00 ක දීමනාවක් හිමි වේ. පුරප්පාඩු 01
5. **තනතුර** : III **වන ශ්‍රේණියේ ලිපිකරු තනතුර**
   වැටුප් පරිමාණය : රු.15600 -10X110-10X120 - 17900 ඊට අමතරව රු. 3500.00 ක දීමනාවක් හිමි වේ. පුරප්පාඩු 05
6. **තනතුර** : II **වන ශ්‍රේණියේ සේවා සහායක - බැංකු තනතුර**
   වැටුප් පරිමාණය : රු. 13200 - 10 X 86 - 5 X90 - 14450 ඊට අමතරව රු. 3500.00 ක දීමනාවක් හිමි වේ. පුරප්පාඩු 04
7. **තනතුර** : II **වන ශ්‍රේණියේ වෙළඳ සහායක තනතුර**
   වැටුප් පරිමාණය : රු.13200 - 10 X 80 - 5X90 - 14450
   ඊට අමතරව රු. 3500.00 ක දීමනාවක් හිමි වේ. පුරප්පාඩු 06

01. තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පතක්, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාමසේවා සහතිකය. පළපුරුද්ද පිළිබඳ සහතික හැඳුනුම්පත සහ වෙනත් සුදුසුකම් සහතික වල ඡායා පිටපත් සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.
    ගරු සභාපති,
    සී.ස. ගලිගමුව වි.සේ. සමිතිය,
    බල්ලපාත, ගලිගමුව නගරය.
02. අයදුම්පතේ පිටපතක් පමණක් ලේකම් සමුපකාර සේවක කොමිෂන් සභාව, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර යන ලිපිනයට යැවිය යුතුය. ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ තනතුර සඳහන් කළ යුතුය.

දුරකථන අංකය - 035 - 2282696

ගරු සභාපති

ලේක්හවුස් ඡායාරූප ශිල්පීන් විසින් ඡායාරූප ගත කරන ලද කළු සුදු හා වර්ණ සේයා පත් කර්තෘ මණ්ඩල පුස්තකාලයෙන් මිලදී ලබාගැනීමට පහසුකම් සලසා ඇත.

දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොවූ ඡායාරූපවල දළ සේයාපට 1950 සිට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන අංක 2429491

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය

කොළඹ විශ්වවිද්‍යාලයේ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ. පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය අපේක්ෂකයින් වෙතින්, අයදුම්පත් කැඳවනු ලැබේ.

සහකාර ජාලකරණ කළමනාකරු
II වන ශ්‍රේණිය - පුරප්පාඩු - 01 යි

1. සුදුසුකම් :

(I) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (B.Sc.) විශේෂ උපාධියක පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක්.

හෝ

(II) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (B.Sc) (විශේෂ) උපාධියක් සමත්වීම.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක බාවිතය විෂය සංඝටකයක් ලෙස ලත් විද්‍යාවේදී (B.Sc) (සාමාන්‍ය) උපාධියක පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක්

සහ

(ආ) පරිගණක භාවිතය, ජාලකරණය (Computing / Net Working) පිළිබඳ ක්ෂේත්‍රයේ එක් (01) වසරක පළපුරුද්ද.

හෝ

(III) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්, පරිගණක භාවිතය (Computing) විෂය සංඝටකයක් ලෙස ලත් විද්‍යාවේදී (B.Sc) සාමාන්‍ය උපාධි සාමාර්ථයක්.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් (පරිගණක භාවිතය (Computing) විෂය සංඝටකයක් නොවන) විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක, පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක්.

සහ

(ආ) පරිගණක භාවිතය, ජාලකරණය (Computing / Net Working) පිළිබඳ ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්ද.

හෝ

(IV) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් (පරිගණක භාවිතය (Computing) විෂය සංඝටකයක් නොවන) විද්‍යාවේදී (B.Sc) සාමාන්‍ය උපාධියක සාමාර්ථයක්.

සහ

පරිගණක භාවිතය, ජාලකරණය (Computing / Net Working) පිළිබඳ ක්ෂේත්‍රයේ, වසර තුනක (03), පළපුරුද්ද.

හෝ

(V) වෙනයම් උපාධියක්

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව / පරිගණක තාක්ෂණ වේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

සහ

පරිගණකය භාවිතය / ජාලකරණය (Computing / Net Working) පිළිබඳ ක්ෂේත්‍රයේ, එක් (01) වසරක පළපුරුද්ද.

හෝ

(VI) විශ්වවිද්‍යාල සේවයේ, පරිගණක ක්‍රමලේඛක (Computer / Programmer) වරයෙකු ලෙස වසර 15 ක පළපුරුද්ද.

2. බඳවා ගැනීමේ ක්‍රමවේදය

අභියෝග්‍යතා පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

3. වැටුප් පරිමාණය :

රුපියල් : 50,625-3X1,335 - 54,630 (EB) 55,965 - 14X1,335 - 74,655 (මාසිකව) U-AS 2 (II), 2020-01-01 වන දිනට

ඉහත සඳහන් වැටුපට අතිරේකව, ජීවන වියදම් දීමනාව (COL) හා වෙනත් අදාළ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

4. වෙනත් ප්‍රතිලාභ :

➢ **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) :**
සේවා යෝජකයා විසින් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට (UPF) මාසික මූලික වැටුපෙන්, 7% කට සමාන වන මුදලක් / අගයක්, දායකවනු ඇත. සේවකයා විසින් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට (UPF) සිය මාසික මූලික වැටුපෙන් 10% කට සමාන අගයක් ලෙස, දායකත්වය සපයනු ඇත.

➢ **විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය :**
සේවා යෝජකයා විසින් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට, මාසික මූලික වැටුපෙන්, 8% ක අගයක් ලෙස දායක වනු ඇත.

➢ **සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (ETF) :**
සේවා යෝජකයා විසින් සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට (ETF) ට, මාසික මූලික වැටුපෙන්, 3% ක් වන අගයට සමාන වටිනාකමක් දායක වනු ඇත.

5. වැදගත් :

➢ උසස් අධ්‍යාපන ආයතන / රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන්, ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

➢ අදාළ සහතික පත්‍රවල පිටපත්, අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

➢ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් සහ නියමිත ආකෘති පත්‍රයට නොඅනුකූලව ඉදිරිපත් කරනු ලබන, අනනුකූල අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව, භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

➢ අයදුම්පත්, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) හි, වෙබ් අඩවිය වන www.iim.cmb.ac.lk යන වෙබ් අඩවියෙන් භාගත කරගත හැකිය.

➢ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතික පත්‍රවල පිටපත් ද සමග, 2020-10-09 වන දිනට හෝ ඉන් පෙර ලැබෙන සේ, රාජගිරිය, කොළඹ විශ්වවිද්‍යාලයේ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) හි, සහකාර ලේඛකාධිකාරී / ආයතන, වෙත, ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. අයදුම්කරනු ලබන තනතුර, ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

අධ්‍යක්ෂක,
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ නීති නිලධාරී තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2020

වාරිමාර්ග අමාත්‍යාංශය

වාරිමාර්ග අමාත්‍යාංශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩුව (01) පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

අවශ්‍ය සුදුසුකම්

(i) අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර 03 කට නොඅඩු නීතිඥයකු වශයෙන් සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රිය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලය, දිනය හා නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය).

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර 03කට නොඅඩු පහත දැක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම.

i. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.
ii. ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු.
iii. අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු.
iv. පනත් කෙටුම්පත්, චක්‍රලේඛ රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු.
v. විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.

(මෙම කරුණු ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කළ සහතිකයකින් සනාථ කළ යුතුය.)

(iii) කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

(iv) වෙනත් සුදුසුකම්

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- අ.පොස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි

i. මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
ii. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට පත්වී වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
iii. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රයටද, රජයේ මූදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත්වේ.

04. වයස් සීමාව

ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට, වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

05. වැටුප් පරිමාණය

මෙම තනතුරට රු. 47615 - 10 ×1335 –8× 1630 -17 × 2170 - රු.110,895/- (SL- 1- 2016) මාසික වැටුප් පරිමාණයක් හිමිය.(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමිවේ.)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

	විෂයය		උපරිම ලකුණු
01	**අතිරේක අධ්‍යාපන සුදුසුකම්**		
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය	25	
	රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු)	20	
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය		
	– පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා	15	25
	– දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා	10	
	– දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා	05	
	නීති විද්‍යුලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා	10	
	නීති විද්‍යුලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා	05	
	සටහන : ගෞරව සාමාර්ථයක් සමඟ අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 05 ලබාදිය යුතුයි.		
	(උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දේ)		
02	**අතිරේක වෘත්තීය පළපුරුද්ද**		
	i. අතිරේක වෘත්තීය සුදුසුකම්	10	
	රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට වැඩි ඩිප්ලෝමාවක් සඳහා		
	(එක් ඩිප්ලෝමාවකට ලකුණු 10කි.)		
	රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා		
	(එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්.)		
	රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට වැඩි හා මාස 06කට අඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා		
	(එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින්.)		
	(අංක 01 යටතේ වන ලකුණු ලබා දුන් සහතික හැර වෙනත්)		
	ii. අතිරේක පළපුරුද්ද	25	35
	නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද		
	(එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 25ක්)		
	(මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු – ලකුණු 02)		
	(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර)		
	(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මඟින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.)		
	(ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් හෝ පෞද්ගලික අංශයේ නිලධාරීන් සඳහා ආයතන ප්‍රධානී විසින් අතිරේක පළපුරුද්ද සනාථ කිරීමේදී අයදුම්කරු නීතිමය තනතුරක සේවය කරන බවට සේවා සහතිකයක් /සහතික පත් මඟින් සනාථ කළ යුතුය.)		
3	**භාෂා ප්‍රවීණතාව**		
	ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/ පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය	15	
	(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.)		
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500)	10	
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා		15
	– මාස 06/පැය 720	07	
	– මාස 03/පැය 360	05	
	(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ)		
04	**තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම**		
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්තා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා	10	
	රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා	07	10
	රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා		
	– මාස 06/පැය 720	05	
	– මාස 03/පැය 360	03	
	(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ)		
05	**සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව**		
	i. සාමාන්‍ය දැනීම හා බුද්ධිය	05	
	ii. නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම	05	15
	iii. පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය	05	
	මුළු එකතුව		**100**

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
- සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම

I. අයදුම්පත් 2020.10.23 දිනට හෝ එදිනට ප්‍රථම වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත්, 02 වන පිටුව අංක 04 සිට 06 දක්වාත්,03 වන පිටුව අංක 07 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"නීති නිලධාරී තනතුර සඳහා අයදුම් කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

IV. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 47,615/- ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

V. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

VI. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්වයක් ඇති වුවහොත් හෝ ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

12. මෙම ගැසට් නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
වාරිමාර්ග අමාත්‍යාංශය
2020 සැප්තැම්බර් මස 09 දින

ආදර්ශ අයදුම්පත්‍රය

වාරිමාර්ග අමාත්‍යාංශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2020

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍ය	

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල -1/දෙමළ-2/ඉංග්‍රීසි-3)
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

සටහන :- අයදුම් කරන භාෂා මාධ්‍ය ය වෙනස් කළ නොහැක.

1.0 1.1 සම්පූර්ණ නම(මයා/මිය/මෙය) : .....
(සිංහලෙන්/දෙමළෙන්) .....
1.2 සම්පූර්ණ නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....
1.3 මුලකුරු සමඟ නම(මයා/මිය/මෙය) : .....
(සිංහලෙන්/දෙමළෙන්) .....
1.4 මුලකුරු සමඟ නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා: GUNAWARDHANA, M.G.B.S.K

2.0 2.1 ස්ථිර ලිපිනය : .....
(සිංහලෙන්/දෙමළෙන්)
2.2 ස්ථිර ලිපිනය : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය පුරුෂ – 0 ☐
ස්ත්‍රී – 1
3.2 විවාහක/අවිවාහක බව විවාහක – 1 ☐
අවිවාහක – 2

3.3 උපත් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 2019..... දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 4.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබා ගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තර

සුදුසුකම් ලබාගත් ආයතනය	ලබාගත් දිනය
.....	.....
.....	.....

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :

4.2 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර

4.3 අතිරේක අධ්‍යාපන සුදුසුකම් : .....
4.4 අතිරේක වෘත්තීය සුදුසුකම් : .....
4.5 අතිරේක පළපුරුද්ද : .....
4.6 භාෂා ප්‍රවීණතාව : .....
4.7 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම : .....

5.0 ඔබ කවරදුක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? (අදාළ කොටුවේ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර කරන්න) ඔව් ☐ නැත ☐

6.0 **අයදුම්කරුගේ සහතිකය**
මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත්වන බවත් ප්‍රකාශ කරමි.

....
දිනය අයදුම්කරුගේ අත්සන

7.0 **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිටදී ..... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

....
දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

සම්පූර්ණ නම :
තනතුර :
දිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

8.0 **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :**
ඉහත විස්තර සඳහන් .....මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

.....
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

දිනමිණ The Dinamina
ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

ලංසු කැඳවීමයි

Plain Gel Tubes සහ Sugar Tubes මිලදී ගැනීම

දකුණු කොළඹ ශික්ෂණ රෝහල - කළුබෝවිල, දෙහිවල

දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙම රෝහලේ ප්‍රධාන රසායනාගාරය සඳහා අවශ්‍ය පහත සඳහන් ටියුබ් වර්ග සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

01. Plain Gel tubes with clot Activator - 350,000 nos

02. Sugar Tubes - 120,000 nos

(01) මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයවලුන් ලංසු ලියකියවිලි ගාස්තු වශයෙන් රු. 2,000.00 ක ආපසු නොගෙවනු ලබන අයදුම්පත් ගාස්තුවක් දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ සරප් අංශය වෙත ගෙවා ලබා ගත් ලදුපත සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් **2020.09.18 දින සිට** 2020.10.02 දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා මෙම රෝහලේ මුදල් අංශයෙන් ලංසු ලියකියවිලි ලබාගත හැක.

(02) ලංසු අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර - **දකුණු කොළඹ ශික්ෂණ රෝහල, කළුබෝවිල, දෙහිවල - Plain Gel tubes & Sugar Tubes** සඳහා මිල ගණන් - 2020.10.05 යනුවෙන් සඳහන්කර 2020.10.05 **දින** පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, දකුණු කොළඹ ශික්ෂණ රෝහල, කළුබෝවිල, දෙහිවල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැක. 2020.10.05 දින පෙ.ව. 10.00 ට ගණකාධිකාරී කාර්යාලයේදී මිල ගණන් විවෘත කරනු ලැබේ. **මෙම ටියුබ් වර්ග සඳහා සාම්පල් ලබාදීම අනිවාර්ය වන අතර, සාම්පල් මිල ගණන් සමග අමුණා එවීමට කටයුතු කළ යුතුය.**

(03) ලංසු ලියකියවිලි පිටපත් 02 න් මුල් පිටපත හා අනුපිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර 02 තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

(04) ලංසු භාරගැනීම අවසන් වූ විගස එම ස්ථානයේදීම ලංසු අයදුම්පත් විවෘත කරන අතර, ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් එක් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

(05) ලංසු ලියකියවිලි ගෙවීමකින් තොරව දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ගණකාධිකාරී කාර්යාලයේදී පරීක්ෂා කිරීමට පිළිවන.

(06) රජයේ කොන්ත්‍රාත්තු, කොන්දේසි කඩකර අසාධු ලේඛන ගත කොට ඇති පුද්ගලයින් වෙත ලංසුපත් නිකුත් කරනු නොලැබේ.

(07) අදාළ ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

(08) වැඩි විස්තර සඳහා දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ ගණකාධිකාරී අමතන්න.

(දුරකථන අංකය - 0112763038)

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
දකුණු කොළඹ ශික්ෂණ රෝහල,
කළුබෝවිල, දෙහිවල.

ප්‍රසම්පාදන දැන්වීමයි

දකුණු පළාත් සභාව

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලය

කොටුව - ගාල්ල

ගාල්ල, කොටුව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ සභාපති, ප්‍රසම්පාදන කමිටුව (නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් පහත සඳහන් වැඩ විෂයන් සඳහා 2020.10.14 දින පෙ.ව. 10.30 දක්වා මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ. 2020.10.14 දින පෙ.ව. 10.30 ට මෙම කාර්යාලයේදී ලංසුකරුවන් ඉදිරියේදී ලංසුපත් විවෘත කරනු ලැබේ.

විස්තරය	අවශ්‍ය ලියාපදිංචිය	ආපසු ගෙවන ලංසු ඇපකරය රු.	ආපසු නොගෙවන ලංසු තැන්පත් රු.	ටෙන්ඩර්පත් ලබාගත හැකි දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි කාර්යාලය)
1. දකුණු පළාත් ආදයම් දෙපාර්තමේන්තුවේ අලුත්වැඩියා සහ තීන්ත පිරියම් කිරීම.	C8	45,000.00	1,500.00	දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය ගාල්ල.

02. ලංසුපත් 2020.10.13 දින ප.ව. 2.30 දක්වා අදාළ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැක. ඉහත දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා ඉදිකිරීම් හා පුහුණු **සංවර්ධන ආයතනයේ** (ICTAD) **වලංගු ලියාපදිංචිය සපුරා ඇති දකුණු පළාත් සභාව යටතේ** ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් අදාළ ලංසුපත් නිකුත් කරනු ලැබේ.

03. ලංසු සම්බන්ධ වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හිදී සාමාන්‍ය කාර්යාල වේලාව තුළ අදාළ දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාල වලින් ලබාගත හැක. අදාළ දුරකථන අංක පහත දැක්වේ.

දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලය, ගාල්ල - 091-2246160

04. ඉදිරිපත් කරනු ලබන ලංසු බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ කර්මාන්තයේ තම සඳහන් කළ යුතුය. සම්පූර්ණ කරන ලද ලංසුපත් පිටපත් දෙකකින් යුක්තව "මුල් පිටපත" හා "දෙවන පිටපත" ලෙස වෙන වෙනම නම් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළට බහාලීම හෝ කළ හැක. නියමිත වේලාවට පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසුපත් විවෘත කරන අවස්ථාවේදී ලංසු ඉදිරිපත් කරන්නන් හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද නියෝජිතයන්ට පැමිණ සිටීමට ඉල්ලීමක් කරනු ලැබේ. මිල ගණන් අසම්පූර්ණ ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ලංසු ඇප මුදලද රාජසන්තක කරනු ලැබේ. ලංසුපත් ඉදිරිපත් නොකරන ලංසුකරුවන්ගේ ලංසු ඇප මුදල්ද රාජසන්තක කරනු ලැබේ.

06. ඉහත කර්මාන්තවලට අදාළ ලංසු සුරක්ෂණ ගාස්තු දිස්ත්‍රික් කාර්යාල වෙත මුදලින් ගෙවීම හෝ රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 5:3:13 ආකෘතියේ පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබාගත් අදාළ වටිනාකමින් යුත් ඇපකරයක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) නමින් ඉදිරිපත් කළ යුතුය. මුදලින් ගෙවන්නේ නම් ලදුපතේ ඡායා පිටපතක් ලංසුපත් සමග අමුණා ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකර වලංගු කාලය 2020.10.14 සිට 2021.02.11 දක්වා විය යුතුය.

07. ලංසුවල වලංගු කාලය මාස 3 කි.

08. සෑම මිල ගණන් ඇතුළත් ලංසු පතකම ඒකක මිල ගණන් හා මුළු මුදල දැක්වෙන තීරය හා සාරාංශය (වට්ටම දැක්වෙන තීරයද ඇතුළත්ව) අවර්ණ (Transparent) සෙලෝටේප් කර ඉදිරිපත් කළ යුතුය.

09. ලංසුපත් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිබඳ තීරණය ගැනීම ප්‍රසම්පාදන කමිටුව සතුය.

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා),
